# ජාතිකව නිර්ණය කළ දායකත්ව
# ක්‍රියාත්මක කිරීමේ සැලසුම
## (2021-2030)

ශ්‍රී ලංකාව

# ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**(2021-2030)**

**ශ්‍රී ලංකාව**

ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

පරිසර අමාත්‍යාංශය - සියලුම හිමිකම් ඇවිරිණි

**ISBN: 978-624-5817-38-2**

| | | |
|---|---|---|
| පළමු මුද්‍රණය | : | 2023 ජූලි |
| ප්‍රකාශනය | : | දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය<br>පරිසර අමාත්‍යාංශය<br>'සොබාදම් පියස', 416/1/C, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල<br>**www.climatechange.lk** |
| මූල්‍ය දායකත්වය | : | **Climate Promise Project - UNDP Sri Lanka** |

යාවත්කාලීන කරන ලද ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව, අමාත්‍ය මණ්ඩලය විසින් 2021 ජූලි මස 12 දින අනුමත කරන ලදි. (කැබිනට් පත්‍රිකා අංක. 21/1259/321/12)

# කෙටි යෙදුම්

| | |
|---|---|
| **AAC** | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (Automobile Association of Ceylon) |
| **AAIB** | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (Agricultural and Agrarian Insurance Board) |
| **AERs** | කෘෂි පාරිසරික කලාප (Agro Ecological Regions) |
| **AGD** | නීතිපති දෙපාර්තමේන්තුව (Attorney Generals Department) |
| **AIS** | ස්වයංක්‍රීය හඳුනාගැනීමේ පද්ධති (Automatic Identification Systems) |
| **ASMET** | කුඩා හා මධ්‍යම සංචාරක ව්‍යවසායක සංගමය (Association of Small and Medium Enterprises in Tourism) |
| **BAU** | කටයුතු පුරුදු පරිදි සිදුවන (Business-As-Usua) |
| **BDS** | ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය (Biodiversity Secretariat) |
| **BOI** | ආයෝජන මණ්ඩලය (Board of Investment) |
| **C&HSs** | නගර සහ මානව ජනාවාස (Cities and Human Settlements) |
| **CAASL** | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (Civil Aviation Authority of Sri Lanka) |
| **CARP** | කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (Council for Agricultural Research Policy) |
| **CBOs** | ප්‍රජා මූලික සංවිධාන (Community Based Organisations) |
| **CBSL** | ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank of Sri Lanka) |
| **CC&CRMD** | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (Coast Conservation and Coastal Resources Management Department) |
| **CCB** | පොල් වගාකිරීමේ මණ්ඩලය (Coconut Cultivation Board) |
| **CCC** | ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (Ceylon Chamber of Commerce) |
| **CCF** | මධ්‍යම සංස්කෘතික අරමුදල (Central Cultural Fund) |
| **CCS** | දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය (Climate Change Secretariat) |
| **CDA** | පොල් සංවර්ධන අධිකාරිය (Coconut Development Authority) |
| **CDMA** | CDMA තාක්ෂණය (Code Division Multiple Access) |
| **CEA** | මධ්‍යම පරිසර අධිකාරිය (Central Environment Authority) |
| **CEB** | ලංකා විදුලිබල මණ්ඩලය (Ceylon Electricity Board) |
| **CIAs** | කර්මාන්ත සංවිධාන හා මණ්ඩලය (Chambers and Industry Associations) |
| **CIDA** | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (Construction Industry Development Authority) |
| **CMC** | කොළඹ මහනගර සභාව (Colombo Municipal Council) |
| **COP** | පාර්ශ්වකරුවන්ගේ සමුළුව (Conference of Parties) |
| **CPC** | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (Ceylon Petroleum Cooperation) |
| **CPSTL** | ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (Ceylon Petroleum Storage Terminals Limited) |
| **CRI** | පොල් පර්යේෂණ ආයතනය (Coconut Research Institute) |
| **CRIP** | දේශගුණ බලපෑම් අවමකිරීමේ ව්‍යාපෘතිය (Climate Resilience Improvement Project) |
| **CRIWMP** | දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (Climate Resilient Integrated Water Management Project) |
| **CRWSP** | දේශගුණයට ඔරොත්තු දෙන පානීය ජල ආරක්ෂිත සැලසුම (Climate Resilient Water Safety Plan) |
| **CSA** | දේශගුණ සුහුරු කෘෂිකර්මාන්තය (Climate Smart Agriculture) |
| **CSC** | ලංකා නැව් සංස්ථාව (Ceylon Shipping Corporation) |
| **CWC** | ලංකා කම්කරු කොංග්‍රස් (Ceylon Workers Congress) |
| **CZMP** | වෙරළ කලාප කළමනාකරණ සැලසුම (Coastal Zone Management Plan) |
| **D4S** | තිරසරභාවය සඳහා සැලසුම (Design for Sustainability) |
| **DAD** | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (Department of Agrarian Development) |
| **DAPH** | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (Department of Animal Production and Health) |
| **DArch** | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (Department of Archeology) |
| **DC** | දිසිදි පොල් (Desiccated Coconut) |
| **DCS** | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (Department of Census and Statistics) |
| **DEA** | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (Department of Export Agriculture) |

| | |
|---|---|
| **DEM** | ඩිජිටල් උන්නතාංශ ආකෘතිය (Digital Elevation Model) |
| **DFAR** | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (Department of Fisheries and Aquatic Resources) |
| **DMC** | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (Disaster Management Centre) |
| **DMT** | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (Department of Motor Traffic) |
| **DNBG** | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව (Department of National Botanic Gardens) |
| **DNCWS** | ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව (Department of National Community Water Supply) |
| **DNM** | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව (Department of National Museums) |
| **DNZG** | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව (Department of National Zoological Gardens) |
| **DoA** | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (Department of Agriculture) |
| **DoGI** | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (Department of Government Information) |
| **DoI&EC** | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව (Department of Imports and Exports Control) |
| **DPRD** | ආපදා සූදානම හා ප්‍රතිචාර අංශය (Disaster Preparedness and Response Division) |
| **DRR** | ආපදා අවදානම අඩුකිරීම (Disaster Risk Reduction) |
| **DS** | ප්‍රාදේශීය/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (Divisional/District Secretariat) |
| **DSM** | ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය (Demand Side Management) |
| **DSS** | සමාජ සේවා දෙපාර්තමේන්තුව (Department of Social Services) |
| **DWC** | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (Department of Wildlife Conservation) |
| **EAFM** | ධීවර කළමනාකරණය සඳහා පරිසර පද්ධති ප්‍රවේශය (Ecosystem Approach to Fisheries Management) |
| **EDB** | අපනයන සංවර්ධන මණ්ඩලය (Export Development Board) |
| **EE** | බලශක්ති කාර්යක්ෂමතාවය (Energy Efficiency) |
| **EEI&C** | බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හා සංරක්ෂණය (Energy Efficiency Improvement & Conservation) |
| **EFC** | ලංකා සේව්‍ය සම්මේලනය (Employers' Federation of Ceylon) |
| **EPL** | පරිසර ආරක්ෂණ බලපත්‍රය (Environment Protection License) |
| **EPZs** | අපනයන සැකසුම් කලාප (Export Processing Zones) |
| **ERD** | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (Department of External Resources) |
| **ESA** | පාරිසරික සංවේදී ප්‍රදේශ (Environmental Sensitive area) |
| **ESCO** | බලශක්ති සේවා සමාගම් (Energy Service Company) |
| **ESCAMP** | පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමණාකරණ ව්‍යාපෘතිය (Ecosystem Conservation & Management Project) |
| **EVs** | විදුලි වාහන (Electric Vehicles) |
| **FAO** | ආහාර හා කෘෂිකර්ම සංවිධානය (Food and Agriculture Organisation) |
| **FCRDI** | ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (Field Crops Research and Development Institute) |
| **FD** | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (Forest Department) |
| **FHB** | පවුල් සෞඛ්‍ය කාර්යාංශය (Family Health Bureau) |
| **FMD** | කුර සහ මුඛ රෝගය (Foot & Mouth Disease) |
| **FMRC** | ගොවිපොළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය (Farm Mechanization Research Centre) |
| **FOs** | ගොවි සංවිධාන (Farmer Organizations) |
| **FRDI** | පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය (Fruit Research & Development Institute) |
| **FSMP** | වන ක්ෂේත්‍ර මහ සැලසුම (Forestry Sector Master Plan) |
| **GAP** | යහපත් කෘෂිකර්ම පිළිවෙත් (Good Agriculture Practices) |
| **GBCSL** | ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය (Green Building Council of Sri Lanka) |
| **GCF** | හරිත දේශගුණ අරමුදල (Green Climate Fund) |
| **GHG** | හරිතාගාර වායු (Greenhouse Gas) |
| **GoSL** | ශ්‍රී ලංකා රජය (Government of Sri Lanka) |
| **GPP** | හරිත රාජ්‍ය ප්‍රසම්පාදන (Green Public Procurement) |
| **GPPP** | හරිත රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය (Green Public Procurement Policy) |



| | |
|---|---|
| **GSMB** | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (Geological Survey and Mines Bureau) |
| **GSTC** | ජගත් තිරසර සංචාරක සභාව (Global Sustainable Tourism Council) |
| **HARTI** | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (Hector Kobbekaduwa Agrarian Research and Training Institute) |
| **HBASL** | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (Hadabima Authority of Sri Lanka) |
| **HEM** | අධි කාර්යක්ෂම මෝටර (High Efficiency Motors) |
| **HHAP** | තාප-සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුම (Heat-Health Action Plan) |
| **HORDI** | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (Horticulture Research and Development Institute) |
| **HPB** | සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය (Health Promotion Bureau) |
| **ICE** | අධ්‍යන්තර දහන එන්ජිම (Internal Combustion Engine) |
| **IAS** | ආක්‍රමණික ආගන්තුක ජීවී විශේෂ (Invasive Alien Species) |
| **ICT** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (Information and Communication Technology) |
| **ICTA** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (Information and Communication Technology Agency) |
| **ID** | වාරිමාර්ග දෙපාර්තමේන්තුව (Department of Irrigation) |
| **IDB** | කාර්මික සංවර්ධන මණ්ඩලය (Industrial Development Board) |
| **IESL** | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (Institution of Engineers, Sri Lanka) |
| **ILO** | ජාත්‍යන්තර කම්කරු සංවිධානය (International Labour Organization) |
| **IMD** | වාරිමාර්ග කළමනාකරණ අංශය (Irrigation Management Division) |
| **INGO** | ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (International Non -Governmental Organisation) |
| **INM** | ඒකාබද්ධ පෝෂක කළමනාකරණය (Integrated Nutrient Management) |
| **IPCC** | දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්රාජ්‍ය මණ්ඩලය (Intergovernmental Panel on Climate Change) |
| **IPM** | ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය (Integrated Pest Management) |
| **IPNS** | ඒකාබද්ධ ශාක පෝෂක පද්ධතිය (Integrated Plant Nutrient System) |
| **IPs** | කර්මාන්ත උද්‍යාන (Industrial Parks) |
| **IRBM** | ඒකාබද්ධ ගංගා ද්‍රෝණි කළමනාකරණය (Integrated River Basin Management) |
| **IRCSL** | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (Insurance Regulatory Commission of Sri Lanka) |
| **IRD** | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (Inland Revenue Department) |
| **ISB** | කර්මාන්ත සේවා කාර්යාංශය (Industrial Services Bureau) |
| **IT** | තොරතුරු තාක්ෂණය (Information Technology) |
| **ITI** | කාර්මික තාක්ෂණ ආයතනය (Industrial Technological Institute) |
| **IUCN** | සොබාදහම සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමය (International Union for Conservation of Nature) |
| **IWMI** | අන්තර්ජාතික ජල කළමනාකරණ ආයතනය (International Water Management Institute) |
| **IWRM** | ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය (Integrated Water Resource Management) |
| **KPIs** | මූලික කාර්යසාධන දර්ශක (Key Performance Indicators) |
| **L&D** | අලාභ සහ හානි (Loss and Damage) |
| **LAs** | පළාත් පාලන ආයතන (Local Authorities) |
| **LCA** | ජීවන චක්‍ර ඇගැයීම (Life Cycle Assessment) |
| **LECO** | ලංකා විදුලි සමාගම (Lanka Electricity Company) |
| **LHL** | ලංකා ජලහසුරු ආයතනය (Lanka Hydraulic Institute) |
| **LINDEL** | ලංකා ඉන්ඩස්ට්‍රියල් එස්ටේට් ලිමිටඩ් (Lanka Industrial Estates Limited) |
| **LRC** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම (Land Reforms Corporation) |
| **LRT** | සැහැල්ලු දුම්රිය (Light Rail Transit) |
| **LRWHF** | ලංකා වැසි ජලය රැස්කරන්නන්ගේ සංසදය (Lanka Rain Water Harvesting Forum) |
| **LTGEP** | දිගු කාලීන විදුලි ජනන ව්‍යාප්ති සැලසුම (Long Term Generation Expansion Plan) |
| **LUPPD** | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව (Land Use Policy Planning Department) |
| **M&E** | අධීක්ෂණය හා ඇගැයීම (Monitoring and Evaluation) |
| **MASL** | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (Mahaweli Authority of Sri Lanka) |

| | |
|---|---|
| **MCs** | මහ නගර සභා (Municipal Councils) |
| **MD** | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology) |
| **MDGs** | සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (Millennium Development Goal) |
| **MEPA** | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (Marine Environment Protection Agency) |
| **MoA** | කෘෂිකර්ම අමාත්‍යාංශය (Ministry of Agriculture) |
| **MoD** | ආරක්ෂක අමාත්‍යාංශය (Ministry of Defense) |
| **MoDM** | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය (Ministry of Disaster Management) |
| **MoE** | පරිසර අමාත්‍යාංශය (Ministry of Environment) |
| **MoEd** | අධ්‍යාපන අමාත්‍යාංශය (Ministry of Education) |
| **MoF** | මුදල් අමාත්‍යාංශය (Ministry of Finance) |
| **MoFish** | ධීවර අමාත්‍යාංශය (Ministry of Fisheries) |
| **MoH** | සෞඛ්‍ය අමාත්‍යාංශය (Ministry of Health) |
| **MoI** | කර්මාන්ත අමාත්‍යාංශය (Ministry of Industries) |
| **MoIrri** | වාරිමාර්ග අමාත්‍යාංශය (Ministry of Irrigation) |
| **MoP&E** | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (Ministry of Power & Energy) |
| **MoPlant** | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (Ministry of Plantation) |
| **MoRR&HRA** | නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය (Ministry of Rehabilitation, Resettlement & Hindu Religious Affairs) |
| **MoSD&VT** | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය (Ministry of Skills Development and Vocational Training) |
| **DoSS** | සමාජ සේවා දෙපාර්තමේන්තුව (Department of Social Services) |
| **MoSTR** | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය (Ministry of Science Technology and Research) |
| **MoT** | ප්‍රවාහන අමාත්‍යාංශය (Ministry of Transport) |
| **MoTrad** | වෙළෙඳ අමාත්‍යාංශය (Ministry of Trade) |
| **MoUD&H** | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (Ministry of Urban Development and Housing) |
| **MoWL&FC** | වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය (Ministry of Wildlife and Forest Conservation) |
| **MoWS** | ජල සම්පාදන අමාත්‍යාංශය (Ministry of Water Supply) |
| **MoWCSD** | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සංවර්ධන අමාත්‍යාංශය (Ministry of Women, Child Affairs and Social Development) |
| **MRI** | වෛද්‍ය පර්යේෂණ ආයතනය (Medical Research Institute) |
| **MRV** | මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (Measurement Reporting and Verification) |
| **MSMEs** | ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යවසායකයින් (Micro, Small and Medium Enterprises) |
| **MSS** | වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය (Merchant Shipping Secretariat) |
| **MSW** | නාගරික ඝන අපද්‍රව්‍ය (Municipal Solid Waste) |
| **NAICC** | ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (National Agriculture Information and Communication Centre) |
| **NAQDA** | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (National Aquaculture Development Authority) |
| **NaPID** | කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය (National Policy for Industrial Development) |
| **NARA** | ජාතික ජලජීවී සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (National Aquatic Resources Research and Development Agency) |
| **NBD** | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (Dept of National Budget) |
| **NBSAP** | ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම (National Biodiversity Strategic Action Plan) |
| **NCD** | බෝ නොවන රෝග (Non Communicable Disease) |
| **NCPC** | ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (National Cleaner Production Centre) |
| **NCPI** | ජාතික පාරිභෝගික මිල දර්ශකය (National Consumer Price Index) |
| **NCRE** | සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (Non Conventional Renewable Energy) |
| **NDCs** | ජාතිකව නිර්ණය කළ දායකත්ව (Nationally Determined Contributions) |
| **NDRSC** | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (National Disaster Relief Support Centre) |
| **NEAP** | ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලසුම (National Environmental Action Plan) |
| **NECCC** | දේශගුණ විපර්යාස පිළිබඳව ජාතික විශේෂඥ කමිටුව (National Expert Committee on Climate Change) |
| **NEDA** | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (National Enterprise Development Authority) |
| **NEEA** | ජාතික බලශක්ති කාර්යක්ෂමතා ත්‍යාගය (National Energy Efficiency Award) |
| **NERDC** | ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (National Engineering Research and Development Centre) |
| **NGO** | රාජ්‍ය නොවන සංවිධාන (Non Governmental Organisation) |
| **NGRS** | ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය (National Green Reporting System) |
| **NH** | ජාතික ශාකාගාරය (National Herbarium) |
| **NHDA** | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (National Housing Development Authority) |
| **NHSPEC** | සෞඛ්‍ය, පරිසරය හා දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික උපායමාර්ගික සැලසුම (National Strategic Plan for Health, Environment and Climate Change) |
| **NIPHM** | පසුඅස්වනු කළමනාකරණ ජාතික ආයතනය (National Institute of Post-Harvest Management) |
| **NLDB** | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (National Livestock Development Board) |
| **NOU** | ජාතික ඕසෝන් ඒකකය (National Ozone Unit) |
| **NPD** | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (Department of National Planning) |
| **NPP** | ජාතික භෞතික සැලසුම (National Physical Plan) |
| **NPPD** | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (Department of National Physical Planning) |
| **NRC** | ජාතික පර්යේෂණ සභාව (National Research Council) |
| **NRE** | නව පුනර්ජනනීය බලශක්තිය (New Renewable Energy) |
| **NRMC** | ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (Natural Resource Management Centre) |
| **NRW** | ආදායම් නොවන ජලය (Non-revenue Water) |
| **NSC** | ජාතික මෙහෙයුම් කමිටුව (National Steering Committee) |
| **NSF** | ජාතික විද්‍යා පදනම (National Science Foundation) |
| **NSWMSC** | ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහාය මධ්‍යස්ථානය (National Solid waste Management Support Center) |
| **NTC** | ජාතික ගමනාගමන කොමිෂන් සභාව (National Transport Commission) |
| **NWPEA** | පළාත් පරිසර අධිකාරිය (වයඹ) (North Western Province Environmental Authority) |
| **NWSDB** | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (National Water Supply and Drainage Board) |
| **O&M** | මෙහෙයුම් හා නඩත්තු (Operation and Maintenance) |
| **PAEA** | ආරක්ෂිත කෘෂිකර්ම ව්‍යාපාරිකයින්ගේ සංගමය (Protected Agriculture Entrepreneurs Association) |
| **PAs** | ආරක්ෂිත ප්‍රදේශ (Protected Areas) |
| **PC** | පළාත් සභා (Provincial Council) |
| **PDAPH** | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (Provincial Department of Animal Production and Health) |
| **PDHS** | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (Provincial Director of Health Services) |
| **PDNA** | පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව (Post Disaster Needs Assessment) |
| **PDoAs** | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (Provincial Department of Agriculture) |
| **PGRC** | පළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය (Plant Genetic Resources Centre) |
| **PHDT** | වැවිලි මානව සංවර්ධන භාරය (Plantation Human Development Trust) |
| **PHS** | පෞද්ගලික සෞඛ්‍ය සේවා (Private Health Services) |
| **PID** | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (Provincial Irrigation Department) |
| **PMC** | සැලසුම් හා අධීක්ෂණ කමිටුව (Planning and Monitoring Committee) |
| **PMoA** | පළාත් කෘෂකර්ම අමාත්‍යාංශය (Provincial Ministry of Agriculture) |
| **PMoH** | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය (Provincial Ministry of Health) |
| **PPP** | රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (Public-Private Partnership) |
| **PRDA** | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (Provincial Road Development Authority) |
| **PRPTAs** | පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (Provincial Road Passenger Transport Authorities) |

| | |
|---|---|
| **PUCSL** | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (Public Utility Commission of Sri Lanka) |
| **PV** | ප්‍රකාශ වෝල්ටීය (Photo -voltaic) |
| **RDA** | මාර්ග සංවර්ධන අධිකාරිය (Road Development Authority) |
| **RDHS** | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (Regional Director of Health Services) |
| **RE** | පුනර්ජනනීය බලශක්තිය (Renewable Energy) |
| **RECP** | සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදනය (Resource Efficient Cleaner Production) |
| **RISC** | දිස්ත්‍රික් කර්මාන්ත සේවා කමිටුව (Regional Industry Service Committee) |
| **RMPs** | අවදානම කළමනාකරණ සැලසුම් (Risk Management Plans) |
| **RPCs** | ප්‍රාදේශීය වැවිලි සමාගම් (Regional Plantation Companies) |
| **RRDI** | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය (Rice Research and Development Institute) |
| **RRI** | රබර් පර්යේෂණ ආයතනය (Rubber Research Institute) |
| **RWH** | වැසි ජලය රැස්කිරීම (Rain Water Harvesting) |
| **RWHS** | වැසි ජලය රැස්කිරීමේ පද්ධතිය (Rain Water Harvesting System) |
| **RWSSs** | ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (Rural Water Supply Schemes) |
| **SCP** | තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය (Sustainable Consumption and Production) |
| **SD** | මිනින්දෝරු දෙපාර්තමේන්තුව (Survey Department) |
| **SD&CC** | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (State Development and Construction Corporation) |
| **SDGs** | සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (Sustainable Development Goals) |
| **SEPC** | සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථාන (Socio Economics and Planning Centre) |
| **SLAITO** | දේශීය සංචාරක මෙහෙයුම්කරුවන්ගේ සංවිධානය (Sri Lanka Association of Inbound Tour Operators) |
| **SLC** | ශ්‍රී ලංකා රේගුව (Sri Lanka Customs) |
| **SLCF** | ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (Sri Lanka Climate Fund) |
| **SLCG** | ශ්‍රී ලංකා වෙරළාරක්ෂක සේවය (Sri Lanka Coast Guard) |
| **SLEB** | ශ්‍රී ලංකා බලශක්ති තුලිතය (Sri Lanka Energy Balance) |
| **SLECIC** | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (Sri Lanka Export Credit Insurance) |
| **SLEMA** | ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (Sri Lanka Energy Managers Association) |
| **SLGAP** | ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (Sri Lanka Good Agriculture Practices) |
| **SLIA** | ශ්‍රී ලංකා වාස්තුවිද්‍යාඥයින්ගේ ආයතනය (Sri Lanka Institute of Architects) |
| **SLIE** | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (Sri Lanka Institute of Engineers) |
| **SLINTGL** | ශ්‍රී ලංකා ජාතික සංචාරක මාර්ගෝපදේශක කථිකාචාර්ය ආයතනය (Sri Lanka Institute of National Tourist Guide Lecturers) |
| **SLIP** | ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය (Sri Lanka Institute of Packaging) |
| **SLMA** | ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (Sri Lanka Medical Association) |
| **SLN** | ශ්‍රී ලංකා නාවික හමුදාව (Sri Lanka Navy) |
| **SLLDC** | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (Sri Lanka Land Development Corporation) |
| **SLP** | ශ්‍රී ලංකා පොලීසිය (Sri Lanka Police) |
| **SLPA** | ශ්‍රී ලංකා වරාය අධිකාරිය (Sri Lanka Ports Authority) |
| **SLR** | ශ්‍රී ලංකා දුම්රිය සේවය (Sri Lanka Railway) |
| **SLSDC** | ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව (Sri Lanka Sustainable Development Council) |
| **SLSEA** | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (Sri Lanka Sustainable Energy Authority) |
| **SLSI** | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (Sri Lanka Standards Institution) |
| **SLT** | ශ්‍රී ලංකා ටෙලිකොම් (Sri Lanka Telecom) |
| **SLTB** | ශ්‍රී ලංකා තේ මණ්ඩලය (Sri Lanka Tea Board) |
| **SLTDA** | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (Sri Lanka Tourism Development Authority) |
| **SLTrB** | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (Sri Lanka Transport Board) |
| **SLVET** | ශ්‍රී ලංකා වාහන දුම් පරීක්ෂාව (Sri Lanka Vehicle Emission Testing) |
| **SMART** | විශේෂිත, මැනියහැකි, අත්පත්කරගතහැකි, අදාළ හා කාලනිශ්චිත (Specific, Measurable, Achievable, Relevant, and Time-bound) |
| **SME** | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (Small and Medium Enterprises) |
| **SMIs** | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (Small and Medium Industries) |
| **STEM** | විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු හා ගණිත (Science, Technology, Engineering,and Mathematics) |
| **STC** | රාජ්‍ය දැව සංස්ථාව (State Timber Corporation) |
| **STrC** | රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව (State Trading Corporation) |
| **THASL** | ශ්‍රී ලංකා හෝටල් සංගමය (The Hotels Association of Sri Lanka) |
| **TMR** | මිශ්‍ර පරිපූරක ආහාර (Total Mixed Ration) |
| **TOU** | කාල පාදක සැපයුම (Time-of-Use) |
| **ToT** | පුහුණුකරුවන් පුහුණුකිරීම (Training of Trainers) |
| **TR** | ශීතකාරක ටොන් (Tons of Refrigerent) |
| **TRC** | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (Telecommunications Regulatory Commission) |
| **TRI** | තේ පර්යේෂණ ආයතනය (Tea Research Institute) |
| **TROF** | වනාන්තරයෙන් පිටත ඇති වෘක්ෂ (Trees Outside Forests) |
| **TSHDA** | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (Tea Small Holdings Development  Authority) |
| **UCs** | නගර සභා (Urban Councils) |
| **UDA** | නාගරික සංවර්ධන අධිකාරිය (Urban Development Authority) |
| **UGC** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (University Grants Commission) |
| **UN** | එක්සත් ජාතීන් (United Nations) |
| **UNDP-SGP** | එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය-සුළු මූල්‍යාධාර වැඩසටහන (United Nations Development Project – Small Grants Programme) |
| **UNFCCC** | එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (United Nations Framework Convention on Climate Change) |
| **UNICEF** | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (United Nations Children’ Fund) |
| **UNIDO** | එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (United Nations Industrial Development Organization) |
| **UoSJP** | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (University of Sri Jayewardenepura) |
| **UoM** | මොරටුව විශ්වවිද්‍යාලය (University of Moratuwa) |
| **UoP** | පේරාදෙණිය විශ්වවිද්‍යාලය (University of Peradeniya) |
| **USDA** | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය (Urban Settlement Development Authority) |
| **VFD** | විචල්‍ය සංඛ්‍යාත ධාවක (Variable Frequency Drives) |
| **VIC** | පශු වෛද්‍ය තොරතුරු මධ්‍යස්ථානය (Veterinary Information Centre) |
| **VOC** | වාෂ්පශීලී කාබනික සංයෝග (Volatile Organic Compound) |
| **VMS** | වාහන අධීක්ෂණ පද්ධතිය (Vessel Monitoring System) |
| **VRI** | පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය (Veterinary Research Institute) |
| **VTA** | වෘත්තීය පුහුණු අධිකාරිය (Vocational Training Authority) |
| **WFH** | නිවසේ සිට වැඩකරන (Work-From-Home) |
| **WIM** | වෝර්සෝ අන්තර්ජාතික යාන්ත්‍රණය (Warsaw International Mechanism) |
| **WIMS** | කාලගුණ තොරතුරු කළමනාකරණ පද්ධතිය (Weather Information Management System) |
| **WM** | අපද්‍රව්‍ය කළමනාකරණය (Waste Management) |
| **WMA-WP** | බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (Waste Management Authority (Western Province) |
| **WRB** | ජල සම්පත් මණ්ඩලය (Water Resources Board) |
| **WSP** | ජල ආරක්ෂිත සැලසුම (Water Safety Plan) |
| **WSSs** | ජල සම්පාදන පද්ධති (Water Supply Schemes) |
| **YEDD** | තරුණ, වැඩිහිටි, අවතැන් හා ආබාධිත (Youth, Elderly, Displaced and Disabled) |

# පටුන


කෙටි යෙදුම් ..... v

විධායක සාරාංශය ..... 1

1 ජාතිකව නිර්ණය කළ දායකත්ව පිළිබඳ පසුබිම හා දළ විශ්ලේෂණය ..... 3

- 1.1 ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කළ දායකත්ව අංශ ..... 5
- 1.2 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය ..... 6
- 1.3 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නෛතික හා ප්‍රතිපත්තිමය පදනම ..... 8
- 1.4 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමට බලපාන පරිවේෂණීය බලපෑම් ..... 8
- 1.5 ඉදිරි ගමන්ම ..... 9

2 ක්‍රමවේදය ..... 10

- 2.1 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක සැලසුම සකස් කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය ..... 10
- 2.2 දත්ත මූලාශ්‍ර හා/ හෝ පදනම් කරගත් තත්ත්ව ..... 12

3 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම - හරිතාගාර වායු විමෝචන අවමකිරීම ..... 13

- 3.1 දළ විශ්ලේෂණය ..... 13
- 3.2 විදුලිබල අංශය ..... 16
- 3.3 ප්‍රවාහන අංශය ..... 35
- 3.4 කර්මාන්ත අංශය ..... 77
- 3.5 අපද්‍රව්‍ය අංශය ..... 101
- 3.6 වනාන්තර අංශය ..... 133
- 3.7 කෘෂිකර්ම අංශය ..... 153

4 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම - අනුහුරුවීම ..... 179

- 4.1 දළ විශ්ලේෂණය ..... 179
- 4.2 කෘෂිකර්ම අංශය ..... 181
- 4.3 ධීවර අංශය ..... 199
- 4.4 පශුසම්පත් අංශය ..... 223
- 4.5 ජල අංශය ..... 237
- 4.6 ජෛව විවිධත්ව අංශය ..... 285
- 4.7 වෙරළබඩ හා සමුද්‍ර අංශය ..... 307
- 4.8 සෞඛ්‍ය අංශය ..... 319
- 4.9 නාගරික සැලසුම්කරණ හා මානව ජනාවාස අංශය ..... 337
- 4.10 සංචාරක හා විනෝදාස්වාද අංශය ..... 357

5 NDC ක්‍රියාත්මක කිරීම - අලාභ සහ හානි ..... 369

- 5.1 දළ විශ්ලේෂණය ..... 369

6 ක්‍රියාත්මක කිරීමේ මාර්ග ..... 387

- 6.1 දළ විශ්ලේෂණය ..... 387
- 6.2 තාක්ෂණය පැවරීම හා ධාරිතා වර්ධන අවශ්‍යතා ..... 387
- 6.3 පිරිවැය ගැටලු හා අවශ්‍ය බාහිර මූල්‍ය සහාය ..... 390
- 6.4 NDC-SDG අනුබද්ධතාව තක්සේරුව ..... 394
- 6.5 ස්ත්‍රී පුරුෂ භාවය ඒකාබද්ධ කිරීම හා සමාජ අන්තර්ගතභාවය ..... 399
- 6.6 ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ ..... 405

7 උපලේඛනය ..... 407

## වගු ලැයිස්තුව

1-1 වගුව ශ්‍රී ලංකාවේ අවමකිරීමේ හා අනුහුරුවීමේ අංශ....5
2-1 වගුව අනුගමනය කරන ලද ක්‍රියාකාරකම්....11
3-1 වගුව අවමකිරීමේ අංශවලින් හරිතාගාර වායු විමෝචන අඩුකිරීමට පොරොන්දු වී ඇති ප්‍රමාණ....15
3-2 වගුව විදුලිබල (බලශක්ති) අංශයේ NDC.... 18
3-3 වගුව ප්‍රවාහන අංශයේ NDC....37
3-4 වගුව කර්මාන්ත අංශයේ NDC....78
3-5 වගුව අපද්‍රව්‍ය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව....103
3-6 වගුව වනාන්තර අංශයේ NDC....134
3-7 වගුව කෘෂිකර්ම අංශයේ NDC....154
4-1 වගුව කෘෂිකර්ම අංශයේ අනුහුරුවීමේ NDC....183
4-2 වගුව ධීවර අංශයේ NDC....201
4-3 වගුව කුකුළන්, කිරි හා බිත්තර නිෂ්පාදනය....224
4-4 වගුව පශුසම්පත් අංශයේ NDC....225
4-5 වගුව ජල අංශයේ NDC....238
4-6 වගුව ජෛව විවිධත්ව අංශයේ NDC....286
4-7 වගුව වෙරළබඩ හා සමුද්‍රීය අංශයේ NDC....308
4-8 වගුව සෞඛ්‍ය අංශයේ NDC....321
4-9 වගුව නාගරික සැලසුම්කරණය හා මානව ජනාවාස අංශයේ NDC....338
4-10 වගුව සංචාරක හා විනෝදාස්වාද අංශයේ NDC....358
5-1 වගුව අලාභ සහ හානි අංශයේ NDC....371
6-1 වගුව අවමකිරීමේ හා අනුහුරුවීමේ අංශවල කඩිනම් ධාරිතා ගොඩනැගීමේ අවශ්‍යතා....389
6-2 වගුව අවමකිරීමේ අංශයේ NDC සූචක පිරිවැය සාරාංශය....391
6-3 වගුව සූචක පිරිවැය ඇස්තමේන්තුව බෙදාදැක්වීම....391
6-4 වගුව මූල්‍ය සම්පත් සචලනය කිරීම සඳහා උපායමාර්ගික දිශානතිය....393
6-5 වගුව NDC හා SDG අතර ඇති බහුවිධ සම්බන්ධතා....396
6-6 වගුව එක් එක් SDG යටතේ ඇති සම්බන්ධතා....397



## රූපසටහන් ලැයිස්තුව

1-1 රූපය දේශගුණ ප්‍රතිචාර සඳහා ආයතනික ව්‍යුහය....6
2-1 රූපය ක්‍රමවේදයේ ක්‍රමානුරූප සටහන....10
3-1 රූපය 2020 හා 2021 ජනන ප්‍රභවය අනුව කොටස....16
3-2 රූපය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය හා විදුලිබල අලෙවිය....17
3-3 රූපය විදුලිබල අංශයේ හරිතාගාර වායු විමෝචන ප්‍රක්ෂිප්ත හා විමෝචන අඩුකිරීමේ ඉලක්ක....19
3 4 රූපය ප්‍රවාහන අංශයේ හරිතාගාර වායු විමෝචන ප්‍රක්ෂේපණ හා විමෝචන අඩුකිරීමේ ඉලක්ක....37
3-5 රූපය කර්මාන්ත අංශයේ හරිතාගාර වායු විමෝචන ප්‍රක්ෂේපණ හා අඩුකිරීමේ ඉලක්ක....78
3-6 රූපය අපද්‍රව්‍ය අංශයේ හරිතාගාර වායු ප්‍රක්ෂේපණ හා අඩුකිරීමේ ඉලක්ක....104
3-7 රූපය වනාන්තර අංශයේ කාබන් තිරකිරීමේ ධාරිතාව පිළිබඳ ප්‍රක්ෂේපණ.... 135
3-8 රූපය 2009 සිට 2021 දක්වා කෘෂිකර්ම අංශයේ අපනන ආදායම....153
3-9 රූපට කෘෂිකර්ම අංශයේ හරිතාගාර වායු විමෝචන ප්‍රක්ෂේපණ හා විමෝචන අවමකිරීමේ ඉලක්ක....155
4-1 රූපය 1980 හා 2000 අතර ප්‍රධාන ස්වාභාවික ආපදාවලින් පීඩාවට පත් වූ පුද්ගලයින් ගණන....179
4-2 රූපය කාලයත් සමග කෘෂිකර්ම අංශයේ රැකියා නියුක්තිය ශ්‍රී ලංකාවේ හා ලෝකයේ සාමාන්‍යයේ වෙනස් වී ඇති ආකාරය....181
4-3 රූපය ජාතික ධීවර නිෂ්පාදනය....199
4 4 රූපය පශුසම්පත් සංඛ්‍යා (කුකුළන් හැර)....223
4-5 රූපය ජනගහනයෙන් දහසකට සෞඛ්‍ය ශ්‍රම බලකායේ අනුපාතය....319
4-6 රූපය (a) සෞඛ්‍ය වියදමේ ප්‍රභව (b) ඒක පුද්ගල සෞඛ්‍ය වියදම....320
4-7 රූපය සංචාරක අංශයේ විදේශ විනිමය උත්පාදනය....357
5-1 රූපය සවිස්තර ආපදා හා දේශගුණ ආපදා කළමනාකරණය....371
6-1 රූපය NDC-SDG අන්තර් සම්බන්ධකතා සිතියම්ගත කිරීමේ ප්‍රධාන පියවර....395
6-2 රූපය අවමකිරීමේ අංශ NDC හා SDG අතර සම්බන්ධතා.... 398
6-3 රූපය අනුහුරුවීමේ අංශ NDC හා SDG අතර සම්බන්ධතා.... 398
6-4 රූපය අලාභ සහ හානි අංශයේ NDC හා SDG අතර සම්බන්ධතා....399

# විධායක සාරාංශය

අඩු විමෝචනයක් නිකුත් කරන රටක් වන ශ්‍රී ලංකාව, ඉහළ මට්ටමක මානව සංවර්ධනයක් ඇති රටක් මෙන්ම ගෝලීය උණුසුම් වීමේ ඉලක්ක සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය කරන දීර්ඝකාලීන විමෝචන ප්‍රමාණයට වඩා සැලකිය යුතු තරම් අඩු විමෝචන ප්‍රමාණයක් පවත්වාගත් රටක් සඳහා සුවිශේෂී උදාහරණයකි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බලශක්ති පරිභෝජනය හා සම්බන්ධ ආර්ථික කටයුතු වර්ධනය වෙමින් පවතී. රටේ විමෝචන වර්ධනය වීමේ නැඹුරුවක් තිබේ. ආර්ථිකයට, පරිසරයට (පරිසර පද්ධති සේවා ඇතුළත්ව) හා ජනතාවට නිශේධනීය ලෙස බලපෑ හැකි දේශගුණ විපර්යාස නිසා ඇති විය හැකි ආකාරයේ ආපදාවලට ලක්විය හැකි රටවල් අතර ඉහළ තැනක ශ්‍රී ලංකාව සිටී. පසුගිය දශක කිහිපයක කාලය ඇතුළත රටේ ආර්ථිකය හා ජීවන ක්‍රමයට ස්වාභාවික ආපදාවලින් දැඩි බලපෑමක් ඇති වී තිබේ.

දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමට අත්සන් කළ පාර්ශ්වයක් ලෙස, ශ්‍රී ලංකාව සිය යාවත්කාලීන කළ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDC) 2021 වර්ෂයේ දී ලබා දී ඇත. මෙමගින්, දේශගුණ ක්‍රියාකාරී ප්‍රයත්න සඳහා දායක වන අතර, රටේ ආර්ථික, මානව, හා සමාජයීය වර්ධනය වඩාත් තිරසර ආකාරයෙන් ලබාගන්නා මාර්ගය පෙන්වා දී තිබේ. මෙම යාවත්කාලීන කළ NDC වලට හරිතාගාර වායු විමෝචන අවමකිරීමේ අංශ හයක් (විදුලිබලය, ප්‍රවාහනය, කර්මාන්ත, අපද්‍රව්‍ය, වනාන්තර හා කෘෂිකර්මය) හා දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ අංශ නවයක් (කෘෂිකර්මය, ධීවර, පශුසම්පත්, ජලය, ජෛව විවිධත්වය, වෙරළබඩ හා සමුද්‍ර, සෞඛ්‍ය, නාගරික සැලසුම් හා මානව ජනාවාස හා සංචාරක හා විනෝදාස්වාද) සහ අලාභ සහ හානි (L&D) ඇතුළත් වේ. මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති, NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුමේ අරමුණ වන්නේ මෙම යාවත්කාලීන කළ NDC ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමය.

යාවත්කාලීන කළ 2021 වර්ෂයේ NDC සන්නිවේදනයේ දැක්වෙන ආකාරයට සමාජ අන්තර්ගතකරණය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීම NDC ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් අංගයකි[1]. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා හා ගතිකත්වය නිසා ඉඩම්, ණය, තාක්ෂණය, තොරතුරු, බලශක්තිය, ජලය මෙන්ම සමාජ ආරක්ෂණය හා රැකියා නියුක්තිය වැනි නිෂ්පාදන සම්පත්වලට කාන්තාවන්ට ඇති අයිතිය හා ප්‍රවේශය සීමා වේ. පාලන ඒකකවල සහ තීරණ ගන්නා තනතුරුවල කාන්තාවන්ගේ නියෝජනය සාපේක්ෂව අඩුය.

දේශගුණ තත්ත්වවල ඇතිවන වෙනස්කම්වලට හැඩගැසීමේ දී කාන්තාවන් හා ගැහැණු ළමුන්ට ඇති හැකියාව අඩුය. ඔවුන් ආපදා බලපෑමෙන් ඇතිවන අවදානමට වැඩි වශයෙන් නිරාවරණය වීමට ඉඩ ඇති අතර, ඔවුන්ගේ ජීවනෝපාය ආශ්‍රිත අලාභවලට ද ලක්වේ. දේශගුණ ක්‍රියාමාර්ග හරහා පිරිමින් හා කාන්තාවන් අතර දැනට පවත්නා වෙනස්කම් අඩු කිරීම සඳහා පිරිමින් හා කාන්තාවන්ගේ උපරිම හැකියාව ලබාගැනීම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීම හොඳ නිර්ණායකයකි. NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම මගින් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ප්‍රතිචාර දැක්වීම ඉහළ නැංවීම සඳහා අංශ හතරකට ඒකාබද්ධ ක්‍රියාමාර්ග ඇතුළත් කර ඇත. ඒ, විදුලිබලය, ධීවර, පශුසම්පත් හා ජලය යන අංශයි. මීට අමතරව ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ පොදු ක්‍රියාමාර්ග වෙනත් අංශවල ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී බව දියුණු කිරීම සඳහා නිර්දේශ කර ඇත. මේ අනුව, NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් මගින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාවය හා තිරසර සංවර්ධන කැපවීම් පිළිබඳව ඇති ජාතික ප්‍රතිපත්තිමය කැපවීම සඳහා සහායවීමට මාර්ගය සපයයි.

NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුමේ තවත් වැදගත් අංගයක් වන්නේ එක් එක් NDC යටතේ හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම් හා උප ක්‍රියාකාරකම්, ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතන මගින් වැඩිදුරටත් පැහැදිලි කරගත යුතු වීමයි. ඒ සඳහා ඒ ඒ ආයතනවල ආයතනික රාමුව හා ගැළපෙන ආකාරයෙන් විස්තීර්ණ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සිදුකරයි. මෙමගින්, දේශගුණ විපර්යාස බලපෑම්වලට ඔරොත්තුදීමේ හැකියාව ඉහළ නංවාගන්නා අතර, කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) තත්ත්වයට සාපේක්ෂව 14.5%ක ප්‍රමාණයකින් හරිතාගාර වායු විමෝචන අඩුකිරීම සඳහා වූ කැපවීම සාක්ෂාත් කරගැනීම අපේක්ෂිතය.

NDC හා සමගාමීව සංවර්ධන ඉලක්ක අත්පත්කරගනිමින් ජාතියට සහාය වීම සඳහා තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) ඒ හා සමග අනුගත කිරීමේ ප්‍රයත්නයක් ද දරා තිබේ. NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුමේ ඇති සියලු ක්‍රියාකාරකම් හා තිරසර සංවර්ධන අභිමතාර්ථ හා සමගාමී වන ලෙස ඍජු අන්තර් සම්බන්ධතා සලකා බැලීමෙනි.

1 Ministry of Environment, Updated Nationally Determined Contributions under the Paris Agreement on Climate Change, July 2021

NDC ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ඊට සහාය වන නෛතික හා ප්‍රතිපත්තිමය කරුණු පළමු පරිච්ඡේදයේ දක්වා ඇත. COVID-19 වසංගත තත්ත්වය හා වර්තමාන ආර්ථික අර්බුදය NDC ක්‍රියාත්මක කිරීමට නිශේධනීය ලෙස බලපා ඇති අතර, මේ බලපෑම් ද ඒ කොටසේ දී පරීක්ෂා කර ඇත්තේ ඒ සඳහා වූ විසඳුමක් ද සමගය. මීට අමතරව, NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම සකස් කිරීමේ දී යොදාගත් බහු-පාර්ශ්වකාර අන්තර්ගතික හා සහභාගීත්ව ප්‍රවේශය 2 වන පරිච්ඡේදයේ දැක්වේ.

හරිතාගාර වායු අවමකිරීමේ අංශ හයක් සඳහා වන NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම 3 වන පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇත්තේ ආංශික හැඳින්වීමක් ද සමගය. 4 වන පරිච්ඡේදයේ දැක්වෙන්නේ දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ අංශ නවයක් සඳහා වන NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුමයි. 6 වන පරිච්ඡේදයට ඇතුළත් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධානධාරගත කිරීම සඳහා වන නිර්දේශ හා සමාජ අන්තර්ගතභාවය ඇතුළත් ක්‍රියාත්මක කිරීමේ පියවරයි. යෝජිත NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී මූල්‍ය, තාක්ෂණය, හා මානව ප්‍රාග්ධනය වැනි අංශවල විවිධ බාධක ඇතිවිය හැකිය. අවසන් පරිච්ඡේදය වන 6 වන පරිච්ඡේදයේ දී මේ අභියෝග හඳුන්වා දී විස්තර කර තිබේ. තව ද, තිරසර සංවර්ධන අභිමතාර්ථ සමඟ පෙළගැස්වීමේ ප්‍රතිඵල මගින් NDC ගැළපෙන ආකාරය දක්වා ඇති අතර, එමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී බව ආමන්ත්‍රණය කරන ආකාරය පැහැදිලි කරයි. මේ පරිච්ඡේදයට අධීක්ෂණ යාන්ත්‍රණයක් පිළිබඳ කොටසක් ද ඇතුළත් වේ.

# 1. ජාතිකව නිර්ණය කළ දායකත්ව පිළිබඳ පසුබිම හා දළ විශ්ලේෂණය

2023 සඳහා INFORM අවදානම් දර්ශකය අනුව රටවල් 191ක් අතරින් 106 වැනි රට ලෙස අඩු අවදානමක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව ලයිස්තුගත කර ඇතත්[2] , දේශගුණ විපර්යාසයේ බලපෑම්වලට මෙරට දැඩි අවදානමක පවතී. COVID-19 වසංගත කාලය තුළ හා වර්තමාන ආර්ථික අර්බුදය නිසා යම් පසුබෑමකට ලක් වුවද, පසුගිය වර්ෂ විස්සක පමණ කාලය තුළ ආදායම වර්ධනය කිරීමේ හා දරිද්‍රතාවය අඩුකිරීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රගතියක් ශ්‍රී ලංකාව අත්පත් කරගෙන තිබේ. මේ වර්ධනයට සැලකිය යුතු තරම් දැඩි තර්ජනයක් දේශගුණ විපර්යාසවල බලපෑම් මගින් ඇති කර ඇත. වාණිජමය කෘෂිකර්මය, නිෂ්පාදන, සංචාරක කර්මාන්තය හා වෙනත් ප්‍රාථමික ආර්ථික ධාවක ආදිය ආන්තික කාලගුණ තත්ත්ව හා මුහුදු මට්ටම ඉහළ යෑම නිසා විශේෂයෙන් අවදානමට ලක්වේ. වනාන්තර විනාශය, පාංශු ඛාදනය හා ජෛව විවිධත්වය අහිමි වීම වැනි අංශ රටේ ආර්ථික නිෂ්පාදනයට තර්ජනයක් ඇති කරයි. බොහෝ කාලයක සිට ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා මානව සංවර්ධනය අඩු කාබන් ක්‍රමවේදයක් ඔස්සේ සිදු කරගෙන ගොස් තිබේ. ගෝලීය දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීම වර්ධනය කිරීම හා හරිතාගාර වායු විමෝචන අවමකිරීමේ ක්‍රියාකාරකම් මගින් දේශගුණ විපර්යාස අඩු මට්ටමක පවත්වාගැනීම සඳහා ද පියවර ගණනාවක් ගෙන තිබේ.

දේශගුණ විපර්යාසවල හානිකර බලපෑම් වැළැක්වීම සඳහා ගෝලීය වශයෙන් ගෙන ඇති සහයෝගී ක්‍රියාදාමය හා සමගාමී වන පියවර ගණනාවක් ශ්‍රී ලංකාව විසින් ගෙන තිබේ. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCC) පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක දී ගත් අංක 1/CP.19 හා 1/CP.20 දරන තීරණ අනුව ලබා දෙන ලද අපේක්ෂිත ජාතිකව නිර්ණය කළ දායකත්ව (INDCs) මෙවැනි මුල්ම මුලපිරීමක් වේ. එහි පළමු සංස්කරණය 2015 ඔක්තෝබර් මාසයේ දී ලබා දුන් අතර, 2016 අප්‍රේල් මාසයේ දී වඩා දියුණු කළ සංස්කරණයක් ලබාදී තිබේ. පසුව එම අපේක්ෂිත ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම සඳහා වූ 2017-2019 සූදානම් සැලසුම මත පදනම්ව අංශ 14ක් ආවරණය කරමින් ජාතිකව නිර්ණය කළ දායකත්ව (NDC) සකස් කර බාරදෙන ලද්දේ 2016 සැප්තැම්බර් මාසයේ දීය. වඩාත් අභිලාෂකාමී, ප්‍රමාණාත්මකව මැනිය හැකි හා අවමකිරීමේ විභවය (අංශ 6ක) හා අනුහුරුවීමේ උපායමාර්ග (අංශ 9ක) හා අලාභ සහ හානිවලින් සමන්විත මීළඟ දශකය (2021-2030) සඳහා සකස් කළ යාවත්කාලීන කළ ජාතිකව නිර්ණය කළ දායකත්ව ඉදිරිපත් කරන ලද්දේ 2021 වර්ෂයේ දීය. එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ නීති හා මාර්ගෝපදේශ මත පදනම්ව 2016-2025 දේශගුණ විපර්යාස බලපෑම්වලට අනුහුරුවීමේ ජාතික සැලසුම (NAP) සකස් කරන ලදි. මෙය වර්තමානයේ දී නැවත සංශෝධනය කරනු ලබන අතර, පළාත් අනුහුරුවීමේ සැලසුම් ද සකස් කරනු ලැබේ.

ගෝලීය මානවකෘත හරිතාගාර වායු විමෝචන අඛණ්ඩව වැඩි වෙමින් ඇති නිසා පැරිස් ගිවිසුමේ උෂ්ණත්ව ඉලක්ක වන උෂ්ණත්වය ඉහළ යෑම සෙල්සියස් අංශක 2 සීමාවේ හෝ හැකිනම් අංශක 1.5 සීමාවට සීමා කිරීමට උත්සාහ කිරීමේ ඉලක්ක තවදුරටත් අභියෝගාත්මක වී තිබේ[3]. මීට ප්‍රතිචාරයක් ලෙස පාර්ශ්වකරුවන්ගේ සමුළුවල මෑත දී පැවති සැසිවාරවල දී දේශගුණ ක්‍රියාමාර්ග පිළිබඳව වැදගත්වන තීරණ කීපයක් ගෙන තිබේ. 2021 නොවැම්බර් මාසයේ දී එක්සත් රාජධානියේ ග්ලාස්ගෝහි දී පැවැති 26වන පාර්ශ්වකරුවන්ගේ සමුළුවේ දී (COP26) ග්ලාස්ගෝ
දේශගුණ විපර්යාස එකඟතාවය ඇති කරගත් අතර, එමගින් අපේක්ෂා කරන ලද්දේ ගල් අඟුරුවලින් ඈත් වීම, වනාන්තර විනාශය නැවැත්වීම හා ආපසු හැරවීම, මීතේන් විමෝචන අඩුකිරීම හා විද්‍යුත් වාහනවලට මාරු වීම වේගවත් කිරීම වැනි කරුණුය. මේ පළමු වතාවට මේ පාර්ශ්වකරුවන්ගේ සමුළුවක දී ගල්අඟුරු භාවිතය ඉවත් කිරීම සඳහා එකඟ වී ඇත. යාවත්කාලීන කළ ජාතිකව නිර්ණය කළ දායකත්ව මගින් ශ්‍රී ලංකාව අනාගතයේ දී ගල්අඟුරු බලා ගාර ඇති නොකරන බවට සිය කැපවීම ප්‍රකාශ කර ඇත්තේ ය. වෙනස් භූ-දේශපාලනික පසුබිමක් ඇති පවත්වන ලද 27වන පාර්ශ්වකරුවන්ගේ සමුළුවේ (COP27) දී රටවල් පැරිස් ගිවිසුමට සිය කැපවීම නැවතත් තහවුරු කරමින් තීරණ ගණනාවක් ගන්නා ලදි. මෙම එකඟතාවය මගින් දේශගුණ ක්‍රියාමාර්ග ශක්තිමත් කරන ලද්දේ හරිතාගාර වායු විමෝචන කපාහැරීම, දේශගුණ විපර්යාසවල නොවැළැක්විය හැකි බලපෑම්වලට අනුහුරුවීම, මූල්‍ය සහාය, තාක්ෂණය හා ධාරිතා වර්ධනය සඳහා දියුණු වන රටවලට සහාය ලබාදීමට එකඟ වීමෙනි. එසේම වඩාත් අභිලාෂකාමී ජාතිකව නිර්ණය කළ දායකත්ව මගින්, ගෝලීය කාබන් ඩයොක්සයිඩ් විමෝචන 2010 මට්ටමට සාපේක්ෂව 2030 වර්ෂයේ දී 45%ක් දක්වා අඩු කිරීමට හා ශතවර්ෂය මැද වන විට ශුද්ධ ශුන්‍ය බවට පත් කිරීම ඇතුළත් කඩිනම්, ගැඹුරු හා තිරසර වූ හරිතාගාර වායු විමෝචන කපාහැරීමක් ද එහි දී අනුමත කරන ලදි.

2 INFORM අවදානම් දර්ශකය යනු ගෝලීය මානවවාදී අර්බුද හා ආපදා සඳහා වූ විවෘත කේත, අවදානම් තක්සේරුවකි https://drmkc.jrc.ec.europa.eu/inform-index

3 IPCC Sixth Assessment report (AR6), 2023. https://www.ipcc.ch/assessment-report/ar6/

අලාභ සහ හානි සඳහා විශේෂ අරමුදලක් පිහිටුවීම ද ප්‍රගතියේ වැදගත් මඟසලකුණක් වන අතර, එය නිල න්‍යායපත්‍රයට ඇතුළත් කිරීම හා සම්මත කිරීම මුල්වරට සිදුකරන ලද්දේ ද COP27 සමුළුවේ දීය.

ප්‍රතිපත්තිමය පරිසරය ගත් විට, ශ්‍රී ලංකාවේ මුල්ම දේශගුණ විපර්යාස වැළැක්වීමේ උත්සාහය වාර්තා වන්නේ 1990 ගණන්වල දී දියත් කරන ලද ජාතික පරිසර ක්‍රියාකාරී සැලසුමයි (NEAP). 2022-2030 ජාතික පරිසර ක්‍රියාකාරී සැලසුම යනු එහි සිව්වැන්න වන අතර වඩාත් මෑතදීම අනුමත කරන ලද සැලසුම වේ. විසිඑක්වැනි සියවසේ පාරිසරික අභියෝග විසඳීමේ දී හා තිරසර සංවර්ධනය අත්පත් කරගැනීමේ දී, මේ සැලසුමට අනුගත වීම වැදගත්ය.

මේ සැලසුමට තේමා නවයක් අනුව ජාතික පරිසර ප්‍රතිපත්තිය යටතේ උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් ඇතුළත් වේ. මේ තේමාත්මක අංශ නවය සඳහා මූලික කාර්යසාධන දර්ශක (KPI) ඇතුළත් වන අතර, ඉලක්ක, කාලරාමු සහ වගකිවයුතු මූලික ආයතන, වෙනත් මූලික ආයතන, මූර්ත අයවැය හා අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඊට ඇතුළත් වේ. මේ තේමා නවයම ජාතිකව නිර්ණය කළ දායකත්වවල අවමකිරීමේ හා අනුහුරුවීමේ අංශවලට අදාළ වුවත්, තේමා අංක 3 විශේෂයෙන්ම දේශගුණ විපර්යාස හා සම්බන්ධය. පරිසර අමාත්‍යාංශය මගින් බහුපාර්ශ්වීය ගිවිසුම් යටතේ ගෝලීය උණුසුම අඩුකිරීමට හේතුවන මූලික මුලපිරීම් ගණනාවක් ගෙන ඇත. 2019 දී සම්මත කරන ලද "තිරසර නයිට්‍රජන් කළමනාකරණයක් පිළිබඳ කොළඹ ප්‍රකාශනය" මගින් 2030 වන විට නයිට්‍රජන් අපද්‍රව්‍ය අඩකින් අඩුකිරීමේ ඉලක්කයක් ඇති කර තිබේ. 2022 දී 'තිරසර නයිට්‍රජන් කළමනාකරණයක් මගින් 2030 වන විට සාමාජික රටවල ගෝලීය මට්ටමෙන් නයිට්‍රජන් අපද්‍රව්‍ය සැලකිය යුතු මට්ටමකින් අඩුකිරීම' යනුවෙන් යළි අර්ථදක්වන ලදි. 2022 ජාතික නයිට්‍රජන් තත්ත්ව වාර්තාව සකස් කරන ලද අතර, ඒ සමඟ ක්‍රියාකාරී සැලසුමක් සඳහා වන මාර්ග සිතියමක් සකස් කරනු ඇත[4]. කිගාලි සිසිලන සැලසුම (Kigali Cooling Plan) 2020-2038[5] සකස් කරන ලද්දේ මොන්ට්‍රියල් සන්ධානය මත වන අතර, එහි අරමුණ වන්නේ ඕසෝන් ස්තරයට හානිකරන ද්‍රව්‍ය අඩු කිරීමයි (ඕසෝන් ස්තරයට හානි නොකරන අතර, අඩු ගෝලීය උණුසුම් විභයටක් ඇති ශීතකාරක වායු ආදේශ කිරීම).

ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කර ඇති වෙනත් මුලපිරීම් අතර පහත සඳහන් ඒවා ද වේ.

- ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය (2012) (සමාලෝචනයට ලක්වෙමින් තිබේ) (National Climate Change Policy)
- ජාතික පරිසර ප්‍රතිපත්තිය (2022) (National Environment Policy)
- ජාතික පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රතිපත්තිය (2022) (National Environmentally Sensitive Areas Policy)
- ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය (2013) (National Policy on Disaster Management)
- ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ සැලසුම 2018-2030 (Sri Lanka Disaster Management Plan 2018-2030)
- වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලසුම (2018) (Coastal Zone and Coastal Resource Management Plan)
- දේශගුණ විපර්යාස සඳහා වාරිමාර්ග හා ජලසම්පත් අංශයේ උපාය මාර්ගික ක්‍රියාකාරී සැලසුම (2018) (Strategic Action Plan for Adaptation of Irrigation and Water Resources Sector for Climate Change)
- ජාතික කසළ කළමනාකරණ ප්‍රතිපත්තිය (2019) (National Policy on Waste Management)
- ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය (කෙටුම්පත) (National Agriculture Policy)
- ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග (2019) (National Energy Policy & Strategies of Sri Lanka)
- දීර්ඝ කාලීන විදුලිබල ජනන ව්‍යාප්ති සැලසුම් (Long-Term Electricity Generation Expansion Plans)
- ශ්‍රී ලංකාවේ තිරසර සරිභෝජන හා නිෂ්පාදන ජාතික ප්‍රතිපත්තිය (2019) (National Policy on Sustainable Consumption and Production for Sri Lanka)
- ජාතික REDD+ ආයෝජන රාමුව හා ක්‍රියාකාරී සැලසුම (2017) (National REDD+ Investment Framework and Action Plan - NRIFAP)
- ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019) (National Policy on Natural Gas)

4 Nissanka, S.P., Jayaweera, A., & Yang A. (2022). Nitrogen Policy Report: Sri Lanka. South Asia Nitrogen Hub (SANH): Peradeniya, Sri Lanka, and Edinburgh, UK

5 https://www.cleancoolingcollaborative.org/wp-content/uploads/2021/07/Sri-Lanka-NCAP-Final.pdf

## 1.1 ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කළ දායකත්ව අංශ

1-1 වගුවේ දැක්වෙන ආකාරයට ශ්‍රී ලංකාව හරිතාගාර වායු විමෝචන අවමකිරීම සඳහා අංශ 6ක් ද, අනුහුරුවීම සඳහා අංශ 9ක් ද හා අලාභ සහ හානි ද හඳුනාගෙන තිබේ.

1-1 වගුව ශ්‍රී ලංකාවේ අවමකිරීමේ හා අනුහුරුවීමේ අංශ

| NDC කාණ්ඩය | අංශය |
|---|---|
| අවමකිරීමේ අංශ | විදුලිබල අංශය |
| | ප්‍රවාහන අංශය |
| | කර්මාන්ත අංශය |
| | අපද්‍රව්‍ය අංශය |
| | වනාන්තර අංශය |
| | කෘෂිකර්ම අංශය (පශුසම්පත් අංශය ද ඇතුළත්ය) * |
| අනුහුරුවීමේ අංශ | කෘෂිකර්ම අංශය * |
| | ධීවර අංශය |
| | පශුසම්පත් අංශය |
| | ජල අංශය |
| | ජෛව විවිධත්ව අංශය |
| | වෙරළබඩ හා සාගර අංශය |
| | සෞඛ්‍ය අංශය |
| | නාගරික සැලසුම්කරණ හා මානව ජනාවාස අංශය |
| | සංචාරක හා විනෝදාස්වාද අංශය |
| අලාභ සහ හානි | සියලු අංශවලට අදාළය |

* කෘෂිකර්මය අවමකිරීමේ හා අනුහුරුවීමේ අංශ දෙකම යටතේ සලකා බලනු ලැබේ.

කාන්තාවන් දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ දී සැලකිය යුතු දායකත්වයක් දක්වන්නේ ඊට ඔරොත්තු දීම ගොඩනැගීමෙනි. ඒ විශේෂයෙන් කෘෂිකර්මය, පශුසම්පත් කළමනාකරණය, බලශක්තිය, ආපදා අවදානම අඩුකිරීම, වනාන්තර, ජල කළමනාකරණය හා සෞඛ්‍යය යන අංශවලිනි. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අංශවල ස්ත්‍රී පුරුෂ සමානතාවය හා සමාජ අන්තර්ගතකරණය ආමන්ත්‍රණය කිරීමේ ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් මගින් කාන්තාවන් මෙන්ම පිරිමින්ගේ කුසලතා හා අභිලාෂයනට ගැලපෙන ආර්ථික අවස්ථා ඇති කළ හැකිය. එමගින් සාම්ප්‍රදායිකව ප්‍රවේශයක් නැති අයට අවස්ථාව සැලසේ. NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අංශ හතරක් දක්වා ඇති අතර, ඊට බලශක්ති (විදුලි) අංශය අවමකිරීම යටතේ ද, ජල, ධීවර හා පශු සම්පත් යන අංශ අනුහුරුවීම යටතේ ද ඇතුළත් වේ.



## 1.2 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය

සාර්ව NDC ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව මෙහෙයුම්, උපායමාර්ගික හා ප්‍රතිපත්ති යන මට්ටම්වල දී ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කර තිබේ. ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස සම්බන්ධ ප්‍රමුඛතා සඳහා මගපෙන්වන පුළුල් රාමුවක් ආරම්භ වූයේ ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය (2012) හඳුන්වා දීමත් සමඟය. එසේම ඉන්පසුව අදාළ ජාතික ප්‍රතිපත්ති මෙවලම් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි[6]. ශ්‍රී ලංකාවේ NDC ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා සහාය දීමට මෙන්ම දේශගුණ පිළිවෙත් ආංශික උපායමාර්ගවලට ප්‍රධාන ධාරාගත කිරීම සඳහා ද අවශ්‍ය මූලික කරුණු හඳුනාගෙන සම්පූර්ණ කිරීම සඳහා 2016-2019 සූදානම් සැලසුමක් සකස් කරන ලදි.

හඳුනාගෙන ඇති NDC යනු ඉහළ මට්ටමක ක්‍රියාමාර්ග බව සඳහන් කළ යුතු අතර, ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු එක් එක් ආයතනය ඔවුන්ගේ විධිනියම (mandate) හා ආයතනික රාමුව යටතේ ඔවුන්ගේම පරිපූර්ණ ක්‍රියාකාරී සැලසුමක් තනා ගත යුතුය. මේ ක්‍රියාවලියේ දී ප්‍රධාන ආයතනය අනෙක් මූලික ආයතන උපදේශනයට යොදාගත යුතු අතර. ඒ ක්‍රියාකාරකම් හා උප ක්‍රියාකාරකම්වල දී හඳුනාගත් ඒවාට යෝග්‍ය පරිදි සකස් කිරීමේ දී හා සැලසුම ක්‍රියාත්මක කිරීමේ දීය

NDC ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණ යාන්ත්‍රණය සුපරීක්ෂණය කරනු ලබන්නේ ජාතික කමිටුව විසින් වන අතර, එය කැබිනට් තීරණයක් මගින් ස්ථාපිත කරන ලද්දකි (කැබිනට් පත්‍රිකා අංක ME/2021/12, 07.07.2021 දින දරන).

### 1.2.1 ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සැකසුම්

1-1 රූපයෙන් දැක්වෙන්නේ පොදු ආයතනික රාමුව වන අතර, ඉන්පසුව එන උප කොටස් මගින් වැදගත් ආයතන හා ව්‍යුහයන්ට අවධානය යොමු කර තිබේ. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකරන පරිසර අමාත්‍යාංශය ආයතනික රාමුව සුපරීක්ෂණය කරයි.




1-1 රූපය දේශගුණ ප්‍රතිචාර සඳහා ආයතනික ව්‍යුහය (මූලාශ්‍රය: යාවත්කාලීන කළ NDC, 2021)

6 මීට 2016 ජාතික අනුහුරුවීමේ සැලසුම (NAP) හා 2021 යාවත්කාලීන කළ ජාතිකව නිර්ණය කළ දායකත්ව (NDC) හා 2022-2030 ජාතික පරිසර ක්‍රියාකාරී සැලසුම (NEAP) අයත් වේ.

### 1.2.2 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුව

ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා රජය විසින් අන්තර් ආයතනික ජාතික මෙහෙයුම් කමිටුවක් (NSC) සකස් කරන ලද අතර, එහි සභාපතිත්වය දරනු ලබන්නේ පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාය. NDC අංශ පිළිබඳ වගකීම දරණ රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන් මේ ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වය දරයි. මීට අමතරව ජාතික තිරසර සංවර්ධන කවුන්සිලය, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශය මේ කමිටුව තුළ නියෝජනය වන අතර සහයෝගීතාවයෙන් කටයුතු කරයි. වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කළ යුතු කරුණු පිළිබඳ ප්‍රමාණවත් අන්තර් ආයතනික සම්බන්ධීකරණයක් සහිතව NDC ක්‍රියාත්මක බව බව කහවුරු කිරීම ජාතික මෙහෙයුම් කමිටුවේ වගකීම වේ. ප්‍රතිපත්ති සම්බන්ධව අනුගාමී වීම ඉහළම මට්ටමින් තවදුරටත් දිරිමත් කිරීම සඳහා මෙහෙයුම් කමිටුව විසින් ගන්නා පියවර අතර, ප්‍රයත්න ද්විතීකරණය වීම අඩුකිරීම, ක්‍රියාත්මක කිරීමේ බාධකවලටය ප්‍රායෝගික විසඳුම් ලබා දීම, හා සමස්ත ප්‍රගතිය කාලරාමු සමඟ සංසන්දනාත්මකව පරීක්ෂා කිරීම සිදු කරයි (1 උපලේඛනය බලන්න[7]).

### 1.2.3 පරිසර අමාත්‍යාංශය හා දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ ජාතික කේන්ද්‍රස්ථානය වන්නේ පරිසර අමාත්‍යාංශයයි. අමාත්‍යාංශයේ විශේෂිත ඒකකයක් වන දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය (CCS) 2008 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද්දකි. එතැන් සිට මෙම ලේකම් කාර්යාලය අන්තර් ආයතනික දේශගුණ විපර්යාස කමිටුවක් මෙන්ම දේශගුණ විපර්යාසවලට අනුහුරු වීම හා හරිතාගාර වායු විමෝචන අවමකිරීම සම්බන්ධව ජාතික විශේෂඥ කමිටු (NEC) දෙකක් ද ස්ථාපිත කර ඇත. ලේකම් කාර්යාලය ස්ථාපිත කරන ලද්දේ පරිසර අමාත්‍යාංශයට දේශගුණ සම්මුතිය සම්බන්ධව උපකාර වීමට වන අතර, ජාතික මට්ටමේ හරිතාගාර වායු විමෝචන ඉන්වෙන්ටරි සැකසීම, අනුහුරුවීම හා අවමකිරීම හා සම්බන්ධව  තාක්ෂණය පැවරීම් සඳහා සහාය වීම,  හරිතාගාර වායු විමෝචන අඩුකිරීම හා ඔරොත්තු දීම ගොඩනැගීමේ කාර්ය සඳහා සහායවීම, දේශගුණ දත්ත එකතු කිරීම හා බෙදාගැනීම වැනි කටයුතු සඳහාය. සම්මුතියේ ලේකම් කාර්යාලයට, මෙරට ජාතික සන්නිවේදන වාර්තා කිරීම හා පැරිස් ගිවිසුමේ අවශ්‍යතා වාර්තා කිරීම් ද ලේකම් කාර්යාලයේ විධිනියම (mandate) අතර වේ. මීට අමතරව, පහසුකම් සපයන්නා, සම්බන්ධීකාරක හා සන්නිවේදක ලෙස ද ලේකම් කාර්යාලය කටයුතු කරයි. ඒ දේශගුණ ක්‍රියාකාරිත්වය ක්‍රියත්මක කිරීම හා අධීක්ෂණය ද සම්බන්ධවය.

### 1.2.4 ආංශික සැලසුම් හා අධීක්ෂණ කමිටු

ඒ ඒ ජාතිකව නිර්ණය කළ දායකත්ව අංශය සඳහා ඊටම අදාළ සැලසුම් හා අධීක්ෂණ කමිටු (PMC) තිබේ. මේ එක් එක් කමිටුව සමන්විත වන්නේ අදාළ දෙපාර්තමේන්තු හා/හෝ ආයතනවල ප්‍රධානීන්ගෙනි. මේ ආංශික සංවර්ධන සැලසුම් මගින් NDC සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණ සැලසුම් ඇතුළත් කරන අතර ඒවාට අදාළ කමිටු සහාය ලබා දේ. දේශගුණ කරුණු සාමාන්‍ය සැලසුම් රාමුවට ඇතුළත් කිරීම මගින් NDC සඳහා දේශීය/ මහජන අරමුදල් හෝ විදේශීය ප්‍රදාන සහාය ලබාගැනීමට අවස්ථාව ලබා දේ. එක් එක් ආංශික සැලසුම් හා අධීක්ෂණ කමිටුවල සභාපතිත්වය දරනු ලබන්නේ අදාළ විෂය සම්බන්ධ වගකීම දරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාය. මේ කමිටුවේ කාර්යය වන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහාය ලබාගෙන NDC  ක්‍රියාත්මක කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීමය. මේ එක් එක් කමිටුව මගින් NDC ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික, අයවැය, හා ධාරිතා අවශ්‍යතා ප්‍රවේශමෙන් සලකා බලා ජාතික මෙහෙයුම් කමිටුව (NSC) හා දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය ඒ අවශ්‍යතා ගැන දැනුම්වත් බව තහවුරු කරයි. ක්‍රියාත්මක කිරීමේ පමාවක් වේ නම් ආංශික කමිටු මගින් ඒ පිළිබඳව ද අධීක්ෂණය කරනු ලබන්නේ දේශගුණ මුලපිරීම් පමා වීමෙන් තිරසර සංවර්ධනය අඩපණ වීම වැළැක්වීම සඳහා වූ ආරක්ෂණ ක්‍රියාවලියක් ලෙසය (1 උපලේඛනය බලන්න[8]).

---

7 1 වන උපලේඛනයෙන් දැක්වෙන්නේ ජාතික මෙහෙයුම් කමිටුවේ හා සැලසුම් හා මෙහෙයුම් කමිටුවේ නිර්ණේය විෂය (ToR) වේ (National Steering Committee Meeting 20 December 2022, Sri Lanka.)

8 1 වන උපලේඛනයෙන් දැක්වෙන්නේ ජාතික මෙහෙයුම් කමිටුවේ හා සැලසුම් හා මෙහෙයුම් කමිටුවේ නිර්ණේය විෂය (ToR) වේ (National Steering Committee Meeting 20 December 2022, Sri Lanka.)



## 1.3 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නෛතික හා ප්‍රතිපත්තිමය පදනම

NDC ක්‍රියාත්මක කිරීම සඳහා වූ නෛතික හා ප්‍රතිපත්තිමය පදනම ලබා දෙන්නේ ජාතික ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාපිත නීති මගිනි. මීට, දේශගුණ විපර්යාස ප්‍රතිපත්ති, ජාතික පාරිසරික පනත හා ජාතික පාරිසරික ප්‍රතිපත්තිය හා අදාළ NDC අංශවල ප්‍රතිපත්ති හා පනත් අයත් වේ.

## 1.4 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමට බලපාන පරිවේෂණීය බලපෑම්

NDC සකස් කර ඇත්තේ රටේ නිශ්චිත තත්ත්ව හා සංවර්ධන ප්‍රමුඛතා සලකා බලා වන නිසා හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම් හා අදාළ NDC මගින් පෙන්වා දෙන්නේ ගතික තත්ත්ව බව පැහැදිලිය. මේ නිසා දේශගුණ අභිමතාර්ථ අත්පත් කරගැනීම සඳහා මෙම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී යෝග්‍ය පරිදි නැවත සලකා බලා සංශෝධන සිදුකිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, COVID-19 වසංගත තත්ත්වය වැනි අනපේක්ෂිත සිදුවීම් නිසා පැවති තත්ත්වයේ වෙනස්කම් ඇති වීමෙන් NDC සඳහා බලපෑමක් වූ නිසා එමගින් සලකාබැලීම් අවශ්‍ය වන අතර සැලකිය යුතු වෙනස්කම් ඇති වීමට හැකි තත්ත්ව පැවතිය හැකිය. මෙම වසංගතය හුදෙක් සෞඛ්‍යමය ගැටලුවක් පමණක් නොව, මානව සංවර්ධනය සඳහා ද බලපාන්නක් වීම ගෝලීය තත්ත්වයක් වූ අතර, මෙය ආර්ථිකයට හා සමාජයට බලපාන්නක් විය. මේ බව 2020 මානව සංවර්ධන වාර්තාවේ (HDR) ද අවධාරණය කර තිබේ. මානව සංවර්ධන දර්ශකය මැනීම පටන් ගැනීමෙන් පසුව පළමු වතාවට 2020 සඳහා වූ අගයේ සෘණ අගයක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකාවේ දී තත්ත්වය වඩාත් බරපතළ වූයේ විදේශ විනිමය දැඩිලෙස අවම වීම, ණය, දේශපාලන අස්ථාවරත්වය, ජීවන වියදම ඉහළ යෑම හා අත්‍යවශ්‍ය භාණ්ඩවල (බලශක්තිය, ආහාර හා ඖෂධ) හිඟයක් ඇති වීම වැනි කරුණු නිසාය. ජාතික පාරිභෝගි ක මිල දර්ශකය (NCPI) අනුව  පාරිභෝගික මිල උද්ධමනය 2022 මාර්තු මාසයේ සිට ඉතා ඉහළ අගයක් ගත්තේය. 2020 හා 2021 වර්ෂවල දී එහි වාර්ෂික වෙනසේ ප්‍රතිශතය 4% හා 8% අතර තත්ත්වයක පැවතුණු අතර, 2022 ජනවාරි මාසයේ දී එය 15%ක් පමණ විය. එය 2022 සැප්තැම්බර් මාසයේ දී 74%ක් දක්වා ළඟා වූ අතර, 2023 ජනවාරි මාසයේ දී ඒ අගය 54%ක් විය[9]. මේ තත්ත්වය යටතේ ශ්‍රී ලංකා රජයට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට සිදු වූ අතර, ඒවා අනෙක් තත්ත්ව සඳහා වූ දිගුකාලීන විසඳුම් වන දේශගුණ ක්‍රියාමාර්ග/ NDC හා තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) වැනි කරුණුවලට වඩා වැදගත් විය.

එහෙත්, මේ අතර වසංගත තත්ත්වය නිසා ධනාත්මක ප්‍රතිඵල ද ඇති වී තිබේ. තාක්ෂණයේ වර්ධනය, ඩිජිටල්කරණය (ඉ-වාණිජ හා අතථ්‍ය වේදිකා ඇතුළත්ව), නවෝත්පාදන, සැපයුම් දාම විමධ්‍යගතකරණය හා දේශීය අගය එකතුකිරීම් සඳහා අවස්ථා සැපයීම මේ සඳහා නිදසුන් කිහිපයකි. මීට අමතරව. දේශීය හා ගෝලීය වශයෙන් ක්‍රියාකාරීන් අතර ඇති වූ නව ආකාරයේ හවුල්කාරිත්වයන් හා ක්‍රියාකාරීන්ගේ ජාල ජාතික මට්ටම ඉක්මවා නගර, ආයතන. ව්‍යාපාර, වෛද්‍ය වෘත්තික, විද්‍යාඥ, පර්යේෂක, සිවිල් සමාජ හා මාධ්‍ය මෙන්ම පුද්ගල මට්ටම ට ද ව්‍යාප්ත වීම ආරම්භ වී ඇත. මේ අතර සංවර්ධන හවුල්කරුවන් හා ප්‍රදායකයින් COVID-19 තත්ත්වයෙන් ප්‍රතිසාධනය සඳහා දියුණුවන රටවලට සහාය දීම පොරොන්දු වී ඇති අතර, ඒ ආයෝජන හා තාක්ෂණික සහාය සංවර්ධන ප්‍රගතිය සඳහා පෙළගැස්වීමෙනි. ඒ දේශගුණ විපර්යාස ඉලක්ක අත්පත්කරගන්නා අතරය.

ඒ අනුව, බොහෝ රටවල් හා කලාප ඔවුන්ගේ සංවර්ධන න්‍යායපත්‍රය නැවත සකස්කර ඇත්තේ 'නැවත හොඳින් ගොඩනගමු' (build-back-better) යන සංකල්පය අනුව යමින් බොහෝ අංශ සඳහා හරිත/ අඩුකාබන් සංවර්ධනයක් අත්පත් කරගනිමින් වඩාත් ඵලදායී මාර්ගයක් ඔස්සේ වර්තමාන අර්බුදයෙන් ප්‍රතිසාධනය වන අතර දේශගුණ ඉලක්ක හා තිරසර සංවර්ධන අභිමතාර්ථ අත්පත් කරගැනීම සඳහාය. ශ්‍රී ලංකාව ද තමන්ගේ යාවත්කාලීන කළ NDC ලේඛනයේ දක්වා ඇති ආකරයට පැරිස් ගිවිසුමේ අරමුණු වන ගෝලීය උණුසුම් වීම පාලනය කිරීම සඳහා තම රටට ඇති වගකීම පිළිගනියි. රටේ සංවර්ධන හා විශේෂයෙන් පශ්චාත් COVID-19 ආර්ථික ප්‍රතිසාධනය හා ජීවනෝපාය අවශ්‍යතා සඳහා මෙහි දී වැඩි අවධානයක් යොමුකර ඇත්තේ ඉහළ ආදායමක් හා මානව සංවර්ධනයක් මීළඟ දශකයේ ලබාගැනීම සඳහාය. ඒ හරිතාගාර වායු විමෝචන අවම කිරීම හා දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා සහාය දෙන අඩු විමෝචන ප්‍රක්ෂේපණයක් අනුගමනය කරමිනි.

---

9 CBSL (2023), Consumer price inflation, මාර්ගගතය. https://www.cbsl.gov.lk/measures-of-consumer-price-inflation, ප්‍රවේශවීම 2023 මාර්තු 16

මේ අනුව ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණ සැලසුම් සකස් කිරීම, පශ්චාත් වසංගත තත්ත්වයෙන් පසුව පවත්නා තත්ත්වවල ඇති වී තිබෙන වෙනස්කම් NDC සඳහා කරනු ලබන බලපෑම් තක්සේරු කරනු ලැබේ. මෙහි දී ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී වීම, සමාජ අන්තර්ගතකරණය හා තිරසර සංවර්ධන ඉලක්ක හා අනුකූල වීම ද සලකා බලනු ලැබේ.

## 1.5 ඉදිරි ගමන්මග

බොහෝ බාධක තිබිය දී වුවද, 1.4 කොටසේ සඳහන් කර ඇති පරිදි NDC ක්‍රියාත්මක කිරීම සාර්ථක වීමට නම් සියලු අදාළ පාර්වකරුවන්ගේ සක්‍රිය සහභාගීත්වය අත්‍යාවශය වන අතර. ඒ ඔවුන්ගේම සවිස්තර ක්‍රියාකාරී සැලසුම් හරහාය. ඒ ආයතනික රාමුවට අනුව ඉහළ මට්ටමේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ලෙසය. මේ නිසා පහත සඳහන් ඉදිරි ක්‍රියාමාර්ග යෝජනා කර තිබේ.

1. NDC ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය සඳහා එක් එක් පාර්ශ්වකාර සංවිධානයේ කැපවුණු වෙනම ඒකකයක් තිබීම
2. ඒ ඒ අංශය සඳහා වැඩසටහන් සැලසුමක් සකස් කිරීම සඳහා දේශගුණ ක්‍රියාමාර්ග කමිටුවක් තිබීම
3. පාර්ශ්වකරුවන්ගේ අංශික වාර්ෂික/ දීර්ඝකාලීන සංවර්ධන සැලසුම් NDC ප්‍රධාන ධාරාගත කිරීම හා අයවැය මගින් මුදල් වෙන් කිරීම
4. ප්‍රදායක අරමුදල් ව්‍යාපෘතිවල ක්‍රියාකාරකම්/ ප්‍රතිදාන හා අනුගත කිරීම
5. පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය
6. සියලු පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීම සඳහා ඵලදායී සන්නිවේදන උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීම
7. සියලු මට්ටම්වල දී NDC පිළිබඳ දැනුම්වත්භාවය හා නිපුණතා ගොඩනැගීම (උපායමාර්ගික, ක්‍රමෝපායික හා මෙහෙයුම්)
8. NDC චක්‍රය පුරාම ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතිය හා කැපවීම ලබාගැනීම
9. බාහිර සහාය (ක්‍රියාත්මක කිරීමේ ක්‍රම සඳහා) ලබාගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස්කිරීම පිණිස ආංශික ධාරිතාව කඩිනමින් වර්ධනය කිරීම
10. බහු-ආයතනික සහභාගීත්ව වේදිකාවක් සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම
11. අංශික පාර්ශ්වකරුවන් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කරණ යාන්ත්‍රණයක්
12. දත්ත කළමනාකරණය සඳහා ඵලදායී පද්ධතියක්
13. මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) හා දත්ත ලබාදීමේ රාමුවක් ස්ථාපිත කිරීම
14. සියලු අංශවල ආයතන ආවරණය වන ලෙස දේශගුණ වගකීම් සම්බන්ධ නියෝග (රෙගුලාසි) බලාත්මක කිරීම
15. NDC පිළිබඳ ප්‍රගතිය වාර්තා කිරීම වාර්ෂික වාර්තාවල අනිවාර්ය අංශයක් ලෙස ඇතුළත් කිරීම
16. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා ප්‍රතිචාරී බව සියලු ආංශික NDC තුළට ඒකාබද්ධ කිරීම



# 2. ක්‍රමවේදය

## 2.1 ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක සැලසුම සකස් කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය

යාවත්කාලීන කරන ලද NDC (2021) දියුණු කරන ලද්දේ පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මගින් විශේෂිත, මැනිය හැකි, අත්පත් කරගත හැකි, අදාළ හා කාලනිශ්චිත (SMART) ප්‍රවේශයක් භාවිත කරමිනි. මීට සමගාමීව, NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුමේ කෙටුම්පතක් අදාළ පාර්ශ්වකරුවන් හා සාකච්ඡා කිරීමෙන් සකස් කරන ලදි. 2-1 රූපයේ දැක්වෙන්නේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම සකස් කරන ලද ක්‍රියාවලියයි. පවත්නා සැලසුම් කෙටුම්පත් සමාලෝචනය කරමින් හා හිඩැස් හඳුනාගනිමින්. ප්‍රමුඛතා අංශ හතරක (විදුලබල, ජල, ධීවර හා පශු සම්පත්) ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් කිරීමට නිර්දේශ ඉදිරිපත් කරන ලදි. මේ ක්‍රියාවලියේ ප්‍රධාන ක්‍රියාකාරකම් 2-1 වගුවේ දැක්වේ.




2-1 රූපය ක්‍රමවේදයේ ක්‍රමානුරූප සටහන

2-1 වගුව අනුගමනය කරන ලද ක්‍රියාකාරකම්

| ක්‍රියාකාරකම් අංක | ප්‍රධාන ක්‍රියාකාරකම | විස්තරය |
|---|---|---|
| 1 | හිඩැස් ඇගැයීම | 2021 යාවත්කාලීන කරන ලද NDC සකස් කිරීමේ ක්‍රියාවලියේ දී පරිසර අමාත්‍යාංශය හා දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මගින් සකස් කරන ලද NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් කෙටුම්පතේ පවත්නා හිඩැස් තක්සේරු කරන ලදි. සම්පූර්ණ බව හා විනිවිදභාවය තහවුරු කිරීම පිණිස හිඩැස් විශ්ලේෂණය සඳහා උපායමාර්ගික රාමුවක් අනුගමනය කරන ලදි. |
| 2 | NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වල ව්‍යුහය | ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වල ව්‍යුහය අවසන් වශයෙන් සකස් කරනලද්දේ දේශගුණ ලේකම් කාර්යාලයේ හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අවසන් අනුමැතිය ඇතිවය. |
| 3 | හිඩැස් පිරවීම | අංශික ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් මාලාවක් පැවැත්වීමෙන්, (පරිසර අමාත්‍යාංශය/ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මගින් සකස් කරන ලද) NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වල කෙටුම්පත්වල ඇති හිඩැස් හඳුනාගෙන පිරවීම සිදුකරන ලදි. |
| 4 | තිරසර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලවීම තක්සේරු කිරීම | මේ ක්‍රියාකාරකම පවත්වන ලද්දේ යාවත්කාලීන කරන ලද NDC සකස් කිරීමේ ක්‍රියාවලියේ දී එ.ජා. සංවර්ධන වැඩසටහනේ SCAN මෙවලම භාවිතයෙනි. මේ තිරසර සංවර්ධන අභිමතාර්ථ හා අනුකූලවීම පිළිබඳ තක්සේරුව සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදි. |
| 5 | ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් | පාර්ශ්වකාර උපදේශන රැස්වීම් මාලාවක් (ක්‍රියාකාරී කණ්ඩායම්, සැලසුම් හා අධීක්ෂණ කමිටු) පවත්වන ලද්දේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස්කිරීම සඳහාය. එය ඇතුළත් හා සහභාගීත්ව ප්‍රවේශයකින් සිදුකරන ලදි. |
| 6 | ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී වීම හා සමාජ අන්තර්ගතකරණය තක්සේරු කිරීම | කඩිනම් ඇගැයීමක් පැවැත්වීමෙන්  පහත කරුණු තක්සේරු කරන ලදි. (i) NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් කෙටුම්පතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමාජ අන්තර්ගතකරණය (ii) ජාතික හා ආංශික ප්‍රතිපත්ති වැනි පවත්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ තොරතුරු, (iii) NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධානධාරාගත කිරීම සඳහා ප්‍රමුඛතා අංශවල (විදුලිබල, ජල. ධීවර හා පශු සම්පත්) දැනට පවත්නා යාන්ත්‍රණ (iv) ප්‍රශ්නාවලී සමීක්ෂණයකින් ආයතනික යාත්ත්‍රණවල ඇති හිඩැස් හා කාර්ය මණ්ඩල ධාරිතාව |
| 7 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමාජ අන්තර්ගතකරණය සඳහා වන නිර්දේශ | NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වල ප්‍රමුඛතාගත අවමකිරීමේ හා අනුහුරුවීමේ අංශවල (විදුලිබල, ජල, ධීවර, පශුසම්පත්) ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී බව හා සමාජ අන්තර්ගතකරණය පිළිබඳ ක්‍රියාමාර්ග[10] ඒකාබද්ධ කළ අවස්ථා හඳුනාගන්නා ලදි. ඒ, තක්සේරුවල ප්‍රතිඵලයක් ලෙස හා ශ්‍රී ලංකාවට ද යොදාගත හැකි වෙනත් රටවල ක්‍රියාත්මක කරන ලද නිදර්ශන / යහ පිළිවෙත් මගිනි. |
| 8 | NDC අධීක්ෂණ පද්ධතිය | අඛණ්ඩ හා අන්‍යොන්‍ය වශයෙන් ශක්තිමත් කරන අධීක්ෂණ රාමුවක දළ සැකැස්මක් දක්වන ලදි. 2021 දී NDC සමාලෝචනය කරන ලද අවස්ථාවේ දී පාර්ශ්වකරුවන් එකඟ වූ  ජාතික මට්ටමේ අධීක්ෂණ රාමුව  වැඩිදුරටත් අනුමත කරන ලදි. අදාළ පාර්ශ්වකරුවන් සමඟ SMART ප්‍රධාන කාර්යසාධන දර්ශක හා ඉලක්ක ස්ථාපිත කරන ලද අතර, එ මගින් ක්‍රියාත්මක කිරීමේ සැලසුම සමීපව අධීක්ෂණය කිරීම පහසු කරන ලදි. |
| 9 | NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් | දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයේ අනුමැතිය ඇතිව NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම ප්‍රකාශයට පත් කළ හැකි ආකාරයකින් සකස් කරන ලදි. |
| 10 | ප්‍රගතිය වාර්තා කිරීම | 2021 හා 2022 වර්ෂ සඳහා NDC වල ප්‍රගතිය හඳුනාගන්නා ලද අතර, අවම කිරීමේ අංශවල හරිතාගාර වායු විමෝචන අඩු වීම පිළිබඳ ඇස්තමේන්තු ද ගණනය කරන ලදි. |
| 11 | තිරසර සංවර්ධන අභිමතාර්ථ හා පෙළගැසීම | තිරසර සංවර්ධන අභිමතාර්ථ සමඟ NDC එක්ව පෙළගැසීම සිදුකරන ලද්දේ එක් එක් NDC ක්‍රියාකාරකම හා උප ක්‍රියාකාරකම හා තිරසර සංවර්ධන අභිමතාර්ථ අතර ඍජු අන්තර් සම්බන්ධතා පිළිබඳව සලකා බැලීමෙනි. |
| 12 | වලංගුකරණ වැඩමුළුව | ආංශික වලංගුකරණ වැඩමුළු පවත්වන ලද්දේ සකස්කරන ලද ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ සැලසුම් වලංගු කිරීම පිණිසයි. |
| 13 | ජාතික මෙහෙයුම් කමිටු (NSC) රැස්වීම | NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ජාතික මෙහෙයුම් කමිටුවේ (NSC) අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. |

10 මේ අංශ හතරට අමතරව, කෘෂිකර්ම (අනුහුරුවීම) අංශය සඳහා වෙනත් ව්‍යාපෘතියක් යටතේ මේ හා සමාන තක්සේරුවක් සිදුකර තිබේ.



## 2.2 දත්ත මූලාශ්‍ර හා/ හෝ පදනම් කරගත් තත්ත්ව

NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීමට පසුව පාර්ශ්වකරුවන් සමඟ සවිස්තර උපදේශනයක් සිදුකරන ලදි. ඒ අනුව ක්‍රියාත්මක කිරීමේ සැලසුම්, ක්‍රියාකාරකම් හා ප්‍රධාන කාර්යසාධන දර්ශක, අංශ විශේෂිත ප්‍රතිපත්ති, අදාළ ජාතික ප්‍රතිපත්ති, ආංශික දත්ත හා ගැටලු ආදිය සලකා බලන ලදි. ප්‍රධාන කාර්යසාධන දර්ශක හා ඉලක්ක සුවිශේෂී, මැනිය කළ හැකි, අත්පත් කරගත හැකි, යථාර්ථවත් හා කාල නිශ්චිත බව තහවුරු කිරීම සඳහා මෙම ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ද වලංගු කිරීම සිදුකරන ලදි.

# 3. ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීම - හරිතාගාර වායු විමෝචන අවමකිරීම

## 3.1 දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකාව ඓතිහාසික වශයෙන් අඩු කාබන් සමාජ ආර්ථික සංවර්ධනයක් අනුගමන කර ඇති අතර, ඒක පුද්ගල කාබන් විමෝචන වේගය ගතහොත් එය පහළ මැදි ආදායම් ඇති රටවල් අතර අඩුම අගයක් ඇති රටකි (ලෝක බැංකුවට අනුව 2020 දී එය එක් පුද්ගලයෙකුට කාබන් ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් 1.0කි[11]. මෙය රටේ භාවිත වී ඇති ආර්ථික ආකෘතිය නිසා සිදුවූ ලෙස සැලකිය හැකි අතර, එය අධික ලෙස බලශක්තිය අවශ්‍ය කර්මාන්ත මත නොයැපීම හා ජෛව ස්කන්ධ, ජලය, සූර්ය බලය හා සුළඟ වැනි පුනර්ජනනීය බලශක්තිය අධික ලෙස භාවිත වන්නක් වීම දැක්විය හැකිය. කෙසේ වෙතත්, පසුගිය දශකය පුරාම මූලික පද්ධතිමය කරුණු ගණනාවක්, විශේෂයෙන් ප්‍රතිපත්තිමය හිඩැස් තුළින්, ආයතන හා ව්‍යුහයන් තුළින් ඇති වී තිබේ. මේවා නිසා අඩුකාබන් වර්ධනයේ ප්‍රක්ෂිප්තය නොසලකා හැර ඇති අතර, රටේ පාරිසරික තිරසරභාවය ද අඩු වී තිබේ. මෙය බලශක්ති, කර්මාන්ත, අපද්‍රව්‍ය, කෘෂිකර්ම හා වනාන්තර යන අංශවල මෙන්ම ස්වාභාවික සම්පත් කළමනාකරණ අංශයේ ද දැකිය හැකිය. මේ තත්ත්වය තවදුරටත් අයහපත් කරමින් බහුවිධ හා සංකීර්ණ සමාජ ආර්ථික අභියෝග පසුගිය COVID-19 වසංගත සමයෙන් පසුව ඇති වී තිබේ.

මේ කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය දේශපාලන හා ප්‍රතිපත්ති යන අංශවල මුලපිරීම් හා මැදිහත්වීම් ගණනාවක් සිදුකර තිබේ. එහි අරමුණ වන්නේ අඩු-කාබන් වර්ධනයක් හා තිරසර සංවර්ධන න්‍යායපත්‍රය ඉදිරියට ගෙන යෑමට ගම්‍යතාවයක් ලබාගැනීමය. 2021 සිට 2030 දක්වා කාලයේ දී ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති අවමකිරීමේ ප්‍රධාන පියවර සමඟ යාවත්කාලීන කරන ලද NDC මගින් දක්වා ඇත්තේ වඩාත් අභිලාෂකාමී දේශගුණ කැපවීමකි. එහි දී වගකිව යුතු ආයතනවලට හා වෙනත් අදාළ පාර්ශ්වකරුවන් හා ප්‍රධාන සහායක ආයතනවලට ඔවුන්ගේ වැඩසටහන් අනුකූල කරගැනීමේ දී 2050 ශුද්ධ ශුන්‍ය කාබන් ඉලක්කය පැහැදිලි මගපෙන්වීමක් ලබාදෙයි. මේ පියවරවලට හරිතාගාර වායු විමෝචන අඩුකිරීම සඳහා ඉහළ විභවයක් ඇති අතර, ඒවා තිරසර සංවර්ධන ඉලක්කවලට සමීපව සම්බන්ධ වේ. එසේම, යාවත්කාලීන කරන ලද NDC සකස් කරන ලදදේ ජාතික හා ආංශික ප්‍රතිපත්ති ගණනාවක් සලකා බලමින් වන අතර, මෑත කාලයේ සංශෝධනය කර සකස් කරන ලද අදාළ ප්‍රතිපත්ති උපායමාර්ග හා සැලසුම්වල දේශගුණ ක්‍රියාමාර්ග වඩාත් සඳහන් වේ. ඇතැම් උදාහරණ කීපයක් වන්නේ: දේශගුණ සෞභාග්‍ය සැලසුම (2022), ජාතික පරිසර ප්‍රතිපත්තිය (2022), ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය (සමාලෝචනයට ලක්වෙමින් තිබේ), තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (කෙටුම්පත) තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය (2019), ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග (2019), 2022-2030 ජාතික පරිසර ක්‍රියාකාරී සැලසුම (2022), ජාතික කර්මාන්ත ප්‍රතිපත්තිය (කෙටුම්පත), ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය (කෙටුම්පත), ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය (කෙටුම්පත). ඉහත සඳහන් කර ඇති ප්‍රතිපත්ති මගින් පොදුවේ අඩු-කාබන් හා සම්පත් කාර්යක්ෂම ක්‍රියාකාරකම්වලට හා චක්‍රිය ආර්ථිකයකට වැඩි තැනක් දෙන අතර, වනාන්තර/ වෘක්ෂ ආවරණය වැඩි කිරීම මගින් හරිතාගාර වායු තැන්පත් ප්‍රවර්ධනය කරයි. මීට අමතර, ශ්‍රී ලංකාව මෑත කාලයේ දී මූල්‍ය සවලකරණය හා අඩු-කාබන් මං පෙතක් සඳහා සහාය වීමට ප්‍රගාමී පියවර ගණනාවක් ද ගෙන තිබේ.

නිදසුනක් ලෙස ගතහොත්, විදුලිබල අංශය පෞද්ගලික අංශයේ පුනර්ජනනීය බලශක්තිය සඳහා ආයෝජනය කිරීමට පහසුකම් සපයා ඇත්තේ පෝෂක අය ක්‍රම (feed-in tariff), විවිධ පියැසි මත සූර්ය බල සම්බන්ධතා සඳහා සහාය දෙන නෛතික මෙවලම් ශුද්ධ මනුකරණය (බැළු පැළුරසබට), ශුද්ධ ගණනය (net accounting) හා ශුද්ධ එකතුව (net plus) ආදි යොදාගනිමිනි. බලශක්ති කාර්යක්ෂමතාවය දිරිමත් කරනු ලබන්නේ ඉහළ විදුලිබල පරිභෝජන අය ක්‍රම මගින් භාවිතය සාධාරණීකරණය කිරීම, කාල පාදක සැපයුම (Time-of-Use) මත බිල්කරණය ආදි ක්‍රම මගිනි. එසේම සූත්‍රිකා විදුලි බුබුලුවල සිට සංයුක්ත ප්‍රතිදීපන පහන් (CFL) හා LED විදුලි ආලෝකය දක්වා සිදු වූ මාරුවීම සඳහා ද මූල්‍යමය සහන ලබා දී තිබේ. නාගරික ප්‍රදේශවල කළමනාකරණය කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ ගොස් ඇත්තේ අපද්‍රව්‍ය තුළින් විදුලිය ලබාගැනීම හා අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන් සඳහා ආයෝජනය කළ නිසාය. හෝටල හා සත්ත්ව ගොවිපොළ වැනි මහා පරිමාණ අපද්‍රව්‍ය ජනනය කරන ආයතනවල ස්ථානීය අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදුකිරීම සඳහා ආයෝජනය කිරීමට නීතිමය අවශ්‍යතා හා පාරිසරික කරුණු නිසා සිදු වී තිබේ.

11 The World Bank. CO2 emissions (metric tons per capita) – Sri Lanka. Retrieved from https://data.worldbank.org/indicator/EN.ATM.CO2E.PC?locations=LK



පරිසර අමාත්‍යාංශය විසින් 2022 සිට 2030 දක්වා කාලය සඳහා වන ජාතික පරිසර ක්‍රියාකාරී සැලසුම (NEAP) සකස් කර ඇත්තේ 'ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සඳහා ගමන්මග' නම් තේමාව යටතේය. එය ජාතික පරිසර ප්‍රතිපත්තිය (NEP) මත පදනම් වී ඇත. කර්මාන්ත අමාත්‍යාංශය මේ වන විට ඇත්තේ ජාතික කර්මාන්ත ප්‍රතිපත්තියක් හඳුන්වා දීමේ ක්‍රියාවලියේය. කැබිනට් අනුමැතිය ලැබීමට නියමිත මේ යටතේ දැනට පවත්නා කර්මාන්ත පුර 'පරිසර කර්මාන්ත පුර' බවට පරිවර්තනය කිරීමට නියමිත අතර, සියලු නව කර්මාන්ත පුර "හරිත හෝ පරිසර" තේමා යටතේ ආරම්භ කෙරෙනු ඇත. චක්‍රිය ආර්ථිකය, බලශක්ති කාර්යක්ෂමතාව හා පිවිතුරු නිෂ්පාදනය වැනි සංකල්ප කර්මාන්ත විසින් පිළිගෙන තිබේ. තිරසරභාවයට හා අලෙවිකරණයේ වාසියක් ලැබීම සඳහා ඇතැම් ප්‍රධාන පෙළේ කාර්මික නිෂ්පාදන ආයතන හා තේ කර්මාන්තය වැනි ඇතැම් කර්මාන්ත අංශ මගින් 'කාබන් උදාසීනකරණය' ඉලක්ක කරගෙන තිබේ.

මැදි ආදායම් සංවර්ධන අපේක්ෂා සමඟ පොදු ප්‍රවාහනයේ සිට පෞද්ගලික ප්‍රවාහනය වෙත ප්‍රවාහන අංශයේ මාදිලි වෙනසක් ක්‍රමයෙන් සිදුව ඇත. 2005 වර්ෂයේ දී පොදු ප්‍රවාහන සේවා (බස් හා දුම්රිය) මගින් මගීන්ගෙන් 70%කට ප්‍රවාහන සේවා සැපයුන නමුත් ඒ ප්‍රමාණය 2015 දී 50%ක් දක්වා ද, 2021 වන විට 33%ක් දක්වා ද අඩු වී තිබේ[12]. 2021 වර්ෂයේ දී මිලියන 5.53ක් පමණ වාහන ප්‍රමාණයකින් යුක්ත වූ රටේ සක්‍රිය වාහන ඇණියෙන් 85.5%ක් වූයේ කාර් රථ, මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථයි[13]. මේ අතර මගී ප්‍රවාහන සේවා නවීකරණය කිරීම සඳහා විශාල ආයෝජන සැලසුම් කර ඇති අතර, මීට දුම්රිය හා අධිවේගී මාර්ග ජාලය, දුම්රිය විද්‍යුත්කරණය, පෞද්ගලික වාහන ධාවකයින් වැඩි පිරිසක් දෙමුහුම් හා විදුලි වාහන (EV) භාවිතය සඳහා පෙළඹවීම වැනි කරුණු අයත් වේ. අභ්‍යන්තර දහන එන්ජින්වලින් යුක්ත වාහන ආනයනය සඳහා මෑතක දී රජය විසින් පනවන ලද ආනයන සීමා හේතුවෙන් ඒ වෙනුවට විදුලි වාහන සඳහා උනන්දුවක් ඇති වී තිබේ. මීට දේශීයව නිෂ්පාදිත මෙන්ම අගය එකතු කළ විදුලි වාහන ද ඇතුළත්ය. සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ඇතිව, නියමු ව්‍යාපෘති ගණනාවක් දියත්කර ඇත්තේ විදුලි වාහන ප්‍රවර්ධනය කිරීම සඳහා සහ අභ්‍යන්තර දහන එන්ජින් සහිත වාහන නැවත සකස් කිරීම සඳහා සහ ආරෝපණ ගන්වන යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සඳහාය.

අඩු-කාබන් සංවර්ධනයක් සඳහා ප්‍රතිපත්ති හා දේශපාලන මට්ටමේ අවධානය යොමුවීම පෙන්වන තවත් කරුණක් වන්නේ මෑතක දී රජය විසින් සිදුකරන ලද මැදිහත් වීම්ය. ඒ අතර දේශගුණ සෞභාග්‍ය සැලසුම, කාබන් ශුද්ධ ශුන්‍ය මාර්ග සිතියම, අන්තර්ජාතික දේශගුණ විපර්යාස විශ්ව විද්‍යාලයක් පිහිටුවීමට ඉදිරිපත්ව ඇති යෝජනාව ආදිය වේ. කෙසේ වෙතත්, මේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඇති බාධාව වී ඇත්තේ ඒ සඳහා අවශ්‍ය අරමුදල් සීමාසහිත වීමය. මේ තත්ත්වය වර්තමාන ආර්ථික අර්බුදය නිසා වඩාත් උග්‍ර වී ඇත. මේ අභියෝග ජයගැනීම සඳහා, ශ්‍රී ලංකා රජය දේශගුණ මූල්‍ය පහසුකම් හා වෙනත් මූලාශ්‍ර පිළිබඳව සොයාබලමින් සිටියි. මූල්‍ය සම්පාදනය සම්බන්ධයෙන් වැදගත් මුලපිරීම් අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් 2022 දී ප්‍රකාශිත ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය (Sri Lanka Green Finance Taxonomy) සහ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව (SLSDC) හා ආයෝජන මණ්ඩලයේ (BOI) මගපෙන්වීම මත සකස් කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ ආයෝජන සිතියම (SDG Investor Map) වේ. මේවා මගින් අපේක්ෂා කරන්නේ අඩු-කාබන් හා තිරසර සංවර්ධනයක් සඳහා ආයෝජන සිදු කිරීම සඳහා යෝග්‍ය පරිසරයක් ලබාදීමයි. පරිසර අමාත්‍යාංශය මෑතක දී විශේෂඥ කමිටුවක් පිහිටුවන ලද්දේ රටේ කාබන් වෙළෙඳාම සඳහා පවත්නා විභවය හඳුනා ගැනීමට හා ශ්‍රී ලංකාවේ කාබන් වෙළෙඳාම පිළිබඳ උපායමාර්ගය සංවර්ධනය කිරීම සඳහාය.

### 3.1.1 කොන්දේසි රහිත හා කොන්දේසි සහිත ප්‍රතිපත්තිමය ප්‍රතිචාර

ශ්‍රී ලංකා රජය ඒ සඳහා කැපවූව ද, NDC සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම කරුණු ගණනාවක් මත රඳා පවතී. දත්ත, මූල්‍ය පහසුකම්, තාක්ෂණය, හැකියාව හා විශේෂඥතාවය වැනි සම්පත් පැවතීම මේ අතරින් විශේෂ වේ. මේ අනුව, NDC අතරින් හඳුනාගෙන ඇති සමහරක් ක්‍රියාත්මක කිරීම පහසු වන අතර, අනෙක්වා සඳහා වැඩි ප්‍රයත්නයක් හා වෙනත් පාර්ශ්ව හෝ සංවර්ධන හවුල්කරුවන් වැනි අන්තර්ජාතික සහයෝගයක් අවශ්‍ය වේ. මේ නිසා NDC කොන්දේසි සහිත හා කොන්දේසි රහිත යනුවෙන් කාණ්ඩ දෙකකට බෙදා ඇත. කොන්දේසි සහිත යනුවෙන් දක්වා ඇති NDC ක්‍රියාත්මක කිරීම සඳහා රටේ ආර්ථික හැකියාවට ඔබ්බෙන් වූ අතිරේක සම්පත් අවශ්‍ය වේ. ඇතැම් අවස්ථාවල වඩාත් යෝග්‍ය පාලනයක් හා නෛතික පරිසරයක් ද අවශ්‍ය වේ. නිදසුනක් ලෙස ගතහොත්, කොන්දේසි සහිත NDC ගණනාවක් එසේ සීමා වී ඇත්තේ තාක්ෂණික වශයෙන් නොමේරූ තත්ත්වයක ඇති නිසා සහ දේශීයව වෙළෙඳපොළ සූදානමක් නොමැති වීම (වාණිජමය ශක්‍යතාවයක් නොමැති වීම) නිසාය.

12 National Transport Commission (NTC), National Transport Statistics 2022.
13 CBSL, Economic and Social Statistics of Sri Lanka 2022.

අඩු කාබන් ගමන් මාර්ගයක දීර්ඝකාලීන මාරුවක් සිදු කිරීම සඳහා ප්‍රධාන අංශ වන විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය, වනාන්තර, කෘෂිකර්මය හා පශු පාලනය යන අංශවල මේ පියවර ඉතා වැදගත් වේ. කොන්දේසි සහිත NDC ක්‍රියාමාර්ග මගින් 2021-2030 අතර කාලයේ දී හරිතාගාර වායු විමෝචන 10.5%ක් පමණ ප්‍රමාණයක් අතිරේකව අඩු කළ හැකිය[14]. මෙය රජයේ මුළු විමෝචන කපාහැරීම වන 14.5%ක ප්‍රමාණයේ ප්‍රධාන අංගයකි[15]. කොන්දේසි රහිත NDC යනු ජාතික සැලසුම් හා වැඩසටහන්වල දී හඳුනාගෙන ඇති ඒවා වන අතර, ජාතික ආයෝජන (රාජ්‍ය හා පෞද්ගලික) සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. මේවා දේශීය ධාරිතාවයෙන් පමණක් ක්‍රියාත්මක කළ හැකි ඒවාය. මේ ක්‍රියාමාර්ග මගින් කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) තත්ත්වයට සාපේක්ෂව 2021-2030 අතර කාලයේ දී හරිතාගාර වායු විමෝචනවලින් 4%ක් පමණ අඩු කළ හැකිය. 3-1 වගුව මගින් දැක්වෙන්නේ හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ අංශය යටතේ අඩු කළ හැකි වායු විමෝචන ප්‍රමාණයයි (කොන්දේසි සහිත හා රහිත).

හරිතාගාර වායු විමෝචන අඩු කිරීමේ සැබෑ විභවය ඉහත දැක් වූ ප්‍රමාණවලට වඩා බෙහෙවින් ඉහළ විය හැකි බව මෙහි දී සඳහන් කළ යුතුය. ඒ, රටේ ක්‍රියාත්මක වන හරිතාගාර වායු විමෝචන අවමකිරීම හා දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම යන පියවරවලින් යන දෙකෙන්ම සිදුවන හරිතාගාර වායු විමෝචන අඩුකිරීම ඇතුළුව, සම-ප්‍රතිලාභ මේ දක්වා තක්සේරු කර නැති නිසාය. ඒ අවශ්‍ය දත්ත හා අදාළ මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) පද්ධතිවල නොමැති නිසාය.

3-1 වගුව - අවමකිරීමේ අංශවලින් හරිතාගාර වායු විමෝචන අඩුකිරීමට පොරොන්දු වී ඇති ප්‍රමාණ (යාවත්කාලීන කළ NDC වෙතින්, 2021)

| අංශය | කොන්දේසි රහිත | ප්‍රමාණය ($MTCO_2$ eq) | කොන්දේසි සහිත | ප්‍රමාණය ($MTCO_2$ eq) | එකතුව % ($MTCO_2$ eq) |
|---|---|---|---|---|---|
| විදුලිබල | 5% | 9,819,000 | 20% | 39,274,000 | 25% (49,093,000) |
| ප්‍රවාහන | 1% | 1,337,000 | 3% | 4,011,000 | 4% (5,348,000) |
| කර්මාන්ත | 4% | 2,088,000 | 3% | 1,482,000 | 7% (3,570,000) |
| අපද්‍රව්‍ය | 8.5% | 1,969,000 | 2.5% | 580,000 | 11% (2,549,000) |
| වනාන්තර | 2% | 705,000 | 5% | 1,652,000 | 7% (2,357,000) |
| කෘෂිකර්ම (පශුසම්පත් ඇතුළුව) | 4% | 2,477,400 | 3% | 1,858,000 | 7% (4,335,400) |
| එකතුව | **4%** | | **10.5%** | | **14.5% (67,252,400)** |

14 මෙම සංශෝධනයේ දී ආවරණය වූ අංශ හය (විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය, කෘෂිකර්ම හා පශුසම්පත්, වනාන්තර) සඳහා පමණි. ඇතැම් භූමි පරිහරණ කාණ්ඩ වැනි සමහර උප අංශවල විමෝචන හා විමෝචන අඩුකිරීමේ ක්‍රියාකාරකම් මේ විශ්ලේෂණයේ දී බැහැර කර ඇත.

15 Updated NDC Sri Lanka, 2021



## 3.2 විදුලිබල අංශය

ශ්‍රී ලංකාවේ විදුලි උත්පාදනය කරන ප්‍රධාන ක්‍රම තුනකි: තාප විදුලිය (ගල් අඟුරු හා තෙල් වැනි පොසිල ඉන්ධන භාවිත කරන), මහා පරිමාණ ජලවිදුලිබල ව්‍යාපෘති, වෙනත් නව පුනර්ජනනීය මූලාශ්‍ර (කුඩා ජලවිදුලි, සූර්ය, සුළං හා ජෛවස්කන්ධ) යනුවෙනි. මෙම නව පුනර්ජනනීය විදුලි මූලාශ්‍ර සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය විදුලිය (NCRE) හෝ නව පුනර්ජනනීය විදුලි ප්‍රභව (NRE) ලෙස ද හැඳින්වේ. රටේ විද්‍යුත්කරණය සියලු විදුලි පාරිභෝගිකයන් සඳහා බොහෝ දුරට 100%ක් වේ. ලංකා විදුලිබල මණ්ඩලයට[16] අනුව, 2021 වර්ෂයේ දී මුළු ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 4.186ක් වන අතර, එය 2020ට වඩා 1.9%කින් (මෙගවොඩ් 79) අඩු වීමකි. ඊට හේතුව වූයේ ස්වාධීන විදුලි උත්පාදකයන්ගේ විදුලිබලාගාර කිහිපයක් ආයු කාලය අවසන් වීම නිසා වසාදැමීමයි. 3-1 රූපයේ දැක්වෙන ආකාරයට විදුලිබල ජනනය සඳහා යොදාගන්නා බලශක්ති ප්‍රභවයේ වඩාත් පරිසර හිතකාමී තත්ත්වයක් දක්වා වෙනස් වීමක් සිදුව ඇත (ඒ ප්‍රධාන වශයෙන් සූර්ය හා සුළං වැනි සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය විදුලිබල ප්‍රභව නිසාය).




3-1 රූපය 2020 හා 2021 ජනන ප්‍රභවය අනුව කොටස[16]

ශ්‍රී ලංකාවේ බලශක්ති සැපයුම සුරක්ෂිත, සාධාරණ හා තිරසර එකක් බවට පත් කිරීම සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කරමින් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග (2019) ස්ථාපිත කරන ලදී. මේ ව්‍යවස්ථාපිත කුලුණු දහය මගින් ගෘහාශ්‍රිත පුනර්ජනනීය විදුලි ප්‍රභව සංවර්ධනය උපරිමකරණය කිරීම, ජනන මුසුව විවිධාංගීකරණය, හා පොසිල ඉන්ධන ආනයනය අඩුකිරීම සිදුකරයි. 2030 වන විට පුනර්ජනනීය විදුලිබල ප්‍රභවවලින් නිපදවන විදුලිය මුළු විදුලි උත්පාදනයෙන් 70%ක් බවට පත් කිරීමේ ඉලක්ක ඇතිව, මේ මුලපිරීම් මගින් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය වැඩිදුරටත් ඉදිරියට ගෙන යනු ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා බලශක්ති තුලිතය (Sri Lanka Energy Balance) අනුව විදුලිබලය සඳහා ඇති ඉල්ලුම 2010 හා 2020 අතර වාර්ෂිකව 5% බැගින් ඉහළ ගොස් තිබේ[17] . කෙසේ වෙතත්, එය 2020 දී මදක් අඩු වී ඇත්තේ COVID-19 වසංගත තත්ත්වය නිසා නිසා අඩු වූ ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙනි. මෑත අතීතයේ හා වර්තමානයේ දී විවිධ හේතු (ආනයන සීමා, දිග්ගැසුනු විදුලි කප්පාදු කිරීම්, ඛනිජ තෙල් හිඟය) විදුලි ඉල්ලුමේ කිසියම් අඩුවක් තිබුන ද, දීර්ඝකාලීනව වර්ධන ප්‍රවණතාවය අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ නිසා විදුලිබල උත්පාදනය සඳහා අනාගත ව්‍යාප්ත සැලසුම් අනුගමනය කරනු ඇත. 3-2 රූපයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් හා විදුලිබල ඉල්ලුම එකිනෙකට සම්බන්ධ වන ආකාරයයි.

16 CEB, Sales and Generation Handbook, 2021

17 SLSEA, Sri Lanka Energy Balance 2020

මෙහි ප්‍රතිඵලයක් ලෙස, ආර්ථික සංවර්ධනය සමඟ විදුලිය සඳහා ඇති ඉල්ලුම ඉහළ යනු ඇති බව විශ්වාස කිරීම සාධාරණය. 2026 වර්ෂයේ පමණ සිට උපරිම විදුලි ඉල්ලුම රාත්‍රියේ සිට දිවා කාලයට මාරු වනු ඇති බව මීට පෙර පුරෝකථනය කර තිබුනේ ඉහළ යන කාර්මික කටයුතු නිසාය.[18]




3-2 රූපය - දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය හා විදුලිබල අලෙවිය[18]

පුනර්ජනනීය බලශක්තිය සඳහා ශ්‍රී ලංකා රජය ලබා දී ඇති අවධානයත් සමඟ එහි ධාරිතාවය ඉහළ ගොස් සැලකිය යුතු ප්‍රගතියක් ඇති වී තිබේ. මෙය සුළං, සූර්ය, ජල හා ජෛවස්කන්ධ යන අංශවල විශේෂයෙන් සිදු වී ඇත. මේ අතර, මෑත කාලයේ ඇති වී තිබෙන වඩාත් කැපී පෙනෙන වර්ධනය වන්නේ පියැසි මත ඉදිකර ඇති සූර්ය කෝෂ පද්ධතිය. මේවායේ මුළු ධාරිතාව 2022 අවසානය වන විට මෙගාවොට් 700ක් පමණ විය. ගෘහාශ්‍රිත, වාණිජ හා කාර්මික ඉදිකිරීම්වල ස්ථාපනය කර ඇති මෙම පියැසි මත සූර්ය කෝෂ පද්ධති සංඛ්‍යාව 47,000ක් පමණ වන අතර, ඒවායේ ධාරිතාව කිලෝවොට් කීපයක සිට මෙගාවොට් කීපයක් දක්වා වූ පරාසයක පවතී. මේවා සඳහා තාක්ෂණය සපයන්නන් ප්‍රමාණය 470කට අධිකය. පියැසි මත ඉදිකරන සූර්ය කෝෂ පද්ධති සංවර්ධනය සඳහා මූලිකව පාලනය කරනලද්දේ "සූර්යබල සංග්‍රාමය" (Battle for Solar Energy) නමින් දියත් කරන ලද ජාතික වැඩසටහනයි. මේ යටතේ එකිනෙකට වෙනස් ක්‍රම තුනක් හඳුන්වා දෙන ලදි. ඒ ශුද්ධ මනුකරණය, ශුද්ධ ගණනය හා ශුද්ධ එකතුව යනුවෙන් වන අතර, ඒ මගින් විදුලි පාරිභෝගිකයාට අතිරේකව ජනනය වන විදුලිය ගබඩා කිරීමට හෝ විදුලිබල මණ්ඩලයට අලෙවි කිරීමට අවස්ථාව ලබා දී තිබේ. 2025 වර්ෂය වන විට මේ ක්‍රමය මගින් ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 1,000ක් ද, 2030 වන විට මොගාවොට් 1,500ක් ද එක් කිරීමට අපේක්ෂා කරනු ලැබේ[19] .

විදුලිබල අංශයේ හරිතාගාර වායු විමෝචන තවදුරටත් අඩුකිරීම සඳහා හේතු වූ තවත් මැදිහත්වීමක් වූයේ මේ වනවිටත් ක්‍රියාත්මක බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය හා සංරක්ෂණය (EEI&C) වැඩසටහනයි. මේ යටතේ ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ මුලපිරීම් මෙන්ම සම්ප්‍රේෂණය හා බෙදාහැරීමේ හානිය අඩුකිරීමේ ප්‍රයත්න ද ක්‍රියාත්මකය. මෙහි දී ක්‍රියාත්මක කර ඇති ප්‍රධාන වැඩසටහන් අතර, විශේෂයෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරිය (කලින්, බලශක්ති සංරක්ෂණ අරමුදල) ක්‍රියාත්මක කර ඇති ප්‍රතිපත්ති, නියෝග, රීති සංග්‍රහ, උපකරණ ලේබල් කිරීම, මාර්ගෝපදේශ, අධ්‍යාපන/ දැනුම්වත් කිරීම් හා වෙනත් ප්‍රවර්ධනාත්මක වැඩසටහන් තිබේ.

18 CEB, Long-Term Generation Expansion Plan 2022-2041

19 SLSEA, සූර්ය බල සංග්‍රාමය. https://www.energy.gov.lk/index.php/en/soorya-bala-sangramaya



වඩාත් මෑත කාලයේ දී මෙවැනි ප්‍රයත්නයක් ක්‍රියාත්මක කරන ලද්දේ මෙහෙයුම් ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (ODSM) වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙනි. මෙය බලශක්ති ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකාය මගින් සකස් කරන ලද අතර ඊට ක්ෂේත්‍ර නවයක් අයත් විය: කාර්යක්ෂම විදුලි ආලෝකය, කාර්යක්ෂම විදුලි පංකා, කාර්යක්ෂම මෝටර්, කාර්යක්ෂම ශීතකරණ, සූත්‍රිකා බල්බ භාවිතයෙන් ඉවත් කිරීම, කාර්යක්ෂම වායු සමීකරණ, සුහුරු නිවාස, හරිත ගොඩනැගිලි හා කාර්යක්ෂම පොම්ප ආදිය වේ. මෙම වැඩසටහනේ ක්‍රියාත්මක කාලය වන 2016 හා 2020 අතර කාලයේ දී ගිගාවොට් පැය 2,000ක විදුලි ඉල්ලුම් මෙමගින් ඉලක්ක කරන ලදී[20] . මේ වන විට සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් එම වැඩසටහන ඉදිරියට කරගෙන යයි.

තවද, අනාගතයේ දී 'නව ගල්අඟුරු බලාගාර එකතු කිරීමක් අපේක්ෂා නොකරන' අතර, දැනට පවතින ඉන්ධන තෙල් පදනම් කරගත් ඒකාබද්ධ චක්‍රිය බලාගාර, ස්වාභාවික වායු බලාගාර බවට පත් කිරීම සහ නව ස්වාභාවික වායු පදනම් කරගත් බලාගාර හඳුන්වා දීම තුළින් හරිතාගාර වායු විමෝචන අඩු කිරීමේ උත්සාහයට සහාය දැක්වීම මගින් අංශයේ NDC සඳහා දායක වනු ඇත. වගුව 3-2හි ඇතුළත් වන NDC පහ මගින් 2021-2030 අතර කාලයේ දී හරිතාගාර වායු විමෝචන සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීමට අපේක්ෂා කරන අතර, අවසානයේ 2050 වර්ෂයේ දී බලශක්ති ක්ෂේත්‍රයේ කාබන් උදාසීනභාවයේ ඉලක්කය අත්පත් කර ගැනීම සඳහා රට මෙහෙයවනු ඇත.

3-2 වගුව විදුලිබල (බලශක්ති) අංශයේ NDC

| NDC අංකය | NDC ක්‍රියාමාර්ග |
|---|---|
| 1 | සූර්ය කෝෂ, සුළං, ජල, සහ තිරසර ජෛව ස්කන්ධ පදනම් කරගත් විදුලිබල උත්පාදනය ඉහළ නැංවීම හරහා ජාතික විදුලි ජනන මුසුවට පුනර්ජනනීය බලශක්තියෙන් ලැබෙන දායකත්වය වැඩිදියුණු කිරීම |
| 2 | ජාතික බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහන (EEI&C) මගින් බලශක්ති කාර්යක්ෂම උපකරණ, තාක්ෂණය සහ පද්ධතියේ වැඩිදියුණුකිරීම් ප්‍රවර්ධනය කිරීම හරහා ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම |
| 3 | ඉන්ධන තෙල් භාවිතයෙන් ක්‍රියාත්මක වන, දැනට පවතින සංයුක්ත චක්‍රිය විදුලි බලාගාර ස්වාභාවික වායු භාවිත කරන බලාගාර බවට පරිවර්තනය කිරීම සහ කොන්දේසි සහිත ක්‍රියාමාර්ග වශයෙන් නව ස්වාභාවික වායු බලාගාර ඇති කිරීම (අවශ්‍ය යටිතලපහසුකම් ඇති වූ පසුව) |
| 4 | කොන්දේසි රහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, සම්ප්‍රේෂණයේ සහ බෙදාහැරීමේ ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම (පවතින තත්ත්වයට සාපේක්ෂව 2030 වනවිට හානි අඩුකරගැනීම 0.5%කි) (ඉලක්කය - 2021-2030 කාලය අතර ගිගාවොට් 1848ක බලශක්ති ඉතිරියකි) |
| 5 | කොන්දේසි සහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, තවමත් වාණිජමය පරිණතභාවයට පත්ව නැති සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ප්‍රභව සඳහා නියමු මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා විදුලි පද්ධතියට සහාය ලබාදෙන අනෙකුත් යටිතලපහසුකම් සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකිරීම |

3-3 රූපයේ දැක්වෙන පරිදි විදුලිබල අංශයේ NDC ක්‍රියාත්මක කිරීම තුළින්, කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) තත්ත්-වයට සාපේක්ෂව 25%ක (5%ක් කොන්දේසි රහිතව සහ 20%ක් කොන්දේසි සහිතව) හරිතාගාර වායු විමෝචන අඩුකරග ැනීමක් 2021-2030 කාලසීමාව තුළ අත්පත් කරගත හැකි වෙතැයි අපේක්ෂිතය. මෙම ප්‍රමාණය කාබන් ඩයොක්සයිඩ් හා අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 9,819,000ක් කොන්දේසි රහිතව ද මෙට්‍රික් ටොන් 39,274,000ක් කොන්දේසි සහිතව ද (එකතුව මෙට්‍රික් ටොන් 49,093,000කි) අඩු කිරීමකට සමාන වනු ඇත.

20 SLSEA, Operation Demand Side Management, https://www.energy.gov.lk/ODSM/

මෙම ඇස්තමේන්තුව සකස් කර ඇත්තේ 2013 ලංකා විදුලිබල මණ්ඩලයේ දීර්ඝ කාලීන ජනන ව්‍යාප්ති සැලසුම පාදක අගය ලෙස ගැනීමෙනි. 2022 වර්ෂයේ දීර්ඝ කාලීන ජනන ව්‍යාප්ති සැලසුම ඉදිරිපත් කරන ලද්දේ NDC යාවත්කාලීන කිරීමෙන් පසුව වන අතර, එහි ජනන මුසුවෙහි පුනර්ජනනීය ප්‍රභව පාදක කරගත් වැඩි විදුලිබල ජනනයක් ඇතුළත්ය.




3-3 රූපය විදුලිබල අංශයේ හරිතාගාර වායු විමෝචන ප්‍රක්ෂිප්ත හා විමෝචන අඩුකිරීමේ ඉලක්ක

### 3.2.1 බලශක්ති (විදුලිබල) අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව ලක්ෂණ

2019 ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග[21] සකස් කර ඇත්තේ ලෝකයේ වර්තමාන බලශක්ති ප්‍රවණතා, 7 වන තිරසර සංවර්ධන අභිමතාර්ථය[22] හා ශ්‍රී ලංකාවේ වෙනත් අනාගත අභිලාෂයන් සමඟ සමගාමීවය. එමගින් ප්‍රකාශ කර ඇත්තේ ශ්‍රී ලංකාවේ සාධාරණ සංවර්ධනයක් සඳහා යෝග්‍ය හා දැරිය හැකි බලශක්ති සේවා ලබාගැනීම සඳහා පිරිසිදු, ආරක්ෂිත, තිරසර, විශ්වසනීය හා ආර්ථික වශයෙන් ශක්‍ය වූ බලශක්ති සැපයුමක් භාවිත කරන බවයි. 'බලශක්ති සේවා සඳහා ප්‍රවේශය ලබාදීම' යන්නෙන් මේ ප්‍රතිපත්තිය මගින් අරමුණු කරන්නේ කෘෂිකර්මය, ග්‍රාමීය හා ප්‍රාථමික කර්මාන්ත ආදියේ ඵලදායී විදුලි භාවිතයක් සඳහා අවශ්‍ය උපායමාර්ග හඳුන්වා දීමයි. මෙහි දී කාන්තාවන් හා ළමුන් සඳහා අවධානය යොමුවේ. එසේම කාන්තාවන් බලගැන්වීම සඳහා දියත් කිරීමට නියමිත බලශක්ති කාර්යක්ෂමතාව හා සංරක්ෂණය කේන්ද්‍රීය තේමාව කරගත් ගෘහස්ථ ඵලදායීතා දියුණු කිරීමේ වැඩටහනක් එහි සංක්ෂිප්තව දක්වා ඇත.

හරිතාගාර වායු විමෝචන අවමකිරීමේ දී ද කාන්තාව ප්‍රධාන කාර්යයක් ඉටු කරයි. ඔවුහු පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධකයෝ වෙති. පිරිසිදු උඳුන්, තිරසර දැව ඉන්ධන, ගෘහස්ථ සූර්ය හා ජීව වායු බොහෝ විට කළමනාකරණය කරන්නේ කාන්තාවන් විසිනි. කාර්යක්ෂම බලශක්ති පද්ධති මගින් කාන්තාවන්ට ප්‍රතිලාභ ලැබෙන්නේ ව්‍යවසායකත්වය සහ පවුලේ අය සමඟ ගත කිරීම සඳහා කාලය ලබාදීමෙන් හා අඩු කාබන් පියසටහනක් ඇති කිරීමෙනි.

21 Ministry of Power, Energy and Business Development (August 2019). National Energy Policy and Strategies of Sri Lanka. Gazette Extraordinary 2135/61. https://www.energy.gov.lk/images/resources/downloads/national-energy-policy-2019-en.pdf

22 SDG 7 (දරාගත හැකි මිලතට ඇති, විශ්වසනීය, තිරසර හා නවීන බලශක්ති සැපයුමක් සඳහා ප්‍රවේශය තහවුරු කිරීම)

### 3.2.2 බලශක්ති (විදුලිබල) අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී හෘඝ සැලසුම් හා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ

බලශක්ති අංශයේ ඉහත සඳහන් කරන ලද කාන්තාවන්ගේ තත්ත්වය සලකා බැලීමේ දී, වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සමස්ත අවමකිරීමේ ප්‍රතිඵලයක් සඳහා පරිශීලකයා, නිෂ්පාදකයා හා ව්‍යවසායකයා යන ආකාරවලින් කාන්තාවන්ගේ කාර්යභාරය සඳහා සහාය දීම, පහසුකම් සැපයීම හා ඉහළ නැංවීම වැදගත් බව පෙනේ. NDC ක්‍රියාත්මක කිරීමේ දී. පහත සඳහන් නිර්දේශ මේ සඳහා සලකා බැලීමට යෝජනා කරනු ලැබේ.

I සමස්තඃ

i. අංශයේ NDC ක්‍රියාකාරකම් සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ දී විවිධ බලශක්ති අවශ්‍යතා, පිරිමින් හා කාන්තාවන්ගේ ප්‍රමුඛතා, බලශක්ති උත්පාදනයේ ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් වූ කාර්ය, නිවාසවල බෙදාහැරීම හා භාවිතය, ප්‍රජාව හා වෙළෙඳපොළ වැනි කරුණු සැලකිය යුතුවේ (බලශක්ති අංශය සඳහා, හරිතාගාර වායු විමෝචන අවමකිරීම පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ තක්සේරුවක් හා විශ්ලේෂණයක් සිදුකිරීම හරහා).

ii. අවමකිරීමේ ක්‍රියාකාරකම්වල දී කාන්තාවන්ගේ වැඩි සහභාගීත්වයක් ඉලක්ක කරගනිමින් කාන්තාවන් (i) බලශක්ති සැපයුම්කරුවන් හා (ii) බලශක්ති පරිභෝගිකයන් ලෙස සිදුකරන කාර්යභාරය සැලකිල්ලට ගත යුතු අංශ දෙකකි (වර්තමානයේ දී මේ පිළිබඳව නොපෙනෙන්නේ මනාව එකතු වූ දත්ත නොතිබීම, ප්‍රතිපත්තිමට හිඩැස් හා ඒකාකෘතික බව නිසාය).

iii. බලශක්ති ක්ෂේත්‍රයේ තාක්ෂණ ශිල්පීන්, වෘත්තිකයන් හා කළමනාකරුවන් ලෙස කාන්තාවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැපයීමඃ ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් විද්‍යාඥවරියන්, නිලධාරිනීන්, තාක්ෂණ නිලධාරිනීන් සිටිය යුතු ප්‍රමාණය ගැන සාක්ෂාත් කරගත යුතු ඉලක්ක පිහිටුවීම

iv. NDC සැලසුමේ ප්‍රගති සමාලෝචන හා අධීක්ෂණය සඳහා ස්ත්‍රී පුරුෂ භාවය මත වර්ගීකරණය කර ඇති දත්ත එකතුවක් ඇතුළත්කිරීම, ඉලක්ක දියුණු කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රියාකාරකම් සමාලෝචනය සඳහා දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක, අවමකිරීමේ ප්‍රතිඵල, ආදිය ඇතුළත් කිරීම

II. NDC මගින් හඳුනාගෙන ඇති තිරසර බලශක්ති විකල්ප උත්පාදනයේ දී හා සැපයීමේ දී කාන්තාවන්ගේ සහභාගීත්වය ලබාගැනීමඃ

i. පුනර්ජනනීය බලශක්ති උත්පාදනයේ දී, සැපයීමේ හා සේවා සැපයීමේ වැඩසටහන්වල දී කාන්තාවන් ප්‍රගාමීව ඉලක්ක කරගැනීම හා සහභාගී කරගැනීම. මෙහි දී තනි ව්‍යවසායකයන් හෝ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායවල කොටස්කරුවන් ලෙස විය හැකිය (සූර්ය කෝෂ පද්ධති. තිරසර ජෛව ස්කන්ධ නිෂ්පාදනය හා සේවා)

ii. තිරසර බලශක්ති තාක්ෂණය පිළිබඳව පුහුණු සැපයීමේ දී කාන්තාවන් ඉලක්ක කරගැනීම හා ඇතුළත් කර ගැනීම. මෙහි දී තිරසර බලශක්ති නිෂ්පාදන ව්‍යවසායකයන් හා භාවිත කරන්නවුන් ලෙස ඔවුන්ගේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ණය සැපයීම, සහන ලබාදීම

III. ව්‍යාපාර/ ජීවනෝපාය සඳහා, ආහාර පිසීම හා ආලෝකය සඳහා පිරිසිදු බලශක්ති ප්‍රභව භාවිත කිරීම සඳහා කාන්තාවන්ට හැකියාව ඇති කිරීම:

i. අවමකිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස දැරිය හැකි, ප්‍රවේශ විය හැකි, පිරිසිදු ඉන්ධන හා කාර්යක්ෂම බලශක්ති තාක්ෂණය භාවිත කිරීම ප්‍රගාමී ලෙස ප්‍රවර්ධනය කිරීම: පොසිල ඉන්ධන, ජීව වායුව හා ජෛව ස්කන්ධ ආහාර පිසීම සඳහා යොදාගැනීම අවම කිරීම සඳහා පිරිසිදු බලශක්ති විකල්ප හඳුන්වා දීම හා ප්‍රවර්ධනය, ව්‍යවසාය/ ජීවනෝපාය සහාය ක්‍රියාකාරකම් සඳහා පිරිසිදු බලශක්ති ප්‍රභව තාක්ෂණය යොදාගැනීම. සත්‍ය වශයෙන් ග්‍රාමීය ප්‍රජාවගේ බහුතරයකට හා ක්ෂුද්‍ර හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් බහුතරයකට ලබාගත හැකි හා ප්‍රවේශ විය හැකි බලශක්ති ප්‍රභවය වන්නේ ජෛව ස්කන්ධයයි. මේ අංශවල කාන්තාවන්ගේ සහභාගීත්වය කැපී පෙනෙන අතර, උත්පාදනයේ සිට අවසන් භාවිතය දක්වා සමස්ත අගය දාමය තුළ මෙය දැකිය හැකිය.

(කරුණාකර ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමාජ අන්තර්ගතකරණය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂිත ක්‍රියාමාර්ග සඳහා 3.2.3 වගුව බලන්න)

### 3.2.3 විදුලිබල අංශයේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - සූර්ය කෝෂ, සුළං, ජල, සහ තිරසර ජෛව ස්කන්ධ පදනම් කරගත් විදුලිබල උත්පාදනය වැඩිකිරීම හරහා ජාතික විදුලි ජනන මුසුවට පුනර්ජනනීය බලශක්තියෙන් ලැබෙන දායකත්වය වැඩිදියුණු කිරීම (ඉලක්කය: මෙගාවොට් 3,867ක අමතර පුනර්ජනනීය බලශක්ති ධාරිතාවයක් පවතින තත්ත්ව යටතේ සංවර්ධනය කිරීම හා ඉන් මෙගාවොට් 950ක් කොන්දේසි රහිත පදනමින් ද මෙගාවොට් 2,917ක් කොන්දේසි සහිත පදනමින් ද වනු ඇත)**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1 සුළං, සූර්ය (පියැසි මත, කුඩා පරිමාණ සහ මහා පරිමාණ සූර්ය කෝෂ), ජෛව ස්කන්ධ, විශාල සහ කුඩා පරිමාණ ජලවිදුලිබලාගාර | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.1.1 - සුළං බලාගාර ස්ථාපිත කිරීම | SLSEA, CEB | MoP&E, CEA, පෞද්ගලික ආයෝජනයන්, ඉඩම් හාරකරුවන් | ස්ථාපිත MW ප්‍රමාණය | CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | 178 MW | 865 MWක් එකතු කිරීම (කොන්දේසි රහිතව 128 MW, කොන්දේසි සහිතව 737 MW) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |
| 1.1.2 - පියැසි මත හා පොළව මත සවි කළ සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම | SLSEA, CEB | MoP&E, LECO, සූර්ය පැනල සේවා සපයන්නන්, පෞද්ගලික ආයෝජකයන්, ඉඩම් හාරකරුවන් CEA, | ස්ථාපිත MW ප්‍රමාණය | CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | 425 MW | 2,263 MWක් එකතු කිරීම (කොන්දේසි රහිතව 335 MW, කොන්දේසි සහිතව 1,928 MW) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |
| 1.1.2.1 පියැසි මත සූර්ය පැනල පද්ධති සවිකිරීමේ වැඩසටහනේ නියැලි කාන්තාවන් දිරිමත් කිරීම හා ගණන ඉහළ නැංවීම | SLSEA | MoP&E, LECO, සූර්ය පැනල සේවා සපයන්නන්, පෞද්ගලික ආයෝජකයන් | පියැසි මත සූර්ය පැනල සවිකිරීමේ වැඩසටහනට සම්බන්ධ කාන්තාවන් | කාන්තාවන්ගේ සහභාගීත්වය හා වැඩසටහනේ නියැලෙන කාන්තාවන් ප්‍රමාණය පිළිබඳ දත්ත සමග CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | දළ වශයෙන් කාන්තාවන් 200ක් පමණ (10000කින්) (2%) | 2% to 5% දක්වා ඉහළ යෑම | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.a, 5.b, 5.c, 7.2, 13.1, 13.2 |
| 1.1.3 - තිරසර ජෛව ස්කන්ධ සම්පත් භාවිත කරමින් විදුලි ජනනය | SLSEA | MoP&E, MoE, MoLR, CEA, MASL, LAs, ඉඩම් හාරකරුවන් | ස්ථාපිත MW ප්‍රමාණය | CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | 50 MW | 65 MWක් එකතු කිරීම (කොන්දේසි රහිතව 10 MW, කොන්දේසි සහිතව 55 MW) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.1.3.1. විදුලි බලාගාරවලට තිරසර ජෛව ස්කන්ධ සැපයීම සඳහා කාන්තාවන් දිරිමත් කිරීම | SLSEA | MoP&E, MoE, MoLR, CEA, MASL, LAs, ඉඩම් හාරකරුවන් | කාන්තා සැපයුම්කරුවන් ගණන | | කාන්තා සැපයුම් කරුවන් පිළිබඳ දත්ත සමග CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | මූලික දත්ත 2023 දී SLSEA මගින් සැපයිය යුතුය | 2023 දී SLSEA මගින් ඉලක්කය ඇති කළ යුතුය | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.5 |
| 1.1.3.2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත එකතු කිරීම සබලකිරීමට ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | SLSEA | CEB, LECO | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත එකතු කිරීමේ ආයතනික යාන්ත්‍රණයක් | | CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | 0 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත එකතු කළ හැකි ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | | | √ | | | | | | | | 7.5 |
| 1.1.4 - මහා පරිමාණ හා කුඩා පරිමා ජල විදුලි බලාගාර ස්ථාපිත කිරීම | SLSEA, CEB | MoP&E, CEA, MASL, LAs, ඉඩම් හාරකරුවන් | ස්ථාපිත MW ගණන | | CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | 410 MW | මහා පරිමාණ ජලවිදුලි බලාගාර වලින් එකතු කළ ගනන කොන්දේසි රහිතව 31 MW. කුඩා ජලවිදිලි බලාගාර කොන්දේසි රහිතව 20 MW, කොන්දේසි සහිතව 10 MW (මුළු කුඩා ජලවිදුලි බලාගාර 130 MW) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |
| 1.2 - පුනර්ජනනීය විදුලිය ඒකාබද්ධ කළ හැකි සම්ප්‍රේෂණ ජාල යටිතල පහසුකම් දියුණු කිරීම | CEB | MoP&E, CEB | පද්ධති යටිතල පහසුකම් දියුණු කිරීම/ උත්ශ්‍රේණිගත කිරීම | | CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය | 3,160 km | 480 km (REDMAP යටතේ ඉතා සවිස්තර ඉලක්කයක් විය හැකිය) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.b |

**NDC 2 - ජාතික බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් (EEI&C) මගින් බලශක්ති කාර්යක්ෂම උපකරණ, තාක්ෂණයන් සහ පද්ධති වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම හරහා ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1 - කොන්දේසි රහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, තාපදීප්ත විදුලි බුබුළු භාවිතය ක්‍රමක්‍රමයෙන් ඉවත් කිරීම ඔස්සේ ගිගාවොට් පැය 2,603ක බලශක්තියක් ඉතිරි කරගැනීම | SLSEA | CEB, MoP&E, SLSI | ඉතිරිවන GWh ගණන | | SLEB | 14 GWh | 2,603 GWh | √ | √ | √ | √ | √ | | | | | | 7.3 |
| 2.2 - කොන්දේසි සහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, කාර්යක්ෂම ආලෝකකරණය, විදුලි පංකා, ශීතකරණ, සහ සිසිලන හඳුන්වාදීම ඔස්සේ ගිගාවොට් පැය 5,189ක බලශක්තියක් ඉතිරි කරගැනීම | SLSEA | CEB, MoP&E, SLSI, EE සේවා සපයන්නන්, පෞද්ගලික අංශය | ඉතිරිවන GWh ගණන | | SLEB | 724 GWh | 5,189 GWh<br>(2023-401)<br>(2024-600)<br>(2025-794)<br>(2026-1,051)<br>(2027-1,549)<br>(2028-1,487)<br>(2029-1,737)<br>(2030-1,737) | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.3 |
| 2.3 - බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි නීති සංග්‍රහයක් අනිවාර්ය පදනමින් ක්‍රියාත්මක කිරීම | SLSEA | MoP&E, UDA, LAs, CIDA, වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය, IESL, GBCSL, ඉදිකිරීම් සමාගම් | ස්ථාපිත කරන සංඛ්‍යාව | | ගොඩනැගිලි අයදුම්පත් පිළිබඳ SLSEA වාර්තා | 425 MW | 5,189 MW<br>(2023-401)<br>(2024-600)<br>(2025-794)<br>(2026-1,051)<br>(2027-1,549)<br>(2028-1,487)<br>(2029-1,737)<br>(2030-1,737) | | √ | | | | | | | | | 7.3 |
| 2.4 - අධිකාර්යක්ෂම මෝටර (HEM), විචල්‍ය සංඛ්‍යාත ධාවක (VFD), ත්‍රිත්ව-ජනනය, සහ අනෙකුත් බලශක්ති කාර්යක්ෂම ක්‍රියාමාර්ග කර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය කිරීම | SLSEA | CEB, MoP&E, MoI, EE , සේවා සපයන්නන්, වාණිජ මණ්ඩලය හා කර්මාන්ත සංවිධාන (CC&IAs), පෞද්ගලික ආයෝජකයන් | ඉතිරිවන GWh ගණන | | SLEB / SLSEA සංඛ්‍යාලේඛන තොරතුරු | HEM - 775 GWh<br><br>VFD - 590 GWh (Energy NAMA<br><br>ව්‍යාපෘතිය මගින් පහසුකම් සපයන ලද)<br><br>කාර්යක්ෂම සිසිලන - 1,300 GWh | 466 GWh<br>(2024-10)<br>(2025-20)<br>(2026-50)<br>(2027-86)<br>(2028-100)<br>(2029-100)<br>(2030-100) | | | | √ | √ | √ | √ | √ | √ | √ | 7.3 |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.5 ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණයේ (DSM) පියවරක් ලෙස සේවා සපයන්නන් හා බලශක්ති පරිශීලනය කරන්නන් ලෙස කාන්තාවන් සහභාගි කරගැනීම සඳහා විශේෂිත ඉලක්කගත ක්‍රියාකාරකම් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම | SLSEA | CEB, MoP&E, SLSI | විශේෂිත ක්‍රියාකාරකම්වලදී අවධානය යොමු-වන, ඉලක්ක වන කාන්තාවන් ගණන<br><br>ප්‍රතිලාභී කාන්තාවන් ගණන | | ප්‍රගති වාර්තා, කාන්තා සේවා සපයන්නි-න් ගණන හා බලශක්ති භාවිත කරන්නියන් ගණන | මූලික දත්ත ස්ථාපිත කිරීම කර්මාන්ත සමීක් ෂණයකින් කළ යුතුය | වර්ෂයකට කාන්තාවන් 100ක් | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.8, 7, 5 |

| NDC 3 - දැනට පවතින ඉන්ධන තෙල් භාවිතයෙන් ක්‍රියාත්මක වන සංයුක්ත චක්‍රිය විදුලි බලාගාර ස්වාභාවික වායු භාවිත කරන බලාගාර බවට පරිවර්තනය කිරීම සහ කොන්දේසි සහිත ක්‍රියාමාර්ග ලෙස නව ස්වාභාවික වායු බලාගාර ඇති කිරීම (අවශ්‍ය යටිතලපහසුකම් ඇති වූ පසුව) | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1 - ඉන්ධන තෙල් භාවිතයෙන් බලශක්තිය නිපදවන, දැනට පවතින මෙගාවොට් 600ක සංයුක්ත චක්‍රිය විදුලි බලාගාර ස්වාභාවික වායු බලාගාර බවට පරිවර්තනය කිරීම | CEB | MoP&E, MoE, MoF | පරිවර්තනය කළ MW ගණන | | CEB සංඛ්‍යා-ලේඛන සංග්‍රහය | 0 MW | 600 MW | | | | | √ | √ | √ | √ | √ | √ | 13.1 |
| 3.2 - පවතින තත්ත්ව යටතේ ගල්අඟුරු බලශක්තිය නිපදවීමට ඇතිකිරීම සඳහා බලාපොරොත්තු වන බලාගාර වෙනුවට නව සංයුක්ත චක්‍රිය බලාගාර ඇතිකිරිම සහ ස්වා-භාවික වායුවලින් ක්‍රියාත්මක වන මෙගාවොට් 700ක පමණ ගෑස් ටර්බයින ඇතිකිරීම | CEB | MoP&E, MoE, MoF, පෞද්ගලික අංශය (IPPs) | ස්ථාපිත MW ගණන | | CEB සංඛ්‍යා-ලේඛන සංග්‍රහය | 0 MW | 830 MW | | | | | √ | √ | √ | √ | √ | √ | 13.1 |

NDC 4 - කොන්දේසි රහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, සම්ප්‍රේෂණයේ සහ බෙදාහැරීමේ ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම (පවතින තත්ත්වයට සාපේක්ෂව 2030 වනවිට හානි අඩුකර ගැනීම 0.5%කි) (ඉලක්කය - 2021-2030 කාලය අතර ගිගාවොට් පැය 1848ක බලශක්තියක් ඉතිරි කිරීම)

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1 - සම්ප්‍රේෂණ ජාලය වැඩිදියුණු කිරීම, පවතින සම්ප්‍රේෂණ මාර්ගවල නැවත-සන්නායක සවි කිරීම, සහ ප්‍රතික්‍රියක විදුලි අනුපූරක ක්‍රියාකාරකම් සිදුකිරීම | CEB | MoP&E, MoF | ඉතිරි වූ GWh ගණන | | CEB සංඛ්‍යා-ලේඛන සංග්‍රහය | 302 GWh | 1,848 GWh | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.b |
| 4.2 - කේවල සන්නායකවල සිට කළඹ සන්නායක දක්වා පරිවර්තනය සිදුකිරීම, විබර තුලනය සහ බෙදාහැරීමේ ජාලයේ ට්‍රාන්ස්ෆෝමර ස්ථාපිත කිරීම මගින් කම්බි දිග අඩුකිරීම | CEB | MoP&E, MoF | ඉතිරි වූ GWh ගණන GWh saved | | CEB සංඛ්‍යා-ලේඛන සංග්‍රහය | ඉහත වාර්තා වී ඇති පරිදි | GWh ඉලක්කය විබර අඩුවීමේ අධ්‍යයනයකින් ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.b |

NDC 5 - කොන්දේසි සහිත ක්‍රියාමාර්ගයක් වශයෙන්, තවමත් වාණිජමය පරිණත වී නැති සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව (NCRE) සඳහා නියමු මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා විදුලි පද්ධතියට සහාය ලබාදෙන අනෙකුත් යටිතලපහසුකම් සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1 - වාණිජ පරිමාණයෙන් ඵලදායී තත්ත්වයට තවමත් ළඟා වී නොමැති, භූතාපජ විදුලි පරිවර්තනය, සාගර තාප ශක්ති පරිවර්තනය (OTEC), සාගර බලශක්තිය (රළ) ආදි නව පුනර්ජනනීය බලශක්ති (NRE) ප්‍රභව සඳහා නියමු පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම | SLSEA | CEB, MoP&E, ශාස්ත්‍රඥයන් | පර්යේෂණ කර නියමු ව්‍යාපෘති සිදු කළ විදේශීය තාක්ෂණයන් ගණන | | CEB සංඛ්‍යා-ලේඛන සංග්‍රහය හා SLEB | මූලික අධ්‍යයන සිදුවෙමින් පවතී | තාක්ෂණයන් 5ක් නියමු ව්‍යාපෘති ලෙස සිදුකිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.a |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.2 - පද්ධතියට සවිරාම පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා සහය ලබාදීම පිණිස පාරිභෝගික පාර්ශ්වයේ (BtM) සහ විදුලි පද්ධති පරිමාණයේ බලශක්ති ගබඩාකරණ විසඳුම් (BES) වැනි නියමු මට්ටමේ ගබඩාකරණ පද්ධති සහ ජනන ගබඩාකරණ විදුලි බලාගාර සංවර්ධනය කිරීම | CEB, SLSEA | MoP&E, ශාස්ත්‍රඥයන්, පෞද්ගලික අංශය | ස්ථාපිත කර ඇති ප්‍රමාණය/ ස්ථාපිත MW ගණන, MWh ගබඩා ධාරිතාව | CEB සංඛ්‍යාලේඛන සංග්‍රහය හා SLEB | ජනන ගබඩාකරණ විදුලි බලාගාර පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදුවෙමින් පවතී | 600 MW ජනන ගබඩාකරණ ජල විදුලි බලාගාර (PSPP) ස්ථාපිත කිරීම,<br>100 MW බලශක්ති ගබඩාකරණ විසඳුම් (BESS) ස්ථාපිත කිරීම<br>(ජාල පද්ධති සහාය සේවා සඳහා) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.a |
| 5.3 - පද්ධතියට සවිරාමව පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා සහය ලබාදෙන සුහුරු විදුලි පද්ධති තාක්ෂණය වැනි තොරතුරු සන්නිවේදන තාක්ෂණ මැදිහත්වීම් හඳුන්වා දීම | SLSEA | CEB, MoP&E, ශාස්ත්‍රඥයන් | මැදිහත්වීම් ගණන | SLSEA වාර්ෂික වාර්තාව | එක් සුහුරු කුඩා විදුලි පද්ධතියක් ක්‍රියාත්මක වේ (නකල්ස් හි ගලමුදුණ ගමෙහි) | නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මැදිහත්වීම් 4ක් හඳුන්වා දීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.a |
| 5.4 - අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව තක්සේරුවක් හා විශ්ලේෂණයක් සිදු කර, අංශයේ ඒ සම්බන්ධව ඇති ප්‍රධාන ගැටලු හඳුනාගැනීම හා මූලික දත්ත ස්ථාපිත කිරීම | MoP&E | SLSEA, CEB, PUCSL | අංශයේ ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රධාන ගැටලු හඳුනාගැනීම<br><br>ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී අවමකිරීමේ ක්‍රියාකාකරකම් හඳුනාගැනීම/ප්‍රවර්ධනය පිළිබඳ මූලික දත්ත | අංශයේ දැනට ඇති ස්ත්‍රී පුරුෂ භාව ප්‍රතිචාරී අවමකිරීමේ ක්‍රියාකාරකම් හඳුනාගැනීම හා ප්‍රවර්ධනය පිළිබඳ නිර්දේශ සමඟ ස්ත්‍රී පුරුෂ සමාජභාව තක්සේරු ලේඛනයක් ඉදිරිපත් වීම | 0 | යාවත්කාලීන කළ තොරතුරු සමඟ බලශක්ති අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තක්සේරුවක් | | | √ | | | | | | | | 5.a, 5.b, 5.c, 7.1, 7.2, 7.3, 13.1, 13.2 |
| 5.4.1 - අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු පිළිබඳව ප්‍රධාන සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම්/ ආයතන දැනුම්වත් භාවය හා ධාරිතාව ගොඩනැගීම | MoP&E | අන්තර්ජාතික ආයතන | සැලසුම්කිරීමේ හා තීරණ ගැනීමේ මට්ටම තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුම්වත්භාවය | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු හා ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීම ගැන පිළිබඳව පවත්වනු ලබන දැනුම්වත්කිරීමේ හා පුහුණු වැඩසටහන් ගණන<br><br>පුහුණු වූ නිලධාරීන් ගණන | දැනුම්වත් කිරීම් සිදුකරමින් තිබේ | MoP&Eට අයත් සියලු ආයතන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී කිරීම | | | | √ | √ | √ | √ | √ | √ | √ | 5.a, 5.b, 5.c, 7.1, 7.2, 7.3, 13.1, 13.2 |

## 3.3 ප්‍රවාහන අංශය

මගී ප්‍රවාහනය මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය ගත්ත ද, ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අංශයේ ප්‍රමුඛස්ථානයක් ගන්නේ මගී කිලෝමීටර් ප්‍රමාණයෙන් 95%ක් හා භාණ්ඩ කිලෝමීටර් ප්‍රමාණයෙන් 99%කටත් වැඩි ප්‍රමාණයක් සඳහා දායක වන මහාමාර්ග ප්‍රවාහනයයි. මගී ගමනාගමනය සඳහා ඇති ඉල්ලුමේ ඉහළම අගය වාර්තා වූයේ 2019 වර්ෂයේ දී වන අතර, එය මගී කිලෝමීටර් බිලියන 231.5ක් පමණ විය. කෙසේ වෙතත් COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන සීමා නිසා මේ ඉල්ලුම 2020 වර්ෂයේ දී මගී කිලෝමීටර් බිලියන 185.5ක් දක්වා අඩු විය. මෙම අඩුවීම මගීන් පොදු ප්‍රවාහනයෙන් ඈත් වීම හා සම්බන්ධිත විය. 2021 වර්ෂයේ දී මෙය මගී කිලෝමීටර් බිලියන 191.8 දක්වා ඉහළ ගිය ද, එය තවමත් 2019 අගයට වඩා අඩුය. පොදු ප්‍රවාහන මාදිලි (බස් රථ හා දුම්රිය) මගින් 2019 වර්ෂයේ දී මගීන්ගේ 40.6%ක් සඳහා සේවා සැපයුන ද, එය 2020 දී එය 36.3%ක් හා 2021 දී 33.0%ක් විය. මීට සමගාමීව 2019, 2020 හා 2021 දී මෝටර් බයිසිකල්: 8.0%, 9.1%, 9.1%, ත්‍රිරෝද රථ: 19.9%, 21.8%, 22.6% හා මෝටර් කාර් රථ 17.6%, 18.5%, 19.5% ලෙස වෙනස් විය[23]. 2021 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වාහන ප්‍රමාණය මිලියන 8.33ක් පමණ වන අතර, සක්‍රිය වාහන ඇණිය (වාර්ෂික වාහන ආදායම් බලපත්‍ර දත්ත අනුව) මිලියන 5.53ක් වේ. ඉන් 54.30%ක් යතුරුපැදි ද 18.14%ක් ත්‍රිරෝද රථ ද, 13.04%ක් මෝටර් කාර් ද, 0.94%ක් බස්රථ ද විය[24].

පසුගිය වර්ෂ ගණනාවක කාලයේ දී පොදු ප්‍රවාහන මාදිලිවල ක්‍රමික පිරිහීමක් දැකිය හැකි අතර, 2005 වර්ෂයේ දී මගී ප්‍රවාහනයෙන් 70%ක් වූ පොදු ප්‍රවාහනය 2015 වන විට 50%ක් දක්වා අඩු විය. කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) තත්ත්වය යටතේ මගී ප්‍රවාහනය සඳහා පොදු ප්‍රවාහනයේ දායකත්වයේ කොටස තවදුරටත් අඩුවනු ඇත. පොදු ප්‍රවාහන විකල්ප වැඩිදියුණු කිරීම සඳහා ගත් ආයෝජන හා ප්‍රයත්න ගණනාවක් තිබුණ ද, පොදු ප්‍රවාහන සේවාවේ ගුණාත්මක බව හා උපයෝග්‍යතාව අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුය. එය සහ ඉහළ යන ඒක පුද්ගල ආදායම නිසා පොදු ප්‍රවාහන සේවා භාවිත කරන මගීන්ගේ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී පෞද්ගලික වාහන ප්‍රමාණයේ වැඩි වීමක් ඇති වී තිබේ. ප්‍රවාහන අංශය ද ආනයනය කරනු ලබන පෙට්‍රෝලියම් තෙල් වැඩි ප්‍රමාණයක් භාවිත කරයි. 2021 වර්ෂයේ දී මුළු බොරතෙල් ආනයනය මෙට්‍රික් ටොන් 1,182,000ක් (රු. බිලියන 123.9ක්) වූ අතර, මුළු පිරිපහදු කළ තෙල් ආනයනය මෙට්‍රික් ටොන් 4,553,000ක් (රු. බිලියන 564.7) පමණ විය[25] . ශ්‍රී ලංකාව යුරෝ 4 විමෝචන ප්‍රමිතීන් සම්මත කර, රථවාහන විමෝචන පරීක්ෂා කිරීමේ වැඩසටහන (VET) අඛණ්ඩව සිදුකර ඇතත්, දැනට ධාවනයේ ඇති අකාර්යක්ෂම වාහන සංඛ්‍යාවේ ප්‍රමාණය සැලකිය යුතු ලෙස විශාල බැවින් එය වැඩි හරිතාගාර වායු විමෝචනයක් සඳහා හේතු වී ඇත.

නාගරික ප්‍රදේශවල පෞද්ගලික වාහන භාවිතය වැඩිවීම හේතුවෙන් රථවාහන තදබදය, මාර්ග අනතුරු සහ වායු දූෂණය ඉහළ ගොස් ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයට, පරිසරයට හා සමාජයට සැලකිය යුතු අහිතකර බලපෑම් ද ඇති වී තිබේ. දුම්රිය හෝ ජලමාර්ග ආශ්‍රිත ප්‍රවාහන මාදිලි වෙනුවට මහාමාර්ග ගමනාගමනය මතම වැඩි වශයෙන් යැපීම සමස්ත බලශක්ති පරිභෝජනය හා වායු දූෂණය ඉහළ යෑම සඳහා හේතු වී ඇත. අතීතයේ දී මගී හා භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයක් ඉටු කළත්, ඒ සඳහා දුම්රිය මගින් ලබාදෙන දායකත්වය කාලයත් සමග අඩුවී තිබේ (2015 දී 4.3%ක් හා 2021 දී 1.1%ක් ලෙස). නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල රථවාහන තදබදය විශාල ප්‍රමාණයකින් අඩුකළ හැකි අඩු වියදම් මහා පරිමාණ ප්‍රවාහන මාදිලියක් ලෙස සිය සේවාව වර්ධනය කිරීමේ විභවය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇත. එසේම, මෝටර් නොවන ප්‍රවාහන ක්‍රම ඉතා අඩු අතර, ග්‍රාමීය ප්‍රදේශවල ද එය අඩුවෙමින් පවතියි. බස් රථ හෝ දුම්රිය කරා සෘජු ප්‍රවේශයක් නොමැති ප්‍රජාව සඳහා ත්‍රිරෝද රථ, පාසල් හා කාර්යාල ප්‍රවාහන සේවා වැන් රථ වැනි වාහන මගින් සේවා සපයනු ලබයි. අධිවේගී මාර්ග, වාහන ගාල්කර පොදු ප්‍රවාහන මාධ්‍යයක ගමන් කිරීම හෙවත් 'පාර්ක් ඇන්ඩ් රයිඩ්' පහසුකම්, බහුමාදිලි ප්‍රවාහන මධ්‍යස්ථාන වැනි මෑත කාලීන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් මගින් පරිසරයට සහ ආර්ථිකයට ධනාත්මකව දායක වන අතර විමෝචන පියසටහන අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

23 NTC, National Transport Statistics 2022, National Transport Commission (NTC), [Online]. Available: https://www.ntc.gov.lk/corporate/pdf/2022/statistics_Report/stat_2022_EN.pdf

24 CBSL, Chapter 2: Economic and Social Infrastructure, Economic and Social Statistics of Sri Lanka 2021, Volume XLIII, Central Bank of Sri Lanka (CBSL), July 2021, [Online]. Available: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/ess_2021_economic_and_social_infrastructure_e.pdf

25 CBSL, Chapter 1: National Output, Expenditure and Income, Economic and Social Statistics of Sri Lanka 2022, Central Bank of Sri Lanka (CBSL)



වර්තමාන ආර්ථික අර්බුදය මගින් ද ප්‍රවාහන අංශය කෙරේ සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබෙන අතර, මේ සඳහා වාහන ආනයනයේ සීමා හා පෙට්‍රෝලියම් ඉන්ධන නිකුත් කිරීම පාලනය හා අභ්‍යන්තර දහන එන්ජින් වාහන ආනයනය තහනම් කිරීම හේතු වී තිබේ. විදුලි වාහන ආනයනය පහසු කර තිබීම හා වෙනත් ප්‍රවර්ධනාත්මක වැඩසටහන් මගින් විද්‍යුත් සංචලතාවයේ සැලකිය යුතු වෙනසක් ඇති වෙතැයි අපේක්ෂා කරනු ලබන්නේ බැටරි ආරෝපණය සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදාගැනීම ඒකාබද්ධ කිරීම හරහාය. ශ්‍රී ලංකාව තුළ අධිවේගී ආරෝපණ මධ්‍යස්ථාන 60ක් පමණ ඇති අතර, ඒ වැඩි වශයෙන් කොළඹ නගරයේ වන අතර වෙනත් ප්‍රධාන නගර කීපයක ද මේවා ඇත. මෙයින් හතක් පමණ පවත්වාගෙන යනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් වන අතර ඉතිරි මධ්‍යස්ථාන පෞද්ගලික අංශයේ සංවිධාන මගින් මෙහෙයවනු ලැබේ. කෙසේ වෙතත්, නව විදුලි වාහන නොමැති නිසා සහ පවත්නා වාහන ඇණියේ අඩු ප්‍රමාණය නිසා පෞද්ගලික අංශය මේ ජාලය ව්‍යාප්ත කිරීමට සැලසුම් නොකරයි. මීට පෙර ක්‍රියාත්මක වූ ආරෝපණ මධ්‍යස්ථාන සමහරක් වසා දමා හෝ පාඩු පිට පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, ආරෝපණ මධ්‍යස්ථාන දියුණු කරන ඇතැම් දේශීය නිෂ්පාදකයන් ඔවුන්ගේ නිෂ්පාදන ආසන්න රටවලට අපනයනය කිරීම ආරම්භ කර ඇත්තේ වඩා වැඩි වාණිජ විභවයක් ඒ රටවල ඇති නිසාය. මේ අතර, සුනිත්‍ය බලශක්ති අධිකාරිය සකස් කර ඇති යෝජනාවක් අනුව සූර්ය පැනල භාවිත කරමින් මෙවැනි ආරෝපණ මධ්‍යස්ථාන සෑම දිස්ත්‍රික්කයකම එක බැගින් ඇති කළ හැකිය. කෙසේ වෙතත් මූල්‍ය පහසුකම් නොමැති නිසා මේ යෝජනාව තවමත් ක්‍රියාත්මක වී නොමැත.

මෙම සන්දර්භය තුළ යාවත්කාලීන කරන ලද ප්‍රවාහන අංශයේ NDC සකස් කර ඇත්තේ වැළැක්වීම-මාරුව-වැඩිදියුණුව (Avoid-Shift-Improve) නම් සංකල්පමය රාමුව යටතේය. මෙහි දී දේශීය තත්ත්වය හා ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳව සුදුසු පරිදි සලකා බලනු ලැබේ. මෙහි දී වැළැක්වීම යනුවෙන් අදහස් වන්නේ ප්‍රවාහනය හා පොසිල ඉන්ධන භාවිතයට ඇති අවශ්‍යතාව අඩුකිරීම සඳහා භූමි පරිහරණය, සමාජ හා ආර්ථික ක්‍රියාකාරකම් සංවිධානය කිරීමය. මාරුව යන්නෙන් අදහස් වන්නේ එක් ගමනක් සඳහා වන ඉන්ධන පරිභෝජනය අඩු කිරීම සඳහා පොදු ප්‍රවාහනය හා මෝටර් නොවන ප්‍රවාහනය වැනි පරිසර හිතකාමී ප්‍රවාහන මාදිලි භාවිතය වෙත යොමු වීමයි. වැඩිදියුණුව යන්නෙන් අදහස් වන්නේ දියුණු තාක්ෂණය හා පිරිසිදු ඉන්ධන භාවිතය හා මෝටර් වාහන මෙහෙයවීම ප්‍රශස්ත කිරීම මගින් වාහන කිලෝමීටරයකට භාවිත වන බලශක්තිය හැකි තරම් අඩු කිරීමයි[26].

මේ අනුව යාවත්කාලීන කළ NDC මගින් ප්‍රවාහන අංශයේ පද්ධති කාර්යසාධනය, ගමන් කාර්යක්ෂමතාවය හා වාහනයේ කාර්යසාධනය ඒකාබද්ධ ආකාරයකින් වැඩි දියුණු කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මෙහි දී දුම්රිය, බස් රථ ඇතුළත් පොදු ප්‍රවාහනය නැවත පණගැන්වීම හා දුම්රිය, මාර්ග, ජල මාර්ග ප්‍රවාහනය අතර දියුණු කළ අන්තර්මාදිලි සම්බන්ධතාවය දියුණු කිරීම සිදුකිරීම ඇතුළත්ය. එසේම බලශක්ති කාර්යක්ෂමතාව/ ඉන්ධන පිරිමැස්ම වැඩි දියුණු කරමින්, විදේශ විනිමය ඉතිරි කරමින්, හරිතාගාර වායු විමෝචන අඩුකිරීමට හා ඊට අමතරව රටේ ආර්ථිකයට ද, දේශීය හා ගෝලීය වායු දූෂණය අඩු කිරීමට ද දායක වේ. 3-3 වගුව මගින් දැක්වෙන්නේ ප්‍රවාහන අංශයේ විමෝචන අඩුකිරීම සඳහා යෝජනා කර ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග වන අතර ඊට අදාළ හරිතාගාර වායු විමෝචන අඩුකිරීමේ ප්‍රක්ෂේපණ 3-4 රූපයේ ඉදිරිපත් කර තිබේ.

26 GIZ, “Sustainable Urban Transport: Avoid-Shift-Improve (A-S-I)”, Transformative Urban Mobility Initiative (TUMI), German Corporation for International Cooperation GmbH (GIZ), March 2019, [Online]. Available: https://www.transformative-mobility.org/assets/publications/ASI_TUMI_SUTP_iNUA_No-9_April-2019.pdf

3-3 වගුව ප්‍රවාහන අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | ප්‍රවාහන අංශයේ පද්ධති දියුණුකිරීම |
| 2 | පොදු මගී ප්‍රවාහනය ප්‍රවර්ධනය |
| 3 | භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම ක්‍රමවලට මාරු කිරීම |
| 4 | මගී ප්‍රවාහනය සඳහා වේගවත් ප්‍රවාහන මාධ්‍ය |
| 5 | මෝටර් නොවන ප්‍රවාහන මාදිලි ප්‍රවර්ධනය |
| 6 | පොදු ප්‍රවාහනය ප්‍රවර්ධනය සඳහා බදු හා වෙනත් උපකරණ හඳුන්වා දීම |
| 7 | අභ්‍යන්තර ජල ප්‍රවාහන මාදිලි හඳුන්වාදීම |
| 8 | උපනගර දුම්රිය නවීකරණය හා උත්ශ්‍රේණිගත කිරීම |
| 9 | විද්‍යුත් සංචලනය හා දෙමුහුම් වාහන ප්‍රවර්ධනය |
| 10 | වාහක ඇණියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම |
| 11 | මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය |
| 12 | සමුද්‍රීය අංශයේ හරිතාගාර වායු විමෝචන අඩු කිරීම |
| 13 | සහයෝගී ප්‍රතිපත්ති රාමුවක් හා ක්‍රියාකාරකම් |

2021 සිට 2030 දක්වා කාලය තුළ, යාවත්කාලීන කළ NDC ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රවාහන අංශයේ හරිතාගාර වායු විමෝචන කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) තත්ත්වයට සාපේක්ෂව 4.0%කින් අඩුකරගැනීමට (කොන්දේසි රහිතව 1.0% සහ කොන්දේසි සහිතව 3.0%ක්) හැකිවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මෙය එම කාලසීමාව සඳහා ඇස්තමේන්තු කළ කාබන් ඩයොක්සයිඩ් සහ එවැනි අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 1,337,000 ක් කොන්දේසි රහිතව ද, මෙට්‍රික් ටොන් 4,011,000 ක් කොන්දේසි සහිතව ද (එකතුව මෙට්‍රික් ටොන් 5,348,000 කි) අවමකිරීමකට සමාන වේ (3-4 රූපය). මෙහි දී සඳහන් කළ යුතු කරුණක් වන්නේ, මේ දක්වා ක්‍රමානුකූල වාර්තාකරණ/ ගණන්තැබීම් ක්‍රමවේදයක් නොමැති වීම නිසා ගණන් බැලීම අසීරු වන විවිධ මුලපිරීම්වලින් මීට අතිරේක වූ විමෝචන අඩු කිරීමක් ද ඇති විය හැකි බවයි.




3-4 රූපය ප්‍රවාහන අංශයේ හරිතාගාර වායු විමෝචන ප්‍රක්ෂේපණ හා විමෝචන අඩුකිරීමේ ඉලක්ක



ප්‍රවාහන අංශයේ NDC ඇගැයීමෙන් පෙනෙන්නේ ක්‍රියාකාරකම් හා උප ක්‍රියාකාරකම් ගණනවක ප්‍රගතියක් නැති වීමටත්, සමහරක් ක්‍රියාත්මක නොකර තිබීමටත් හේතුවන බාධා හා සීමාකිරීම් ඇති බවයි. නිදසුනක් ලෙස ගතහොත් 4 වන NDC වේගවත් මගී ප්‍රවාහනය යටතේ එන කොළඹ නගරයේ සැහැල්ලු දුම්රිය ප්‍රවාහනය සඳහා වූ ව්‍යාපෘතිය අවලංගු කර තිබේ. එය නැවත ආරම්භ කිරීම සඳහා වූ සාකච්ඡා මෑත දී ඇති වූව ද, එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කැපවීමක් දැකිය නොහැකිය. පෞද්ගලික අංශයේ ආයතන කීපයක් භාණ්ඩ ප්‍රවාහනය සඳහා වඩා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන පද්ධතිය යොදාගැනීම ආරම්භ කර තිබේ. මේ සඳහා එක් නිදසුනක් වන්නේ ප්‍රීමා ලංකා සමාගම මගින් තිරිඟු පිටි ප්‍රවාහනය සඳහා මාර්ග ප්‍රවාහනය වෙනුවට දුම්රිය යොදාගැනීමයි (NDC 3 යටතේ). මෙය වර්ෂ කීපයක් තිස්සේ සිදුකරන ලද නමුත්, මෑත දී සිදු වූ ඛනිජ තෙල් මිල ඉහළ යෑමත් සමඟ අය කරන ගාස්තු ක්‍රමය ගැන එකඟතාවයක් නොමැති වීම නිසා එය අඛණ්ඩව සිදු කිරීමේ ගැටලුවක් ඇති වී තිබේ.

## 3.3.1 ප්‍රවාහන අංශයේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - ප්‍රවාහන අංශයේ පද්ධති දියුණුකිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: ප්‍රවාහනය සඳහා ඇති අවශ්‍යතාව මගහැරීම (දුරස්ථ රැස්වීම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදවුම්, ව්‍යාපාර සම්පත් සැලසුම (ERP) පද්ධති, ක්‍රියාවලී ස්වයංක්‍රීයකරණය, නම්‍යශීලී කාල යොදාගැනීම, නිවසේ සිට වැඩකිරීම ආදිය) | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.1.1: ලංකා සතොස සිල්ලර වෙළෙඳසැල්, සමූපාකාර හා සුපිරි වෙළෙඳසැල් දාම, රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව, මාර්ගගත වේදිකා ආවරණය වන ලෙස ඉ-වෙළෙඳාම් පහසුකම් ප්‍රවර්ධනය | MoTrad | MoF, STC, CAASL, CIAs, ලංකා සතොස, ICTA, ICT සේවා සපයන්නන්, පෞද්ගලික අංශයෙ ආයතන | ඉ-වෙළෙඳ පහසුකම් සහිත ව්‍යාපාර ආයතන ගණනේ ප්‍රතිශතය | දත්ත මූලාශ්‍රඃ CBSL, මූල්‍ය ආයතන | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 8.4, 11.6 |
| 1.1.2: නම්‍යශීලි සේවා කාල, නිවසේ සිට කටයුතු කිරීම ආදිය සඳහා අවස්ථා ලබාදීම | MoPA | MoL,ඵලදායකත්වය භාර අමාත්‍යාංශය | 1. නිවසේ සිට කටයුතු කිරීමේ විකල්පය ලබා දී ඇති ආයතන ගණන<br><br>2. නිවසේ සිට කටයුතු කිරීමේ යෙදෙන සේවක ප්‍රතිශතය | අදාළ අමාත්‍යාංශ Respective ministries;<br>CCC (පෞද්ගලික අංශය නියෝජනය කරන) | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | - | - | - | - | - | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 8.4, 11.6 |
| 1.1.3: රාජ්‍ය අංශයේ ආයතන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හඳුන්වා දී (i) අතත්‍ය රැස්වීම් (ii) දුරස්ථ සේවා සැපයීම ප්‍රවර්ධනය | ICTA | අදාළ සියලු රාජ්‍ය ආයතන, ශාස්ත්‍රඥයින්, පෞද්ගලික තොරතුරු තාක්ෂණ සේවා සපයන්නන්, TRC | 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කරන රාජ්‍ය අංශයේ ආයතන ගණන හා ප්‍රතිශතය<br><br>2. මාර්ගගතව සිදුකරන රැස්වීම් ප්‍රතිශතය;<br><br>3. දුරස්ථව සපයන සේවා ගණන | ICTA වාර්තා | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 8.4, 11.6 |
| 1.2: ගමන් කරන දුර හා ගමන් කාලය අඩු කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.2.1: යෝග්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් හරහා නාගරික කුලී නේවාසික පහසුකම් ඇති කිරීම | UDA | MoUD&H, LAs, පෞද්ගලික සංවර්ධකයන් | පවත්වා නාගරික නේවාසික පහසුකම් ගණන | MoUD&H, UDA, පළාත් පාලන ආයතන වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.a |
| 1.3: රථවාහන ගමනාගමනය දියුණු කිරීම හා වර්ණ සංඥා කළමනාකරණය දියුණු කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.3.1: කාලය ඉතිරි කිරීමට හේතුවන සංවේදක මගින් පාලනය වන සැකසුම් කළ හැකි වර්ණ සංඥා පද්ධති වැනි ඉල්ලුම් ප්‍රතිචාරී සංඥා හඳුන්වා දීම | RDA | MoT, SLP, SLR, SD&CC, LAs | 1. ස්ථාපිත කරන ලද සංඛ්‍යාව<br><br>2. ආවරණය කළ නගර සංඛ්‍යාව | RDA වාර්තා, ශාස්ත්‍රඥයන් | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 11.6 |
| 1.3.2: වර්ණ සංඥා සමකාලිකකරණය හඳුන්වා දීම | RDA | MoT, SLP, SD&CC, Las | 1. ස්ථාපිත කරන ලද සංඛ්‍යාව<br><br>2. ආවරණය කළ නගර සංඛ්‍යාව | RDA, ශාස්ත්‍රඥයන් වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 11.7 |
| 1.3.3: ප්‍රදේශ ව්‍යාප්ත වාහන පාලනය හඳුන්වා දීම | UDA | MoT, RDA, SLP, LAs | හඳුන්වා දුන් ප්‍රදේශ ව්‍යාප්ත වාහන පාලන සංඛ්‍යාව | MoT, RDA, පළාත් පාලන ආයතන වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 11.7 |
| 1.4: රථවාහන ගාල් කිරීම වැඩිදියුණු කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.4.1: වාහන ගාල් කර පොදු ප්‍රවාහන මාධ්‍යයක ගමන් කිරීමේ පාක් ඇන්ඩ් රයිඩ් (Park & Ride) සංකල්පය හඳුන්වා දීම - බහුමාදිලි ප්‍රචාරණ මධ්‍යස්ථාන හා පහත් පතුල් බස් රථ සමග | MoT | RDA, UDA, SLTrB, SLR, NTC, LAs, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | 1. පාක් ඇන්ඩ් රයිඩ් පහසුකම හඳුන්වා දුන් සංඛ්‍යාව<br><br>2. එක් එක් පහසුකමේ ගාල් කළ හැකි වාහන ධාරිතාව<br><br>3. එක් එක් පහසුකම භාවිත කරන්නවුන් ගණන | MoT, RDA, පළාත් පාලන ආයතන වාර්තා<br><br>Las | නැත | 1. 2025 වන විට 7ක්<br>7 by 2025<br><br>2. වාහන ගාල්කිරීමේ ධාරිතාවේ ඉලක්ක ස්ථාපිත කළ යුතුය<br><br>3. එක් එක් පහසුකම භාවිත කරන්නවුන් ගණනේ ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 3.9, 11.7 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.4.2: බහුකාර්ය ප්‍රවාහන මධ්‍යස්ථාන ප්‍රධාන නගරවල ස්ථාපිත කිරීම (කොට්ටාව, කඩවත, අනුරාධපුරය) | MoT | RDA, UDA, SLTrB, SLR, NTC, LAs, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | 1. පිහිටුවන ලද බහුකාර්ය ප්‍රවාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව<br><br>2. එක් එක් මධ්‍යස්ථානයේ ධාරිතාව<br><br>3. එක් එක් මධ්‍යස්ථානයේ පරිශීලකයන් සංඛ්‍යාව | | MoT, RDA, පළාත් පාලන ආයතන වාර්තා | නැත | 1. 2025 වන විට බහුකාර්ය ප්‍රවාහන මධ්‍යස්ථාන 3ක්<br><br>2. එක් එක් මධ්‍යස්ථානයේ ධාරිතාව ස්ථාපිත කළ යුතුය<br><br>3. එක් එක් මධ්‍යස්ථානයේ පරිශීලකයන් සංඛ්‍යාව | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 3.9, 11.7 |
| 1.4.3: මාර්ගයෙන් පිටත වාහන ගාල් කිරීමේ පහසුකම් සැපයීම | UDA | MoT, RDA, SLP, LAs | හඳුන්වා දුන් මාර්ගයෙන් පිටත වාහන ගාල් කිරීමේ ධාරිතාව (අවකාශය හා/හෝ වාහන ගණන අනුව) | | UDA, පළාත් පාලන ආයතන වාර්තා | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 11.7 |
| 1.4.4: මාර්ග දෙපස වාහන නවතාතැබීම අධෛර්යමත් කිරීම - නියෝග, මිල මගින් | RDA | MoT, UDA, SLP, LAs | මාර්ග දෙපස වාහන නවතා තැබීමේ සීමා ඇති කිලෝමීටර් ගණන | | Records of RDA, UDA, පළාත් පාලන ආයතන වාර්තා<br><br>LAs | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 11.7 |
| 1.5: සබුද්ධික ප්‍රවාහන කළමනාකරණ පද්ධති හඳුන්වාදීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.5.1: බස් රථවල ගමනාගමනය නිරීක්ෂණය කිරීමේ පද්ධති හඳුන්වාදීම (GPS වැනි) | MoT | NTC, SLTrB, PRP-TAs, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | නිරීක්ෂණ පද්ධති සවි කළ බස් රථ සංඛ්‍යාව | | MoT, NTC, SL-TrB, පෞද්ගලික අංශයේ පොදු මගී සේවා සපයන්නන්නේ වාර්තා | 1,400 (2020 දී) මෙමගින් සුඛෝපභෝගී, අධි සුඛෝපභෝගී බස් රථ සියල්ල හා අර්ධ සුඛෝපභෝගී බස්රථවලින් 60%ක් නිරීක්ෂණය වේ) | 2025 දී පෞද්ගලික බස් රථ 3,200 ක් හා ශ්‍රීලංගම බස් රථ 4000ක් නිරීක්ෂණය | √ | √ | √ | √ | √ | | | | | | 9.1, 11.2 |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.5.2: ආසන වෙන්කිරීමේ පහසුකම සැලයීම (මාර්ගගත පද්ධති ඇතුළුව) | MoT | ICTA, SLTrB, SLR, NTC, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | ආසන වෙන්කිරීමේ පහසුකම සහිත බස් නැවතුම්පොළ සංඛ්‍යාව | | ICTA, SLTrB, SLR, පෞද්ගලික අංශයේ පොදු මගී සේවා සපයන්නන්නේ වාර්තා | නැත | 2025 වන විට ප්‍රධාන බස් නැවතුම් 18ක | √ | √ | √ | √ | √ | | | | | | 9.1, 11.2 |
| 1.5.3: රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා සඳහා ඒකාබද්ධ කාලසටහන් හඳුන්වා දීම | MoT | ICTA, SLTrB, SLR, NTC, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | ඒකාබද්ධ කාල සටහන් භාවිත කරන මාර්ග ගණන | | NTC, SLTrB, SLR වාර්තා | නැත | 2030 දී මුළු රටම ආවරණය වීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.1, 11.2 |
| 1.5.4: පෙර ගෙවුම් ගමන් කාඩ්පත් හඳුන්වාදීම | MoT | ICTA, SLTrB, SLR, NTC, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | 1. පෙර ගෙවුම් ගමන් කාඩ්පත් භාවිත කරන බස් රථ ඇණියේ ප්‍රතිශතය<br><br>2. පෙර ගෙවුම් ගමන් කාඩ්පත් භාවිත කරන දුම්රිය ඇණියේ ප්‍රතිශතය | | SLTrB, SLR, පෞද්ගලික අංශයේ පොදු මගී සේවා සපයන්නන්නේ, තාඩ්පත් නිකුත් කරන්නන්ගේ වාර්තා | නැත | 1. 2025 වන විට බස් ඇණියෙන් 100%ක්<br><br>2. 2025 වන විට දුම්රිය ඇණියෙන් 100%ක් | √ | √ | √ | √ | √ | | | | | | 9.1, 11.2 |
| 1.6: මාර්ග නිර්මාණශිල්පය දියුණු කිරීම (මාර්ග සංඥා, සංඥා සැපයීම ආදිය) | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.6.1: බස් ප්‍රමුඛතා මං තීරු සඳහා මාර්ග යටිතලපහසුකම් සංවර්ධනය | RDA | MoT, UDA, LAs | 1. ආවරණය වන නගර සංඛ්‍යාව<br><br>2. බස් ප්‍රමුඛතා මංතීරුවල දිග (කිමී) | | RDA, UDA, පළාත් පාලන ආයතන වාර්තා | නැත | 1. 2030 වන විට සියලු ප්‍රධාන නගරවල<br>2. දිග පිළිබඳ ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2, 11.6 |
| 1.6.2: බස් ගාල්කර තබන ස්ථාන වෙන්කිරීම | RDA | MoT, SLP, PRPTAs, LAs | ස්ථාපිත නව බස් ගාල් සංඛ්‍යාව | | RDA, පළාත් පාලන ආයතන වාර්තා | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 3.9, 9.1, 11.2, 11.6 |

## NDC 2 - පොදු මගී ප්‍රවාහනය ප්‍රවර්ධනය

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: විශ්වසනීයත්වය, දැරියහැකිබව, ප්‍රවේශ හැකියාව, ලබාගතහැකි බව, සුවපහසුව සහ සුරක්ෂිතබව සඳහා පොදු මහාමාර්ග ප්‍රවාහනය වැඩිදියුණු කිරීම | MoT | NTC, SLTrB, PRP-TAs, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | 1. හඳුන්වාදුන් නවීන බස් රථ සංඛ්‍යාව<br>2. මගී ප්‍රවාහනයේ බස් මගින් සැපයෙන මාදිලි කොටස (%) | | MoT, NTC, රාජ්‍ය, පෞද්ගලික සෙවා සපයන්නන්ගේ වාර්තා හා ශාස්ත්‍රීය ප්‍රකාශන | 1. නවීන බස් රථ නැත<br>2. මගී ප්‍රවාහනයෙන් 19.8% (මගී කිමී බිලියන 158.6කින්) | 1. 2025 වනවිට බස් 1,000ක්<br>2. මාදිලි කොටස සඳහා ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2 |
| 2.2: විශ්වසනීයත්වය, දැරියහැකිබව, ප්‍රවේශ හැකියාව, ලබාගතහැකි බව, සුවපහසුව සහ සුරක්ෂිතබව සඳහා දුම්රිය ප්‍රවාහනය වැඩිදියුණු කිරීම | MoT | SLR, NTC | මගී ප්‍රවාහනයේ දුම්රිය මගින් සැපයෙන කොටස (%) | | SLR, MoT, NTC වාර්තා සහ ශාස්ත්‍රීය ප්‍රකාශන | මගී ප්‍රවාහනයෙන් 0.9% (මගී කිමී බිලියන 185.5කින්) | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2 |
| 2.3: ප්‍රවාහන මාධ්‍ය ඒකාබද්ධ කිරීම | MoT | ICTA, NTC, SL-TrB, SLR, UDA, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන් | ඒකාබද්ධ කළ ප්‍රධාන ස්ථාන සංඛ්‍යාව (දුම්රියපොළ, බස්නැවතුම්පොළ) | | MoT, NTC, SLTrB, SLR වාර්තා | 10 | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2 |
| 2.4: ගමන අවසානයේ සම්බන්ධකතාවය වැඩිදියුණු කිරීම | MoT | NTC, SLTrB, SLR, UDA, LAs, පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා සපයන්නන්, ටැක්සි. ත්‍රිරෝද රථ සංගම් | ගමන අවසානයේ සම්බන්ධකතාවය සංවිධානය කළ ස්ථාන ගණන | | MoT, NTC, SLTrB, SLR වාර්තා | අවිධිමත් සැකසුම් | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | | | | | | 9.1, 11.2 |

## NDC 3 - භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම ක්‍රමවලට මාරු කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: මහාමාර්ග ප්‍රවාහනයේ සිට නැවතත් දුම්රිය ප්‍රවාහනය දක්වා මාරුවීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.1.1: තිරිඟු පිටි ප්‍රවාහනයට (ප්‍රීමා ලංකා සමාගම) මාර්ග ප්‍රවාහනයෙන් දුම්රියට මාරු කිරීම | SLR | MoT, ප්‍රීමා ලංකා සමාගම | 1. දුම්රිය මගින් මෙෙයවනු ලබන ටොන් ප්‍රමාණය<br><br>2. ප්‍රතිස්ථාපනය කළ ප්‍රයිම් මූවර් (prime mover) ප්‍රමාණය<br><br>3. ප්‍රතිස්ථාපනය කළ ලොරි ප්‍රමාණය | | SLR වාර්තා | 1. මූලික දත්ත ස්ථාපිත කළ යුතුය<br><br>2. ප්‍රයිම් මූවර් ප්‍රතිස්ථාපනය: 26 (ඉහළ හා පහළ) (වර්ෂය තුළ);<br><br>3. ලොරි: නැත | 1. ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. ප්‍රයිම් මූවර්: 26 (ඉහළ හා පහළ) 2025 දී සති දෙකකට වරක්;<br><br>3. ලොරි: ත්‍රිකුණාමලය සිට සීදුවට 1144 (2020 දී), ත්‍රිකුණාමලය සිට යාපනයට 200 (2022 දී), ත්‍රිකුණාමලය සිට කොළඹට අපනයනය සඳහා 100 (2025 දී), ත්‍රිකුණාමලය සිට ගාල්ලට 260 (2024 දී) | √ | √ | √ | √ | √ | - | - | - | - | - | 3.6, 3.9, 9.1, 11.6 |
| 3.1.2: ඛනිජතෙල් නිෂ්පාදන දුම්රියෙන් ප්‍රවාහනය කිරීම | SLR | MoT, CPC, CPSTL | 1. දුම්රියෙන් ප්‍රවාහනය කළ ඛනිජ තෙල් නිෂ්පාදන ලීටර් ගණන<br><br>2. දුම්රියෙන් ප්‍රවාහනය කළ ඛනිංතෙල් නිෂ්පාදන පරිමාවේ ප්‍රතිශතය | | SLR හා CPC වාර්තා; Reports of CPSTL වාර්තා | 1. කිලෝ ලීටර් 872,651<br><br>2. 58.8% | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.6 |
| 3.1.3: වෙනත් ද්‍රව්‍ය (සිමෙන්ති, වැලි ආදි) | SLR | නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් ගණන | වර්ෂයකට ප්‍රවාහනය කළ වෙනත් නිෂ්පාදන (සිමෙන්ති, වැලි ආදි) පරිමාව | | SLR වාර්තා | මූලික දත්ත ඇස්තමේන්තු කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.6 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.2: පෙට්‍රෝලියම් නිෂ්පාදන නලමාර්ග ඔස්සේ ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.2.1: මුතුරාජවෙල සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ දක්වා ගුවන්යානා ඉන්ධන ප්‍රවාහනය | CPC | CAASL | වළක්වන ලද බවුසර් සංඛ්‍යාව | CPC, CAASL වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | | | | | | | 3.6, 3.9, 9.1, 11.6 |
| 3.3: රට අභ්‍යන්තරයේ බහාලුම් මධ්‍යස්ථාන ඇතිකර දුම්රිය පාදක ප්‍රවාහන පද්ධතියක් හඳුන්වාදීම | SLR | පෞද්ගලික අංශයේ ප්‍රවාහන හවුල්කරුවන් | 1. අඩි 20 හා 40 බහාලුම් සංඛ්‍යාව<br><br>2. වර්ෂයකට හසුරුවන ලද බර ප්‍රමාණය | SLR වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.6 |

## NDC 4 - මගී ප්‍රවාහනය සඳහා වේගවත් ප්‍රවාහන මාධ්‍ය

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1: සැහැල්ලු දුම්රිය මාර්ග (LRT) ප්‍රවාහනය කොළඹ නගරයට හඳුන්වා දීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 4.1.1: රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) පාදක කරගත් බස්නාහිර කලාප මහනගර සැහැල්ලු දුම්රිය පද්ධතිය (මාර්ග තුනයි - රතු, කොළ. නිල්) | MoF | SLR, UDA, LAs | 1. සැහැල්ලු දුම්රිය මාර්ග මගින් ආ-වරණය වන දුර ප්‍රමාණය<br><br>2. සැහැල්ලු දුම්රිය මාර්ග මගින් සේවා සැපයෙන මගීන් ගණන | MoT වාර්තා | ව්‍යාපෘතිය පැවතියේ ශක්‍යතා අධ්‍යයන මට්ටමේය | 1. සැහැල්ලු දුම්රිය මාර්ග මගින් ආ-වරණය වන දුර: කොළ මාර්ගය = කිමී 28.6; රතු මාර්ගය = කිමී 32.4; නිල් මාර්ගය = කිමී 21.5;<br><br>2. සේවා සපයන ලද මගීන් ගණන පිළිබඳ ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2, 11.6 |

## NDC 5 - මෝටර් නොවන ප්‍රවාහන මාදිලි ප්‍රවර්ධනය

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1: පාපැදි භාවිතය ප්‍රවර්ධනය කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 5.1.1: නව බයිසිකල් ධාවන මංතීරු හඳුන්වා දීම | UDA | MoPC&LG, RDA, LAs | 1. නව බයිසිකල් මංතීරු ආවරණය වූ කිලෝමීටර ප්‍රමාණය<br><br>2. ඒකාබද්ධ බයිසිකල් මංතීරු සහිත නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කළ සංඛ්‍යාව | | UDA, RDA, පළාත් සභා, පළාත්පාලන ආයතන PCs, LAs, PRDAs | බයිසිකල් මංතීරු ඇතැම් ස්ථා-නවල හඳුන්-වා දී ඇතත්, මූලික දත්ත සඳහා සං-ඛ්‍යා ඇස්ත-මේන්තු කළ යුතුය | 1. දුර සඳහා වූ ඉලක්කය ස්ථාපිත කළ යුතුය;<br><br>2. 2030 වන විට නගර 45ක් 45 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 9.1, 11.2, 11.6 |
| 5.1.2: බයිසිකල් කුලියට දීමේ පහසුකම් ප්‍ර-වර්ධනය | අදාළ LAs | MoPC&LG, UDA, RDA | 1. ස්ථාපිත බයිසිකල් ගාල් කරන ස්ථාන ප්‍රමාණය<br><br>2. මුළු ධාරිතාව<br><br>3. ආවරණය වන නගර ගණන | | UDA, RDA, පළාත් සභා, පළාත්පාලන ආයතන PCs, LAs, PRDAs | නැත | 1. ස්ථාපනය කළ යුතු බයිසිකල් ගාල් කරන ස්ථාන පිළිබඳ ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. මුලු ධාරිතාව පිළිබඳ ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>3. 2030 වන විට සියලු ප්‍රධාන නගර ආවරණය කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 9.1, 11.2, 11.6 |
| 5.1.3: යාපනය මහ නගර සභා සීමාවේ පාසල් ප්‍රවාහනය වෙනුවට බයිසිකල් වෙත මාරුවීම | යාපනය MC | MoT, උතුරු පළාත් සභාව හා LA | 1. ආවරණය වන පාසල් ප්‍රමාණය<br><br>2. බයිසිකල් භාවිත කරන සිසුන් ප්‍රතිශතය % | | MoT, උතුරු පළාත් සභාව හා යාපනය මහ නගර සභා වාර්තා | යාපනය මහ නගර සභා සීමාවේ පාසල් ප්‍රජාව බයිසිකල් භාවිත කරන නමුත්, මූලික දත්ත ඇස්තමේ-න්තු කිරීමට නිශ්චිත සං-ඛ්‍යා නැත | ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | | | | | | | | 3.9, 9.1, 11.2, 11.6 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.2: පදික මංපෙත් සඳහා ඇති පහසුකම් වැඩිදියුණු කිරීම | UDA | RDA, PRDAs, PCs, MCs හා LAs | 1. පදික මංපෙත් සඳහා පහසුකම් දියුණු කළ ස්ථාන සංඛ්‍යාව<br><br>2. දියුණු කළ පදික මංපෙත් මගින් ආවරණය වන මුළු දුර<br><br>3. ආවරණය කළ නගර සංඛ්‍යාව | | UDA, පළාත් සභා, මහ නගර සභා පළාත්පාලන ආයතන PCs, MCs, LAs, PR-DAs | පදික මංපෙත් සඳහා පහසුකම් දියුණු කිරීම සමහර ස්ථානවල සිදු කර ඇතත් මූලික දත්ත සඳහා නිශ්චිත සංඛ්‍යා ඇස්තමේන්තු කළ යුතුය | 1. ස්ථාන සංඛ්‍යාව පිළිබඳ ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. මුළු දුර ප්‍රමාණය පිළිබඳ ඉලක්කය ස්ථාපිත කළ යුතුය for the total length;<br><br>3. 2030 වන විට නගර 45ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2, 11.6 |

| NDC 6 - පොදු ප්‍රවාහනය ප්‍රවර්ධනය සඳහා බඳු හා වෙනත් උපකරණ හඳුන්වා දීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 6.1: දැනට පවතින, වාහන පදනම් කරගත් විමෝචන අය ක්‍රමය වෙනුවට වාහන වර්ගය, ඉන්ධන වර්ගය සහ විමෝචන පදනම් කරගත් සහ ගමන් කළ මුළු කිලෝමීටර ප්‍රමාණය පදනම් කරගත් ක්‍රමයකට මාරු කිරීම (වාහන ඉන්ධන කාර්යසාධනය හා ගමන් කළ දුර අනුව විමෝචන බදු හඳුන්වා දීම) | DMT | MoF, MoT, MoE, CEA, SLVET මෙහෙයුම් | වාහන විමෝචන පරීක්ෂා කිරීමේ යෝජනා ක්‍රමය උත්ශ්‍රේණිගත කිරීම | | DMT වාර්තා | වාහනය මත පදනම් වූ පද්ධතියක් තිබේ | 2023 දී වාහන වර්ගය, ඉන්ධන වර්ගය සහ විමෝචන පදනම් කරගත් ක්‍රමයක් හඳුන්වා දීම | | | | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2, 11.6 |
| 6.2: වාහන තදබදය ඉහළ කාලසීමා තුළ ප්‍රධාන නගරවල සංවේදී හා තදබදය වැඩි ප්‍රදේශවලට ඇතුළුවන තනි රථවාහන මාදිලි සීමාකිරීම සඳහා බදු ක්‍රමයක් හඳුන්වාදීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 6.2.1: කොඩොන් පාදක කරගත් මිල යාන්ත්‍රණයක් මගින් කාර්යසාධනය අඩු වාහන නගරයට ඇතුළු වීම සීමා කිරීම හඳුන්වා දීම | MoT | MoF, UDA, LAs | හඳුනාගත් නගරවලට සීමා කළ කාලසීමාවේ ඇතුළු වන වාහන ප්‍රමාණය අඩු වීමේ ප්‍රතිශතය | | MoT, UDA, පළාත් පාලන ආයතන වාර්තා | ඇස්තමේන්තු කර නැත | ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | | | | | | | | 3.6, 3.9, 9.1, 11.2, 11.6 |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.3: තම වාහන ගාල්කර පොදු ප්‍රවාහන මාධ්‍යයක ගමන් කිරීම හෙවත් 'පාර්ක් ඇන්ඩ් රයිඩ්' යටිතල පහසුකම් සමග කෝඩොන් පාදක මිල යාන්ත්‍රණයක් හඳුන්වාදීම | MoT | MoF, RDA, NTC, SLTrB, SLR, පළාත් පාලන ආයතන | 1. කොඩොන් පාදක මිල යාන්ත්‍රණයක් සහිත 'පාක් ඇන්ඩ් රයිඩ්' යටිතල පහ-සුකම් සංවර්ධනය කළ ප්‍රමාණය;<br><br>2. මුළු ධාරිතාව | | MoT, NTC, UDA, LAs, | සකස් කළ යුතුය | 1. 2025 වන විට 'පාක් ඇන්ඩ් රයිඩ්' යටිතල පහසුකම් 5ක් 5<br><br>2. ඉලක්කය ඇස්තමේන්තු කළ යුතුය | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 3.9, 9.1, 11.2, 11.6 |

NDC 7 - අභ්‍යන්තර ජල ප්‍රවාහන මාදිලි හඳුන්වාදීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 7.1: තෝරාගත් ඇළ මාර්ග සඳහා ඩීසල් හෝ විදුලි සැපයුම් පද්ධතියේ විදුලියෙන් ධාවනය වන බෝට්ටු සේවා භාවිතයෙන් ඇළ-මාර්ග පාදක ජල ප්‍රවාහනය හඳුන්වාදීම | SLLDC | SLN, UDA, NTC | 1. ඇළ මාර්ග ප්‍ර-වාහනය සහිත කි-ලෝමීටර් ගණන<br><br>2. සේවයේ යෙදෙන බෝට්ටු ගණන<br><br>3. වර්ෂයකට ධාවනය වන මගී කිලෝමීටර් ගණන | | SLN, UDA හා SLLDC වාර්තා | ආරම්භ කර නැත | ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 11.6 |
| 7.2: අභ්‍යන්තර ජල මාර්ගවලට ජල ප්‍රවාහන පද්ධති හඳුන්වා දීම | ID | SLN, MASL, පෞද්ගලික මෙහෙයුම්කරුවන් | 1. අභ්‍යන්තර ජල මාර්ගවල ආවරණය වන කිලෝමීටර් ගණන<br><br>2. සේවයේ යෙදෙන බෝට්ටු ගණන<br><br>3. වර්ෂයකට මගී කිලෝමීටර් ගණන | | ID, MASL හා SLN වාර්තා | ආරම්භ කර නැත | ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 11.6 |

| NDC 8 - උපනගර දුම්රිය නවීකරණය හා උත්ශ්‍රේණිගත කිරීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 8.1: විදුලිදුම්රිය ක්‍රියාත්මක කිරීම | SLR | MoT, MoF, MoP&E, CEB, | දුම්රිය මාර්ග ප්‍රමා-ණය | | SLR වාර්තා | ආරම්භ කර නැත | 2030 වන විට මාර්ග 5ක් - කොළඹ-පාදුක්ක; කොළඹ-පානදුර; කොළඹ-වේයන් ගොඩ; පුත්තලම මාර්ගය; මහනුවර උපනාගරික මාර්ගය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 3.9, 9.1, 11.2 |
| 8.2: නව දුම්රිය මාර්ග ස්ථපිත කිරීම සහ පවත්නා මාර්ග ජාලය තවත් ව්‍යාප්ත කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 8.2.1: නව දුම්රිය මාර්ග ස්ථපිත කිරීම | SLR | MoT, MoF | 1. හඳුන්වා දුන් නව දුම්රිය මාර්ග ගණන<br><br>2. මුළු කිලෝමීටර් ප්‍රමාණය | | SLR වාර්තා | ආරම්භ කර නැත | 1. 2025 වන විට 2ක් (කුරුණෑගල-හබ-රණ හා මාතර-බෙලිඅත්ත) ඔඅද (02) ඉහ 2025<br><br>2. මුළු දුර = කිමී 105 | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 3.9, 9.1, 11.2 |
| 8.2.2: ද්විත්ව දුම්රිය මාර්ග හඳුන්වා දීම | SLR | MoT, MoF | 1. හඳුන්වා දුන් ද්විත්ව දුම්රිය මාර්ග සංඛ්‍යාව<br><br>2. මුළු දිග කිලෝමීටර් | | SLR වාර්තා | නැත | 1. 2025 දී 1ක් (පොල්ගහවෙල-කුරුණෑගල);<br><br>2. මුළු දුර = කිමී 20 | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 3.9, 9.1, 11.2 |
| 8.2.3 දුම්රිය මාර්ග දීර්ඝ කිරීම | SLR | MoT, MoF | 1. දීර්ඝ කරන ලද දුම්රිය මාර්ග සංඛ්‍යාව<br><br>2. මුළු කිලෝමීටර් ගණන | | SLR වාර්තා | ආරම්භ කර නැත | 1. 2025 වන විට 1 (හම්බන්තොට - කතරගම)<br><br>2. මුළු දුර = කිමී 40 | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 3.9, 9.1, 11.2 |

## NDC 9 - විද්‍යුත් සංචලනය හා දෙමුහුම් වාහන ප්‍රවර්ධනය

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 9.1: විදුලි සහ දෙමුහුම් (hybrid) වාහන සඳහා ලබා දෙන බදුසහන වැඩි කිරීම | MoF | MoT, SLC | 1. විදුලි සහ දෙමුහුම් වාහන සඳහා බදුසහන<br><br>2. අලුතින් ලියාපදිංචි වන විදුලි වාහන ප්‍රමාණයේ %<br><br>3. අලුතින් ලියාපදිංචි වන දෙමුහුම් වාහන ප්‍රමාණයේ % | | MoF, SLC වාර්තා හා ගැසට් | 1. බදු සහන නැත<br><br>2. විදුලි වාහනː සියලු වාහනවලින් 0.17%ක්; කාර් රථවලින් 0.37%ක්; 2W 0.17%ක්; 3W 0%<br><br>3. දෙමුහුම් වාහනː සියලු වාහන කාණ්ඩවලින් 0.82%; කාර්වලින් 7.85%ක්; 2W 0%ක්; 3W 0% | ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | | | | | | | | 3.9, 7.3, 7.a, 11.6 |
| 9.2: වාහන ආරෝපණය කරන ස්ථාන, බැටරි හුවමාරුකරන ස්ථාන සහ අළුත් බැටරි යෙදීම වැනි උපකාරක යටිතල පහසුකම් සඳහා අවශ්‍යකරන පහසුකම් සැලසීම | MoT | MoF, MoE, MoP&E, CEB, SLSEA, CEA, UDA, LAs | 1. ආරෝපණ මධ්‍යස්ථාන සංඛ්‍යාව<br><br>2. බැටරි හුවමාරු කරන ස්ථාන ගණන | | MoT වාර්තා | 1. ආරෝපණ මධ්‍යස්ථානː CEB-7 හා පෞද්ගලික අංශයේ - 52<br><br>2. බැටරි හුවමාරුකරන ස්ථානː නැත | 1. CEB - 2023 වන විට තවත් 10ක් හා SLSEA - 2024 වන විට සූර්යබලයෙන් ක්‍රියාකරන මධ්‍යස්ථාන 90ක්<br><br>2. බැටරි හුවමාරු කරන ස්ථාන ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | | | | | | | | 3.9, 7.3, 7.a, 11.6 |
| 9.3: නව HS කේතයක් හඳුන්වා දී විදුලි සහ දෙමුහුම් වාහන බැටරි සඳහා වන බදු හා තීරු බදු සහන ලබාදීම | MoF | MoT, MoE, SLC | නව HS කේතය යොදාගෙන ආනයනය කළ බැටරි සංඛ්‍යාව | | MoF, SLC වාර්තා | HS කේතය ස්ථාපිත කර නැත | 2023 දී විදුලි කාර් බැටරි 4000ක් | √ | √ | √ | | | | | | | | 3.9, 7.3, 7.a, 11.6 |

## NDC 10 - වාහන ඇණියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 10.1: පවතින වාහන සංචිතයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම (උදා - ත්‍රිරෝද රථ, මගී කාර්, බස්) | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 10.1.1: පරීක්ෂා කිරීම හා නඩත්තු කිරීම | DMT | MoT, SMoT, SLTrB, ශාස්ත්‍රඥයන් හා වෘත්තීය පුහුණු ආයතන, පෞද්ගලික සේවා සපයන්නන් | 1. SLVET පූර්ව පරීක්ෂා කිරීමේ අදියරේ දී ප්‍රතික්ෂේප වූ වාහන ප්‍රතිශතය<br><br>2. SLVET පළමු පරීක්ෂාවේ දී ප්‍රතික්ෂේප වූ වාහන ප්‍රතිශතය | DMT, SLVET ව්‍යාපෘති කාර්යාල වාර්තා project office | 1. මූලික දත්ත ස්ථාපිත කළ යුතුය<br><br>2. 17% | 1. ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. 2025 දී 10% | √ | √ | √ | √ | √ | | | | | | 7.3, 7.a |
| 10.1.2: වාහන විමෝචන පරීක්ෂාව (වැඩිදුර අහඹු මාර්ග පරීක්ෂාවලින් වැඩිදියුණු කිරීම් යෝජනා කළ යුතුය) | DMT | MoF, MoT, MoE, CEA, SLVET මෙහෙයුම් | 1. වාහන විමෝචන පරීක්ෂා කිරීමේ යෝජනාක්‍රමය උත්ශ්‍රේණිගත කිරීම<br><br>2. අහඹු මාර්ග පරීක්ෂාවලින් වාර්ෂිකව පරීක්ෂා කරන ලද වහාන ප්‍රමාණය මුළු වාහන ඇණියේ ප්‍රතිශතයක් ලෙස | DMT, SLVET ව්‍යාපෘති කාර්යාල වාර්තා | 1. සම්ප්‍රදායානුකූල බර රහිත පරීක්ෂාව<br><br>2. වාර්ෂික අහඹු මාර්ග පරීක්ෂා 0.06% | 1. 2025 වන විට නව විමෝචන පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම (VET 2.0)<br><br>2. 2025 වන විට වාර්ෂික අහඹු මාර්ග පරීක්ෂා 1 % | √ | √ | √ | √ | √ | | | | | | 3.9, 7.3, 7.a, 11.6 |
| 10.1.3: මාර්ග යෝග්‍යතා පරීක්ෂණය හඳුන්වාදීම | DMT | MoT, IRCSL, AAC, රක්ෂණ සමාගම් | මාර්ග යෝග්‍යතා පරීක්ෂාව අනිවාර්ය වන වාහන කාණ්ඩ ගණන | Records of SLP, DMT, රක්ෂණ සමාගම් වාර්තා | වාණිජමය වාහන පමණි | 2030 වන විට සියලු වාහන කාණ්ඩ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 7.3, 7.a, 11.6 |
| 10.1.4: ගරාජ වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් හඳුන්වාදීම | DMT | CEA, ශාස්ත්‍රඥයන් හා වෘත්තීය පුහුනු ආයතන | ප්‍රතීතනය කළ ගරාජ ප්‍රමාණය මුළු ගරාජ ගණනේ ප්‍රතිශතයක් ලෙස | දත්ත මූලාශ්‍රය: CEA, EPL සඳහා පළාත්පාලන ආයතන | ගරාජ සඳහා ප්‍රතීතන වැඩසටහනක් නැත | ගරාජ ප්‍රතීතන වැඩසටහන යටතේ 2025 වන විට දිවයින පුරා ප්‍රතීතනය කළ ගරාජ 25%ක් | √ | √ | √ | √ | √ | | | | | | 7.3, 7.a, 8.3 |
| 10.1.5: අකාර්යක්ෂම (නොවටිනා) වාහන බැහැරලීමේ නිර්නායක හඳුන්වාදීම (වාහන සුන්බුන්කරන වැඩසටහනක්) | DMT | MoF, MoT, MoE, CEA, IRCSL, රක්ෂණ සමාගම් | සුන්බුන්කරණ වැඩසටහන යටතේ ආවරණය වූ වාහන ප්‍රමාණය | DMT, SLVET ව්‍යාපෘති කාර්යාල වාර්තා | වැඩසටහනක් නැත | 2030 වන විට සියලු වාහන | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 7.3, 7.a, 11.6 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10.2: ඉන්ධන කාර්යක්ෂම වාහන ආනයනය කිරීම ප්‍රවර්ධනය (උදා සැහැල්ල කාර්ය වාහන) | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 10.2.1: වාහන ආනයනය සඳහා විමෝචන ප්‍රමිති හඳුන්වාදීම | MoE | MoF, MoT, DoI&EC, SLC, DMT, CEA, SLSEA, CPC, SLSI, ශාස්ත්‍රඥයන් | වාහන ආනයනය සඳහා විමෝචන ප්‍රමිති | | MoF ගැසට් නිවේදන, DMT වාර්තා | මේ වන විට ද ගැසට් කර ඇත. (2018) | සෑම වර්ෂ 5කට වරක් යාවත්කාලීන කිරීම (මීළඟට 2023) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 7.3, 7.a, 11.6 |
| 10.2.2: ඉන්ධන පිරිමැස්ම පිළිබඳ ලේබල්කරණ වැසටහනක් හඳුන්වා දීම | SLSEA | MoT, MoE, SLSI, DMT, CEA, | හඳුන්වා දුන් ඉන්ධන පිරිමැස්ම ලේබල ප්‍රමාණය | | SLSEA, SLSI වාර්තා | CleanAir SL වැඩසටහන මගින් මූලික දත්ත අධ්‍යයනයක් ආරම්භ කර ඇත (UNEP හා GFEI සහාය ඇතිව) | 2025 දී 6ක් (LDVs, HDVs, හා EVs) | √ | √ | √ | √ | √ | | | | | | 3.9, 7.3, 7.a, 11.6 |
| 10.2.3: ඉන්ධන කාර්යක්ෂමතාව සහිත වාහන වාහන ආනයනය සඳහා බදු සහන හඳුන්වා දීම | MoF | MoT, MoE, DoI&EC, SLC, IRD, DMT, SLSEA, CPC, SLSI, ශාස්ත්‍රඥයන් | ඉන්ධන පිරිමැස්ම මත පදනම් වූ බදු සහන යෝජනා ක්‍රමයක් යටතේ ආවරණය වන වාහන පංති ප්‍රමාණය | | MoF ගැසට් නිවේදන. SLC වාර්තා | එන්ජින් ධාරිතාව හා වාහන පංතිය මත පදනම්ව පවත්නා බදු ව්‍යුහය සකස් වී ඇති අතර, ඉන්ධන පිරිමැස්ම එහි දී සලකාබැලේ. කෙසේ වෙතත්, විදුලි වාහන හා දෙමුහුම් වාහන සඳහා වූ වෙනස් බදු පද්ධතියක් ක්‍රියාත්මකය. | 2025 දී සියලු වාහන කාණ්ඩ | √ | √ | √ | √ | √ | | | | | | 3.9, 7.3, 7.a, 11.6 |
| 10.3: රියැදුරන්ගේ චර්යාමය වෙනස්කම් ඇති කිරීම සඳහා වැඩසටහන් හඳුන්වා දීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10.3.1: රියදුරු බලපත් ලබාදීමේ යාන්ත්‍රණය දියුණු කිරීම | DMT | MoT, SLP | 1. පරිසර හිතකාමී රියපැදවීම ඇගැයීමේ නිර්ණායක ඇතුළත් දියුණු රියදුරු බලපත් ලබාදීමේ යාන්ත්‍රණයක්/ පරීක්ෂාවක්<br><br>2. සමාකෘති/ නිරීක්ෂක ස්ථාපිත දිස්ත්‍රික්ක ගණන | | DMT වාර්තා | 1. ආරම්භ කළ යුතුව ඇත<br><br>2. නැත | 1. 2023 වන විට දියුණු රියදුරු බලපත් ලබාදීමේ යාන්ත්‍රණයක්<br><br>2. 2025 වන විට සියලු දිස්ත්‍රික්කවල සමාකෘති/ නිරීක්ෂක කිරීම් ඇත | √ | √ | √ | √ | √ | | | | | | 3.6, 7.3, 8.3 |
| 10.3.2: රියැදුරු බලපත්‍රය සඳහා නිශේධනීය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම | DMT | MoT, SLP | 1. රියදුරු බලපත්‍රය සඳමා ඵලදායී නිශේධනීය කිරීමේ වැඩසටහනක්/ දඩ යෝජනා ක්‍රමයක්<br><br>2. වාර්ෂිකව වාර්තා වන සිදුවීම් ගණන | | DMT, SLP වාර්තා, උසාවි වාර්තා | වැඩසටහන-ක්/ යෝජනා ක්‍රමයක් නැත | 1. 2024 වන විට රියදුරු බලපත්‍රය සඳහා ඵලදායී නිශේධනීය කිරීමේ වැඩසටහනක්/ දඩ යෝජනා ක්‍රමයක්<br>2. සිදුවීම් ගණන සඳහා සඳහා ඉලක්කය ස්ථාපිත කළ යුතුය | | | √ | √ | | | | | | | 3.6, 7.3 |
| 10.3.3: පරිසර හිතකාමී රිය පැදවීම පුහුණුව හඳුන්වා දීම | DMT | MoT, රියදුරු පුහුණු පාසල්, SLP, ශාස්ත්‍රඥයන් හා වෘත්තීය පුහුණු ආයතන | 1. වාර්ෂිකව රියදුරන් හා මහජනතාව සඳහා සිදුකරන දැනුම්-වත්කිරීමේ හා පුහුණු වැඩසටහන්<br><br>2. රියදුරු පුහුණු පාසල්වලට පරිසර හිතකාමී රියපැදවීම පිළිබඳ මොඩියුල හඳුන්වාදීම | | DMT වාර්තා | 1, දැනුම්-වත් කිරීමේ වැඩසටහන් සමහරක් පවත්වා ඇතත්, ඒ ව්‍යුහාත්මක සැලසුමක් ඇතිව නොවේ<br><br>2. මොඩියුල හඳුන්වා දී නැත | 1. 2024 සිට වර්ෂයකට වැඩසටහන් 20ක්;<br><br>2. පරිසර හිතකාමී රියපැදවීම පිළිබඳ මොඩියුල 2024 දී හඳුන්වා දීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.6, 7.3 |

## NDC 11 - මාර්ග යටිතල පහසුකම් සංවර්ධන

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 11.1: සංචලතාව වැඩිදියුණු කිරීම සඳහා පළාත් සහ ග්‍රාමීය මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 11.1.1: පළාත් හා ග්‍රාමීය මාර්ග පද්ධතිය නැවත ඇතුරුම් යෙදීම නවීකරණය කිරීම | RDA | RDA භාර අමාත්‍යාංශය, ග්‍රාමීය මාර්ග භාර අමාත්‍යාංශය, UDA, PCs, LAs, PDRAs, | නැවත ඇතුරුම් යෙදීම හා නවීකරණය කළ පළාත් හා ග්‍රාමීය මාර්ග ජාලයේ දිග | | RDA, PDRAs, PCs, LAs වාර්තා | නැත | අයිරෝඩ් - 2025 වන විට ග්‍රාමීය මාර්ග කිමී 6430ක් හා 100,000ක් සංවර්ධනය කිරීම; 2030 වන විට මාර්ග කිමී 7411ක් නැවත ඇතිරීම හා කිමී 2500ක් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම, හා අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) මගින් කිමී 1200ක් | √ | √ | √ | √ | √ | | | | | | 3.9, 7.3, 9.1, 11.2, 11.6 |
| 11.2: අධිවේගී මාර්ග ජාලය ව්‍යාප්ත කිරීම | මහාමාර්ග භාර අමාත්‍යාංශය | MoT, RDA, පෞද්ගලික ආයෝජකයන්/ සංවර්ධකයන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වවල පාර්ශ්වකරුවන් | සංවර්ධනය කළ අධිවේගීමාර්ග දුර ප්‍රමාණය | | මහාමාර්ග භාර අමාත්‍යාංශයේ වාර්තා, RDA | කිමී 272 (අධිවේගී මාර්ග 4 - කොට්ටාව -මත්තල (E01); කොළඹ කටුනායක (E03); පිටත වටරවුම් මාර්ගය (E02) කොට්ටාව-කෙරවල පිටිය; අන්ද-රවැව-හම්බන්තොට | කිමී 529.5 (අතිරේක කිමී 257.5 - මධ්‍යම අධිවේගී මාර්ගය; රුවන්පුර අධිවේගී මාර්ගය; කොළඹ කටුනායක අධිවේගී මාර්ගය කොච්චිකඩේ දක්වා දීර්ඝ කිරීම - 2025 දී ආරම්භ කිරීමට නියමිතය) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 7.3, 9.1, 11.2, 11.6 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 272 km-<br>වැව-හම්බන්තොට<br>272 km<br><br>වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය (නව කැලණි පාලම -වරාය පල්ලිය 5.7 කිමී කණු මත දිනෙ අධිවේගී මාර්ගය නව කැලණි පාලම-අතුරුගිරිය ව කිමී 16.4)<br><br>මැරයි-න් ඩ්‍රයිව් අධිවේගී මාර්ගය - වරාය ප්‍රවේශය සිට කොල්ලුපිටිය දක්වා - කිමී 3.2) | | | | | | | | | | | | |

## NDC 12 - සමුද්‍රීය අංශයේ හරිතාගාර වායු විමෝචන අඩු කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 12.1: MARPOL සම්මුතියේ VI ඇමුණුම අපරානුමත කර එහි විධිවිධාන ශ්‍රී ලංකාවේ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය තත්ත්වය ප්‍රකාශයට පත් කිරීම | MEPA | MEPA භාර අමාත්‍යාංශය, MoPorts, MSS, SLPA | MARPOL සම්මුතියේ VI ඇමුණුම අපරානුමත කර එහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම | | වරාය හා නාවුක කටයුතු හා MEPA භාර අමාත්‍යාංශවල වාර්තා | MARPOL සම්මුතියේ I සිට V දක්වා වූ ඇමුණුම් අපරානුමත කර ඇති අතර, VI වන ඇමුණුම පිළිබඳ සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. | MARPOL සම්මුතියේ VI ඇමුණුම අපරානුමත කිරීම | √ | √ | √ | √ | √ | | | | | | 3.9, 7.3, 11.6 |
| 12.2: සාධක මත පදනම් වූ තොරතුරු අනුව, නාවුක කටයුතුවලින් (වෙරළාශ්‍රිත හා වරාය) හරිතාගාර වායු විමෝචනයට ඇතිකෙරෙන බලපෑම අධ්‍යයනය කිරීම සහ එම ගැටලු ආමන්ත්‍රණය සඳහා ක්‍රියාමාර්ග හඳුන්වාදීම | MEPA | MoE, MoPorts, MEPA භාර අමාත්‍යාංශය, SLPA, MSS, CEA, ශාස්ත්‍රඥයන් | නාවුක කටයුතුවලින් හරිතාගාර වායු විමෝචනයට ඇතිකෙරෙන බලපෑම අධ්‍යයනය කිරීම/ පළ කිරීම | | වරාය හා නාවුක කටයුතු භාර අමාත්‍යාංශයේ, MEPA හා MoE වාර්තා | නැත (අධ්‍යයන හෝ වැඩසටහන් ආරම්භ කර නැත, දත්ත සඳහා ප්‍රවේශය නැතිවීම හා පාර්ශ්වකරුවන් හා සහයෝගය සීමා වීම බාධා අතර වේ.) | 2025 වන විට හරිතාගාර වායු විමෝචන ඇස්තමේන්තු ප්‍රකාශයට පත් කිරීම | √ | √ | √ | √ | √ | | | | | | 3.9, 7.3, 11.6, 12.4 |
| 12.3: මුහුදු ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 12.4.1: යාත්‍රා හා බෝට්ටු සඳහා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් | SLSEA | MoP&E, MoEn, MoPorts, MoFish, CPC, MEPA, SLPA, DoF, SLN, CC&CRMD, CSC, MSS, CEB, ශාස්ත්‍රඥයන් | වාර්ෂිකව පවත්වන ලද දැනුමවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | SLSEA, SLPA, MoFish, DoF, MSS වාර්තා | නැත | වර්ෂයකට 12 බැගින් 2023-2030 දක්වා | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 7.3, 7.a, 11.6 |

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 12.4.2: වරාය හා වරාය මෙහෙයුම් සඳහා බලශක්ති කාර්යක්ෂමතාව දියුණු කිරීමේ වැඩසටහන් | SLSEA | MoP&E, MoE, MoFish, MoPorts, CPC, MEPA, SL-PA,CSC, DoF, SLN, CC&CRMD, MSS, CEB, ශාස්ත්‍රඥයන් | වර්ෂයකට පවත්වන ලද දැනුම්වත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | | SLSEA, SLPA, MoFish, DoF, MSS වාර්තා | නැත | 2023-2030 අතර වර්ෂයකට 12ක් බැගින් | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 7.3, 7.a, 11.6 |

| NDC 13 - සහයෝගී ප්‍රතිපත්ති රාමුවක් හා ක්‍රියාකාරකම් | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 13.1: විද්‍යුත් සංචලනය හා දෙමුහුම් වාහන ප්‍රවර්ධනයට කිරීම සඳහා ඊට අදාළව නව ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම හෝ පවතින ප්‍රතිපත්තිවලට සංශෝධන සිදු කිරීම | MoT | MoE, MoP&E, CPC, SLSEA, CEB, RDA, UDA, SLP, NTC, DMT, SLTrB, SLR, LAs, පෞද්ගලික අංශයේ ප්‍රවාහන මෙහෙයුම්කරුවන් | ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය | | ගැසට් නිවේදනය | ප්‍රතිපත්ති කෙටුම්පත | 2023 දී ප්‍රතිපත්තිය අනුමත වීම | √ | √ | √ | | | | | | | | 3.9, 7.3, 7.a, 11.6 |
| 13.2: ඉන්ධන පාදක කාබන් බද්දක් හඳුන්-වාදීම | MoF | MoT, MoE, CPC, SL-SEA, NTC, DMT | ඉන්ධන- පාදක කරගත් කාබන් බද්දක් | | MoF ගැසට් නිවේදන | නැත | 2025 වන විට ඉන්ධන- පාදක කරගත් කාබන් බද්දක් හඳුන්වාදීම | - | - | - | - | - | √ | √ | √ | √ | √ | 3.9, 7.3, 11.6 |
| 13.3: නාවුක ප්‍රතිපත්ති සම්පාදනයේදී දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග (අනුහුරුවීම හා අවමකිරීම) ඇතුළත් කිරීම | MoPorts | MoE, MoD, SLPA, MEPA, SLN, CEA, MSC, SLCG | සමුද්‍රීය ප්‍රතිපත්තිවලට දේශගුණ විපර්යාස පියවර ඇතුළත් කිරීම | | වරාය හා නාවුක අමාත්‍යාංශය | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | | | | | | | | 11.6 |

## 3.4 කර්මාන්ත අංශය

ආර්ථික වර්ධනයේ දී, අපනයන ධාවකයක් ලෙස, ආදායම් උත්පාදනයේදී, රැකියා ඇතිකිරීමේ දී හා දරිද්‍රතාවය දුරුකිරීමේ දී කර්මාන්ත ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 දී පවත්වන ලද කර්මාන්ත සමීක්ෂණයෙන් ශ්‍රී ලංකාවේ කාර්මික ආයතන 20,737ක් ඇති බවත්[27], ඉන් වැඩි ප්‍රමාණයක් වන 17,719ක් නිෂ්පාදන අංශයට අයත් බවත් වාර්තා කර තිබේ. 2019 වර්ෂයේ මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, කර්මාන්ත අංශය රටේ දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය (26.4%) දෙවැනි වන්නේ සේවා අංශයට (26.1%) පමණි. රටේ ශ්‍රම බලකායෙන් 27.6%ක් පමණ මෙම අංශයේ සේවය කරන අය වේ. රෙදිපිළි, ඇඟළුම් හා තේ නිෂ්පාදනය මෙරට වඩාත් වැදගත් අපනයනය ඉලක්ක කරගත් උප-අංශ වේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2019 වර්ෂයේ බලශක්ති තුලිතය අනුව, කර්මාන්ත අංශයට අවශ්‍ය කරන බලශක්තිය ලබාගෙන ඇත්තේ ජෛව ස්කන්ධ (74.4%), පොසිල ඉන්ධන - පෙට්‍රෝලියම් තෙල් හා ගල්අඟුරු (10.4%), සහ විදුලිය (15.2%) යන ප්‍රභව තුනකිනි. තේ සහ රබර් කර්මාන්ත ශාලා, බේකරි, උළු සහ ගඩොල් කර්මාන්තශාලා, සහ අනෙකුත් ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ කර්මාන්ත සඳහා ජෛව ස්කන්ධය යොදාගෙන ඇත. පොසිල ඉන්ධන යොදාගන්නා ප්‍රාථමික භාවිතයන් වන්නේ බොයිලේරු, උඳුන් සහ පෝරණු ආදියයි. හරිතාගාර වායු සඳහා දායක වන ප්‍රධාන කර්මාන්ත අතර සිමෙන්ති නිෂ්පාදනය, අළුහුණු නිෂ්පාදනය (ඉදිකිරීම් කර්මාන්තය සඳහා) සහ හුණුගල් හා සෝඩා අළු භාවිත කරන කර්මාන්ත වේ. කෙසේවෙතත්, කාර්මික බලශක්ති පරිභෝජනයෙන් සිදුවන විමෝචනය හා සංසන්දනය කරන විට, කාර්මික ක්‍රියාවලීන්ගෙන් උත්පාදනය වන හරිතාගාර වායු විමෝචන ප්‍රමාණය සාපේක්ෂව අඩුය.

ප්‍රධාන ආර්ථිකයන් ඇති රටවල් ඔවුන්ගේ ආර්ථිකය නිර්කාබනීකරණය කිරීම සඳහා දේශගුණ විපර්යාස හා පාරිසරික කරුණු ඒකාබද්ධ කරමින් විවිධ මුලපිරීම් ගණනාවක් ක්‍රියාත්මක කරයි. මෙය ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධන උපායමාර්ගයට තීරණාත්මක ලෙස වැදගත් වන්නේ වේගයෙන් වෙනස්වන ගෝලීය ආර්ථිකය තුළ අදාළව හා තරඟකාරී තත්ත්වයක පැවතීම සඳහාය.

ශ්‍රී ලංකා රජය අවධානය යොමුකර ඇත්තේ ගෝලීය වශයෙන් තරඟකාරී, එකතු කළ අගය වැඩි, නව්‍ය, තාක්ෂණය හා දැනුම පාදක කරගත් සහ හානිකර පාරිසරික බලපෑම් අවම වූ කර්මාන්ත ඇති කිරීම කෙරෙහිය. ඒවා මගින් ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කළ හැකි අතර, ඉහළ අපනයන අදායම් ඇති බව තහවුරු කර, තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට ද හැකිය. මෙම නව දිශානතිය අනුව, කර්මාන්ත අමාත්‍යාංශය මේ වන විට කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් (NaPID) සහ එම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ පස්-අවුරුදු උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් සම්පාදනය කිරීමෙහි නිරත වී සිටියි.

මේ හා සමගාමීව කර්මාන්ත අමාත්‍යාංශය මගින් පහත සඳහන් වන (3-4 වගුව බලන්න) කර්මාන්ත අංශයේ NDC ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයාබලමින් සිටියි. ඒ පුනර්ජනනීය බලශක්තිය යෙදවීම වේගවත් කිරීම, බලශක්ති හා සම්පත්-කාර්යක්ෂම තාක්ෂණය හා යහ පිළිවෙත් වේගවත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය, නියාමනමය, තාක්ෂණික හා මූල්‍යමය යාන්ත්‍රණ සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මගිනි.

එසේම මෙම NDC මගින් සම්පත් කාර්යක්ෂමතාව, චක්‍රීය ආර්ථිකය සහ අනෙකුත් ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති සංකල්ප පිළිගෙන ඒවා ඒකාබද්ධ කරගන්නා අතර දේශගුණ විපර්යාස අවමකරගැනීමේ අභිලාෂ තවදුරටත් වැඩිදියුණු කරනු ඇත. කාර්මික ක්‍රියාවලී සහ නිෂ්පාදන භාවිතය (IPPU) සම්බන්ධ ක්‍රියා පිළිබඳව විශ්වසනීය දත්ත මූලාශ්‍ර හා මාර්ග සීමිත වන බැවින් බලශක්තිය-පරිභෝජනය-සම්බන්ධ විමෝචන මෙම NDC මගින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ආමන්ත්‍රණය කරන බව සඳහන් කළ යුතුය.

27 Annual Survey of Industries (2018),Department of Census and Statistics.



3-4 වගුව කර්මාත්න අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | තිරසර ජෛවස්කන්ධ බලශක්තිය වෙත මාරුවීම අඛණ්ඩව සිදුකිරීම පරිශීලක කාර්යක්ෂමතා-වය වැඩිදියුණු කිරීම |
| 2 | සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන (RECP) පිළිවෙත් යොදාගැනීම වැඩිදියුණු කිරීම |
| 3 | පරිසර හිතකාමී කාර්මික උද්‍යාන ඇතිකිරීම |
| 4 | 'චක්‍රිය ආර්ථික' සංකල්පය හඳුන්වාදීම |
| 5 | 'ත්‍රිත්ව-ජනන' පහසුකම හඳුන්වාදීම |
| 6 | සිමෙන්ති කර්මාන්තයේ ක්ලින්කර් නිෂ්පාදනයේ දී හරිතාගාර වායු නිෂ්පාදනය අඩුකිරීම සඳහා දිරිගැන්වීම් |
| 7 | සාමාන්‍ය සබලකාරක ක්‍රියාකාරකම් |

මෙම NDC මගින්, 2021 සිට 2030 දක්වා කාලය සඳහා කර්මාන්ත අංශයේ හරිතාගාර වායු විමෝචන කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) තත්ත්වයට සාපේක්ෂව 7%කින් අඩුකරගැනීමට (කොන්දේසි රහිතව 4% ක් සහ කොන්දේසි සහිතව 3%ක්) හැකිවෙතැයි අපේක්ෂා කරයි. එය එම කාලසීමාව සඳහා ඇස්තමේන්තු කළ කාබන් ඩයොක්සයිඩ් සහ එවැනි අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 2,088,000ක් කොන්දේසි රහිතව ද, මෙට්‍රික් ටොන් 1,482,000ක් කොන්දේසි සහිතව ද (එකතුව මෙට්‍රික් ටොන් 3,570,000කි) විමෝචන අවමකිරීමේ මට්ටමකට සමාන වේ (3-5 රූපය). එසේම, තවමත් ක්‍රමවත් වාර්තාකරණ/ ගිණුම්කරණ ක්‍රමයක් නොමැතිවීම හේතුවෙන් ගණන්ගැනීම අසීරු වූ වෙනත් විවිධ මුලපිරීම් හරහා විමෝචන තවත් අඩු කෙරෙන බව ද සඳහන් කළ යුතුය.




3-5 රූපය කර්මාන්ත අංශයේ හරිතාගාර වායු විමෝචන ප්‍රක්ෂේපණ හා අඩුකිරීමේ ඉලක්ක

### 3.4.1 කර්මාන්ත අංශයේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - තිරසර ජෛවස්කන්ධ බලශක්තිය වෙත මාරුවීම අඛණ්ඩව සිදුකිරීම සහ තෝරාගත් කාර්මික උප-අංශවල (තේ, රබර්, ඇඟළුම්, හෝටල් හා සංචාරක, සහල් සැකසුම්) පරිශීලක කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: 1.1 කාර්මික උදුන්, වාෂ්ප බොයිලේරු සහ උණුජල පද්ධති බවට පරිවර්තනය කිරීම සහ තිරසර ජෛව ස්කන්ධය අඛණ්ඩව භාවිතය | SLSEA | MoI MoP&E, SLTB, TRI, SLTDA, CIAs | කාර්මික බොයිලේරු පරිවර්තනය කළ ප්‍රමාණය | | NEEA යෙදවුම්, ESCO හා බොයිලේරු සැපයුම්කරුවන්ගේ වාර්තා මගින් | 500 | 90 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |
| 1.2: කර්මාන්ත (කුඩා හා මධ්‍ය පරිමාණ හා විශාල) කර්මාන්ත උප අංශ හරහා ජෛවස්කන්ධ පරිශීලන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම | SLSEA | MoI, MoP, SLTB, TRI, SLTDA, CIAs, SLSI | දියුණුකිරීම් ගණන, යෙදවුම් තොග තත්ත්වයේ ප්‍රමිතිය | | NEEA යෙදවුම්, ESCO හා බොයිලේරු සැපයුම්කරුවන්ගේ වාර්තා මගින් | 500 | 300 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 හා 7.3 |
| 1.2.1: ප්‍රමිතිකරණය මගින් ජෛව ස්කන්ධ තොගයේ තත්ත්වය ඉහළ නැංවීම (වර්ගය, ප්‍රමාණය, වියළි බව, ගබඩාකිරීම ආදි) | 1.2.1 සිට 1.2.2 උප ක්‍රියාකාරකම්වල දායකත්වය 1.2 ප්‍රධාන නොදැක්වේ. කෙසේ වෙතත්, මෙම උප ක්‍රියාකාරකම් ක්‍රියාත්මක ආයතනික රාමුව හා සමගාමීව සකස් කරනු ඇතැයි අපේක්ෂා කරනු | | | | ක්‍රියාකාරකමේ නිරූපණය කරන අතර ඒ නිසා උප ක්‍රියාකාරකම් විස්තර මෙම ක්‍රියාත්මක කිරීමේ සැලසුමේ කිරීම සඳහා වගකිව යුතු පාර්ශ්වකාර ආයතනය (මෙහි දී SLSEA) ඔවුන්ගේම විස්තීර්ණ ක්‍රියාකාරී සැලසුමක් ලැබේ. | | | | | | | | | | | | | |
| 1.2.2: මෙහෙයුම් හා නඩත්තු පිළිවෙත්, පද්ධතියේ සැලසුම දියුණු කිරීම (වායු නැවත චක්‍රිකරණය හා වායු පූර්වතාපක) මගින් බලශක්ති කාර්යක්ඔහතා දියුණු කිරීම | | | | | | | | | | | | | | | | | | |
| 1.3: කර්මාන්ත තුළ ජෛව ස්කන්ධ 'සම-ජනනය' (තාපනය හා සිසිලනය) හඳුන්වාදීම | SLSEA | MoI, SLTDA, CIAs | ස්ථාපනය කළ පද්ධති ගණන | | SLSEA වාර්තා | 4 | 25 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 හා 7.3 |
| 1.4: රාජ්‍ය ආයතනවල තාප බලශක්ති අවශ්‍යතා සඳහා පොසිල ඉන්ධන මගින් ක්‍රියාත්මක තාප බලශක්ති ජනක වෙනුවට ජෛව ස්කන්ධ මගින් ක්‍රියාත්මක ජනක දක්වා මාරුවීම (රෝහල්, බන්ධණාගාර, සන්නද්ධ හමුදා, නොවාසිකාගාර විශ්ව විද්‍යාල ආදි ජෛව ස්කන්ධ මගින් ශක්තිය සැපයෙන උනු ජල පද්ධති ඇති ස්ථාන) | SLSEA | MoH, MoD, MoEd | ස්ථාපනය කළ පද්ධති ගණන | | SLSEA වාර්තා | 25 | 192 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |

NDC 2 - සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන (RECP) පිළිවෙත් යොදාගැනීම වැඩිදියුණු කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන (RECP) සහ බලශක්ති විගණන පැවැත්වීම සහ කර්මාන්ත වර්ගීකරණය හා වැදගත්කම අනුව මූලික දත්ත මට්ටම නිර්ණය කරගැනීම | MoI | NCPC, SLSEA, SLEMA, BOI, SCP හා EE සේවා සපයන්නන් | පිවිතුරු නිෂ්පාදන හා බලශක්ති විගණන සිදුකරන ලද කර්මාන්ත සංඛ්‍යාව හා ප්‍රතිශතය | | MoI වාර්තා | 300 (කර්මාන්ත 3000 - 5000 අතරින්), මූලාශ්‍රය NCPC හා CEA | අදාළ කර්මාන්ත අතරින් 25% (500ක් පමණ) | √ | √ | √ | √ | √ | | | | | | 9.4 |
| 2.2: අඩු කාබන් තාක්ෂණයන් හා ක්‍රියාවලී ඇතුළුව සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන පිළිවෙත් යොදාගැනීම | MoI | MoPC&LG, NCPC, IDB, CDA, RRI, ITI, SCP හා EE සේවා සපයන්නන්, CIAs | සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන පිළිවෙත් හා අඩු කාබන් තාක්ෂණයන් හා ක්‍රියාවලීන් ක්‍රියාත්මක කරන කර්මාන්ත සංඛ්‍යාව | | MoI වාර්තා | 250 | ඉහත ඉලක්ක 500න් 400ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.2, 6.3, 6.4, 7.2, 7.3, 8.4, 8.8, 9.4, 12.2, 12.4 හා 12.5 |
| 2.3: තෝරාගත් කර්මාන්ත උප-අංශවල ජල පරිහරණ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම | MoI | MoPC&LG, NCPC, SLSEA, IDB, CDA, RRI, CIAs | යෙදෙන අදාළ කර්මාන්ත ප්‍රමාණය | | MoI වාර්තා | 100 | අදාළ කර්මාන්ත අතරින් 50%ක් (කෘෂිකර්ම පාදක කර්මාන්තඃ ආහාර හා පාන, කිරි, මත්ස්‍ය සැකසුම්, දිසිඳි පොල්, රෙදි සැකසුම් ආදි) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.4 |
| 2.4: තෝරාගත් කර්මාන්ත උපඅංශවල බලශක්ති කාර්යක්ෂම උපකරණ හා තාක්ෂණ භාවිතය ප්‍රවර්ධනය කිරීම | - | - | - | | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - |
| 2.4.1: ජල අංශය සඳහා අධි-කාර්යක්ෂම මෝටර (HEM) (ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සඳහා) | NWSDB | SLSEA | අධි කාර්යක්ෂම මෝටරවලින් සිදු වූ බලශක්ති ඉතිරිය | | NWSDB වාර්තා | 775 GWh | වර්ෂයකට 18 GWh (2.25%ක අඩුවීමක්) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.3 |
| 2.4.2: උචිත කර්මාන්ත සඳහා විචල්‍ය සංඛ්‍යාත ධාවක (VFD) හඳුන්වා දීම (තේ කර්මාන්තය වැනි) | SLSEA | SLTB, TRI | විචල්‍ය සංඛ්‍යාත ධාවක (VFD) මගින් සිදුවන බලශක්ති ඉතිරිය | | SLSEA හා MoI හරහා ESCO වාර්තා | 590 GWh (බලශක්ති NAMA ව්‍යාපෘතියෙන් පහසුකම් සැපයෙන) | 2,900 GWh | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.4 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.4.3: සුපිරිවෙළෙඳසැල්, රෙදිපිළි හා ඇඟළුම්, හෝටල, කිරි අංශය සඳහා කාර්යක්ෂම සිසිලන හා ශීතකරණ තාක්ෂණය (ප්‍රතිස්ථාපනය) | SLSEA | MoI, MoP&E, BOI, RISC, IDB, ISB, LINDEL, UDA, NCPC, NERDC, GBCSL, CIAs | කාර්යක්ෂම සිසිලන හා ශීතකරණ තාක්ෂණයන් මගින් ලැබෙන බලශක්ති ඉතිරිය | | SLSEA හා MoI හරහා ESCO වාර්තා | 1,300 GWh | 170 GWh | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.5 |
| 2.5: තෝරාගත් කර්මාන්ත උප අංශවල (පොල්, ආහාර කර්මාන්ත වැනි) සම්පත් කාර්යක්ෂමතාව දියුණු කරන අතර අපද්‍රව්‍ය අවමකිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය, සම්පත් නැවත ප්‍රතිසාධනය, ශේෂ (රොන් බොර හා මලාපවහන) සැකසුම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2.5.1: ප්‍රශස්තම ජලය නැවත භාවිත කිරීමේ අවස්ථා සහිතව අපජලය පිළියම් කිරීම ප්‍රවර්ධනය කිරීම (ආහාර පාන, කිරි, සහල් හා වෙනත් ජල-පාදක කර්මාන්ත සඳහා) | MoI | MoPC&LG,, NCPC, IDB, CDA, RRI, ITI, WM සේවා සපයන්න-න්, අදාළ CIAs | අදාළ නියැලෙන කර්මාන්තවලින් ප්‍රතිශතය | | CEA කර්මාන්ත දත්ත සමුදාය | 1,500 | අදාළ කර්මාන්තවලින් 50% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4 |
| 2.5.2: ප්‍රශස්තතම ජලය නවැත භාවිත කිරීම් අවස්ථා සහිතව මලාපවාහන පිළියම් කිරීම ප්‍රවර්ධනය - හෝටල්, බද්ධ නිවාස සංකීර්ණ, ඇඟළුම් කම්හල් හා වෙනත් උචිත කර්මාන්ත (ස්ථානීයව හා මධ්‍යගතව) | MoI | MoPC&LG NCPC, IDB, CDA, RRI, ITI, WM සේවා සපයන්න-න් අදාළ CIAs | අදාළ නියැලෙන කර්මාන්තවලින් ප්‍රතිශතය | | CEA කර්මාන්ත දත්ත සමුදාය | මලාපවාහන ඇතුළත් පිළියම් පද්ධති<br><br>ඇඟළුම් හා රෙදිපිළි - 715, ආහාර පාන - 3952, හෝටිල් හා බද්ධ නිවාස - 2171 (CEAහි EPL දත්ත සමුදායෙනි) | අදාළ කර්මාන්ත-වලින් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4 |
| 2.5.3: අදාළ ස්ථානවල දී ජෛවහායනයට ලක්වන අපද්‍රව්‍ය පිළියම්කරණය දිරිමත් කිරීම (කොම්පෝස්ට් හා ජීවවායුව) | MoI | MoPC&LG, NCPC, IDB, CDA, RRI, ITI, NSWMSC, WM සෙ-ˀවා සපයන්නන්, අදාළ CIAs | අදාළ නියැලෙන කර්මාන්තවලින් ප්‍රතිශතය | | CEහි EPL දත්ත සමුදාය | CEA අනුව පිළිසරු වඩසටහනේ සහායෙන් පළාත් පාලන ආයතනවල පිහිටුවන ලද කොම්පෝස්ට් ව්‍යාපෘති 137 ක් | අදාළ කර්මාන්ත-වලින් 60% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 හා 9.4 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අතරින් 119ක් 2019 මැයි වන විට ක්‍රියාත්මකය.<br><br>කර්මාන්ත අංශයේ දත්ත නො මැති අතර මූලික දත්ත ස්ථාපිත කළ නොහැකිය | | | | | | | | | | | | |
| 2.5.4: ඇසුරුම්, අමුද්‍රව්‍ය හා ප්‍රතික්ෂේපිත ප්‍රමාණය අවම කිරීම | MoI | NCPC, IDB, CDA, RRI, ITI, WM සේවා සපයන්නන්, අදාළ CIAs SLIP | අදාළ නියැලෙන කර්මාන්තවලින් ප්‍රතිශතය | | BOI, CEA, SLIP වාර්තා | BOI කර්මාන්ත අතරින් 70%ක මේ වන විටත් ඇසුරුම් හැකි උපරිම මට්ටමට අවමකර තිබේ. | අදාළ කර්මාන්තවලින් 70% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4 |
| 2.5.5: රසායන ද්‍රව්‍ය භාවිතය අවමකිරීම | MoI | NCPC, IDB, CDA, RRI, ITI, WM සේවා සපයන්නන්, අදාළ CIAs | අදාළ නියැලෙන කර්මාන්තවලින් ප්‍රතිශතය | | CEA, BOI, වාර්තා | BOI කර්මාන්තවලින් 25% | අදාළ කර්මාන්තවලින් 70% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12.4 |
| 2.5.6: අඩු කාබන් තාක්ෂණයන් හා දියුණු කළ සම්පත් කාර්යක්ෂමතාව ක්‍රියාත්මක කිරීම | MoI | තාක්ෂණ සැපයුම් කරුවන්, අදාළ CIA | අදාළ නියැලෙන කර්මාන්තවලින් ප්‍රතිශතය | | හඳුනාගත යුතුය | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | අදාළ කර්මාන්තවලින් 70% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4 |
| 2.5.7: තීන්ත කර්මාන්තය, ටයර් කම්හල් හා මුද්‍රණ කර්මාන්තවල VOC විමෝචන පාලන පද්ධති ප්‍රවර්ධනය කිරීම | CEA | BOI, MoI, IDB, ISB, RISC, NCPC | අදාළ නියැලෙන කර්මාන්තවලින් ප්‍රතිශතය | | CEAහි EPL දත්ත සමුදාය | කර්මාන්ත අංශයේ මේ පිළිබඳ දත්ත නො මැති අතර, මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | අදාළ කර්මාන්තවලින් 30% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12.4 |
| 2.5.8: සහල්මෝල්, රෙදිපිළි හා සෙරමික් කර්මාන්තවල ජලයේ තාපය නැවත ලබාගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීම | SLSEA | MoI, බලශක්ති සේවා සපයන්නන්, අදාළ CIAs | ස්ථාපිත පද්ධති සංඛ්‍යාව | | SLSEA වාර්තා | විභවය හඳුනාගැනීමේ සමීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව මූලික දත්ත ස්ථාපිත කරනු ඇත | විභවය හඳුනාගැනීමේ සමීක්ෂණය පැවැත්වීමෙන් පසුව ඉලක්ක ස්ථාපිත කරනු ලැබේ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.3 |

## NDC 2 - පරිසර හිතකාමී කාර්මික උද්‍යාන ඇතිකිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: පවතින කාර්මික උද්‍යානවලට හරිත කාර්මික සංකල්ප හැකි උපරිමයෙන් ඒකාබද්ධ කිරීමෙන් ඒවා පරිවර්තනයකට ලක් කිරීම | BOI, MoI | RISC, IDB, ISB, LINDEL, UDA | පරිසර හිතකාමී කාර්මික උද්‍යාන බවට පරිවර්තනය කළ BOI EPZ ප්‍රමාණය, පරිසර හිතකාමී කර්මාන්ත උද්‍යාන බවට පරිවර්තනය කළ පවත්නා BOI නොවන කාර්මික උද්‍යාන ප්‍රතිශතය | කාර්මික උද්‍යාන මෙහෙයුම්කරුවන්ගේ වාර්තා | 0 | 04 (පවත්නා අපජල පිළියම්කරණ යටිතල පහසුකම් උත්ශ්‍රේණිගත කිරීම BOI සිදු කළ යුතුය - සීතාවක, හොරණ, කොග්ගල හා මාවතගම EPZ),<br><br>BOI නොවන කාර්මික උද්‍යානවලින් 50%ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4 |
| 3.1.1: පවත්නා සියලු කාර්මික උද්‍යානවල සම්පත් කාර්යක්ෂමතාව පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම හා තිරසර පරිභෝජනය හා නිෂ්පාදන යහ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම | 300 | | | | | | | | | | | | | | | | |
| 3.1.2: පරිසර හිතකාමී කාර්මික උද්‍යාන ස්ථාපිත කිරීම පිළිබඳ නිර්ණායක සකස් කිරීම | 3.1.1 සිට 3.1.10 උප ක්‍රියාකාරකම්වල දායකත්වය 3.1 ප්‍රධාන ක්‍රියාකාරකමේ නිරූපණය කරන අතර, ඒ නිසා උප ක්‍රියාකාරකම් විස්තර මෙම ක්‍රියාත්මක කිරීමේ සැලසුමේ නොදැක්වේ. කෙසේ වෙතත්, මෙම උප ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු පාර්ශ්වකාර ආයතන ඔවුන්ගේම විස්තීර්ණ ක්‍රියාකාරී සැලසුමක් ආයතනික රාමුව හා සමගාමීව සකස් කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. | | | | | | | | | | | | | | | | |
| 3.1.3: පවත්නා සැලසුම් සමාලෝචනය කර දියුණු කිරීම හා පාරිසරික, ආර්ථික හා සමාජ ප්‍රමිති ඇතුළත්ව මාර්ගෝපදේශ ප්‍රශස්තකිරීම | | | | | | | | | | | | | | | | | |
| 3.1.4: වෙනත් රටවල පවත්නා නව්‍ය සංකල්ප සොයාබැලීම හා ක්‍රියාත්මක කිරීම (D4S, පාරිසරික නවෝත්පාදන, LCA, චක්‍රිය ආර්ථිකය, පාරිසරික පහතිකකරණ පද්ධති හා ඩිජිටල් ආර්ථිකය ආදි) | | | | | | | | | | | | | | | | | |
| 3.1.5: කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඇති කාර්මික උද්‍යානවල බලශක්ති, ජල හා ද්‍රව්‍ය කාර්යක්ෂමතාවය, චක්‍රිය ආර්ථික පියවර දියුණු කිරීම සඳහා සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම | | | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.1.6: අපද්‍රව්‍ය උත්පාදනය අවමකිරීම ඇතුළත්ව සාකල්‍ය අපද්‍රව්‍ය කළමනාකරණ (ඝන, ද්‍රව හා වායු) ප්‍රවේශයක් හඳුන්වා දීම | - - - - | | | | | | | | | | | | | | | | | |
| 3.1.7: පවත්නා කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත යටිතල පහසුකම් නැවත සකස්කිරීම හා තිරසර පරිභෝජනය හා නිෂ්පාදන හා හරිත සංකල්ප හා ගැළපෙන සේ ක්‍රියාවලි නැවත සකස් කිරීම | - - - - - | | | | | | | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.1.8: ඩිජිටල් ආර්ථිකය සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සූදානම් කිරීම (ප්‍රධාන පාර්ශ්වකරුවන් හා කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත අතර ජාලගත කිරීම - දත්ත හුවමාරුව, ස්වයං සහතිකකරණය හා අධීක්ෂණය හරහා) | - - - - - - - | | | | | | | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.1.9: වෙනත් රටවල අත්දැකීම් පදනම් කරගෙන, රජය තෝරාගෙන් ස්ථානවල පරිසර හිතකාමී කාර්මික උද්‍යාන 1ක් හෝ 2ක විශේෂිත නිර්මාණ හා සැලසුම් සකස් කිරීම සඳහා සහාය වීම | - - - - - | | | | | | | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.1.10: කර්මාන්ත භාර අමාත්‍යාංශය යටතේ සුදුසු ස්ථාවයල පරිසර හිතකාමී කාර්මික උද්‍යාන නියමු මට්ටමින් ස්ථාපිත කිරීම | - - - - - - - | | | | | | | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.2: සියලුම නව කාර්මික උද්‍යාන පරිසර හිතකාමී කාර්මික උද්‍යාන වශයෙන් ඇතිකෙරෙන බව සහතික කරගැනීම සඳහා මාර්ගෝපදේශ ඇතුළුව ඒ සඳහා අදාළ ප්‍රතිපත්ති හා නියාමන රාමුව හඳුන්වාදීම | | | | | | | | | | | | | | | | | | |
| 3.2.1: හොඳම අන්තර්ජාතික පිළිවෙත් මත පදනම්ව අනාගත පරිසර හිතකාමී කාර්මික උද්‍යාන සඳහා ප්‍රමිති හා මාර්ගෝපදේශ සකස්කිරීම | MoI | MoE, CEA, BOI, RISC, IDB, ISB, UDA, LINDEL, CIAs | පරිසර හිතකාමී කාර්මික උද්‍යාන සඳහා ප්‍රතිපත්ති පැකේජයක් | | MoI වාර්තා | 0 | පරිසර හිතකාමී කාර්මික උද්‍යාන සඳහා ප්‍රතිපත්ති පැකේජයක් හඳුන්වාදීම | √ | √ | √ | √ | | | | | | | 9.4 |

## NDC 4 - තෝරාගත් කර්මාන්ත උප අංශවල හෝ තෝරාගත් කර්මාන්ත කලාපවලට 'චක්‍රිය ආර්ථික' සංකල්පය හඳුන්වාදීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1: චක්‍රිය ආර්ථික සංකල්පය ක්‍රියාත්මක කිරීමේ විභවයක් ඇති උප-අංශ හඳුනාගැනීම හා තීරණය කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම | MoI | BOI, RISC, IDB, NEDA, ISB, LINDEL, UDA, SCP හා WM සේවා සපයන්නන්, CIAs | චක්‍රිය ආර්ථිකය සඳහා හඳුනාගෙන ඇති කර්මාන්ත හා උප කර්මාන්ත ගණන | | MoI වාර්තා | දත්ත නොමැත | අදාළ සියලු කර්මාන්ත | √ | √ | | | | | | | | | 9.4, 12.4 හා 12.5 |
| 4.2: සැපයුම්දාමය හරිතකරණය කිරීම සඳහා තෝරාගත් උප අංශවලට ජීවනචක්‍ර ප්‍රවේශය හඳුන්වාදීම | MoI | NCPC, SCP සේවා සපයන්නන්, CIAs | සැපයුම් දාමය හරිතකරණය කිරීමේ යෙදී සිටින උප අංශ හා කර්මාන්ත ප්‍රතිශතය, නියමු ආදර්ශන ව්‍යාපෘතිය | | MoI, (NCPC, UoM, UoP, UoJP) වාර්තා | 15 (පවත්වනු ලබන්නේ - NCPC, UoM, UoP, UoJP) | 100 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12.4 |
| 4.3: තෝරාගත් කාර්මික උද්‍යානවල සහ කර්මාන්ත උප-අංශවල කාර්මික සහජීවන සංකල්පය ප්‍රගුණ කිරීම (කෘෂිකර්ම-පාදක, ඇඟළුම්, ලෝහ ආදි) | MoI | BOI, RISC, IDB, NEDA, ISB, UDA, LINDEL, SCP හා WM සේවා සපයන්නන්, CIA, ශාස්ත්‍රඥයන්, | කාර්මික සහජීවනය ක්‍රියාත්මක කරන උප අංශ හා නව කාර්මික උද්‍යාන සංඛ්‍යාව | | MoI වාර්තා | 10 කට අඩුය | සියලු උප අංශ හා නව කර්මාන්ත උද්‍යාන | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4 |
| 4.4: තෝරාගත් කාර්මික උද්‍යානවල සහ කර්මාන්ත උප-අංශවල ශූන්‍ය අපද්‍රව්‍ය සංකල්පයේ නියමු ව්‍යාපෘතියක් ඇතිකිරීම | MoI | BOI, RISC, IDB, NEDA, ISB, LINDEL, UDA, SCP හා WM සේවා සපයන්නන්, ශාස්ත්‍රඥයන්, | උප අංශවල ශූන්‍ය අපද්‍රව්‍ය නියමු ව්‍යාපෘති සංඛ්‍යාව | | MoI වාර්තා | ඇඟළුම් හා හෝටල් කර්මාන්තවල කීපයක් | කර්මාන්ත උප අංශ 10 | √ | √ | √ | √ | √ | | | | | | 9.4, 12.4 හා 12.5 |
| 4.5: චක්‍රීය ආර්ථික සංකල්පය සඳහා වන ISO ප්‍රමිතීන් (ISO/TC 323) ක්‍රියාත්මක කිරීම | SLSI | MoI, BOI, RISC, IDB, NEDA, ISB, LINDEL, UDA, SCP හා WM සේවා සපයන්නන්, CIAs | ISO/ITC 323 ක්‍රියාත්මක කළ කර්මාන්ත ප්‍රතිශතය | | SLSI වාර්තා | නැත | අදාළ කර්මාන්තවලින් 70%ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4, 12.4 හා 12.5 |
| 4.6: චක්‍රීය ආර්ථික සංකල්පය අනුගමනය කිරීම සඳහා කර්මාන්තවල ධාරිතාව වර්ධනය කිරීම | MoI | NCPC, SCP හා WM සේවා සපයන්නන්, CIAs | චක්‍රිය ආර්ථික සංකල්පය ක්‍රියාත්මක කළ කර්මාන්ත ප්‍රතිශතය | | Records of MoI වාර්තා | කර්මාන්තවලින් 10% | අදාළ කර්මාන්තවලින් 70%ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.4, 12.4 හා 12.7 |

| NDC 5 - තෝරාගත් කාර්මික උද්‍යාන සඳහා 'ත්‍රිත්ව-ජනන' පහසුකම හඳුන්වාදීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1: කාර්මික උද්‍යාන 10ක ත්‍රිත්ව-ජනන විභවය සම්බන්ධයෙන් කඩිනම් ඇගැයීමක් සිදුකිරීම | SLSEA | BOI, MoI, ශාස්ත්‍රඥය-න් | සම්පූර්ණ කළ කඩිනම් ඇගයීම් සංඛ්‍යාව | | SLSEA වාර්තා | 1 | 9 | √ | √ | √ | √ | | | | | | | 7.2 හා 7.3 |
| 5.2: නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ කාර්මික උද්‍යානයක සවිස්තර තක්සේරුයක් සිදුකිරීම - බියගම ආයෝජන සැලසුම් කලාපයේ | SLSEA | BOI | සවිස්තර තක්සේරුව | | SLSEA වාර්තා | නැත | සවිස්තර තක්සේරුව සම්පූර්ණ කිරීම | √ | √ | | | | | | | | | 7.2 හා 7.4 |
| 5.3: ව්‍යාපාර ආකෘතියක් සහ අරමුදල් විකල්ප සකස් කිරීම | BOI | MoI, SLSEA | ව්‍යාපාර ආකෘතියක් සහ අරමුදල් විකල්ප | | BOI වාර්තා | නැත | ව්‍යාපාර ආකෘතියක් සහ අරමුදල් විකල්ප 3ක් සම්පූර්ණ කර ඇත | | √ | √ | | | | | | | | 7.2 හා 7.5 |
| 5.4: නියමු ව්‍යාපෘතියක් වශයෙන් එක් ත්‍රිත්ව-ජනන පහසුකමක් ඇතිකිරීම | BOI | SLSEA | නියමු ත්‍රිත්ව-ජනන පහසුමක් | | BOI වාර්තා | නැත | එක් නියමු ත්‍රිත්ව-ජනන පහසුකමක් බියගම ස්ථාපිත කිරීම | | | | √ | √ | √ | √ | | | | 7.2 හා 7.6 |
| 5.5: නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත, එය ආයෝජන මණ්ඩලයේ සහ අනෙකුත් කාර්මික උද්‍යානවලට ද අදාළ කරගත හැකි අනෙකුත් ස්ථානවලට ද ව්‍යාප්ත කිරීම | BOI | MoI, SLSEA, CIAs | ස්ථාපිත ත්‍රිත්ව ජනන පහසුකම් ගණන | | MoI, SLSEA, CIAs වාර්තා | නැත | 5 | | | | | | | | √ | √ | √ | 7.2 හා 7.7 |
| 5.6: නව කාර්මික කලාපවලට ත්‍රිත්ව-ජනන පහසුකම් ඇතිකිරීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රතිපත්ති මෙවලම් හරහා ඊට විධිවිධාන සැලසීම | MoI | SLSEA, CIAs | ප්‍රතිපත්තිමය පැකේජයක් | | MoI වාර්තා | නැත | ප්‍රතිපත්ති පැකේජයක් හඳුන්වා දීම | | | | | | | | √ | √ | √ | 7.2 හා 7.8 |

## NDC 6 - සිමෙන්ති කර්මාන්තයේ ක්ලින්කර් නිෂ්පාදනයේ දී හරිතාගාර වායු නිෂ්පාදනය අඩුකිරීම සඳහා දිරිගැන්වීම්

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 6.1: කර්මාන්තයේ ප්‍රමිතීන් හා ජගත් ප්‍රවණතා අනුව යමින්, සිමෙන්ති නිෂ්පාදනය සඳහා ක්ලින්කර් වෙනුවට අළු සහ ඊට සමාන වෙනත් අමුද්‍රව්‍ය භාවිතය ඉහළ නැංවීමට හැකිවන ලෙස සිමෙන්ති නිෂ්පාදනය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) ප්‍රමිතිවලට අවශ්‍ය සංශෝධන සිදුකිරීම (වළක්වන ලද ක්ලින්කර් නිෂ්පාදනය නිසා අඩු වූ හරිතාගාර වායුවිමෝචන) | SLSI | අදාළ සිමෙන්ති කර්මාන්තය, MoI, MoE, CEA | අදාළ ප්‍රමිතීන් හඳුන්වා දීම, හරිතාගාර වායු අඩු කිරීම | | SLSI, අදාළ සිමෙන්ති කර්මාන්තයේ වාර්තා | පවත්නා SLSI ප්‍රමිතිය | අදාළ ප්‍රමිති දෙකක් මේ වන විටද හඳුන්වා දී ඇතත්, පරිශීලකයන්ගේ දැනුම්වත්භාවය ඇති කළ යුතුය. හරිතාගාර වායු විමෝචන අඩුකිරීමේ ප්‍රතිශතය හා නිශ්චිත ප්‍රමාණය | √ | | | | | | | | | | 9.4, 12.2, 12.4 හා 12.5 |

## NDC 7 - NDC සහාය ප්‍රතිපත්ති මෙවලම් හා උපකරණ හඳුන්වා දීම (සාමාන්‍ය සබලකාරක ක්‍රියාකාරකම්)

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 7.1: තෝරාගත් උප අංශවල කර්මාන්තවලට හරිතාගාර වායු විමෝචන අඩුකිරීම අරමුණු කරගත්, ISO 50001 හා ISO 14064-1 (යාවත්කාලීන) වැනි අදාළ ISO පද්ධති යොදාගැනීම සඳහා පහසුකම් සැලසීම (උප අංශ: තේ, රෙදිපිළි හා ඇඟලුම්, ආහාර සැකසුම් ආදි) | MoI | SLSI, BOI, RISC, IDB, NEDA, ISB, UDA, LINDEL, NCPC, EE, SCP හා WM සේවා සපයන්නන්, CIAs | විවිධ ISO පද්ධති ක්‍රියාත්මක කරන කර්මාන්ත ප්‍රතිශතය | | NCPC වාර්තා | 100 | අදාළ කර්මාන්තවලින් 25% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.3, 8.8, 9.4, 12.2, 12.4 & 12.5 |
| 7.2: තිරසර තාක්ෂණයන් අත්පත් කරගැනීම සඳහා ද්විත්ව අඩුකිරීම වැනි සුදුසු බදු සහන දිරිගැන්වීම් හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම | MoI | MoF | මූල්‍ය සහ මූල්‍ය නොවන දිරිගැන්වීම් | | MoI වාර්තා | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | අදාළ කර්මාන්තවලින් 50% | √ | √ | √ | √ | | | | | | | 8.3 & 9.3 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7.3: ශ්‍රී ලංකා තිරසර (හරිත) රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට ප්‍රවේශ වීම සඳහා, පරිසරය හා සම්බන්ධ ISO සහතික ලත් සමාගම්වලට ප්‍රවේශවීම සඳහා පහසුකම් සැලසීම | MoE (පරිසර සැලසුම් හා ආර්ථික අංශය) | MoI, MoF | ශ්‍රී ලංකා තිරසර (හරිත) රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට ප්‍රවේශ වන පරිසරය පිළිබඳ ISO සහතික ලපත් සමාගම් සංඛ්‍යාව හා ප්‍රතිශතය | | MoE හා MoF වාර්තා | නැත | ශ්‍රී ලංකා තිරසර (හරිත) රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දුන් පසුව ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12.7 |
| 7.4: හරිත මූල්‍යකරණය සමගින් සම්බන්ධ කරමින් මූල්‍යකරණ ආයතන හරහා පරිවර්තනීය ආයෝජන සහ වාසිසහගත ණය පහසුකම් ලබාගැනීමට පහසුකම් සැලසීම | MoI | MoF | හරිත මූල්‍යකරණයෙන් ප්‍රතිලාභ ලබන කර්මාන්ත සංඛ්‍යාව හා ප්‍රතිශතය | | MoI වාර්තා | SMILE III ණය යෝජනා ක්‍රමය - 2013-2020 අතර කාලයේ දී රු. මිලියන 13522.80ක ව්‍යාපෘති 2997ක්<br><br>E-Friends II ණය යෝජනා ක්‍රමය - 2018-2020 අතර රු. මිලියන 935.75ක ව්‍යාපෘති 96ක් | SMILE III ණය යෝජනා ක්‍රමය - වර්ෂයකට රු. බිලියන 1.5ක්<br><br>E-Friends II ණය යෝජනා ක්‍රමය - වර්ෂයකට රුත මිලියන 600 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.3 |
| 7.5: කාර්මික උද්‍යාන සහ තනි කර්මාන්ත පිහිටන ස්ථාන, චක්‍රීය ආර්ථිකය, කර්මාන්ත පරිසර විද්‍යාව, සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදනය, ඩිජිටල්කරණය යනාදී නව සංකල්ප ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම | MoI | MoE, CEA, අදාළ CIAs, ශාස්ත්‍රඥයන් | ප්‍රතිපත්ති මාලාව | | MoI වාර්තා | නැත | ප්‍රතිපත්ති මාලාව ශක්තිමත් කිරීම | √ | √ | √ | √ | | | | | | | 8.3 & 9.4 |
| 7.6 කර්මාන්තවල පරිහරණය සඳහා තිරසර ජෛව ස්කන්ධ පවතින බව සහතික කරගැනීම | | | | | | | | | | | | | | | | | | |
| 7.6.1: අදාළ ප්‍රතිපත්ති සම්පාදන හා නියාමන අධිකාරීන් සමග අවශ්‍ය පහසුකම් හා සම්බන්ධීකරණයෙන්, SLSI 1551 ප්‍රතිපත්ති මෙවලම් ක්‍රියාත්මක කිරීමෙන් කර්මාන්තවල පරිහරණය සඳහා තිරසර ජෛව ස්කන්ධ පවතින බව සහතික කරගැනීම | SLSEA | FD , MoP&E, MASL | තිරතර ජෛව ස්කන්ධයට ප්‍රවේශය ඇති කර්මාන්ත ප්‍රතිශතය | | SLSEA වාර්තා | අනිවාර්ය වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීමෙන් පසුව මූලික දත්ත ස්ථාපිත කෙරේ | අදාළ කර්මාන්තවලින් 100% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7.7: කර්මාන්තවලට අඩු කාබන් මුලපිරීම් ආරම්භ කිරීම සඳහා දිරිමත් කිරීමක් ලෙස ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය (NGRS) ප්‍රවර්ධනය කිරීම | MoE (පරිසර සැලසුම් හා ආර්ථික අංශය) | MoI, CEA, SLSEA, BOI, RISC, IDB, NEDA, ISB, LIN-DEL, UDA, NCPC, CCC, ITI, CIAs | ලියාපදිංචි වූ හා වාර්තා කළ හරිත වාර්තාකරුවන් ගණන | | MoE වාර්තා | මේ වන විට 178ක් ලියාපදිංචි වී ඇති අතර, වාර්ෂික වාර්තා ලබාදෙන්නේ ඉන් 10%කි | ලියාපදිංචියේ 20%ක වාර්ෂික වර්ධනයක් හා ඉන් 50%ක් වාර්ෂික වාර්තා ලබා දීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12.6 |

## 3.5 අපද්‍රව්‍ය අංශය

අපද්‍රව්‍ය අංශය මිනිස් ජීවිතවලට ඇති කරන විවිධ බලපෑම්වලින් නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාව සෘජුවම හා දැඩි ලෙස බලපෑමට ලක් වේ. අපද්‍රව්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව පරිසරයට, ජෛව විවිධත්වයට, මහජන සෞඛ්‍යයට, සමාජයට හා ආර්ථිකයට සෘජුව බලපායි. තිරසර සංවර්ධන අභිමතාර්ථවල වැදගත් කාර්යයක් අපද්‍රව්‍ය අංශයට ඇති අතර, ඊට 3 වන අභිමතාර්ථය (යහපත් සෞඛ්‍යය හා යහපැවැත්ම), 11වන අභිමතාර්ථය (තිරසර නගර හා ප්‍රජාවන්) හා 12 වන අභිමතාර්ථය (වගකිව යුතු පරිභෝජනය හා නිෂ්පාදනය) ඇතුළත්ය. අපද්‍රව්‍ය යනු ගෝලීය මට්ටමේ ගැටලුවක් වන අතර, 2025 වර්ෂය වන විට ඒක පුද්ගල නාගරික ඝන අපද්‍රව්‍ය උත්පාදනය කිලෝග්‍රෑම් 1.42ක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මේ අනුව, ඒ වන විට ලෝකයේ නාගරික ප්‍රදේශවල වාසය කරන බිලියන 4.3ක් පමණ ජනතාව විසින් නාගරික ඝන අපද්‍රව්‍ය ටොන් බිලියන 2.2ක් වාර්ෂිකව උත්පාදනය කරනු ඇතැයි ගණන් බලා ඇත[28].

ශ්‍රී ලංකාවේ දිනකට නාගරික ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 8,000ත් 9,000ක් අතර ප්‍රමාණයක් (දිනකට එක් පුද්ගලයෙකුට කි.ග්‍රෑ. 0.41කට සමාන ප්‍රමාණයක්) ජනනය වන අතර, ඉන් මෙට්‍රික් ටොන් 3,500ක් (43%) බස්නාහිර පළාතේ උත්පාදනය වේ. පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය එකතු කරන ප්‍රමාණය ගත් විට, බස්නාහිර පළාතේ 60%ක් ද අනෙක් පළාත්වල 30%ක් ද පමණ එකතු කරනු ලැබේ[29]. ජනගහන වර්ධනය, යටිතල පහසුකම් වේගවත්ව සංවර්ධනය වීම, ශීඝ්‍ර නාගරිකරණය, කාර්මික සංවර්ධනය, ඒක පුද්ගල ආදායම ඉහළ යෑම හා ජීවන තත්ත්වයේ වර්ධනය, වෙනස්වන ජීවනරටාව හා ආර්ථික තත්ත්ව නිසා, එළැඹෙන 2021-2030 දශකයේ දී නාගරික ඝන අපද්‍රව්‍ය උත්පාදනය තවත් වැඩි වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත්, වර්තමානයේ පවත්නා ගෝලීය අර්ථික තත්ත්වයේ පිරිහීම හා රටේ ආර්ථිකය තාවකාලිකව හෝ හැකිලීම නිසා අපද්‍රව්‍ය එකතු කිරීමේ සැලකිය යුතු වෙනස්කම් සිදුවී ඇති බව හඳුනාගෙන තිබේ. එය 2021 හා 2022 දී ඇස්තමේන්තු කරන ලද හරිතාගාර වායු විමෝචන අවමකිරීමේ ප්‍රගතිය පෙන්වා දෙන්නක් විය හැකි අතර, මේ තත්ත්වය 2023 වර්ෂයේ දී ද පැවතිය හැකිය. අපද්‍රව්‍ය එකතු කිරීමේ සුදුසු යාන්ත්‍රණවල ආවරණය සීමාසහිත වීම, අපද්‍රව්‍ය එකතුකිරීම සහ අවසන් බැහැරලීම සඳහා පවත්නා යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සහ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජනතාවගේ දැනුම්වත් භාවය හා කැපවීම ප්‍රමාණවත් නොවීම, 3R මූලධර්ම යොදාගැනීම පිළිබඳව ඇති ප්‍රායෝගික දුෂ්කරතා වත්මන් අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් පදනම් වී ඇති ගැටලු කිහිපයක් වේ. අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා යොදාගත හැකි තාක්ෂණයන් හා ක්‍රම පිළිගත් ඒවා වුවත්, පවත්නා අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් අනාකූල කර හා නවීකරණය කිරීමට නව්‍ය තාක්ෂණයන් හා උපායමාර්ග තවමත් හඳුන්වා දී නැත.

ජාතික මට්ටමේ දී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පරිසරය හා සම්බන්ධ ප්‍රතිපත්ති, උපායමාර්ග මාර්ගෝපදේශ ඇතුළත් වන නීතිමය සහ ආයතනික රාමුවක් ශ්‍රී ලංකාව සතුය. අපද්‍රව්‍ය අංශයේ අනාගතය හා හරිතාගාර වායු විමෝචන අවමකිරීමේ හැකියාව ගත් විට මෑතදී අනුමත කරන ලද අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019) මගින් ප්‍රමුඛතාවය ලබා දී ඇති අරමුණු වන්නේ අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම සහ අඩුකරගැනීමයි. මීළඟ කළමනාකරණ මට්ටමේ දී සිදුකරන නිර්දේශ අතර, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය හා පරිසර හිතකාමී අන්දමින් අපද්‍රව්‍ය බැහැර කරන අනෙකුත් ආකාර; වැළැක්විය නොහැකි අපද්‍රව්‍ය හැකිතාක් දුරට නැවත භාවිතය; අපද්‍රව්‍යවල අන්තරායකර ද්‍රව්‍ය ඇතුළත්වීම අඩුම මට්ටමින් පවත්වා ගැනීම; සහ පාරිසරික වශයෙන් යහපත් අවශේෂ කසළ ප්‍රතිකර්ම හා බැහැරකිරීමේ කටයුතු සිදුකිරීම වේ. කසළ උත්පාදනය වන සමාජ-සංස්කෘතික ක්‍රමයක සිට, කසළ නැවත භාවිත කිරීම හා පරිභෝජනය අඩු කිරීම අපේක්ෂාවෙන් කසළ බැහැර කිරීම අවම කිරීම ප්‍රවර්ධනය කරන සුසමාදර්ශයකට මාරුවීම මෙයින් පෙනේ. වෙන්කරන ලද ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතුකිරීම සඳහා සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණය කිරීම, ප්ලාස්ටික් කර්මාන්තය සඳහා ගුණාත්මක අමුද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීම ලාබදායී ව්‍යාපාරයක් ලෙස 2021-2030 ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලසුම මගින් හඳුනාගෙන තිබේ.

28 Bhada-Tata, P.H.; Daniel, A. What a Waste? A global review of solid waste management (English). In Urban Development Series Knowledge Papers; No. 15; World Bank Group: Washington, DC, USA, 2012.

29 National Environment Action Plan 2022-2030 (NEAP)



මෙය සැලසුමේ ප්‍රධාන ක්‍රියාකාරකමකි[30]. 2006, 2017[31] හා 2021[32] දී නිකුත් කරන ලද ගැසට් පත්‍ර මගින් මයික්‍රෝන 20 ට අඩු පොලිතින් නිෂ්පාදන හා තනි භාවිත ප්ලාස්ටික් භාවිතය සහ ප්ලාස්ටික් විවෘත දහනය කිරීම ආදිය තහනම් කිරීම අවධාරණය කර තිබේ. මීට අමතරව, අධ්‍යාපනය තුළින් දැනුම්වත්භාවය ඇති කිරීම හා මහජනතාව අතර ආකල්පමය වෙනසක් ඇති කිරීම හා වෙනත් පියවර ද තිරසර අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සඳහා අවශ්‍ය වේ. අපද්‍රව්‍ය විවෘත භූමියේ බැහැරකිරීම පිළිබඳ දීර්ඝකාලීන විසඳුමක් සහ අපද්‍රව්‍ය උත්පාදනය සඳහා මූල්‍යමය නිරනුබලයක් ඇතිකිරීම අවශ්‍යව තිබේ.

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) තාක්ෂණික සහාය ඇතිව වෙනත් පාර්ශ්වකාර ආයතනවල උපදේශනයත් යොදාගනිමින් බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (WMA-WP) මගින් වර්ෂ විස්සක කාලයක් (2022 සිට 2043 දක්වා) සඳහා නාගරික ඝන අපද්‍රව්‍ය මහ සැලසුමක් සම්පාදනය කර ඇත[33]. මේ මහ සැලසුම අනුව අපද්‍රව්‍ය කළමනාකරණයේ දී චක්‍රිය ආර්ථික මූලධර්ම ප්‍රවර්ධනය කිරීමෙන් අපද්‍රව්‍ය උත්පාදනය තවදුරටත් අඩුකිරීම වැදගත්බව දක්වා තිබේ. එසේම, කොම්පෝස්ට් කිරීම, ප්‍රතිචක්‍රීකරණය, අපද්‍රව්‍යවලින් විදුලිය ජනනය වැනි තාක්ෂණික විකල්ප මගින් සම්පත් ප්‍රතිසාධනය කිරීම සඳහා ඉලක්ක ඇතිකරගෙන තිබේ. මේ අනුව උක්ත මහ සැලසුම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමත් සමඟ පළාතේ අපද්‍රව්‍ය විවෘත භූමිවල බැහැරලීම අවසන් වනු ඇත. ශ්‍රී ලංකාවේ නාගරික ඝන අද්‍රව්‍ය බැහැරලන භූමි ආරක්ෂිතව වසාදැමීම හා පුනරුත්ථාපනය පිළිබඳ මාර්ගෝපදේශ (2021) මගින් මේ ප්‍රයත්නයට තවදුරටත් සහාය ලැබේ[34].

දිනකට මෙට්‍රික් ටොන් 700ක් සහ දිනකට මෙට්‍රික් ටොන් 500ක් භාවිත කරමින් බස්නාහිර පළාතේ අපද්‍රව්‍යවලින් බලශක්තිය උත්පාදනය සඳහා වූ ව්‍යාපෘති දෙකක් සඳහා පෞද්ගලික ආයතන දෙකකට අවසරය ලබාදී තිබේ. මේ පළමු බලාගාරය කෙරවලපිටියේ ස්ථාපිත කර ඇති අතර, එය මේ වන විට වාණිජමය වශයෙන් ක්‍රියාත්මක තත්ත්වයේ ඇත. අනෙක් ව්‍යාපෘතිය අවලංගු කර තිබේ. මේ පළමු බලාගාරයේ ක්‍රියාකාරිත්වය නිසා එකතු කරනු ලබන දහනය කළ හැකි අපද්‍රව්‍යවලින් 45%ක් බලශක්තිය ලබාගැනීම සඳහා යොදාගැනේ. කෙසේ වෙතත්, විදුලි උත්පාදනය සඳහා යොදාගත හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳව හා පෝෂක අයක්‍රම පිළිබඳව මෙහෙයුම් ගැටලු පවතී. එමෙන්ම බලාගාරය මිශ්‍ර අපද්‍රව්‍ය බාරගන්නා බැවින් අපද්‍රව්‍ය වෙන්කිරීම හා ප්‍රතිචක්‍රිකරණය සඳහා ඇති විය හැකි බලපෑම ගැන ද සැලකිය යුතුව තිබේ.

බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ කොම්පෝස්ට් පහසුකම් තුනට අමතරව කොම්පෝස්ට් පහසුකම් 27ක් ක්‍රියාත්මක වන අතර, ඒවායේ මුළු ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 300කි. ඉහත දැක්වූ පහසුකම්වලින් කොම්පෝස්ට් කරනු ලබන්නේ මේ වන විට එකතු කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් 12%ත් පමණක් වන අතර, පළාත්පාලන ආයතනවලින් (විධිමත් අංශය) ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන්නේ එකතු කරන කසළ අතරින් 2%ක් පමණි. එසේම අවිධිමත් අංශයෙන් මීට වඩා හතර ගුණයත්, පස් ගුණයත් අතර ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කරන බව සලකනු ලැබේ. කෙසේ වෙතත්, එකතු කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් 40%ක් පමණ තවමත් විවෘත බැහැරලීම් ස්ථාන 21ක පමණ බැහැර කරනු ලැබේ.

වෙනත් පළාත්වල දී දෛනික අපද්‍රව්‍ය ප්‍රවාහයේ ඇති ද්‍රව්‍ය ප්‍රතිසාධනය සඳහා යොදාගන්නා ප්‍රධාන ක්‍රමවේදය වන්නේ ප්‍රතිචක්‍රීකරණය හා කොම්පෝස්ට් නිපදවීමය. කොම්පෝස්ට් පහසුකම් ගත් විට දිනකට මෙට්‍රික් ටොන් 50ක ධාරිතාවය සහිත කවෂිමා (KAWASHIMA) කොම්පෝස්ට් නිෂ්පාදන පහසුකම් 9ක් ඇතිකිරීමට පළාත්පාලන හා පළාත්සභා අමාත්‍යාංශය කටයුතු කර තිබේ.

30 https://ccet.jp/sites/default/files/2021-08/srilanka_report_web_fin_pw.pdf

31 Gazette No.2034/34 to 38 -2017.09.01

32 Gazette No.2211/51 of 2021.01.21

33 Government of Sri Lanka. (2023). Western Province Solid Waste Management Master Plan. Retrieved from https://wma.wp.gov.lk/notice/8

34 https://ccet.jp/publications/guidelines-safe-closure-and-rehabilitation-municipal-solid-waste-dumpsites-sri-lanka

ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් අපද්‍රව්‍ය (e-waste), සෞඛ්‍ය අංශයේ අපද්‍රව්‍ය, ගොඩනැගිලි ඉදිකිරීම් හා බිඳහෙළීම් අපද්‍රව්‍ය, රසායනික හා වෙනත් අන්තරායකර අපද්‍රව්‍ය, ආදී වෙනත් ප්‍රධාන අපද්‍රව්‍ය ප්‍රවාහ ගණනාවක් කළමනාකරණය කිරීම ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අභියෝගයකි. ඊට හේතුව ප්‍රමාණවත් ගබඩා ඉඩ නොමැති වීම, පිළියම් කිරීමට හා බැහැරලීමට පහසුකම් නොමැති වීම නිසාය. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පිළිබඳ ගතහොත්, මධ්‍යම පරිසර අධිකාරිය මගින් බලපත්‍රලත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන්නන්ගේ ලේඛනයක් පවත්වාගෙන යයි. අන්තරායකර අපද්‍රව්‍ය ආරක්ෂිත ලෙස කළමනාකරණය කළ හැකි එකම පහසුකම වන්නේ කලින් හොල්සිම් ජියෝසයිකල් ලෙස හැඳින් වූ INSEE එකෝසයිකල් ලංකා (පෞද්ගලික) සමාගමේ සිමෙන්ති සැකසුම් කර්මාන්තශාලාවයි. මේ පහසුකම භාවිත කරමින් දශක කීපයක් තිස්සේ එකතු වී තිබූ කල් පසු වූ දිගුකල් පවත්නා විෂ රසායනවලින් කොටසක්ද, පළිබෝධනාශක හා වෙනත් දූෂිත නිෂ්පාදන ද, PCB ඇතුළත් තෙල් ද බැහැර කිරීම සඳහා යොදාගනු ලැබේ. මීට අමතරව, පළාත් පාලන ආයතන ගණනාවක්ම ඔවුන්ගේ වෙන් කරන ලද දහනය කළ හැකි අපද්‍රව්‍ය INSEE සමාගම වෙත එවනු ලැබේ. සෞඛ්‍ය අංශයේ අපද්‍රව්‍ය පිළිබඳව ගතහොත්, සාකල්‍ය අපද්‍රව්‍ය කළමනාකරණ සංකල්පය අනුගමනය කිරීම සඳහා ඒ අංශයේ ආයතන සැලකිය යුතු ප්‍රයත්න දරා ඇත. වැඩි සෞඛ්‍ය පහසුකම් ගණනාවක අපද්‍රව්‍ය වර්ගීකරණයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන හා පිළියම් කිරීමේ ක්‍රමවේද (හස්මීකරණය හා දෙමුහුම් පීඩනතාපක) හඳුන්වා දී ඇතත්, මේ ප්‍රතිකාර පහසුකම් නිසි ලෙස ක්‍රියාත්මක වීම හා ප්‍රතිකාර කරන ලද ද්‍රව්‍ය/ ශේෂ බැහැරලීම පිළිබඳව ගැටලු පවතී. මේ තත්ත්වය විසඳීම සඳහා අන්තර්ජාතික සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ඇතිව සෞඛ්‍ය අංශයේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ආරම්භ කර ඇත.

අපද්‍රව්‍ය අංශයේ NDC (3-5 වගුවේ සඳහන්) මගින් අපද්‍රව්‍ය කළමනාකරණය හා තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිවල (SCP) පැහැදිලිව සඳහන් වන චක්‍රීය ආර්ථික සංකල්ප පිළිග නිමින්, හරිතාගාර වායු විමෝචන අවමකරගැනීමේ අභිලාෂ ඉහළ නංවනු ඇත.

3-5 වගුව අපද්‍රව්‍ය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව

| NDC # | NDC |
|---|---|
| 1 | නාගරික ඝන අපද්‍රව්‍ය උත්පාදනය වන ප්‍රභව සියල්ලේම "චක්‍රීය ආර්ථික" පිළිවෙත් වැඩිදියුණු කිරීම |
| 2 | ජෛවභායනයට ලක්වන අපද්‍රව්‍ය ප්‍රතිකාර තුළින් කළමනාකරණය |
| 3 | වෙනත් ක්‍රමවලින් කළමනාකරණය කළ නොහැකි, කොම්පෝස්ට් කළ නොහැකි හා ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි සහ අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්තිය ජනනය හඳුන්වාදීම |
| 4 | අවශේෂ අපද්‍රව්‍ය (කොම්පෝස්ට් කළ නොහැකි, ප්‍රතිචක්‍රියකරණය කළ නොහැකි, ප්‍රතිසාධනය කළ නොහැකි හා බලශක්තිය උත්පාදනයෙන් පසු ඉතිරි වන ශේෂ) බැහැර කිරීම සඳහා වන සනීපාරක්ෂිත කසළ බිම් පිරවුම් භාවිතා කිරීම, බර අනුව දැනට පවතින 5%ක ප්‍රමාණයේ සිට 100% දක්වා ඉහළ නැංවීම |
| 5 | සාමාන්‍ය සබලකාරක ක්‍රියාකාරකම් |

2021 සිට 2030 දක්වා කාලසීමාව තුළ දී NDC ක්‍රියාත්මක කිරීම මගින් අපද්‍රව්‍ය අංශයේ හරිතාගාර වායු විමෝචන කටයුතු පුරුදු පරිදි සිදුවන තත්ත්වයට සාපේක්ෂව 11%කින් (කොන්දේසි රහිතව 8.5%ක් සහ කොන්දේසි සහිතව 2.5%ක්) අඩුකරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරයි. එය එම කාලසීමාව සඳහා ඇස්තමේන්තු කළ කාබන් ඩයොක්සයිඩ් සහ එවැනි අනෙකුත් හරිතාගාර වායු මෙට්‍රික් ටොන් 2,549,000ක් (මෙට්‍රික් ටොන් 1,969,000කින් කොන්දේසි රහිතව ද, මෙට්‍රික් ටොන් 580,000ක් කොන්දේසි සහිතව ද) අඩු කිරීම හා සමාන වේ (3-6 රූපය බලන්න).




3-6 රූපය අපද්‍රව්‍ය අංශයේ හරිතාගාර වායු ප්‍රක්ෂේපණ හා අඩුකිරීමේ ඉලක්ක

## 3.5.1 අපද්‍රව්‍ය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

| NDC 1 - නාගරික ඝන අපද්‍රව්‍ය ජනනය වන ප්‍රභව සියල්ලේම "චක්‍රීය ආර්ථික" පිළිවෙත් වැඩිදියුණු කිරීම | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: අපද්‍රව්‍ය වර්ධනය වන වේගය 10%කින් අඩුකිරීම හරහා නාගරික ඝන අපද්‍රව්‍ය උත්පාදනය වැළැක්වීම, මගහැරීම හෝ අඩුකිරීම හා කර්මාන්තවල ජනනය වන ඝන අපද්‍රව්‍ය හා අපදියර ප්‍රමාණයෙන් පිළියම් කිරීම හා බැහැරලීම සඳහා ආවරණය කරන මුළු ප්‍රමාණය | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.1.1: නාගරික ඝන අපද්‍රව්‍ය උත්පාදනයේ වර්ධන වේගය 10%කින් අඩු කිරීම | පළාත් සභා සහ පළාත් පාලන ආයතන භාර අමාත්‍යාංශ | LAs, WP-WMA, NSWMSC, MoE, LAs, PCs | අපද්‍රව්‍ය උත්පාදනය වර්ධනය වන වේගය අඩු කිරීම | | වාර්ෂික අපද්‍රව්‍ය විගණනයෙන් දත්ත ලබාගැනීම - බස්නාහිර පළාතට - WP-WMA, වෙනත් පළාත් සඳහා - NSWMSC | 2% (ඇස්තමේන්තුගත නාගරික ඝන අපද්‍රව්‍ය උත්පාදන වේගය දිනකට මෙට්‍රික් ටොන් 7000 හා ඇස්තමේන්තු කළ වාර්ෂික වර්ධන වේගය 2%) | 1.8% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.6, 3.9, 8.4, 12.2, 12.3, 12.5 |
| 1.1.2: උත්පාදනය වන කාර්මික ඝන අපද්‍රව්‍ය හා අපදියරවලින් ප්‍රතිකාර කිරීම හා බැහැරලීම සඳහා ආවරණය වන මුළු ප්‍රමාණය (ප්‍රධාන කර්මාන්ත, ආයෝජන මණ්ඩල කලාප, ආයෝජන මණ්ඩල නොවන කාර්මික උද්‍යාන, ආයෝජන මණ්ඩල අනුමත තනිව පිහිටි කර්මාන්ත, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හැර වෙනත් තනිව පිහිටා ඇති කර්මාන්ත) | MoI | MoE, BOI, IDB, RISC, UDA, ISB, LINDEL, CCC, CEA, LAs, NWPEA | කාර්මික ඝන අපද්‍රව්‍ය හා අපදියර ප්‍රමාණයෙන් පිළියම් කිරීම හා බැහැරලීමෙන් ආවරණය වන ප්‍රමාණය | | CEA, BOI හා වෙනත් කර්මාන්ත කලාප මෙහෙයුම්කරුවන්ගෙන් වෙතින් ලබාගත් දත්ත | BOI කලාපවල ඝන අපද්‍රව්‍ය උත්පාදනය වන වේගය දිනකට මෙට්‍රික් ටොන් 269ක් හා අපදියර උත්පාදනය දිනකට ඝනමීටර් 48110ක් පමණ වේ | උත්පාදනය වන ඝන අපද්‍රව්‍ය හා කාර්මික අපදියරවලින් 100%ක් ආවරණය වීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 8.4, 9.4, 11.6, 12.2, 12.3,12.5 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වෙනත්<br><br>මූලික දත්ත හඳුනාගත යුතුය | | | | | | | | | | | | |
| 1.2: නාගරික ඝන අපද්‍රව්‍ය ඒවායේ ප්‍රභවයේදීම වර්ගීකරණය කිරීම, වැඩිදියුණු කිරීම සහ එසේ වර්ගීකරණය කරනු ලබන වර්ග සංඛ්‍යාව වැඩිකිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.2.1: අපද්‍රව්‍ය වර්ගීකරණය කරන මට්ටම ඉහළ නැංවීම (දිරාපත් වන හා දිරාපත් නොවන) | MoPC&LG | NSWMSC, LAs, PCs, WP-WMA | අපද්‍රව්‍ය වර්ගීකරණය කරනු ලබන ප්‍රතිශතය | | දත්ත මූලාශ්‍ර - බස්නාහිර පළාත - WP-WMA, වෙනත් පළාත් - NSWMSC | බස්නාහිර පළාතේ = 60%<br><br>වෙනත් පළාත් = 30% (සාමාන්‍යය) | 2025 වන විට බස්නාහිර පළාතේ =75%<br><br>වෙනත් පළාත් - 60% (සාමාන්‍ය අගය) | √ | √ | √ | √ | √ | | | | | | 11.6, 12.3, 12.5 |
| 1.2.2: ප්‍රභවයේ දීම අපද්‍රව්‍ය වර්ගීකරණය කරන කාණ්ඩ ගණන 2 සිට 3 දක්වා ඉහළ නැංවීම (දිරාපත් වන, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි, අවශේෂ) | MoPC&LG | NSWMSC, WP-WMA, LAs | සිය අපද්‍රව්‍ය වර්ගීකරණය කරන කාණ්ඩ ගණන 2 සිට 3 දක්වා ඉහළ නංවා ඇති පළාත් පාලන ආයතන ගණන | | දත්ත මූලාශ්‍ර - බස්නාහිර පළාත - WP - WP-WMA, වෙනත් පළාත් - NSWMSC | බස්නාහිර පළාතේ = 2020 දී පළාත් පාලන ආයතන 30ක්<br><br>වෙත් පළාත්වල = 2020 දී පළාත් පාලන ආයතන 60ක් | 2027 වන විට සියලුම පළාත් පාලන ආයතන | √ | √ | √ | √ | √ | √ | √ | | | | 11.6, 12.4, 12.6 |
| 1.3: නාගරික ඝන අපද්‍රව්‍ය එකතු කිරීම හා ප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීම (වාහන, හුවමාරු ස්ථාන, එකතු කිරීමේ ස්ථාන වැනි යටිතල පහසුකම් හා මාර්ග සැලසුම්කිරීම හා GPS මගින් අධීක්ෂණය ඇතුළු තාක්ෂණය හා ධාරිතා වර්ධනය වැනි කටයුතු සඳහා) | MoPC&LG | NSWMSC, LAs, PCs, WP-WMA, UDA | අපද්‍රව්‍ය එකතු කිරීමේ සේවා මගින් ආවරණය වන ජනගහනයේ ප්‍රතිශතය | | බස්නාහිර පළාත-WP-WMA<br><br>වෙනත් පළාත් NSWMSC | බස්නාහිර පළාත = 60% (මහනගර සභා = 65%, නගර සභා = 72%, ප්‍රා-දේශීය සභා = 32%)<br><br>වෙනත් පළාත් = 30% | බස්නාහිර පළාත = 75%<br><br>වෙනත් පළාත් = 60% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 9.a, 11.6, 12.5 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.4: එකතු කරන ප්‍රමාණය මත පදනම්ව, පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන ප්‍රමාණය ඉහළ නැංවීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.4.1: බස්නාහිර පළාතේ වර්තමානයේ ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන ප්‍රතිශතය ඉහළ නැංවීම (අපද්‍රව්‍ය ප්‍රතිවර්ත අලෙවි යන්ත්‍ර, නව තාක්ෂණික වර්ගීකරණ යන්ත්‍ර ආදිය. එකතුකිරී අනාකූල කිරීම, අපද්‍රව්‍ය එකතු කිරීමේ හා වර්ගීකරණය කිරීමේ මධ්‍යස්ථාන ආදිය ) | MoPC&LG | NSWMSC පෞද්ගලික අංශයේ ප්‍රතිචක්‍රීකරණය කරන්නන් හා එකතු කරන්නන්, වෙළෙඳ නාම හිමිකරුවන් | පළාත්පාලන ආයතන විසින් විධිමත්ව ප්‍රතිචක්‍රීක-රණය කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රතිශතය (එකතු කරන ප්‍රමා-ණය මත පදනම්ව) හා අවිධිමත් අංශය විසින් ප්‍රතිචක්‍රීකරණ කරනු ලබන ප්‍රමා-ණය දිනකට මෙට්‍රික් ටොන් | | WP-WMAහි දත්ත පාදක හා CEA, CCC | විධිමත් ප්‍රතිචක්‍රීක-රණ ප්‍රතිශතය =2% (දිනකට මෙට්‍රික් ටොන් 32). පළාත් පාලන අයාතන (එකතු කරන ප්‍රමාණය මත පදනම්ව)<br><br>අවිධිමත් අංශයේ ප්‍රතිචක්‍රීක-රණය දිනකට මෙට්‍රික් ටොන් 40 | විධිමත් ප්‍රතිචක්‍රීක-රණ ප්‍රතිශතය = 7% (දිනකට මෙට්‍රික් ටොන් 116)<br><br>අවිධිමත් ප්‍රතිචක්‍රීක-රණය දිනකට ටොන් 150 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 8.4, 12.2,12.5 |
| 1.4.2: රටේ සෙසු ප්‍රදේශවල ප්‍රතිචක්‍රීකරණය කරන ප්‍රමාණය ඉහළ නැංවීම | MoPC&LG | MoE, CEA, NSWM-SC, NWPEA, පෞද්ගලික අංශය, හා එකතු කරන්නන්, වෙළෙඳනාම හිමිකරුවන් | පළාත්පාලන ආයතන විසින් විධිමත්ව ප්‍රතිචක්‍රීක-රණය කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රතිශතය (එකතු කරන ප්‍රමා-ණය මත පදනම්ව) හා අවිධිමත් අංශය විසින් ප්‍රතිචක්‍රීකරණ කරනු ලබන ප්‍රමා-ණය දිනකට මෙට්‍රික් ටොන් | | WP-WMAහි දත්ත පාදන හා CEA, CCC | විධිමත් ප්‍රතිචක්‍රීක-රණ ප්‍රතිශතය= 1.0% (පළාත් පාලන ආයතන එකතු කරන ප්‍රමාණය මත පදනම්ව) හා අවිධිමත් අංශයේ ප්‍රතිචක්‍රීක-රණය දිනකට මෙට්‍රික් ටොන් 20 | විධිමත් ප්‍රතිචක්‍රීක-රණ ප්‍රතිශතය = 5% (පළාත් පාලන ආයතන එකතු කරන ප්‍රමාණය මත පදනම්ව) හා අවිධිමත් ප්‍රතිචක්‍රීක-රණයේ ඉලක්කය අවම වශයෙන් දිනකට ටොන් 100 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 8.4, 12.2,12.5 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.4.3: පොලිඑතිලීන් ටෙරෙප්තැලේට් (PET) බෝතල ප්‍රතිචක්‍රීකරණය කරන බව තහවුරු කිරීම | CEA | MoPC&LG, MoE, CCC, WP-WMA, NSWMSC, NWPEA | බර අනුව PET නැවත ලබාගත් % | | CCC/CEA දත්ත සමුදාය | බරෙන් 30% | බරෙන් 80% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 8.4, 12.2,12.5 |
| 1.4.4: හයි ඉම්පැක්ට් පොලිස්ටයිරීන් (HIPS) කෝප්ප ප්‍රතිචක්‍රීකරණය කරන බව තහවුරු කිරීම (වර්ෂයකට මෙට්‍රික් ටොන් 960ක් එකතු කෙරේ) | CEA | MoPC&LG, MoE, CCC, WP-WMA, NSWMSC, NWPEA | බර අනුව HIPS නැවත ලබාගත් % | | CCC/CEA දත්ත සමුදාය | බරෙන් 3% | බරෙන් 15% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 8.4, 12.2,12.5 |
| 1.4.5: ටෙට්රා පැක්, ලෝහ සහිත පටල හා අනෙක් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අසුරන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන බව තහවුරු කිරීම | CEA | MoPC&LG, MoE, CCC, WP-WMA, NSWMSC, NWPEA | බර අනුව නැවත ලබාගත් % | | CCC/CEA දත්ත සමුදාය | බරෙන් 0.01% | බරෙන් 15% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 8.4, 12.2,12.5 |
| 1.5: අධික අපද්‍රව්‍ය උත්පාදනය වන නිෂ්පාදන පාලනය සඳහා නියාමන රාමුවක් ක්‍රියාත්මක කිරීම | CEA | MoE, MoI, MoH, පළාත් පාලන ආයතන CCC, CAASL, SLSI,SLIP, ITI, පරිසර පොලිසිය | නියාමනය කරනු ලබන නිෂ්පාදන ගණන | | CEA | දැනටමත් නියාමනය කරනු ලබන නිෂ්පාදන ගණන 7 | 2023 වන විට නියාමනය කරනු ලබන නිෂ්පාදන ගණන 15කි | √ | √ | √ | | | | | | | | 9.4,12.5 |

NDC 2 - ජෛවභායනයට ලක්වන අපද්‍රව්‍ය ජෛවප්‍රතිකාර කිරීම් මගින් කළමනාකරණය කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: ජෛවභායනයට ලක්වන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී කොම්පෝස්ට්කිරීම ප්‍රමුඛ පිළියම්කරණ ක්‍රමයක් ලෙස යොදාගැනීම (කොම්පෝස්ට් සකස්කරන ප්‍රමාණය ඉහළ නැංවීම - බස්නාහිර පළාතේ 15% සිට 30% දක්වා ද, අනෙකුත් පළාත්වල 3% සිට 30% දක්වා ද) | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2.1.1: දැනටමත් පවත්නා කොම්පෝස්ට් පහසුකම්වල ධාරිතාවය, ගුණාත්මකබව කළමනාකරණය හා නව තාක්ෂණය යොදාගැනීම සම්බන්ධව පුනරුත්ථාපනය/ ප්‍රතිස්ථාපනය හෝ වැඩිදියුණු කිරීම | MoPC&LG, SLLDC | MoA, UDA, පොහොර ලේකම් කාර්යාලය, NSWMSC, WP-WMA | පුනරුත්ථාපනය/ ප්‍රතිස්ථාපනය කළ පවත්නා කොම්පෝස්ට් පහසුකම් ප්‍රතිශතය හා වැඩි කරන ලද ධාරිතාව (දිනකට මෙට්‍රික් ටොන්) | | බස්නාහිර පළාත- WP-WMA<br><br>වෙන්ත පළාත් - NSWMSC | දැනට පවත්නා කොම්පෝස්ට් පහසුකම් ගණන 195 | පවත්නා කොම්පෝස්ට් පහසුකම් අතරින් 10%ක් පුනරුත්ථාපනය/ ප්‍රතිස්ථාපනය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.4, 12.2, 12.3,12.5 |
| 2.1.2: ඒ සඳහා විභවයක් ඇති පළාත් පාලන ආයතනවලට නව කොම්පෝස්ට් පහසුකම් හඳුන්වා දීම | MoPC&LG | MoE, UDA, NSWMSC, WP-WMA | සියලු පළාත් පාලන ආයතන කොම්පොස්ට් නිපදවීම | | බස්නාහිර පළාත- WP-WMA<br><br>වෙන්ත පළාත් - NSWMSC | පවත්නා කොම්පෝස්ට් පහසුකම් ගණන = = 195 සහ ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 1000ක් පමණ | 2025 වන විට නව පහසුකම් 10ක් ඇති කිරීම හා පවත්නා ධාරිතාවයට එකතු කිරීමට නියමිත ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 100කි | √ | √ | √ | √ | √ | | | | | | 2.4, 12.2, 12.3,12.5 |
| 2.1.3: කොම්පොස්ට් පහසුකම්වල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණය භාවිතය | MoPC&LG, SLLDC | MoST, LAs, PCs, ශාස්ත්‍රඥයන් WP-WMA, NSWMSC | කොම්පොස්ට් පහසුකම්වල ඵලදායීතාව | | බස්නාහිර පළාත- WP-WMA<br><br>වෙන්ත පළාත් - NSWMSC | බස්නාහිර පළාතේ = 53%,<br><br>සෙසු පළාත් = 5% | බස්නාහිර පළාතේ = 75%,<br><br>සෙසු පළාත් = above 25% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 8.4, 12.2,12.5 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.1.4: ගුණාත්මක තත්ත්වය/ නඩත්තු කිරීම වැඩිදියුණු කිරීම හා ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ ප්‍රමිති දක්වා ක්‍රමයෙන් උත්ශ්‍රේණිගත කිරීම | MoPC&LG, SLL-DC | MoA, DoA, SLSI, පොහොර ලේකම් කාර්යාලය, WP-WMA, NSWMSC, LAS, CEA | පොහොර ලේකම් කාර්යාලයේ ලියා-පදිංචි කොම්පෝස්ට් මධ්‍යස්ථාන ගණන හා ප්‍රතිශතය<br><br>ශ්‍රී ලංකා ප්‍රමිතිය ලැබූ කොම්පෙසෝට් මධ්‍යස්ථාන ගණන | බස්නාහිර පළාත- WP-WMA<br><br>වෙනත් පළාත් - NSWMSC | බස්නාහිර පළාත = 0, (0%)<br><br>සෙසු පළාත් = 01, (0.6%)<br><br>SLSI ප්‍රමිතිය ලද = 0 | -බස්නාහිර පළාත =20 (80%)<br><br>සෙසු පළාත් = 33 (20%)<br><br>SLSI ප්‍රමිතිය ලද = 10% | √ | √ | √ | √ | √ | | | | | | 12.2, 12.3, 12.4, 12.5 |
| 2.1.5: පාරිසරික නියෝගවලට එකඟ ලෙද කොම්පෝස්ට් මධ්‍යස්ථාන පිහිටුවීම | MoPC&LG, SLLDC | WP-WMA, NSWMSC, LAs, PCs, CEA | පරිසර ආරක්ෂක බලපත්‍රය (EPL) ලද කොම්පෝස්ට් මධ්‍යස්ථාන ගණන හා ප්‍රතිශතය | CEA, WP-WMA, NSWMSC, පළාත් පාලන ආයතනවලින් ලැබෙන වාර්තා | බස්නාහිර පළාතේ = 11, (40%)<br><br>වෙනත් පළාත්වලින් = 8 (5%) | බස්නාහිර පළාතේ = 21 (80%)<br><br>වෙනත් පළාත් = 42 (25%) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.4, 12.2, 12.3, 12.5 |
| 2.1.6: ගෘහස්ථ මට්ටමේ කොම්පෝස්ට් සැකසීම ප්‍රවර්ධනය | MoPC&LG | LAs, PCs, WP-WMA, NSWMSC, NGOs, INGOs | අදාළ පළාත් පාලන ආයතනය මගින් සැපයෙන දිරාපත්වන අපද්‍රව්‍ය බැහැරකරන සේවා මත නොයැපෙන නිවාස ප්‍රතිශතය | බස්නාහිර පළාතේ- WP-WMA<br><br>වෙනත් පළාත් - NSWMSC | බස්නාහිර පළාතේ = 5%<br><br>වෙනත් පළාත් - 10% | බස්නාහිර පළාතේ = 10%<br><br>වෙනත් පළාත් 30% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.4, 12.2, 12.3, 12.5 |
| 2.2: දියර අපද්‍රව්‍ය සඳහා යෝග්‍ය පිළියම් පහසුකම් යොදාගැනීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2.2.1: තෝරාගත් පළාත්පාලන ආයතනවල මධ්‍යම (ජාලගත) මලාපවහන හා අපජල ප්‍රතිකාරක පහසුකම් හඳුන්වා දීම | NWSDB | MoPC&LG, MoE. MoWS, CEA, LAs | මලාපවාහන ජාල මගින් සේවා සැප-යෙන ජනගහනයේ ප්‍රතිශතය | NWSDB ප්‍රගති වාර්තා | මලාපවාහන පද්ධතිවලට සම්බන්ධිත ජනගහනය 2.1% | මහාපවාහන පද්ධතිවලට සම්බන්ධිත ජනගහනය 4.4% දක්වා ඉහළ නැංවීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 6.2, 6.3, 9.4, 12.2, 12.4, 12.5 |
| 2.2.2: පූතික ටැංකිගත මල මණ්ඩි බැහැරලීම සඳහා මලද්‍රව්‍ය පිළියම්කරන පහසුකම් හඳුන්වා දීම | MoPC&LG, NWSDB | LAs, WP-WMA, PCs | පූතික ටැංකිගත මල මණ්ඩි ආරක්ෂිත ලෙස බැහැරලීමේ පහසුකම් සහිත ආරක්ෂිත සනීපාරක්ෂාව ඇති ප්‍රතිශතය | LAs, CEA වෙතින් ලැබෙන වාර්තා - දත්ත සමුදාය / EPL බලපත්‍රය ලැබීම | 11.1% | 57.4% | | | | | | | | | | | 3.9, 6.2, 6.3, 9.4, 12.2, 12.4, 12.5 |
| 2.2.3: කාර්මික අපජලය ප්‍රතිකාර කිරීම සහ යෝග්‍ය ලෙස බැහැරකිරීම වැඩිදියුණු කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.2.3.1: ආයෝජන මණ්ඩල (BOI) කලාප | BOI | MoI, NWSDB | කාර්මික අපජලය පිළියම්කරණය සහ බැහැරකිරීම වැඩිදියුණු කිරීම සිදු කළ ආයෝජන මණ්ඩල කලාප ගණන | | BOI වාර්තා | ආවරණය වන ආයෝජන මණ්ඩල කලාප ගණන - 1 (මුළු ආයෝජන මණ්ඩල කලාප ගණන = 16) | ආවරණය කිරීමට නියමිත ආයෝජන මණ්ඩල කලාප ගණන - 5 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 6.2, 6.3, 9.4, 12.2, 12.4, 12.5 |
| 2.2.3.2: ආයෝජන මණ්ඩල නොවන කාර්මික උද්‍යාන | MoI | CEA, NWSDB, කර්මාන්ත උද්‍යාන මෙහෙයුම්කරුවන්, RISC, IDB, LINDEL, ISB, UDA | කාර්මික අපජලය පිළියම්කරණය සහ බැහැරකිරීම වැඩිදියුණු කිරීම සිදු කළ ආයෝජන මණ්ඩල නොවන කලාප ප්‍රතිශතය | | CEA-දත්ත සමුදාය, MoI සහ වෙනත් කාර්මික උද්‍යාන මෙහෙයුම්කරුවන්ගේ වාර්තා | 10% 3ක් පමණ (රත්මලාන, බටඅත, LINDEL) | පිළියම්කරණය හා බැහැරලීමේ පහසුකම් නැති 20% ක් පමණ අවම වශයෙන් | | | | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 6.2, 6.3, 9.4, ,12.4, 12.5, 12.2 |
| 2.2.3.2.1: ආයෝජන මණ්ඩල නොවන කර්මාන්ත උද්‍යාන සඳහා කාර්මික අපජලය උත්පාදනය හා පිළියම් කිරීම ද ඇතුළුව දත්ත එක්රැස්කිරීම සඳහා දත්ත සමුදායක් ස්ථාපිත කිරීම | MoI | BOI, UDA, LAs, CEA, NWPEA | සියලු කර්මාන්ත ආවරණය වන දත්ත සමුදාය | | CEA, NWPEA වෙතින් ලැබෙන වාර්තා | හුදකලාව ක්‍රියාත්මක දත්ත සමුදාය | සජීවී දත්ත සමුදායක් ස්ථාපිත කිරීම | √ | √ | √ | | | | | | | | 3.9, 6.2, 6.3, 9.4, 12.2, 12.4, 12.5 |
| 2.2.3.3: හුදකලාව ක්‍රියාත්මක කර්මාන්ත පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීම | CEA | MoI, LAs, NWPEA | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත් ආයෝජන මණ්ඩල අනුමත හා හුදකලා කර්මාන්ත ප්‍රතිශතය | | MoI, CEA හා NWPEA දත්තසමුදාය | ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපාරවලින් 80%කට වැඩි ප්‍රමාණයකට පරිසර ආරක්ෂණ බලපත්‍ර තිබේ. (බලපත්‍ර ලාභී BOI ව්‍යාපාර ගණන 2407, මින් 361ක් කලාප තුළ පිහිටා ඇත - | ව්‍යාපාර අතරින් 100%ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා තිබීම (ලබාගත යුතු ඒවායින්) | | | | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 6.2, 6.3, ,9.4, 12.2, 12.4, 12.5 |

| 1.6.3: තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක 12.3 සම්පූර්ණ කිරීම සඳහා වන ජාතික කැපවීමට සමගාමීව පසු අස්වනු හානිය අඩු කිරීම සඳහා වූ උපායමාර්ග සකස් කර ක්‍රියාත්මක කිරීම | MoA | MoE, වෙළෙඳ අමාත්‍යාංශය CARP NIPHM | පසු අස්වනු හානිය අඩු වීමේ ප්‍රතිශතය | | CARP, NIPHM, HARTI වාර්තා | 40% | 15% දක්වා අඩු කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.4 |

## NDC 2 - භෝග ඵලදායීතාවය වර්ධනය කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: ඉහළ ඵලදායීතාවයක් දියුණු කිරීම සඳහා ඉහළ විභවයක් සහිත භෝග හඳුනාගැනීම | DoA | MoA, MoPlant, PMoA | හඳුනාගැනීම හා ප්‍රවර්ධනය කළ ඉහළ ඵලදායීතාවයක් ඇති භෝග විශේෂ හා ප්‍රභේද ලේඛනය | | DoA දත්ත ප්‍රභව | ලේඛනයක් පවතී | අඛණ්ඩව යාවත්කාලීන කළ ලැයිස්තුව (වාර්ෂිකව) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 12.2 |
| 2.2: ආහාර භෝගවල ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් තුළ අනිවාර්ය අවශ්‍යතාවයක් වශයෙන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) අනුගමනය කිරීම | MoA | DoA, MoPlant, MASL, PDoA | 1. ඒකක ප්‍රදේශයක් සඳහා නිෂ්පාදනය<br>2. GAP සඳහා සහතික කරන ලද ගොවීන් ගණන<br>3. GAP යටතේ ඇති ඉඩම් ප්‍රමාණය<br>4. වැඩසටහන් ගණන | | MoA, DoA, PDoA, DSC, AG-STAT වාර්ෂික කාර්යසාධන වාර්තා හා වෙනත් වාර්තා | 1. වර්තමාන ඵලදායීතා මට්ටම (AGSTAT 2020)<br>2. වර්තමාන සහතික කළ ගොවීන් ගණන<br>3. වර්තමාන ඉඩම් ප්‍රමා-ණය<br>4. වර්තමාන වැඩසටහ-න් | 1. ස්ථාපිත කළ යුතුය<br>2. ගොවි ප්‍රජාවෙන් 5%<br>3. ස්ථාපිත කළ යුතුය<br>4. වර්ෂයකට අවම වශයෙන් වැඩසටහන් 25ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 12.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.3: වී/සහල් අංශයේ ඉඩම්වල-ඵලදායිතාවය (වී අස්වැන්නේ ජාතික සාමාන්‍යය - හෙක්ටාරයකට ටොන්) කොන්දේසි රහිතව 15% කින් සහ කොන්දේසි සහිතව 5%කින් ඉහළ නැංවීම | DoA | MoA, ID, MASL, PDoA, RRDI, DAD | සාමාන්‍ය වී ඵලදායිතාවය/ අස්වැන්න/ (වැපිරූ හෙක්ටාරයකට ටොන්) | | DoA දත්ත මූලාශ | හෙක්ටයාරයකට 4,670 kg | 20% කින් ඉහළ නැංවීම (හෙක්ටයාරයකට ටොන් 5,604 kg/ha) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.a |
| 2.4: පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව කොන්දේසි රහිතව 10%කින් සහ කොන්දේසි සහිතව 5%කින් වැඩිකිරීම | MoA | DoA, ජාතික පොහොර ලේකම් කාර්යාලය (NFS), ID, PDoA, පෞද්ගලික අංශය, MASL | 1. ස්ථානීය පොහොර භාවිතය සිදුකරන ගොවීන් ගණන<br><br>2. පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවයේ වර්ධනයේ ප්‍රතිශතය (භාවිත කරන පොහොර කිලෝග්‍රෑම් එකක් සඳහා නිෂ්පාදනය) | | DoA දත්ත මූලාශ්‍ර | 1. හඳුනාගත යුතුය<br><br>2. හඳුනාගත යුතුය | 1. ස්ථාපිත කළ යුතුය<br><br>2. 15% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.a |
| 2.5: ජල භාවිතයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම | DoA | MoA, MoIrri (IMD), ID, PDoA, MASL පෞද්ගලික අංශය | සියලු භෝගවල ජල ඵලදායිතාව ඉහළ නැංවීම (ඝන මීටරයට ටොන්) | | DoA, ID. MoIrri (IMD), PDoA, MASL දත්ත මූලාශ්‍ර | හඳුනාගත යුතුය | හඳුනාගත යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.4 |
| 2.5.1 ජලය අරපිරිමසින තාක්ෂණය භාවිත කිරීම (නිසි කලට වගාකිරීම. හවුලේ වගාකිරීම, නියඟයට ඔරොත්තු දෙන භෝග ප්‍රදේශ වගාකිරීමෙන් අස්වැන්නේ විශාල ප්‍රමාණයක් රැකගැනීම, බින්දු හා වෙනත් ක්ෂුද්‍ර වාරිමාර්ග පිළිවෙත්, වැසි ජල සංරක්ෂණය) | DoA | MoA, MASL, ID, PDoA, DADS | තාක්ෂණ සහිත ප්‍රමාණයේ ප්‍රතිශතය | | DoA, ID දත්ත මූලාශ්‍ර | 40% | 80% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.4 |
| 2.5.2: ප්‍රධාන හා කුඩා වාරි පද්ධතිවල පරිවහන හානියේ ප්‍රමාණය අඩු කිරීම | ප්‍රධානः ID, කුඩාः DADS | MoA, DoA, MASL, PDoA | වාරිමාර්ග පරිවහන හානියේ හානිය අඩු කළ ප්‍රතිශතය | | ID, DADS දත්ත මූලාශ්‍ර | 40% | 75% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.4 |
| 2.6: සුනිශ්චිත කෘෂිකර්මය (precision agriculture) ප්‍රවර්ධනය කිරීම | DoA | MoA, PDOAs MASL, ශාස්ත්‍රඥයන්, පෞද්ගලික අංශය | 1. ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම<br><br>2. පවත්වන ලද ධාරිතා වර්ධන වැඩසටහන් ගණන<br><br>3. තාක්ෂණයන්ගේ ලක්ෂණ<br><br>4. විධිමත් අධ්‍යාපන වැඩසටහන්වලට සංකල්ප ඇතුළත්කිරීම | | DoA, MoA, DAD, MASL දත්ත මූලාශ | මූලික දත්ත හඳුනාගත යුතුය | ඉලක්ක ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 2.a, 6.4, 8.2, 12.2, 12.4, 12.5, 14.1 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 5. ක්‍රියාත්මක කළ නියමු ආදර්ශක ව්‍යාපෘති ගණන | | | | | | | | | | | | | | | |
| 2.6.1: තෝරාගත් භෝග වර්ග සඳහා අඩු ශ්‍රමයක් අවශ්‍ය හා/හෝ පිරිවැය ඵලදායී කෘෂිකාර්මික පිළිවෙත්/ තාක්ෂණයක් යොදා ගැනීම (ජලජරෝපණය, හරිතාගාර, පොලි නල, වැසි ආවරණ ආදි) | DoA | MoA, PDoA | වානිජ මට්ටමේ ජලජරෝපණ තාක්ෂණ සහිත ගොවීන්ගේ ප්‍රතිශතය | | MoA, DoA දත්ත වාර්තා | 15% | 60% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 2.a, 6.4, 8.2, 12.2, 12.4, 14.1 |
| 2.6.2: වී වගාවේ ගොවිපොළ යාන්ත්‍රීකරණය (භූමි සැකසීම, පළිබෝධනාශක හා පොහොර යෙදීම, අස්වනු නෙළීම) | DoA | MoA, DAD, MASL, පෞද්ගලික අංශය | යාන්ත්‍රීකකරණය මගින් වගා කරන ලද ඉඩම් ප්‍රමාණයේ ප්‍රතිශතය % | | DoA, MoA, DAD, MASL දත්ත මූලාශ්‍ර | 70% | 100% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.a, 6.4, 12.4, 12.5 |

**NDC 3 - භෝග වගාව/ අගය එකතුකිරීම සඳහා පුනර්ජනනීය බලශක්තිය භාවිතය වැඩිදියුණු කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1- කෘෂිකාර්මික පිළිවෙත් සඳහා සූර්ය සහ සුළං බලශක්තිය (හෝ ඒ දෙකෙහි මිශ්‍රණයක්) යොදාගැනීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.1.1 ජල පොම්ප කිරීම ප්‍රවර්ධනය (සූර්ය හා/හෝ සුළං) | MoA | DoA, SLSEA, CEB, MASL, DAD, PDoA, පෞද්ගලික අංශය | සූර්ය බලයෙන් ක්‍රියාකරන ජල පොම්ප ප්‍රතිශතය | | SLSEA, DoA දත්ත මූලාශ්‍ර | ගොවීන්ගෙන් 2% | ගොවීන්ගෙන් 20% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |
| 3.1.2: පොසිල ඉන්ධන මගින් ක්‍රියාකරණ ඒන්ජින් සහිත පොම්ප වෙනුවට සූර්ය හා සුළං බලය භාවිත කිරීම ප්‍රවර්ධනය | MoA | DoA, SLSEA, CEB, MASL, DAD, PDoA, පෞද්ගලික අංශය | CEBපද්ධතියේ යෙදවුම් සඳහා පරිවර්තනය වූ ගොවීන් ප්‍රතිශතය | | CEB දත්ත මූලාශ්‍ර | ගොවීන්ගෙන් 1% | ගොවීන්ගෙන් 10% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2, 7.3 |
| 3.2: අවදානම් ප්‍රදේශවල පොකුරු කෘෂිකර්මය සඳහා පුනර්ජනනීය බලශක්තියෙන් බලගැන්වෙන කුඩා විදුලිපද්ධති ඇතිකිරීම (නියමු ව්‍යාපෘතියක් ලෙස) | SLSEA | MoA, PDoA | නියමු පරිමාණ අධ්‍යයනයක් | | SLSEA දත්ත මූලාශ්‍ර | නැත | එක් නියමු පරිමාණයේ අධ්‍යයනයක් සම්පූර්ණ කිරීම | √ | √ | √ | √ | √ | | | | | | 7.2 |
| 3.3: කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත වන වාරි ඇළමාර්ගවල කුඩා පරිමාණ ජලවිදුලි උත්පාදනය සංවර්ධනය සඳහා ඇති විභවය ගවේෂණය ක කිරීම (අඩු ප්‍රවාහ ඉහළ හිස) | ID | MoA, SLSEA, CEB, DoA, MASL | විභවය පිළිබඳ වාර්තාව හා නිර්දේශ | | SLSEA දත්ත මූලාශ්‍ර | නැත | නිර්දේශ සමඟ විභවය පිළිබඳ වාර්තාව සම්පූර්ණ කිරීම | √ | √ | √ | √ | √ | | | | | | 7.2 |

NDC 4 - කිරි නිෂ්පාදන අංශයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම (ඉලක්කය - 2030 දී එළදෙනකගෙන් දිනකට ලබාගන්නා කිරි අස්වැන්න ලීටර් 3.2 සිට 4.5 දක්වා (40%ක) වර්ධනයක් ඇතිකරගැනීම සහ කොන්දේසි සහිත පදනමින් එය දිනකට ලීටර් 5 (55%) දක්වා තවදුරටත් වර්ධනය කිරීම. ගවපට්ටියේ කිරි දොවාගත හැකි ඵලදායී එළදෙනුන් සංඛ්‍යාව කොන්දේසි සහිත පදනමින් 60% දක්වා වැඩිකිරීම)

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1: පට්ටි කළමනාකරණය දියුණු කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 4.1.1: ඵලදායී නොවන සතුන් සහේතුක ලෙස කළමනාකරණය කර ඵලදායීතාවය ඇති සතුන්ගේ ප්‍රතිශතය වර්ධනය කිරීම (කිරි දෙන හා නොදෙන සතුන් මුළු සත්ත්ව ගහනයෙන් බෙදීමෙන්) | DAPH | PDAPHs, NLDB, LAs, MASL, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | ඵලදායී සතුන්ගේ ප්‍රතිශත වර්ධනය | | DAPH වාර්තා | ඵලදායී සතුන් ගණන 45% කි (2020 අග දී) | ඵලදායී සතුන් ගණන 60%කට අධික වීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2, 8,3, 8.4, 12.2 |
| 4.1.2: ප්‍රවේණික වශයෙන් දියුණු කිරීම (අභිජනනයෙන්) | DAPH | PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | එක් සතෙකුගෙන් ලබාගන්නා කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම<br><br>එක් ගැබ්ගැනීමක් සඳහා සිදුකරන කෘත්‍රිම සිංචන (AI) ගණන අඩු කිරීම | | DAPH වාර්තා | ලීටර් 3.2<br><br>කෘත්‍රිම සිංචන අනුපාතිකය 3.5 | ලීටර් 5<br><br>කෘත්‍රිම සිංචන අනුපාතිකය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2, 8,3, 8.4, 12.2 |
| 4.1.3: තාපයට ඔරොත්ත දෙන වර්ග හඳුන්වා දීම | DAPH | PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | හඳුන්වා දෙන නව වර්ග ගණන | | DAPH වාර්තා | නව වර්ග 1 (සහීවාල්) | නව වර්ග 3ක් හඳුන්වාදීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2, 8,3, 8.4, 12.2 |
| 4.2: සත්ත්වාහාර කළමනාකරණය දියුණු කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 4.2.1: දියුණු කළ හොඳ තත්ත්වයේ තෘණ ප්‍රභේද හඳුන්වාදීම | DAPH | PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | දියුණු කළ ප්‍රභේද ඇති ප්‍රදේශයේ ප්‍රමාණය (හෙක්)<br><br>ප්‍රභේද ගණන | | DAPH වාර්තා | හෙක් 10,000<br><br>ප්‍රභේද 3-4ක් | හෙක් 20,000<br><br>නව ප්‍රභේද 3 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 4.2.2: ආහාර ලබදෙන ක්‍රම දියුණු කිරීම (හොඳින් සමතුලිත වේලක්) | DAPH | PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | දියුණු කළ ආහාර පද්ධති ලබා දෙන ගොවීන් ගණනේ වර්ධනයේ ප්‍රතිශතය (TMR - මිශ්‍ර පරිපූරක ආහාර) | | DAPH වාර්තා | මූලික දත්ත 2023 දී ස්ථාපිත කළ යුතුය | දියුණු කළ ආහාර පද්ධති ලබා දෙන ගොවීන් ප්‍රතිශතය දෙගුණ කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.2.3: සත්ත්ව ආහාර පරිරක්ෂණය/ සංරක්ෂණය | DAPH | PDAPHs, NLDB, MASL ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | ආරක්ෂා කරන ලද සත්ත්වාහාර ප්‍රමාණය<br><br>නියැලෙන ගොවීන් ගණන | | DAPH වාර්තා | 2023 දී මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | මූලික දත්ත අගය මෙන් දෙගුණයකි | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 4.3: පට්ටියේ සෞඛ්‍යය ඉහළ නැංවීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 4.3.1: ස්ථනග්‍රන්ථි ආශ්‍රිත සෞඛ්‍යය කළමනාකරණය ඉහළ නැංවීම | DAPH | PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයින්, පෞද්ගලික අංශය | බුරුළු ප්‍රදාහය සිදුවීම් වාර්තා වන ප්‍රතිශතය අඩුකිරීම | | DAPH වාර්තා | වාර්තා-වන සිදුවීම් ප්‍රතිශතය - 25% | සිදුවීම් ගණන 25% සිට 10 % දක්වා අඩු කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 4.3.2: ස්පර්ශක රෝග වැළැක්වීම හා පාලනය කිරීම | DAPH | PDAPHs, VRI, NLDB, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | ස්පර්ශක රෝග ඇති-වන අවස්ථා ගණන අඩුකිරීම (FMD කුර සහ මුඛ, HS, BQ)<br><br>ස්පර්ශක රෝග නිසා මර්ත්‍යතා අනුපාතය අඩු කිරීම<br><br>සිදුකරන ලද ප්‍රතිශක්තිකරණ ප්‍රමා-ණය | | DAPH වාර්තා | සිදුවීම් ගණන; FMD - 4,975, HS - 147, BQ - 25<br><br>මර්ත්‍යතා අනුපාතිකය; FMD - 133, HS - 79, BQ - 21<br><br>ප්‍රතිශක්තික-රණය (වර්ෂ 10ක වාර්ෂික සාමාන්‍යය) | සිදුවීම් ගණන; FMD - 0, HS - 0, BQ - 0<br><br>මර්ත්‍යතා අනුපාතිකය; FMD - 0, HS - 0, BQ - 0 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 4.4: සතුන්ගේ සුවපහසුව හා සුබසාධනය වර්ධනය කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 4.4.1: සත්ත්ව නිවාසවල ක්ෂුද්‍ර පරිසරයේ තත්ත්වය දියුණු කිරීම (වාතාශ්‍රය, තාප ආතති කළමනාකරණය ආදි) | DAPH | PDAPHs, NLDB, ශාස්ත්‍රඥයින්, පෞද්ගලික අංශය | වැඩිදියුණු කළ සත්ත්ව මඩු ප්‍රමාණය ඉහළ නැංවීම | | DAPH වාර්තා | 2023 දී මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | මූලික දත්ත මෙන් දෙගුණයක අගයය-ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |

## NDC 5 - රෝමන්ථයින්ගේ ඵලදායීතාවය ඉහළ නැංවීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1: ප්‍රවේණික වැඩිදියුණු කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 5.1.1: ප්‍රවේණිකව දියුණු කළ සතුන් හඳුන්වා දීම (ඌරන් හා කුකුළන් - බ්‍රොයිලර් හා ලේයර්) | DAPH | PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයන්, පෞද්ගලික අංශය | දේහ බර ඉහළ නැංවීම<br><br>බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම<br><br>ආහාර පරිවර්තන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | | DAPH වාර්තා | සතුන්ගේ දේහ බර; බ්‍රොයිලර් -1.2 kg, ඌරා - 60 kg<br><br>බිත්තර නිෂ්පාදනය; 60%<br><br>සත්ත්ව ආහාර පරිවර්තන කාර්යක්ෂ-මතාවය ; බ්‍රොයිලර් - 1.85 | දේහ බර; බ්‍රොයිලර් - 1.5 kg, ඌරන් - 70 kg<br><br>බිත්තර නිෂ්පාදනය; 70%<br><br>සත්ත්ව ආහාර පරිවර්තන කාර්යක්ෂමතාව; බ්‍රොයිලර් - 1.7 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 5.2: සත්ත්ව ආහාරවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 5.2.1: සත්ත්ව පෝෂකවල තත්ත්වය ඉහළ නැංවීමෙන් සත්ත්ව පෝෂක පරිවර්තන කාර්යක්ෂමතාවය දියුණු කිරීම | DAPH | PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | ලියාපදිංචි සත්ත්ව පෝෂක නිෂ්පාදකයන් ප්‍රතිශතය<br><br>ලියාපදිංචි සත්ත්ව පෝෂක ප්‍රමාණය මුළු ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස | | සත්ත්ව ආහාර පනත යටතේ ක්ෂේත්‍ර මට්ටමේ නියැදි සමීක්ෂණ මගින් | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | ලියාපදිංචි සත්ත්ව පෝෂක නිෂ්පාදක-යන් සංඛ්‍යාව - 90%<br><br>ලියාපදිංචි සත්ත්ව පෝෂක ප්‍රමාණය මුළු ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස - 95% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 5.3: සත්ත්ව සෞඛ්‍ය කළමනාකරණය | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.3.1: රෝග පාලනය | DAPH | PDAPHs, VRI, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | සිදුවීම් සංඛ්‍යාව අඩුවීම (කුකුළන් අතර ND හා IBD ඌරන්ගේ Pasturel-losis (බුරුළු ප්‍රදාහය) රෝගය)<br><br>ප්‍රධාන රෝගවල මර්තයතාවය අඩු වීම<br><br>ප්‍රතිශක්තිකරණ සිදු කළ ප්‍රමාණය (දේශීය NDV) | | DAPH වාර්තා | ND සිදුවීම් - 90,356, මර්තයතාවය - 5,418 ප්‍රතිශක්තික-රණය -4,052,769<br><br>IBD සිදුවීම් - 54,192 මර්තයතාවය - 2,069<br><br>Pasturello-sis සිදුවීම් - 1,065 මර්තයතාවය - 120 | ND, IBD හා Pasturellosi රෝග සඳහා 2030 වන විට ඉලක්කය ශූන්‍යවේ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 5.3.2: ජෛව ආරක්ෂණය දියුණු කිරීම | DAPH | PDAPHs, NLDB පෞද්ගලික අංශය | රෝග වසංගත ඇති වන අවස්ථා අඩුවීම (කුකුළු ගොවිපොළ වල එක් කාණ්ඩයක එක් සතියක මර්තයතාවය 5%ට අධිකය)<br><br>ප්‍රධාන රෝගවල මර්තයතා අනුපාතිකය අඩුවීම | | DAPH වාර්තා | ශූන්‍යයි | ශූන්‍ය මට්ටමේ පවත්වාගැනීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |
| 5.4: සතුන්ගේ සුවපහසුව හා සුබසාධනය දියුණු කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 5.4.1: සතුන්ගේ නිවාසවල ක්ෂුද්‍ර පාරිසරික තත්ත්වය ඉහළ නැංවීම (වාතාශ්‍රය, තාප ආතති කළමනාකරණය ආදි) | DAPH | PDAPHs, NLDB, ශාස්ත්‍රඥයින්. පෞද්ගලික අංශය | පාලිත පාරිසරික තත්ත්ව ඇති නිවාස තුළ වසන පක්ෂීන් ප්‍රමාණය ඉහළයන ප්‍රතිශතය | | DAPH වාර්තා | 60% | 90% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 8.2 |

## NDC 6 - පශුපාලන යෙදවුම් සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදාගැනීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 6.1: කිරි ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීමට සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ භාවිතය. කිරි නිෂ්පාදනයේදී සූර්ය බලයෙන් සිසිල්කරණය වන බඳුන් (කෑන්) හඳුන්වා දීම (මිල්කෝ සමාගම මේ වන විට ආරම්භ කර තිබේ) | DAPH | DAPH, PDAPHs, SLSEA, පෞද්ගලික අංශය | මැදිහත්වීම භාවිත කිරීමේ අනුපාතය<br><br>කිරිවල ගුණාත්මක බව හා එකතු කරන ප්‍රමාණය ඉහළ නැංවීම | | DAPH, SLSEA, CEB වාර්තා | SLSEA හි උපදේශකත්වයෙන් 2023 දී මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | SLSEA හි උපදේශකත්වයෙන් ඉලක්කය 2023 දී තීරණය කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 7.2, 8.2, 8,3, 8.4, 12.2 |
| 6.2: කිරි එකතු කිරීමේ හා සිසිලන මධ්‍යස්ථාන සඳහා සූර්ය බලශක්තිය භාවිත කිරීම | SLSEA | DAPH, PDAPHs, CEB,<br>කිරි සැකසුම්කරුවන්, සූර්ය බල සැපයුම්කරුවන්, මූල්‍ය සම්පාදකයන් | ස්ථාපිත සූර්ය කෝෂ පද්ධති කිලෝවොට් ගණන<br><br>ස්ථාපිත පද්ධති ගණන<br><br>ප්‍රධාන විදුලි පද්ධතියෙන් සම්පූර්ණයෙන් ස්වාධීන ස්ථාන ගණන<br><br>කිරි එකතු කිරීමේ වර්ධනය | | SLSEA වාර්තා | SLSEA හි උපදේශකත්වයෙන් 2023 දී මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | SLSEA හි උපදේශකත්වයෙන් ඉලක්කය 2023 දී තීරණය කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 7.2, 8.2, 8,3, 8.4, 12.2 |
| 6.3: ගොවිපොළ මෙහෙයුම් හා සැකසුම් සඳහා සූර්යබලය හඳුන්වා දීම | SLSEA | DAPH, PDAPHs, CEB,<br>කිරි සැකසුම්කරුවන්, සූර්ය බල සැපයුම්කරුවන්, මූල්‍ය සම්පාදකයන් | ස්ථාපිත සූර්ය බල කිලෝවොට් ගණන<br><br>ස්ථාපිත පද්ධති ගණන<br><br>කිරි එකතු කිරීම ඉහළ ගිය ප්‍රමාණය | | SLSEA වාර්තා | SLSEA හි උපදේශකත්වයෙන් 2023 දී මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | SLSEA හි උපදේශකත්වයෙන් ඉලක්කය 2023 දී තීරණය කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 7.2, 8.2, 8,3, 8.4, 12.2 |
| 6.4: මහා පරිමාණ පශු සම්පත් හා කුකුළ් පාලන, කිරි සැකසුම් හා ඝාතකාගාර සඳහා ජීවවායු ජනනය හඳුන්වා දීම | SLSEA | DAPH, PDAPHs, CEB, CEA, LAs, පෞද්ගලික අංශය (පශුසම්පත් හා කුකුළු පාලන නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන්, ජීවවායු සේවා සපයන්නන්), මූල්‍ය පහසුකම් සැපයුම්කරුවන් | ස්ථාපිත ජීවවායු ජනකවල ධාරිතාවය (ඝන මීටර්)<br><br>ස්ථාපනය කළ ප්‍රමාණය | | SLSEA වාර්තා | SLSEA හි උපදේශකත්වයෙන් 2023 දී මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | SLSEA හි උපදේශකත්වයෙන් ඉලක්කය 2023 දී තීරණය කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.4.1: පශුසම්පත් හා කිරිපට්ටිවල මීතේන් විමෝචන කළමනාකරණය | DAPH | MoE, VRI, ශාස්ත්‍රඥයන් | පශුපාලන අංශයේ මීතේන් ජනනය | | DAPH වාර්තා | හඳුනාගත් මුලපිරීම් | 2023-2025 අතර මීතේන් ජනන තක්සේරුවක් හා කලින් කල වෙනස් පද්ධතිවල හා වෙනස් දේශගුණ කලාප සඳහා යාවත්කාලීන කිරීමක් | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12.4 |
| 6.4.2: ස්ථානීය සත්ත්ව මළ ද්‍රව්‍යවලින් බලශක්ති උත්පාදනය (තාප උණුසුම හා විදුලිබල ජනනය සඳහා ජීවවායුව) | SLSEA | DAPH, PDAPHs, CEB, CEA, LAs, පෞද්ගලික අංශය (පශුසම්පත් හා කුකුළු පාලන නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන්, ජීවවායු සේවා සපයන්නන්) මූල්‍ය සම්පාදකයන් | ජීවවායු ජනනය (භාවිතය හා විභවය)<br><br>වාර්ෂිකව ජනනය වන විදුලිය කිලෝවොට් පැය | | SLSEA, CEB වාර්තා | SLSEA උපදේශකත්වයෙන් 2023 දී මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | 2023 දී ජීව වායු ජනනය (භාවිතය හා විභවය) තක්සේරුවක්<br><br>SLSEA හි උපදේශකත්වයෙන් වාර්ෂික විදුලි ජනන ඉලක්කය (කිලෝවොට් පැය) 2023 දී තීරණය කළ යුතුය | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 7.2 |

# 4 NDC ක්‍රියාත්මක කිරීම - අනුහුරුවීම

## 4.1 දළ විශ්ලේෂණය

දේශගුණ විපර්යාස ආර්ථික සංවර්ධනයට හා සංවර්ධනයේ ප්‍රතිලාභවලට දැඩි තර්ජනයක් එල්ල කරයි. ශ්‍රී ලංකාව, දේශගුණ විපර්යාස අනුහුරුවීමට ඇති සූදානම අනුව 100 වැනි ස්ථානයේ ද, දේශගුණ විපර්යාසවලට ලක්වීමේ ඇති අවදානම අනුව 69වන ස්ථානයේ ද පසුවේ[40]. ශ්‍රී ලංකාවේ ND-GAIN දර්ශකය (1995-2020) සාමාන්‍යය 103 අවට රැඳී ඇති අතර, 2020 වර්ෂයේ දර්ශකයේ 104 වැනි තැන හිමිකරගෙන තිබේ[41]. මෙමගින් පෙනන්නේ ද රටේ දේශගුණ විපර්යාසවලට ඇති අවදානම හා දේශගුණ අනුහුරුවීමේ ඇති කඩිනම් අවශ්‍යතාවයයි. 4-1 රූපයේ දැක්වෙන ආකාරයට ශ්‍රී ලංකාව දශක කීපයක පටන් දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට ලක්ව ඇති බව දහස් ගණනක් ජනතාවට බලපාන වාර්ෂික ස්වාභාවික ආපදා නිසා පෙනේ[42]. වඩාත් සුලබ ස්වාභාවික ආපදාව ජලගැලීම් වුවද, නියඟය, නායයෑම්, හා කුණාටු ද මේ සමස්ත හානියට දායක තිබේ. මීට අමතරව, මෝසම් රටාව, වර්ෂාපතන තීව්‍රතාවය, නියඟ කාල, උෂ්ණත්වය ඉහළයාම, දේශගුණ උපද්‍රවවලට නිරාවරණය වැඩිවීම සහ මුහුදු මට්ටම ඉහළ යෑම වැනි මේ වන විටත් දැකිය හැකි වෙනස් වීම් මෙන්ම වර්ෂාපතන ව්‍යාප්තියේ හා පාරිසරික සීමාවල දීර්ඝ කාලීන වෙනස්වීම් ඇතිවෙමින් පවතින බව මෙම අධ්‍යයනවල දැක්වේ.

කෘෂිකර්මය, ජෛව විවිධත්වය, වෙරළබඩ හා සමුද්‍රීය පරිසර, ධීවර කර්මාන්තය, සෞඛ්‍යය, පශුසම්පත්, ජලය, සංචාරක හා විනෝදාස්වාද කර්මාන්තය, නාගරික සැලසුම්කරණය හා මානව ජනාවාස සහ ජලය භාවිතය යනු මෙම වෙනස්කම්වලින් බලපෑමට ලක් වූ වඩාත් වැදගත් අංශ වේ. මේ නිසා ඒ ඒ අවදානම් අංශයේ රාජ්‍ය ආයතන, විශේෂඥයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් අනුහුරුවීමේ ප්‍රමුඛතා ක්‍රියාමාර්ග සඳහා මෙම අංශ 9 හඳුනාගෙන ඇත.




4-1 රූපය 1980 හා 2000 අතර ප්‍රධාන ස්වාභාවික ආපදාවලින් පීඩාවට පත් වූ පුද්ගලයින් ගණන (දත්ත[41])

40 University of Notre Dame, USA, Notre Dame Global Adaptation Initiative https://gain-new.crc.nd.edu/country/sri-lanka (this initiative ranks the climate adaptation performance for 177 countries)

41 https://gain-new.crc.nd.edu/country/sri-lanka

42 World Bank, Climate Change Knowledge Portal, https://climateknowledgeportal.worldbank.org/country/sri-lanka/vulnerability



දේශගුණ විපර්යාස සම්බන්ධව ශ්‍රී ලංකාවේ දීර්ඝකාලීන ප්‍රතිපත්තිමය ඉලක්කය වන්නේ, දේශගුණ විපර්යාසවලින් ඇතිවන අහිතකර බලපෑම්වලින් රට ආරක්ෂා කරගැනීම තහවුරු කරගැනීමයි. බොහෝ ජීවනෝපායයන් රඳා පවතින ස්වාභාවික සම්පත් මූලය ආරක්ෂා කරගන්නා අතර, ඒ ඒ අංශවල තිරසර සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම මෙහි අරමුණ වේ. මෙමගින් අඛණ්ඩ ආර්ථික වර්ධනයක් හා ඉහළ මානව සංවර්ධනයක් පවත්වාගෙන යාමටත් උපකාරී වනු ඇත.

විවිධ සංවර්ධන හවුල්කාර ආයතන මගින් මූල්‍ය පහසුකම් සපයන අනුහුරුවීමේ ව්‍යාපෘති රැසක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, ව්‍යාපෘති ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම හා ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව දීර්ඝකාලීන තිරසරභාවය තහවුරු කිරීම කළ යුතු වේ.

ක්‍රියාත්මක කිරීම සාර්ථක වීම සඳහා අනුහුරුවීමේ ප්‍රමුඛතාවලට පදනම් වූ තත්ත්ව සම්පූර්ණ කළ යුතු වේ. මෙහි දී ප්‍රාදේශීය රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය සහභාගීත්වය අත්‍යාවශ්‍ය වේ. තීරණ ගැනීම සඳහා අවශ්‍ය දත්ත සහ දේශීය වූ ආකෘතික මෙවලම් විශාල වශයෙන් නොමැති වීම අනුහුරුවීමේ ක්‍රියාකාකරම්වල දී ජය ගත යුතු ප්‍රධාන බාධා දෙකකි. අවදානම පිළිබඳ දැනුම්වත් නිශ්චිත ආයෝජන සිදුකිරීම සඳහා බොහෝ කර්මාන්ත හා කලාපවලට අදාළව ප්‍රාදේශීය මට්ටමින්, ලබාගත හැකි දත්ත තිබීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටම ඉහළ යෑම සම්බන්ධයෙන් නිවැරදි ලෙස පුරෝකථනය කිරීම සඳහා පවතින දත්තවල නිරවද්‍යතාවයේ මට්ටම මේ සඳහා උදාහරණයකි. ආංශික උපායමාර්ග සකස් කිරීමේ දී (උදා: සංචාරක කර්මාන්තය) සහ අවකාශයීය සංවර්ධනය (උදා: නාගරික මධ්‍යස්ථාන) පිළිබඳව අවදානම් තක්සේරු දැනට සිදුකර නොමැති නිසා ඒවා ප්‍රමුඛ අනුහුරුවීමේ ක්‍රියාකාරකමක් වශයෙන් සඳහන් කර ඇත. එසේම, පළාත්, ගංගා ද්‍රෝණි හෝ ප්‍රාදේශීය මට්ටමින් තීරණ ගැනීමට සහාය විය හැකි අවදානම් සහ අවදානමට ලක් විය හැකි බව පිළිබඳව ලබාගත හැකි දත්ත සීමාසහිතය. කෙසේ වෙතත්, හරිත දේශගුණ අරමුදල මගින් ක්‍රියාත්මක කරන ජාතික අනුහුරුවීමේ සැලසුම සූදානම් සහාය ව්‍යාපෘතිය මගින් ජාතික අනුහුරුවීමේ සැලසුම සංශෝධනය කිරීම හා පළාත් අනුරුරුවීමේ සැලසුම් සකස් කිරීම සිදු වේ.

## 4.2 කෘෂිකර්ම අංශය

ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් 38%ක් කෘෂිකාර්මික බිම් වන අතර, ඉන් තුනෙන් පංගුවක් භෝග වගා සඳහා ද සෙසු ප්‍රදේශය පශුසම්පත් පාලනය සඳහා ද යොදා ගනු ලැබේ[43]. ලෝකයේ මුළු හරිතාගාර වායු විමෝචනවලින් 23%ක් සඳහා වගකිව යුත්තේ කෘෂිකර්මය හා වනාන්තරයි. ආහාර හා ගොවීන්ගේ ජීවනෝපාය ආරක්ෂා කරන අතර ඉඩම් කළමනාකරණය කිරීම සඳහා වෙනස්කම් සිදුකිරීම අවශ්‍ය වේ. දුර්වල ප්‍රතිපත්තිමය තීරණ, ස්වාභාවික සම්පත් අසීමිත ලෙස සූරාකෑම හා දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් නිසා ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තර්ජනයට ලක් වී ඇත. කෘෂිකාර්මික අංශය ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ජනගහනයකට, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට, සිය ජීවනෝපාය සපයයි. දේශගුණ කරුණු නිසා සහ අඩු ආදායම නිසා ඇතැම් ගොවීන් කෘෂිකර්මය වෙනුවට වෙනත් විකල්ප ආදායම් වෙත යොමු වී ඇත. ලෝක කම්කරු සංවිධානයේ දත්ත අනුව මේ අඩු වීම සිදු වී ඇත්තේ දශක කීපයක් ඇතුළතය[44] (4-2 රූපය). කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අංශයේ රැකියා නියුක්තිය ලෝකයේ සාමාන්‍ය අගයට වඩා අඩු වී ඇති අතර වී සහ ඉරිඟු වැනි භෝග වර්ග ගණනාවක ඵලදායීතාවය ඉහළ ගොස් තිබේ. මෙය යාන්ත්‍රිකකරණය වෙත යොමුවීමක් හා වෙනත් නව තාක්ෂණයන් භාවිතයට යොමු වීම නිසා සිදුව ඇති අතර, ඊට හේතු වී ඇත්තේ කෘෂිකර්ම අංශය නවීකරණය කිරීම සඳහා දරණ ලද උත්සාහයයි.




4-2 රූපය කාලයත් සමග කෘෂිකර්ම අංශයේ රැකියා නියුක්තිය ශ්‍රී ලංකාවේ හා ලෝකයේ සාමාන්‍යයේ වෙනස් වී ඇති ආකාරය (ලෝක කම්කරු සංවිධානයේ දත්ත[28])

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය දේශගුණ විපර්යාසවලට වඩාත් අවදානමට ලක් වන්නේ එය කාලගුණ රටාව හා ස්වාභාවික සම්පත් මත රඳා පැවතීම නිසාය. දේශගුණ විපර්යාස නිසා ගොවීන් හා මේ අංශයේ අනෙක් ප්‍රධාන ක්‍රියාකාරීන් සම්පූර්ණ වෙනස් වූ ගැටලු සමූහයකට මුහුණ දී ඇත. ප්‍රාථමික ආහාර නිෂ්පාදකයන් වන ගොවීන් අතර ඔරොත්තු දීම හා අනුහුරුවීමේ ධාරිතාවයක් නොමැති නම් මෙය ජාතියේ ආහාර සැපයුමට හා පෝෂක සුරක්ෂිතතාවයට, ආර්ථිකයට, තිරසර සංවර්ධන මුලපිරීම්වලට හා වෙනත් බොහෝ කරුණු සඳහා බලපානු ඇත. දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඔරොත්තු දීම හා අනුහුරුවීම ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාව ප්‍රතිඥා දී තිබේ. මේ සඳහා ප්‍රමාණවත් සාක්ෂි ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය 2012 (මේ වන විට යාවත්කාලීනකරමින් පවතී), 2016-2025 සඳහා දේශගුණ විපර්යාසවල බලපෑම්වලට ජාතික අනුහුරුවීමේ සැලසුම, භූමි හායනය වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී වැඩසටහන (2015-2024) හා 1951 අංක 25 දරණ පස සංරක්ෂණ පනත හා එහි සංශෝධන මගින් සැපයේ.

43 Organisation for Economic Co-operation and Development (OECD): https://www.oecd.org/officialdocuments/publicdisplaydocumentpdf/?cote=COM/TAD/CA/ENV/EPOC(2020)3/FINAL&docLanguage=En#:~:text=Executive%20summary-,The%20Agriculture%2C%20Forestry%20and%20Other%20Land%20Use%20(AFOLU)%20sector,share%20is%20likely%20to%20grow.

44 International Labour Organization. “ILO modelled estimates database” ILOSTAT



අනුහුරු වීම සඳහා සියලු පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය හා ඵලදායී දායකත්වයක් තිබීම වැදගත්ය. මේ නිසා වෙනස්වන දේශගුණයේ බලපෑම් අවබෝධ කරගෙන හා ප්‍රධාන අනතුරු කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ප්‍රජාව හා ව්‍යාපාර සමඟ සහයෝගිත්වයෙන් කටයුතු කරයි. දේශගුණ විචල්‍යතාවයේ හා විපර්යාසයේ බලපෑම් හා ප්‍රතිඵල පිළිබඳ විද්‍යාත්මක අවබෝධය වර්ධනය වීමත් සමඟ කෘෂිකාර්මික නිෂ්පාදකයන්, සැලසුම් කිරීමේ හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට මේ තොරතුරු යොදාගෙන ක්‍රියාත්මක වීම සඳහා මාර්ග සොයයි.

කෘෂි-පාරිසරික කලාප (Agro-ecological Regions) 46ක විවිධත්වයක් ඇති රටක් ලෙස දේශගුණය හා නිෂ්පාදනය කරන කෘෂි නිෂ්පාදන අනුව, වෙනස් ස්ථාන හා වෙනස් දේ දේශගුණ විපර්යාසවලට හා විචල්‍යතාවයට වෙනස් ආකාරවලින් ප්‍රතිචාර දක්වනු ඇත. වෙළෙඳපොළ මිල ගණන් වෙනස්වීම, යෙදවුම් මිල ඉහළ යෑම, නව අසල්වැසියන්, ශ්‍රම හිඟතාවය, පළිබෝධ ආක්‍රමණ හා කාලගුණ තත්ත්ව වැනි වෙනස්වන තත්ත්වවලට හැඩගැසීමට කෘෂි නිෂ්පාදකයන්ට සිදු වනු ඇත. දේශගුණ විචල්‍යතාවයේ හා වෙනස නිසා ඇති වන අවදානම අඩුකිරීමට හා ඇති විය හැකි බාධා සඳහා ඔරොත්තු දීමට ඇති හැකියාව ඉහළ නැංවීමට සහාය වීමට දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමට හැකියාව තිබේ. එසේම, අනාගතයේ ඇති වන තත්ත්වවල වාසිය ලබාගැනීමට ද පද්ධතිවලට වැඩි අවස්ථාවක් ඇති කරයි. අනුහුරුවීමේ පියවර මගින් සමහර අරමුණු සඳහා සම-ප්‍රතිලාභ ද ඇතැම් විට ලබෙන අතර, පසේ සෞඛ්‍යය දියුණු කිරීම, ජලයේ ගුණාත්මක බව දියුණු කිරීම, වනජීවී වාසස්ථාන කළමනාකරණය හෝ හරිතාගාර වායු විමෝචන අඩුකිරීම මේ අතර වේ. නිදනුසක් ලෙස ගතහොත් ශ්‍රී  ලංකවේ නායකත්වයෙන් යුතුව ගන්නා ලද එක් සැලකිය යුතු මුලපිරීමක් ලෙස නයිට්‍රජන් අපතේ යෑම අඩු කර ගෝලීය වශයෙන් ඇති නයිට්‍රජන් අභියෝගය විසඳීම සඳහා 2019 දී ඇති කරගත් තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශනය (හා අදාළ එක්සත් ජාතීන්ගේ යෝජනාව) දැක්විය හැකිය. දේශගුණ විපර්යාසවලට ප්‍රතිචාර ලෙස ක්‍රියාත්මක පරිවර්තනීය අනුහුරුවීමේ ක්‍රියාවලිය මගින් වඩාත් ඔරොත්තු දෙන කෘෂි පද්ධති වැඩි වශයෙන් ඇති කිරීම හා ඒ සමඟ අංශයේ පාලනයේ දියුණුවක් ඇති වීම සිදු වේ.

දේශගුණ විපර්යාස අවදානම අඩු කිරීම හා ගොවීන්ගේ ආපදා අවදානමට ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වැඩසටහන් ගණනාවක් දියත් කර තිබේ. මේ අතර අංශ සඳහා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති ස්ථාපිත කිරීම, කෘෂි කාලගුණ උපදේශන සේවාව (Agro-met Advisory Service) දියත් කිරීම හා GeoGoviya නම් මධ්‍යම මාර්ගගත දත්තසමුදාය දැක්විය හැකිය. කෘෂි කාලගුණ උපදේශන සේවාව මගින් කාලගුණය පිළිබඳ තොරතුරු සැපයීම හා භෝග වහා කිරීම සඳහා මගපෙන්වීම සිදුකරන අතර, එය කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සම්පාදනය කරනු ලබන්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන දේශගුණ අනාවැකි පදනම් කරගනිමින් විශේෂඥයන් හා පාර්ශ්වකාර ආයතනවල උපදේශනය හා සමගිනි. GeoGoviya යනු වලාකුළු පරිගණනය පාදක කරගත් සුහුරු ගොවිතැන් වේදිකාවක් වන අතර, එමගින් පිරිවැය ඵලදායී තොරතුරු තාක්ෂණ මෙවලමක් යොදා ගෙන භෝග කාර්යසාධනය අධීක්ෂණය හා නිරීක්ෂණය කිරීම කළ හැකිය. මෙමගින් ගොවිපොළ මට්ටමේ දත්ත මැනීම, නිරීක්ෂණය හා වාර්තාකිරීම සඳහා ශ්‍රී ලංකා රජයට විශාල පද්ධති ධාරිතාවක් සහිත අවස්ථාවක් සැපයේ. මේවා විවිධ ආයතන අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් සිදුකරමින් විශාල ප්‍රමාණයේ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ සැපයීම සඳහා පහසුකම් සැපයිය හැකිය. ගොවීන් සඳහා රක්ෂණ විසඳුම් මීට අයත් වේ.

තවත් ඵලදායී මැදිහත් වීමක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ ව්‍යාප්ති අංශය මගින් සිදුකරන වැඩසටහන් හා ක්‍රියාකාරකම් මාලාව දැක්විය හැකිය. මේ අංශය මගින් කෘෂිකර්මය හා සම්බන්ධ සියලු පාර්ශකරුවන් වෙත කෘෂිකාර්මික තාක්ෂණයන් අඛණ්ඩව බෙදාහැරීම සිදුකරන අතර, ඒ මහා වාරි යෝජනා ක්‍රමවල විවිධ ව්‍යාප්ති ප්‍රවේශයන් භාවිත කරමිනි. ව්‍යාප්ති අංශයේ උප ඒකක ඇති අතර, ඒවා මගින්, වී, වෙනත් ක්ෂේත්‍ර  භෝග, පලතුරු හා එළවළු, ශාක ආරක්ෂාව, කාන්තා කෘෂි ව්‍යාප්තිය, තරුණ ගොවි සමාජ, ශාක පෝෂක හා කාබනික පොහොර, දේශගුණ තිරසර කෘෂිකර්මය හා වාරිමාර්ග කළමනාකරණය වැනි අංශවල ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය සිදුකරයි.

4-1 වගුව මගින් ඉදිරිපත් කර ඇති NDC මගින් දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවට උදාවී ඇති අවස්ථාවකි. ඒ, හදිසි කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය කෙටි කාලීන වෙනස්කම් සඳහා සහාය වෙමින්, දේශගුණ සුහුරු කෘෂිකර්මය පිළිබඳ අවධානය යොමු කර දීර්ඝ කාලීන වශයෙන් කළ යුතු සැලකිය යුතු වෙනස්කම්වලට සැලසුම් කිරීම සලකා බැලීම සඳහාය. ගොවීන්ගේ හා ඔවුන්ගේ ප්‍රජාවගේ ජීවිත හා ජීවනෝපාය ඔරොත්තු දීම හා ආරක්ෂා කිරීම සඳහා සමස්ත කෘෂිකර්ම අංශයේ ඉහළ සහයෝගයක් අවශ්‍ය වේ.

4-1 වගුව කෘෂිකර්ම අංශයේ අනුහුරුවීමේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය තුළ ප්‍රධානධාරාගත කිරීම සඳහා සලකනු ලබන දේශගුණ විපර්යාස සම්බන්ධ කරුණු |
| 2 | දේශගුණ විපර්යාස සඳහා වැඩිම අවදානමක් ඇති ප්‍රදේශ/ දිස්ත්‍රික්ක/ භෝග සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලනය (IPM) සහ ඒකාබද්ධ ශාක සහ පෝෂණ පද්ධති (IPNS) ප්‍රවර්ධනය කිරීම |
| 3 | දේශගුණ විපර්යාසවලට වැඩි වශයෙන් අවදානමට ලක්ව ඇති කෘෂි භෝග ඉලක්ක කරමින්, ජෛව සහ ජෛව නොවන ආතතීන්ට ප්‍රතිරෝධක/ ඔරොත්තු දෙන භෝග ප්‍රභේද දියුණු කිරීම/ හඳුන්වාදීම |
| 4 | වර්තමානයේ සහ අනාගතයේ ඇතිවිය හැකි දේශගුණ තත්ත්ව සමඟ ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප (AERs) සිතියම නැවත සලකා බැලීම සහ දේශගුණ විපර්යාස නිසා ලක්ව ඇති අවදානම අඩුකරගැනීම සඳහා විවිධ කලාපවලට යෝග්‍ය භෝග වර්ග නිර්දේශ කිරීම |
| 5 | අපේක්ෂිත දේශගුණ අවදානම බරපතළ වන ප්‍රදේශවල තිරසර ඉඩම් සහ ජල කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම |
| 6 | දේශගුණ විපර්යාස අවදානම අඩුකිරීම සඳහා, වැඩිදියුණු කළ පූර්ව අනතුරු ඇඟවීමේ සහ අවදානම් කළමණාකරණ යන්ත්‍රණ හඳුන්වාදීම |

## 4.2.1 කෘෂිකර්ම අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම (අනුහුරුවීම)

| NDC 1 - ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය තුළට ප්‍රධානධාරාගත කිරීම සඳහා සලකනු ලබන දේශගුණ විපර්යාස සම්බන්ධ කරුණු (2022) | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1 දේශගුණ සුහුරු කෘෂිකර්මය (CSA) තාක්ෂණයන් ශ්‍රී ලංකාවේ භාවිතය දියුණු කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.1.1 දේශගුණ සුහුරු කෘෂිකර්ම තාක්ෂණයන් පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය | DoA | MoIrri, LUPPD, MASL, DAD, TSH-DA, PDoA, ID, TRI, RRI, CRI, CCB, SRI, PRI | KPI: දේශගුණ සුහුරු කෘෂිකර්මය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම, ක්‍රියාත්මක කිරීම - දියත් කිරීම | | DoA සහ අනෙක් රාජ්‍ය ආයතනවල දත්ත මූලාශ්‍ර | දේශගුණ සුහුරු කෘෂිකර්මය පිළිබඳ ජාතික මාර්ගෝප-දේශ සකස් කර ඇත | 100% | √ | √ | √ | | | | | | | | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 1.1.2 ශ්‍රී ලංකාවේ දේශගුණ සුහුරු කෘෂිකර්ම තාක්ෂණයන් පිළිබඳ ඉන්වෙන්ටරියක් සකස් කර ප්‍රකාශයට පත් කිරීම | DoA | MoIrri, LUPPD, MASL, DAD, TSH-DA, PDoA, ID, TRI, RRI, CRI, CCB, SRI, PRI | දේශගුණ සුහුරු කෘ-ෂිකර්ම තාක්ෂණයන් පිළිබඳ ඉන්වෙන්ටරිය සකස් කර ප්‍රකාශයට පත් කිරීම | | වාර්ෂික වාර්තා<br><br>Annual Reports, | දේශගුණ සුහුරු කෘෂිකර්ම තාක්ෂණය-න් පිළිබඳ තොරතුරු විවිධ ආයතන සතුව පවතී | 100% | √ | √ | √ | | | | | | | | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 1.1.3 ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම යහපිළිවෙත් (SL GAP) මගින් දේශගුණ සුහුරු කෘෂිකර්ම තාක්ෂණයන් ප්‍රධානධාරාගත කිරීම | DoA | PDoA, DEA, MASL | KPI: SL GAP ඇතුළත්ව යාවත්කාලීන කළ ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම යහපිළිවෙත් | | DoA හා වෙනත් රාජ්‍ය ආයතන | ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම යහපිළිවෙත් (SLGAP) මාර්ගෝප දේශ | 100% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 1.2 කෘෂි උපදේශන මත පදනම්ව දේශගුණ අනාවැකි හරහා කෘෂිකර්මයට සිදු වන දේශගුණ විපර්යාස බලපෑම්/ අවදානම් අවම කිරීම | DoA | MET, PDoA, DEA, MASL, වැවිලි අංශය | උත්ශ්‍රේණිගත දේශගුණ පාදක කෘෂි උපදේශන පද්ධතියක් පැවතීම<br><br>නිකුත් කරන ලද උපදේශන ප්‍රමාණය | | වාර්ෂික වාර්තා | පවත්නා පද්ධතිවල අවකාශයීය/ කාලික නිර-වද්‍යතාව හා විභේදනය වැඩිදුරටත් දියුණු කිරීම | 100% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 7, 12,1, 13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.3 දේශගුණ අවදානම සහිත ප්‍රදේශවල භෝග-පශුපාලනය ඒකාබද්ධ වූ ගොවිතැන් ක්‍රම ප්‍රවර්ධනය කිරීම | DoA හා DAPH | PoDA, PDAPH, DAD, MASL, NLDB, RPC ඇතුළත්ව පෞද්ගලික අංශය, ශාස්ත්‍රඥයන් | KPI: (I) ආවරණය වන ප්‍රදේශය (හෙක්) හෝ ප්‍රතිශත වර්ධනය<br><br>(II) ආවරණය වන ගොවීන් ගණන;<br>(III) හඳුන්වා දුන් ඒකාබද්ධ කෘෂි පද්ධති/ ආකෘති ගණන/ | | DoA, DAPH හා සෙසු රජයේ ආයතන දත්ත මූලාශ්‍ර | 10% | 40% | √ | √ | √ | √ | √ | | | | | | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 1.4 අගය එකතු කිරීම සහිත කුඩා පරිමාණ නිෂ්පාදන පද්ධති ලෙස ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳපොළ මාර්ග ඇතිකිරීම | DoA හා DAPH | DEA, MASL, DAD, DAPH, PDAPH, PDoA, පෞද්ගලික අංශයේ ආයතන හා ගොවි සංවිධාන, UDA | (i) ස්ථාපිත ගොවි වෙළෙඳපොළ ගණන<br><br>(ii) ස්ථාපිත කළ ඉදිරි ගිවිසුම් ගණන<br><br>(iii) හඳුනාගත් ගෙවතු වගා ආකෘති ගණන | | දත්ත මූලාශ්‍ර: DoA, DAPH හා සෙසු රජයේ ආයතන, ව්‍යාපෘති ඇගැයීම් | ගෙවතු වගා මාර්ගෝප දේශන පොත් පවතී | 75% | √ | √ | √ | √ | √ | | | | | | 2, 13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

NDC 2 - දේශගුණ විපර්යාස සඳහා වැඩිම අවදානමක් ඇති ප්‍රදේශ/ දිස්ත්‍රික්ක/ භෝග සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලනය (IPM) සහ ඒකාබද්ධ ශාක සහ පෝෂණ පද්ධති (IPNS) ප්‍රවර්ධනය කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1 දේශගුණ විපර්යාස හේතුවෙන් පළිබෝධ/ රෝග, වල් පැළෑටි සහ වනසත්ත්ව ප්‍රහාර නැවත ඇතිවීමට සහ ඇතිවීමට අවදානමක් පවත්නා ප්‍රදේශ හඳුනාගැනීම | DoA | DAD, DWC, MET, DoMC, PDoA, ශාස්ත්‍රඥයන් MASL, DEA, HARTI, HBASL | KPI:<br>(i) ප්‍රමුඛතා ප්‍රදේශ හඳුනාගැනීම<br><br>(ii) සමීක්ෂණ හා දත්ත විශ්ලේෂණ වාර්තා<br>(iii) අවදානම සඳහා දර්ශක | | රාජ්‍ය ආයතවල දත්ත මූලාශ්‍ර හා සමීක්ෂණ වාර්තා | විශ්ලේෂණය හා අවදා-නම් ස්ථාන හඳුනාගැනීම යම් ප්‍රමා-ණයකට සිදුව ඇත | 50% | √ | √ | √ | √ | | | | | | | 13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.2 අවදානමක් සහිත ප්‍රදේශවල තෝරාගත් භෝග සඳහා උචිත ඒකාබද්ධ පළිබෝධ පාලන (IPM) හා ඒකාබද්ධ ශාක සහ පෝෂණ පද්ධති (IPNS) වැඩසටහන් සකස් කර හඳුන්වාදීම | DoA | DAD, DWC, MET, DoMC, PDoA, ශාස්ත්‍රඥයන් HARTI, MASL, DEA, HBASL | KPI: (i) ඒකාබද්ධ පළිබෝධ පාලන (IPM) ක්‍රම ගණන<br><br>(ii) ඒකාබද්ධ ශාක සහ පෝෂණ පද්ධති (IPNS) හඳුන්වා දීම<br><br>(iii) මෙම පැකේජ භාවිතයට ගන්නා ගොවීන් ගණන | | DoA හා රජයේ ආයතනවල දත්ත මූලාශ්‍ර | වී සහ එළවළු සඳහා ඒකාබද්ධ පළි බෝධ පාලන පැකේජ දැනටමත් ක්‍රියාත්මක වේ | 40% | √ | √ | √ | √ | √ | | | | | | 2, 13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 2.3 දේශගුණ විපර්යාස සඳහා වැඩි අවදානමක් ඇති ප්‍රදේශවල නිපදවන SL GAP සහතිකලත් නිෂ්පාදන ප්‍රමාණය 25% කින් වැඩිකිරීම | DoA | DAD, DWC, MET, DodMC, PDoA" Academia, HARTI, MASL, DEA, සුපිරි වෙළෙඳසැල් ජාල, ආර්ථික මධ්‍යස්ථාන හා පෞද්ගලික අංශය, ගොවි වෙළෙඳපොළ, හදබිම වැනි අලෙවි ආයතන | (i) GAP සහතික ලත් ගොවීන් ගනන<br><br>(ii) GAP සහතික ලත් නිෂ්පාදන සහිත වෙළෙඳපොළ ගණන<br><br>(iii) GAP සහතික කළ නිෂ්පාදන අලෙවි කරන ප්‍රමාණය<br><br>(iv) දියුණු කරන ලද ප්‍රවර්ධන ද්‍රව්‍ය ගණන | | DoA හා රාජ්‍ය ආයතනවල චත්ත මූලාශ්‍ර | 5% | එක් එක් KPI සඳහා අපේක්ෂිත මට්ටම අත්පත් කරගැනීම | √ | √ | √ | √ | √ | | | | | | 2, 13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

| NDC 3 - දේශගුණ විපර්යාසවලට වැඩි වශයෙන් අවදානමට ලක්ව ඇති කෘෂි භෝග ඉලක්ක කරමින්, ජෛව සහ ජෛව නොවන ආතතීන්ට ප්‍රතිරෝධක/ ඔරොත්තු දෙන භෝග ප්‍රභේද දියුණු කිරීම/ හඳුන්වාදීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1 උෂ්ණත්වයට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම / ප්‍රවර්ධනය කිරීම | DoA | PDoA, MASL, DAD ශාස්ත්‍රඥයන් | උෂ්ණත්වයට ඔරොත්තු දීම සඳහා දියුණු කරන ලද ප්‍රභේද ප්‍රමාණයෙන් හඳුන්වාදෙන ලද ප්‍රභේද ප්‍රතිශතය | | ප්‍රභේද නිකුත් කිරීමේ කමිටු වාර්තා, සමාජ-ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ වාර්තා, රාජ්‍ය ආයතනවල කාර්යසාධන වාර්තා | 30% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2,12 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.2 නියඟයට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ ප්‍රවර්ධනය කිරීම | DoA | PDoA, MASL, DAD ශාස්ත්‍රඥයන් | නියඟයට ඔරොත්තු දීම සඳහා දියුණු කරන ලද ප්‍රභේද ප්‍රමාණයෙන් හඳුන්-වාදෙන ලද ප්‍රභේද ප්‍රතිශතය | | | 25% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2,7,12 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 3.3 පසේ අධික තෙතමනයට/ ගංවතුරට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්-වාදීම/ ප්‍රවර්ධනය කිරීම | DoA | PDoA, MASL, DAD ශාස්ත්‍රඥයන් | පසේ අධික තෙතමනයට/ ගංවතුරට ඔරොත්තු දීම සඳහා දියුණු කරන ලද ප්‍රභේද ප්‍රමාණයෙන් හඳුන්-වාදෙන ලද ප්‍රභේද ප්‍රතිශතය | | | 10% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2,7,12 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 3.4 ලවණතාවයට ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ ප්‍රවර්ධනය කිරීම | DoA | PDoA, MASL, DAD ශාස්ත්‍රඥයන් | ලවණතාවයට ඔරොත්තු දීම සඳහා දියුණු කරන ලද ප්‍රභේද ප්‍රමාණයෙන් හඳුන්වාදෙන ලද ප්‍රභේද ප්‍රතිශතය | | | 30% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 7, 12 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 3.5 පළිබෝධ සඳහා/ රෝගවලට ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන ප්‍රභේද සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම | DoA | PDoA, MASL, DAD ශාස්ත්‍රඥයන් | පළිබෝධ හා රෝගවලට ප්‍රතිරෝධී බව/ ඔරොත්තු දීම සඳහා දියුණු කරන ලද ප්‍රභේද ප්‍රමාණ-යෙන් හඳුන්වාදෙන ලද ප්‍රභේද ප්‍රතිශතය | | | 80% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 3.6 ආන්තික දේශගුණ තත්ත්වවලට ඔරොත්තු දෙන සත්ත්ව ආහාර ප්‍රභේද සංවර්ධනය, හඳුන්වාදීම/ ප්‍රවර්ධනය කිරීම | DoA, DAPH | PDoA, PDAPH, ශාස්ත්‍රඥයන් | ආන්තික දේශගුණ තත්ත්වවලට ඔරොත්තු දීම සඳහා දියුණු කරන ලද සත්ත්ව ආහාර ප්‍රභේද ප්‍රමාණයෙන් හඳුන්-වාදෙන ලද ප්‍රභේද ප්‍රතිශතය | | | මූලික දත්ත හඳුනාගත යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

**NDC 4 - වර්තමානයේ සහ අනාගතයේ ඇතිවිය හැකි දේශගුණ තත්ත්ව සමඟ ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප (AERs) සිතියම නැවත සලකා බැලීම සහ දේශගුණ විපර්යාස නිසා ලක්ව ඇති අවදානම අඩුකරගැනීම සඳහා විවිධ කලාපවලට යෝග්‍ය භෝග වර්ග නිර්දේශ කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1 දේශගුණ විපර්යාස නිසා වඩාත්ම අවදානමට ලක් විය හැකි කෘෂි පාරිසරික කලාප (AERs) ආවරණය කිරීම සඳහා කෘෂි කාලගුණ නිරීක්ෂණ ජාලය පුළුල් කිරීම | DoA | MET, PDoA, MASL, ID, DAD | කෘෂි පාරිසරික කලාප (AER) ආවරණය කිරීම | | කාර්යසාධන වාර්තා | 40% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 4.2 දේශගුණ විපර්යාස නිසා වඩාත්ම අවදානමකට ලක් විය හැකි කෘෂි පාරිසරික කලාප (AER) ආවරණය කරමින් සඳහා පසේ තෙතමනය සම්බන්ධයෙන් අධ්‍යයන සිදුකිරීම | DoA | DAD, MASL, ID, MET, WRB | අධ්‍යයන 5 | | අධ්‍යයන වාර්තා, කාර්යසාධන වාර්තා | 25% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | | | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 4.3 නිශ්චිත භෝග වර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස, දේශගුණ විපර්යාස නිසා වඩාත්ම අවදානමට ලක් විය හැකි කෘෂි පාරිසරික කලාප (AER) උප කලාප වශයෙන් නැවතත් බෙදීම | DoA, MET | PDoA, MASL, ID, DAD | කෘෂි පාරිසරික කලාප සිතියම | | පවත්නා වාර්තා | 25% | 100% | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 7, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

**NDC 5 - අපේක්ෂිත දේශගුණ අවදානම බරපතළ වන ප්‍රදේශවල තිරසර ඉඩම් සහ ජල කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1 ඉලක්ක ප්‍රදේශයෙන් 2025 වන විට 50%ක් හා 2030 වන විට 100%ක් ආවරණය කෙරෙන පරිදි යෙදවුම් කාර්යක්ෂම ගොවිතැන් ක්‍රම/ පද්ධති ප්‍රවර්ධනය කිරීම | DoA | MASL, PDoA, DAD, ID, HASL, TRI, DoEA, CCB | යෙදවුම් කාර්යක්ෂම ගොවිතැන් පද්ධති ස්ථාපිත කිරීම | | කාර්යසාධන වාර්තා | 30% | 100% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 5.2 ඉලක්ක ප්‍රදේශයෙන් 75%ක් ආවරණය වන පරිදි ගොවිපොළ වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය කිරීම | DoA | FCRDI, HORDI, FRDI | වැසිජලය රැස්කිරීමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම | | කාර්යසාධන වාර්තා | 30% | 75% | √ | √ | √ | √ | √ | | | | | | 2, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.3 ඉලක්ක ප්‍රදේශයෙන් 25%ක ප්‍රමාණයක ගලායන වැසිජලය (storm water) කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම | DoA | LUPPD, PDoAs, HADABIMA, MASL | ආවරණය කරන ප්‍රදේශය | | කාර්යසාධන වාර්තා | 5% | 25% | √ | √ | √ | √ | √ | | | | | 2,12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 5.4 යෙදවුම් කාර්යක්ෂම සහ දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන ප්‍රභේද මගින් ඉලක්ක ප්‍රදේශයෙන් 50%ක භෝග විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම | DoA | PDoA, MASL | වාරිමාර්ග යෝජනා ක්‍රමවල භෝග විවිධාංගීකරණක්‍රම ස්ථාපිත කිරීම | | කාර්යසාධන වාර්තා | 25% | 50% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2,12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 5.5 සමස්ත ඉලක්ක ප්‍රදේශයම ආවරණය වන සේ කුඩා වැව් එල්ලංගා පද්ධති සහ තනි වැව් ප්‍රතිසංස්කරණය කිරීම (මෙය ජල අංශයට සම්බන්ධ වේ) | DAD | DoA, PDoA, ID | කුඩා වැව් වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය | | කාර්යසාධන වාර්තා | 30% | 70% | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 5.6 ඉලක්ක ප්‍රදේශයෙන් 50%ක පස සංරක්ෂණ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සහ යොදාගැනීම | DoA | PDoA, HBASL, MASL, TSHDA | පස සංරක්ෂණ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම | | කාර්යසාධන වාර්තා | 25% | 50% | √ | √ | √ | √ | √ | √ | √ | √ | | | 2, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

## NDC 6 - දේශගුණ විපර්යාස අවදානම අඩුකිරීම සඳහා, වැඩිදියුණු කළ පූර්ව අනතුරු ඇඟවීමේ සහ අවදානම් කළමනාකරණ යන්ත්‍රණ හඳුන්වාදීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 6.1 මහ සහ යල කන්න සඳහා දේශගුණ අනාවැකි වැඩිදියුණු කිරීම | MET | NRMC | වැඩිදියුණු කළ කන්න අනාවැකි දියත් කිරීම | | කාර්යසාධන වාර්තා | 25% | 75% | √ | √ | √ | √ | | | | | | | 2,12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 6.2 ගොවීන්ට සහ ක්ෂේත්‍ර මට්ටමේ කෘෂිකර්ම නිලධාරීන්ට සරල කළ දේශගුණ අනාවැකි පාදක උපදේශන සන්නිවේදන නිසි කලට ලබාදීම ප්‍රවර්ධනය කිරීම | DoA | NAICC, PDoAs MET, NRMC | සන්නිවේදන ජාල ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක වීම | | කාර්යසාධන වාර්තා | 40% | 75% | | √ | √ | √ | √ | | | | | | 2, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 6.3 කෘෂිකර්මයේ අවදානම් කළමනාකරණය සහ අවදානම් පැවරුම් යාන්ත්‍රණ ශක්තිමත් කිරීම | AAIB | SEPC, NRMC | කෘෂි රක්ෂණ යාන්ත්‍රණය පැවතීම හා ක්‍රියාත්මක වීම; මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ ගොවීන් ගණන ඉහළ යෑම | | කාර්යසාධන වාර්තා | 40% | 100% | | √ | √ | √ | √ | | | | | | 2,12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.4 දේශගුණ ආපදා සහ පළිබෝධ හා රෝග අවදානම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති/ උපදේශන ශක්තිමත් කිරීම | DoA | NRMC MET, RRDI, HORDI, FCRDI, PDOA | යාන්ත්‍රණය පැවතීම හා ක්‍රියාත්මක වීම; පූර්ව අනතුරු හඟවන උපදේශන භාවිත කරන ගොවීන් ගණන | | කාර්යසාධන වාර්තා | 25% | 50% | | √ | √ | √ | √ | | | | | | 2,12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 6.5 පසු අස්වනු හානි අඩුකරගැනීම සඳහා දේශගුණය සම්බන්ධ භෝග අනාවැකි හඳුන්වාදීම | DoA | SEPC, NRMC, RRDI, MASL, PDoA | MOSAICC පාදක කරගත් අනාවැකි පැවසීම | | කාර්යසාධන වාර්තා | 15% | 100% | | √ | √ | √ | √ | | | | | | 2,12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |
| 6.6 දේශගුණ අවදානම් කළමනාකරණය සඳහා ආරක්ෂිත කෘෂිකර්මය සහ අනෙකුත් තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම | FMRC, HORDI | ;PAEA සෙසු පෞද්ගලික අංශයේ ආයතන, ශාස්ත්‍රඥයන් | ආරක්ෂිත කෘෂිකර්මය යටතේ ඇති ප්‍රදේශය | | කාර්යසාධන වාර්තා | 20% | 50% | | | √ | √ | √ | √ | √ | | | | 2, 12,13 (SDG ඉලක්ක හඳුනාගත යුතුව තිබේ) |

## 4.3 ධීවර අංශය

ශ්‍රී ලංකාවේ ධීවර අංශයට සමුද්‍රීය ධීවර කර්මාන්තයේ වර්ග කි.මී. 517,000ක අනන්‍ය ආර්ථික කලාපය (EEZ), වර්ග කි.මී. 21,500ක රාජ්‍ය මුහුදු තීරයක් හා කලපු හා මෝයවලින් යුක්ත වර්ග කි.මී. 1580ක් අභ්‍යන්තර ජලාශ සහ වර්ග කි.මී. 5200ක් වන කෘත්‍රිම ජලාශ අයත් වේ. ජලජීවී වගාවේ වර්ධනය සඳහා සම්පත් පදනම සපයන්නේ බොකු, කලපු, ජලාශ හා වෙරළබඩ හා ජලා ප්‍රදේශ ආශ්‍රිතව පිහිටා ඇති ඇතැම් ගොඩබිම් පද්ධති වේ[45] .

ධීවර අංශය ජාතියේ ආර්ථිකයේ මෙන්ම ආහාර සුරක්ෂිතතාවය සඳහා ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ ජනතාව පරිභෝජනය කරන සත්ත්ව ප්‍රෝටීන අතරින් 50%ක් සැපයෙන්නේ ධීවර නිෂ්පාදනවලින් වන අතර එය ලෝකයේ සාමාන්‍යය මෙන් තුන්ගුණයක් පමණ වේ. "අපනයන සංවර්ධන මණ්ඩලයේ ධීවර අංශය සඳහා වන කර්මාන්ත ධාරිතා වාර්තාව" අනුව 2019 වර්ෂයේ දී මුහුදු ආහාර හා ජලජීවී වගා අංශයේ සක්‍රියව යෙදුණු පිරිස 8,500,000ක් පමණ විය. මෙහි ප්‍රධාන පාර්ශ්වකරුවන් වන්නේ ධීවරයින්, අභිජනනය කරන්නන්, සැකසුම්කරුවන්, පහසුකම් සපයන්නන්, ශීත දාම, ඇසුරුම් හා වෙනත් සේවා සපයන්නන්ය. මේ අංශයේ සියලු පියවර මගින් ධීවර හා ජලජීවී වගා කර්මාන්තය මගින් වැඩි වැඩියෙන් රැකියා අවස්ථා උත්පාදනය කරන අතර, ප්‍රධාන වශයෙන් වෙරළ තීරයේ ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සිදුකරයි. මීට අමතරව, 2019 වර්ෂයේ දී මෙරට උත්පාදනය කළ විදේශ විනිමය ප්‍රමාණයෙන් 1.5%ක් ධීවර අංශය මගින් ඉපැයූ අතර, දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.9% සඳහා සෘජුව, වක්‍රව හා ප්‍රේරණය කිරීමෙන් දායක වී තිබේ.

මෙරට ධීවර නිෂ්පාදනය සඳහා වැඩි දායකත්වයක් සපයන්නේ වෙරලබඩ හා සමුද්‍රීය අංශයි. මෙරට ධීවර නිෂ්පාදනය සඳහා වැඩිම දායකත්වයක් ලබාදෙන්නේ සමුද්‍රීය ධීවර කර්මාන්තයෙන් වන අතර, ඊට ගැඹුරු මුහුදේ හා වෙරළබඩ සිදුකරන ධීවර කර්මාන්තය අයත් වේ (4-3 රූපය බලන්න). 2014 සිය 2021 දක්වා කාලය තුළ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සාගර ධීවර ප්‍රතිදානයේ ප්‍රතිශතය පිළිවෙලින් 86%, 87%, 86%, 85%, 83%, 82%, 76% හා 76% ලෙස විය[46].




4-3 රූපය ජාතික ධීවර නිෂ්පාදනය (දත්තඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව[47])

45 The National Fisheries and Aquaculture Policy, Sri Lanka (2018)
46 Statistical Pocket Handbook of Sri Lanka, 2022 Available at http://www.statistics.gov.lk/Publication/PocketBook



කෙසේ වෙතත්, මෑතකාලයේ දී මේ අංශයේ එක් කම්කරු ඒකකයක් සඳහා අල්ලාගනු ලබන මසුන් ප්‍රමාණයේ අඩුවීමක් දැකිය හැකි අතර, ආන්තික කාලගුණ සිදුවීම්වලට ද නිරාවරණය වී තිබේ. මීට අමතරව, COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ මත්ස්‍ය අස්වැන්නේ 20%ක අඩුවීමක් හා මත්ස්‍ය අපනයනයේ 26%ක අඩුවීමක් දැකිය හැකි විය[47]. ඒ තත්ත්වය මේ වන විටත් අවදානමක පසුවන වෙරළබඩ ධීවර ප්‍රජාවගේ ජීවිතවලට සැලකිය යුතු අන්දමින් බලපෑවේය. මේ තත්ත්වය තවත් උග්‍ර කරන ලද්දේ වර්තමාන ආර්ථික අර්බුදය මගිනි. ඉන්ධන හා විදුලිබල සැපයුමේ හිඟය හා ඉහළ ගිය මිල නිසා ධීවර බෝට්ටු ක්‍රියාකරවීමේ අතිවන ගැටලු, මත්ස්‍ය නිෂ්පාදනය පරිරක්ෂණය සඳහා අයිස් ලබාගැනීමේ ඇතිවන ගැටලු හා ධීවර වරායවල සිට අලෙවි මධ්‍යස්ථාන දක්වා නිෂ්පාදන ප්‍රවාහනය කිරීමේ දී ඇති වන ගැටලු හේතුවෙන් ධීවර ජනතාවගේ ජීවනෝපාය අර්බුදයකට ලක් වී තිබේ.

ජලය තුළ ජීවිතය නම් 14 වැනි තිරසර සංවර්ධන අභිමතාර්ථය (SDG) අනුව මේ අංශය 2021 වර්ෂය සඳහා ඉලක්ක තුනක් ඇතිකර තිබේ. ඒ අනුව, මෙට්‍රික් ටොන් 372,472ක සාගර මත්ස්‍ය නිෂ්පාදනයක්, මෙට්‍රික් ටොන් 109,500ක අභ්‍යන්තර හා ජලජීවී වගා නිෂ්පාදනයක් ලබාගැනීම හා ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 48ක් බවට පත් කිරීම මේ අතර වේ. මේ එක් එක් ඉලක්කවලින් 89%ක්, 94.8%ක් හා 77.3%ක් පමණ 2021 වර්ෂය වන විට අත්පත් කරගෙන තිබේ[48]. මේ ඉලක්ක සාර්ථක ලෙස අත්පත් කරගත්ත ද, ධීවර අංශයේ විභවය තිරසර ආකාරයෙන් සම්පූර්ණයෙන් ලබාගැනීමේ දී අංශය මුහුණ දෙන ප්‍රධාන ගැටලු කිහිපයකි. ඒවා නම්, (i) ශ්‍රී ලංකා මුහුදු සීමාවේ දකුණු ඉන්දියානු ධීවරයන් විසින් නීති විරෝධීව ට්‍රෝලර් යාත්‍රා වලින් මුහුදු පතුලේ කෙරෙන මසුන් ඇල්ලීම වැනි හානිදායක ධීවර කටයුතු, (ii) නීති විරෝධී, වාර්තා නොවන හා නියාමනයකින් තොර ධීවර මෙහෙයුම් වර්ධනය වීම හා (iii) ශ්‍රී ලංකාව අවට සාගරයේ නාවුක මාර්ගවල නාවුක ගමනාගමනය ඉහළ යෑම නිසා ඇතිවන ඉහළ යන සාගර දූෂණය හා ආක්‍රමණික ආගන්තුක ජීවි විශේෂ ඉහළ යෑම වේ. ශ්‍රී ලංකා රජය මගින් වෙරළාශ්‍රිත හා සමුද්‍රීය සම්පත් කළමනාකරණය සඳහා පරිපූර්ණ නෛතික, ප්‍රතිපත්ති හා ආයතනික රාමුවක් සකස් කර ඇති අතර, ඉහත දක්වා ඇති පරිදි 2021 වර්ෂයේ දී සාගර අංශයේ ධීවර සැපයුම වර්ධනය කිරීම සඳහා සැලකිය යුතු ප්‍රයත්නයක් ද දරා තිබේ. 1996 අංක 2 දරණ ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන අනුව මෙම නෛතික මැදිහත්වීම් ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගිනි. ජාතික ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තියේ (2018)[49] කෙටුම්පතට පරිසරය, දේශගුණය හා ස්වාභාවික ආපදා යනුවෙන් කොටසක් එකතු කර තිබේ. එමගින් පාරිසරික, දේශගුණ විපර්යාස හා ස්වාභාවික ආපදාවල බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා වූ උපායමාර්ගයක් දියුණු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. මීට අමතරව එමගින් සාගර දූෂණය වැළැක්වීම, දේශගුණ බලපෑම්වලින් බලපෑමට ලක්වන ප්‍රජාවට සහාය වීම හා ඊට මුහුණදීම සඳහා උපායමාර්ගයක් සංවර්ධනය කිරීම ඇතුළත්ය.

මීට අමතරව, වාණිජ අගයයක් ඇති මත්ස්‍ය විශේෂවල අභිජනන බිම් ලෙස ක්‍රියාකරන කඩොලාන හා මුහුදු තණ බිම් ද දේශගුණ විර්යාසවලින් අහිතකර ලෙස බලපෑමට ලක්වේ. දේශගුණ විපර්යාසවලින් ධීවර අංශයට සිදුවන වෙනත් අහිතකර බලපෑම් අතර වෙරළබඩ ප්‍රදේශවල තෙත්බිම් අහිමි වීම, හා මත්ස්‍ය හා බෙල්ලන් සඳහා බලපෑමක් ඇතිකරන කලපු හා මෝයවල ලවණතාවය වෙනස්වීම වේ. උෂ්ණත්ව විචල්‍යතා, නියඟය, වර්ෂාපතනය, අපධාවය හා ගංවතුර නිසා මිරිදිය පරිසර පද්ධතිවලට ඇතිවන බලපෑම අභ්‍යන්තර ධීවර කර්මාන්තයට බලපායි. ඊසාන දිග මෝසම් කාලයේ දී අපේක්ෂිත වර්ෂාපතනය අඩු වීම නිසා ද අභ්‍යන්තර ධීවර කර්මාන්තයට ඇති අවදානම ඉහළ යයි. කුණාටු ඇතිවීම, දැඩි සුළඟ හා සුළිසුළං වැනි ස්වාභාවික ආපදා ඉහළ යෑම නිසා කොරල්පරවලට හානි සිදුවිය හැකි අතර, ඒ මගින් වෙරළ ඛාදනය, පසේ ලවණතාවය ඉහළ යෑම හා මිරිදිය පද්ධති දූෂිත වීම සිදුවේ. ධීවර අංශයට දේශගුණ විපර්යාසවලින් සිදුවන හානිකර බලපෑම් නිසා දැඩි අනුහුරු වීමේ උපායමාර්ග අවශ්‍ය වේ.

47 World Bank, Priorities for Sustainably Managing Sri Lanka's Marine Fisheries, Coastal Aquaculture, and the Ecosystems that Support Them (2021).
48 State Ministry of Ornamental Fish, Inland Fish & Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports, Annual Performance Report, 2021
49 Ministry of Fisheries and Aquatic Resources Development and Rural Economy (2018) National Fishereis and Aquaculture Policy

ධීවර කර්මාන්තය කළමනාකරණය සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශය යොදාගැනිම, ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා ජලජීවී වගාව සහ වගා-පාදක ධීවර කටයුතු වර්ධනය කිරීම, අහිතකර දේශගුණ තත්ත්වවලට ඔරොත්තු දියහැකි මත්ස්‍ය විශේෂ ජලජීවී වගාව සඳහා අභිජනනය කිරීම, මුහුදේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම, දේශගුණ අවදානම් කළමනාකරණය සඳහා වඩාත් හොඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ඇතිකිරීම, ජීවනෝපාය විවිධාංගීකරණය, සහ දේශගුණ විපර්යාස හේතුවෙන් ධීවර කර්මාන්තය මත ඇතිවන බලපෑම ඉලක්ක කරගත් විශේෂිත පර්යේෂණ සිදුකිරීම ඇතුළත් ධීවර අංශයේ අනුහුරුවීමේ උපායමාර්ගයට NDC හතක් ඇතුළත් වේ (4-2 වගුව).

4-2 වගුව ධීවර අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | ඉහළ දේශගුණ අවදානමක් සහිත ප්‍රදේශවල ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම සඳහා ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශය (EAFM) යොදාගැනීම |
| 2 | දේශගුණ විපර්යාස හා සම්බන්ධ වන ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලු සඳහා පිළියම් ලෙස ජලජීවී වගාව හා වගා-පාදක ධීවර කර්මාන්තය ව්‍යාප්ත කිරීම |
| 3 | දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන සහ වාණිජ අගයකින් යුත් ජලජ සම්පත් අභිජනනය කිරීම |
| 4 | දේශගුණ විපර්යාස නිසා දැඩි ලෙස අවදානමට ලක් විය හැකි කලපු 30ක ධීවර සහ ජලජ සම්පත් නිෂ්පාදන හැකියාව වර්ධනය කිරීම |
| 5 | දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන ආන්තික තත්ත්වවල දී මුහුදේ දී ආරක්ෂාව වැඩිදියුණු කිරීම |
| 6 | දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දීම ගොඩනැංවීම පිණිස ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය විවිධාංගීකරණය |
| 7 | දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීම ගොඩනැංවීම සඳහා ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ පැවැත්වීම |

## 4.3.1 ධීවර අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රධාන කරුණු හා අභියෝග

2020 වර්ෂයේ ධීවර සංඛ්‍යාලේඛන අනුව කරදිය ධීවර කර්මාන්තයේ කාන්තාවන් හා පිරිමින් 224,610 ක් සක්‍රියව කටයුතු කරන අතර, 2019 වර්ෂයේ සංඛ්‍යාලේඛන අනුව අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ කාන්තාවන් හා පිරිමින් 70,715ක් සක්‍රියය කටයුතු කරයි. මේ අතර කාන්තාවන් 4,371ක් පමණ පිරිසක් අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ හා ජලජීවී වෙළෙඳාමේ නියැලේ. 2018 ධීවර හා ජලජසම්පත් ප්‍රතිපත්ති කෙටුම්පත මගින් අංශයේ ක්‍රියාකාරකම්වල දී කාන්තාවන් සඳහා සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබේ. කුඩා පරිමාණ ධීවර සංවර්ධන උපායමාර්ගවල දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධානධාරාගත කිරීමේ ඇති අවශ්‍යතාවය පිළිගෙන තිබේ. එනම්, පිරිමි සහ කාන්තාවන්ට සම්පත් හා ප්‍රතිලාභ සඳහා සමාන ප්‍රවේශයක් ඇති වන ආකාරයේ තත්ත්ව නිර්මාණය කිරීම සහ ගැටලු සඳහා පිළියම් සෙවීමේ දී පිරිමින් හා තාන්තාවන් එක්ව කටයුතු කිරීම දිරිමත් කිරීමයි.

සාමාන්‍යයෙන් මසුන් ඇල්ලීම මුළුමනින්ම පාහේ පිරිමින් සිදුකරන කාර්යයකි. සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයේ දී කුඩා බෝට්ටු හා යාත්‍රා පාලනය කිරීම කාන්තාවන් විසින් ද සිදුකරනු ලැබේ. කාන්තාවන් වඩාත් යෙදෙන්නේ වෙරළේ සිට සිදුකරන කාර්යයන් වන දැල් තැනීම හා අලුත්වැඩියා කිරීම, මත්ස්‍ය අස්වැන්න සැකසුම් කිරීම හා අලෙවිකරණය, මට්ටින්, බෙල්ලන් හා මට්ටීන් වැනි මොලස්කාවුන් එකතු කිරීම වැනි කටයුතුවලය.



ධීවර පිළිවෙත් හා මත්ස්‍ය උපයෝජ්‍යතාවය රඳා පවතින්නේ කාලගුණ රටාව මතය. මේ නිසා ධීවර කර්මාන්තය යම් කාලයකට පමණක් සිදුකරන එකක් වන අතර, ධීවර ප්‍රජාව ඔවුන්ගේ ජීවනෝපාය විවිධාංගීකරණ කර තිබේ. දේශගුණ විපර්යාසවල බලපෑම මගින් වෙරළබඩ ප්‍රජාව මුහුණ දෙන අවදානම් ඉහළ නංවන අතර, පිරිමින් මෙන්ම කාන්තාවන් ද යම් කාලවකවානුවල දී තාවකාලිකව සංක්‍රමණය කරන ආකාරය දැකිය හැකිය. ඔවුන් රට අභ්‍යන්තරයට මේ ආකාරයෙන් සංක්‍රමණය කරන්නේ ඉදිකිරීම් කම්කරුවන්, ගෘහ සේවකයින් හා කම්කරුවන් ලෙස රැකියා කිරීම සඳහාය.

## 4.3.2 ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී NDC සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ

ධීවර අංශයේ නියැලෙන කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ ඉහත සඳහන් විස්තර සලකා බැලීමේ දී NDC මගින් කාන්තාවන්ගේ කාර්යභාරය සඳහා පහසුකම් සැලසීම, සහාය වීම හා උත්ශ්‍රේණිගත කිරීම සිදුකිරීම වැදගත්ය. ඒමගින් සමස්ත NDC ප්‍රතිඵල වඩා කාර්යක්ෂම හා ඵලදායී කිරීමට හැකියාව ලැබේ. සලකා බැලීම සඳහා පහත සඳහන් නිර්දේශ යෝජනා කර තිබේ:

(a) අංශයේ NDC ක්‍රියකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රමය බෙදීයෑමේ ස්වභාවය හා ධීවර කර්මාන්තය සඳහා කාන්තාවන් දක්වන සැලකිය යුතු දායකත්වය, මෙම අංශයට සම්පතක් ලෙස හා පිරිමින් ඉටු කරන කාර්යභාරයට අනුපූරක ලෙස ගත යුතුය.

(b) කාන්තාවන් මේ අංශයේ සිදුකරන ක්‍රියාකාරකම්වලට යෝග්‍ය පිළිගැනීමක් ලැබීම තහවුරු කිරීම සඳහා අංශයේ NDC ක්‍රියකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජ භාව ප්‍රතිචාරී ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය (මෙය වර්ගීකරණය නොකරන ලද දත්ත, ප්‍රතිපත්තිමය හිඩැස් හා ඒකාකෘතිකතා නිසා මේ වන විට පිටතට නොපෙනේ). මෙමගින් අංශයේ දියුණු වූ ඵලදායකත්වයක් ඇතිකිරීමට හා සමස්ත ප්‍රතිලාභය සඳහා මගපෙන්වනු ඇත.

(c) ධීවර අංශයේ කාන්තාවගේ සහභාගීත්වය හා විභවය දිරිමත් කිරීමට හා ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් අන්තර්ගත කිරීම (ධීවර සමුපකාර හා ග්‍රාමීය සංවර්ධන සංවිධාන හරහා මෙය සිදු කළ හැකි අතර ඊට NDC ක්‍රියාමාර්ග යටතේ ක්‍රියාත්මක ධාරිතා සංවර්ධන වැඩසටහන් යොදාගත යුතුය).

(d) කාන්තාවන් විසින් සිදු කරන කාර්යභාරය හා ක්‍රියාකාරකම් පිළිබඳ මූලික දත්ත හඳුනාගැනීම හා ඉලක්ක හා මූලික කාර්යසාධන දර්ශක, අංශයේ NDC අධීක්ෂණ සැලසුමට ඇතුළත් කිරීම.

(e) කාන්තාවන්ගේ වගකීමට වැටෙන අදාළ ක්‍රියාකාරකම් උත්ශ්‍රේණිගත කිරීම හා දියුණු කිරීම (කලපු ධීවර කර්මාන්තය, මසුන් කපා කොටස් කිරීම, පිරිසිදු කිරීම හා වියැළීම ආදි) සඳහා වූ වැඩසටහන් අංශයේ NDC ක්‍රියාකාරකම් සැලසුමට ඇතුළත් කිරීම.

(f) කාන්තාවන් මූලිකත්වය දරණ නිවාස ඇතුළත් කරගැනීමට හා ඉලක්ක කරගැනීමට හැකි ලෙස විශේෂිත උපායමාර්ග භාවිත කිරීම. ජලජීවී වගා කටයුතු සඳහා රජයට අයත් ඉඩම් නිදහස් කිරීම මේ සඳහා උදාහරණයකි.

(g) අගය එකතු කිරීම, තාක්ෂණය හා යන්ත්‍ර, ණය, සහනාධාර, මසුන් වියැලීම සඳහා ස්ථාන හා ඉහළ අගයක් ඇති වෙළෙඳපොළක් සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීමේ දී කාන්තාවන් ඇතුළත් කිරීම හා ඉලක්ක කරගැනීම මගින් මත්ස්‍ය අගයදාමයේ කාන්තාවන්ට හිමි ස්ථානය ඉහළ නැංවීම.

(h) අවදානමට ලක්ව ඇති ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය විවිධාංගීකරණය සඳහා මේ අංශයේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල දී කාන්තාවන් හා ඔවුන් විසින් සිදුකරන විශේෂිත ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම හා ඉලක්ක කරගැනීම.

(i) තාක්ෂණය, කළමනාකරණය, අලෙවිය, ප්‍රවාහනය හා ජාල ගොඩනැගීම පිළිබඳව NDC ක්‍රියකාරී සැලසුම යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා සාධාරණ ප්‍රවේශයක් තහවුරු කිරීම.

(j) කාන්තාවන් සතු බර අඩු කිරීම හා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කළ තාක්ෂණයක් හා ක්‍රමවේද හඳුන්වා දීම.

(k) එකිනෙකට වෙනස් සේවාදායකයන්ගේ අවශ්‍යතා අනුව ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සේවා, ණය පහසුකම් වැනි ආදායම් උත්පාදන අවස්ථා සලසාදීම.

(l) නිවසේ දී කාන්තාවගේ කාර්යභාරය සඳහා සහාය ලබාදීමට ව්‍යාපෘති සැලසුම් කිරීම (ජලය සැපයීම, දැව ඉන්ධන සැපයීම, දිවා සුරැකුම ආදිය).

(m) කාන්තා විද්‍යාඥයන්, නිලධාරිනීන්. තාක්ෂණික නිලධාරීන් හා ප්‍රාදේශිය මට්ටමේ කමිටුවල කාන්තාවන්ගේ නියෝජනය අත්පත් කරගැනීම හා පවත්වාගැනීම සඳහා ඉලක්ක ඇති කිරීම.

(n) NDC සැලසුම්වල ප්‍රගති සමාලෝචනයේ දී හා අධීක්ෂණයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රියාකාරකම් හා ප්‍රතිඵල සමාලෝචන කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ දත්ත ඇතුළත් කිරීම, මූලික කාර්යසාධන දර්ශක සැකසීම.

### 4.3.3 ධීවර අංශයේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම

| NDC 1 - ඉහළ දේශගුණ අවදානමක් සහිත ප්‍රදේශවල ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම සඳහා ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශය (EAFM) යොදාගැනීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1 පාරිසරික මූලධර්මවලට අනුව ධීවර කළමනාකරණ ප්‍රදේශ තීරණය කිරීම හා ප්‍රමුඛතා සීමා හඳුනාගැනීම | DFAR | NARA, CC&CRMD, MEPA | හඳුනාගත් ධීවර කළමනාකරණ ඒකක ගණන | | DFAR වාර්තා | ආරම්භ කර නැත | ප්‍රමුඛතා ප්‍රදේශ 5ක් තෝරාගැනීම | | | √ | | | | | | | | 5.c, 14.2, 14.b, 14.c |
| 1.2: ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශ (EAFM) සැලසුම් පහක් සංවර්ධය කිරීම | DFAR | MoFish, NARA, CC&CRMD, MEPA | යෝග්‍ය පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී ලෙස සකස් කරන ලද EAFM සැලසුම් ගණන | | DFAR මගින් ප්‍රකාශිත සැලසුම් | ආරම්භ කර නැත | 5 EAFM සැලසුම් 5ක් සකස්කිරීම | | | √ | √ | √ | | | | | | 5.c, 14.2, 14.b, 14.c |
| 1.3: ධීවර අංශයේ කාන්තාවන්ගේ සහභාගීත්වය/ දායකත්වය ගණන්බැලීම සඳහා සමීක්ෂණ සිදුකිරීම | MoFish (සංඛ්‍යාලේඛන ඒකකය) | MoWCSD, NARA, CC&CRMDMEPA, NAQDA, DFAR, ශාස්ත්‍රඥයන් | 1. මූලික සමීක්ෂණය<br>2. සමීක්ෂණවල යාවත්කාලීනකිරීම් ගණන | | සමීක්ෂණ වාර්තා | ආරම්භ කර නැත | 1. මූලික සමීක්ෂණ 2023 දී පැවැත්වීම<br>2. වර්ෂයකට යාවත්කාලීන කිරීම් දෙකක් | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.1, 5.2, 5.5, 5.a, 5.c, 14.2 |
| 1.4: ධීවර සහ ජලජ සම්පත් පනතෙන් ප්‍රකාශයට පත් කර ඇති, ප්‍රමුඛතා ගත කළ දැනට පවතින ධීවර කළමනාකරණ ප්‍රදේශ පහකට ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශය (EAFM) ඒකාබද්ධ කිරීම | DFAR | NARA, CC&CRMD, MEPA, MoPC&LG, NAQDA, FD, SLCG, DS | EAFM ඒකාබද්ධ කරන ලද ධීවර කළමනාකරණ ප්‍රදේශ ගණන | | DFAR වාර්තා (ලිංගිකත්වය අනුව වර්ගීකරණය කළ දත්ත ඇතුළත්ව) | ආරම්භ කර නැත | දැනට පවතින ධීවර කළමනාකරණ ප්‍රදේශ පහකට EAFM ඒකාබද්ධ කිරීම | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.c, 14.2, 14.b, 14.c |
| 1.5: සියලු ප්‍රධාන පාර්ශ්වකාර ආයතනවල අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුම්වත්භාවය හා ධාරිතාවය ගොඩනැගීම | DFAR | MoWCSD, අන්තර්ජාතික ආයතන | 1. පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් ගණන<br>2. දැනුම්වත් කිරීමේ පුහුණුව ලද සහභාගිවූවන් ගණන | | ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගැටලු, ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව සිදු කළ දැනුම්වත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පිළිබඳ වාර්තා | කටයුතු සමහරක් ආරම්භ කර ඇතත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වා නැත | මෙම දර්ශක දෙක සඳහා ඉලක්ක ස්ථාපිත කළ යුතුය | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.5, 14.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.6: ස්ත්‍රී පුරුෂ සමාජභාවය සබලකිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී පවත්නා නෛතික රාමුව සංශෝධනය කිරීම | MoFish, DFAR | අදාළ සියලු ආයතන | ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් වීම සබලකරන ලද නෛතික රාමුව | | අනුමත කළ ප්‍රතිපත්තිය හා සංශෝධිත නෛතික රාමුව | ප්‍රතිපත්තියේ කෙටුම්පත කැබිනට් අනුමැතිය සඳහා නියමිතය<br><br>ධීවරයන්ගේ කලත්‍රයන් හා යැපෙන්නන් ඇතුළත් කිරීම සඳහා වූ විශ්‍රාම යෝජනා ක්‍රමයක් | අවශ්‍ය ස්ථානවල දී සංශෝධනය කළ නෛතික රාමුව | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.5 |
| 1.7: ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා පරිසර පද්ධති-පාදක ප්‍රවේශ (EAFM) සැලසුම් 5ක් ක්‍රියාත්මක කිරීම | DFAR | MoPC&LG, NARA, CC&CRMD, MEPA, DS | ක්‍රියාත්මක කළ EAFM සැලසුම් ගණන | | ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා (ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ දත්ත සහිත) | ආරම්භ කර නැත | EAFM සැලසුම් 5ක් ක්‍රියාත්මක කර ඇත | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2 |
| 1.8: දේශගුණ ප්‍රතිචාරත්මක නව තාක්ෂණය හා පද්ධති හඳුන්වා දීම සඳහා යෝග්‍ය කාන්තා ප්‍රතිශතයක් ඉලක්ක කරගැනීම | DFAR | MoE, MoWCSD, NARA, ITI, NERDC, NGOs, INGOs | දේශගුණ ප්‍රතිචාරත්මක නව තාක්ෂණය හා පද්ධති හඳුන්වා දීම සඳහා වූ වැඩසටහන්වලට සහභාගි වන කාන්තා ප්‍රතිශතය | | ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ දත්ත සහිත DFAR වාර්තා | 10% කට අධිකය | දේශගුණ ඔරොත්තුදීම සඳහා වූ වැඩසටහන් ප්‍රවර්ධනය සඳහා කාන්තාවන් අතරින් 25%කට නොඅඩු පිරිසක් සම්බන්ධ වීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.1, 5.2, 5.5, 5.a, 5.c, 14.2 |

ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම - ශ්‍රී ලංකාව 208

| NDC 2 - දේශගුණ විපර්යාස හා සම්බන්ධ වන ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලු සඳහා පිළියම් ලෙස ජලජීවී වගාව හා වගා පාදක ධීවර කර්මාන්තය ව්‍යාප්ත කිරීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: අභ්‍යන්තර වගා-පාදක මිරිදිය ධීවර කර්මාන්තයේ වර්ධනය සඳහා සුදුසු මත්ස්‍ය ඇඟිල්ලන් තොග වර්ධනය කරගැනීමට වැඩසටහනක් ප්‍රවර්ධනය කිරීම | NAQDA | MoFish, DFAR, DAD, NARA, MASL" CC&CRMD, ID, DWC, CEA, වාණිජ මණ්ඩලයේ වාර්තා, ශාස්ත්‍රඥයන් | 1. ඇඟිල්ලන් තොග ගණන<br>2. වාර්ෂික මිරිදිය ධීවර නිෂ්පාදනය | | MoFish, NAQDA වාර්තා | 1. ඇඟිල්ල-න් තොගය මිලියන 110<br>2. මෙට්‍රික් ටොන් 104,000 | 1. ඇඟිල්ලන් තොගය මිලියන 500<br>2. මිරිදිය ධීවර නිෂ්පාදනයේ ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | | | | | | 8.1, 8.4, 13.b, 14.2, 14.7 |
| 2.2: වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය සහිතව ගංවතුරෙන් නිතර බලපෑමට ලක්වන බහුවාර්ෂික ජලාශ 50ක මත්ස්‍යයින් ජලාශවලින් නිදහස්වීම වලක්වා ගැනීම සඳහා මත්ස්‍ය බාධක උපකරණ යෙදීම | NAQDA | ID, MASL, NARA, DWC, ගොවි සංවිධාන | ආවරණිත වැව් ගණන | | MoFish, NAQDA වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | | | | | | | | | 2.4, 13.1, 14.2, 14.7 |
| 2.3: වෙනස්වන දේශගුණ තත්ත්වයට ඔරොත්තු දෙන මත්ස්‍ය විශේෂ වගාව ප්‍රවර්ධනය කිරීම | NAQDA | DFAR, NARA, CC&CRMD, CEA, පෞද්ගලික අංශය (ප්‍රවර්ධනය හා යෙදවුම) ශාස්ත්‍රඥයන් | මත්ස්‍ය විශේෂ ගණන | | NAQDA වාර්තා | 01 | 2030 වන විට නව මත්ස්‍ය විශේෂ 2ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.4, 13.1, 14.2, 14. |
| 2.4: ජලජීවී වගා ධීවර කර්මාන්තයේ කාන්තා සහභාගීත්වය/ දායකත්වය ගණන්බැලීම සඳහා සමීක්ෂණ/යක් පැවැත්වීම | NAQDA | MoWCSD, NARA, CC&CRMD, MEPA, DFAR, ශාස්ත්‍රඥයන් | 1. මූලික සමීක්ෂණ<br>2. සමීක්ෂණවල යාවත්කාලීන කිරීම් | | සමීක්ෂණ වාර්තා | ආරම්භ කර නැත | 1. මූලික සමීක්ෂණ 2023 වන විට කළ යුතුය<br>2. වර්ෂයක දී යාවත්කාලීන කිරීම් දෙකක් | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.5 |

**NDC 3 - දේශගුණ විපර්යාසවලට ඔරොත්තුදෙන සහ වාණිජ අගයකින් යුත් ජලජ සම්පත් අභිජනනය කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: දේශගුණ විපර්යාස නිසා ඇතිවූ වෙනස්වීම් මගින් සාමාන්‍ය ලෙස බිජු දැමීමට බලපෑම් එල්ල වූ මත්ස්‍ය විශේෂ කෘතිමව අභිජනනය සඳහා මත්ස්‍ය ශුක්‍රාණු ගබඩා කර තැබීමට දඹුල්ලේ පිහිටා ඇති අධිශීත පරිරක්ෂණ මධ්‍යස්ථානය පුළුල් කිරීම | NAQDA | NARA, ශාස්ත්‍රඥයින්, මේ පහසුකම් ප්‍රවර්ධනය සඳහා පෞද්ගලික අංශය සමග ඇතිකර ගැනීම | පරිරක්ෂණය කරන ලද සාම්පල ගණන | | NAQDA වාර්තා | සැම්පල 300ක් පරිරක්ෂණය කර ඇත | වාර්ෂිකව සාම්පල 300ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 8.2, 13.1, 14.2, 14.4, 14.7 |
| 3.2: දැනට ඇති විවෘක අභිජනන පහසුකම් ලෙස ඇති ස්ථාන 52, ගෘහස්ථ අභිජනන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීම සහ තෝරාගත් විශේෂ අභිජනනය සඳහා උචිත පරිදි උෂ්ණත්වය සහ ලවණතාවය පාලනය කළහැකි අන්දමින් ඒවායෙහි ඉදිකිරීම් සැලසුම් කිරීම | NAQDA | NARA, ශාස්ත්‍රඥයින්, පෞද්ගලික අංශය | ඇතිකරන ලද/ දියුණු කරන ලද අභිජනන මධ්‍යස්ථාන ගණන | | NAQDA වාර්තා | 5 | 52 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 8.2, 13.1, 14.2, 14.4, 14.7 |

**NDC 4 - දේශගුණ විපර්යාස නිසා දැඩි ලෙස අවදානමට ලක් විය හැකි කලපු 30ක ධීවර සහ ජලජ සම්පත් නිෂ්පාදන හැකියාව වර්ධනය කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1: අවදානමට ලක් විය හැකි කලපු හඳුනාගෙන (2022 දී) කලපු 30 ක් සඳහා කලපු පැතිකඩ සකස් කිරීම. | NARA | MoFish, DFAR | 1. හඳුනාගත් අවදාමනට ලක් විය හැකි කලපු ගණන<br>2. සකස් කරන ලද කලපු පැතිකඩ ගණන | | MoFish, DFAR, NARA වාර්තා | 2020 දක්වා කලපු පැතිකඩ 5ක්<br>කලපු 7ක් සඳහා දත්ත එකතු කර ඇත (2017 දී 5ක් හා 2019 දී 2ක්) | කලපු පැතිකඩ 30ක් සකස් කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2, 14.7 |
| 4.2: කලපු 30 ක ඉසුලුම් ධාරිතාව තක්සේරු කිරීම | NARA | MoFish, DFAR, NAQDA,CC&CR MD, MEPA, SLTDA, CEA, ශාස්ත්‍රඥයන් | සම්පූර්ණ කරන ලද ඉසුලුම් ධාරිතා තක්-සේරු ගණන | | NARA වාර්තා | නැත | 15 | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2, 14.7 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.3: කලපු 10 ක් සම-කළමනාකරණ ධීවර කළමනාකරණ ප්‍රදේශ (FMA) ලෙස ප්‍රකාශයට පත් කර කළමනාකරණය කිරීම | DFAR | SD, NARA, CC&CRMD, DS, ප්‍රාදේශීය මට්ටමෙන් ධීවර කමිටු ඇතුළත්ව ආයතන 23ක් පමණ | 1. ගැසට්/ ප්‍රකාශයට පත් කරන ලද කලපු ගණන<br><br>2. ස්ථාපිත කරන ලද සමකළමනාකරණ කණ්ඩායම් ගනන<br><br>3. සකස් කරන ලද හා ක්‍රියාත්මක කරන ලද කළමනාකරණ හා සංවර්ධන සැලසුම් ගණන | | DFAR වාර්තා (කළමනාකරණ සැලසුම්) | 1. 36ක් ගැසට් කර ඇත (2017 වන විට)<br><br>2. නැත<br><br>3. නැත | 1. තවත් කලපු 10ක්<br><br>2. ඉලක්කයක් ස්ථාපිත කළ යුතුය<br><br>3. ඉලක්කය ස්ථාපිත කළ යුතුය | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.2<br>14.2 |
| 4.4: 4.3 හි සඳහන් කරන ලද කලපු 10හි ජල දූෂණය අවම කිරීම | MoFish | NARA, DFAR, CC&CRMD, NGO, MEPA, CEA, LAs | ජල දූෂණය අවම කරන ලද කලපු ගණන | | DFAR හා NARA වාර්තා (ජලයේ ගුණාත්මක තත්ත්වයට) | කලපු 4ක ශක්‍යතා අධ්‍යයන පැවැත්වේ (ආරුගම් බොක්ක, නන්දිකඩාල්, නයාරු, ලංකා පටුන) | 10 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.1 |
| 4.5 තෝරාගත් කලපුවල දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන, ඉහළ වටිනාකමක් ඇති ආහාරයට ගන්නා විශේෂ මගින් ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම | NAQDA | NARA, DFAR, CEA, Las | දේශුගණ විපර්යාසවලට ඔරොත්තු දෙන බවට හඳුනාගත් විශේෂ නැත | | NAQDA හා DFAR | ශක්‍යතා අධ්‍යයන පවත්වාගෙන යනු ලැබේ | 5 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2 |

| NDC 5 - දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන ආන්තික තත්ත්වවලට මුහුණ දීමට මුහුදේ දී ආරක්ෂාව වැඩිදියුණු කිරීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1: මුහුදේ දී ආරක්ෂාව වැඩි කිරීම සඳහා යොදාගත හැකි පියවර ප්‍රවර්ධනය කිරීම | DFAR | MoFish, DMC, MoD, MED | 1. භාවිත කළ හැකි බවට හඳුනාගත් පියවර ගණන<br><br>2. වාර්තා වී ඇති සිදුවීම් ගණන | | 1. DFAR වාර්තාවල ඇති භාවිත කළ හැකි පියවර ලේඛනය (බහුදින ධීවර යාත්‍රා සඳහා සන්නිවේදන උපකරණ)<br><br>2. MCS වාර්තා | 1. භාවිත කළ හැකි පියවර පිලිබඳ යම් මාරේගෝප දේශනයක් පනතේ දක්වා ඇත.<br><br>2, සිදුවීම් පණන හඳුනාගත යුතුය | 1. භාවිත කළ හැකි නිශ්චිත පියවර මොනාවද යන්න 2023 වන විට හඳුනාගැනීම<br><br>2. ඉලක්කය ස්ථාපිත කළ යුතුය (සිදුවීම් අඩු වී ඇති ප්‍රමාණය) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 8.8, 13.1, 14 |
| 5.2: ධීවරයින් සඳහා (කුඩා බෝට්ටු සහ සාම්ප්‍රදායික යාත්‍රා භාවිත කරන්නන් ඇතුළුව) ඵලදායී පූර්ව අනතුරු ඇඟවීම් සම්ප්‍රේෂණ පද්ධති හා රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම. | DFAR | MoFish, MD, DMC, MoD, SLN, MRCC, විදුලිසංදේශ සේවා සපයන්නන්, පෞද්ගලික හා රාජ්‍ය රක්ෂණ සමාගම් | වෙරළ ආශ්‍රිත ධීවරයින්ගෙන් 50%ක් පමණ CDMA වැනි ඵලදායී පූර්ව අනතුරු ඇඟවීම් සම්ප්‍රේෂණ පද්ධති භාවිත කිරීම | | MoFish හා විදුලි සංදේශ සේවා සපයන්නන් අතර අවබෝධතා ගිවිසුම් | මේ වන විට ඇති පද්ධති ඵලදායී නැත | වෙරළ ආශ්‍රිත ධීවරයින්ගෙන් අවම වශයෙන් 50% ක් පමණ CDMA වැනි ඵලදායී පූර්ව අනතුරු ඇඟවීම් සම්ප්‍රේෂණ පද්ධති භාවිත කරයි | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 8.3, 8.8 |
| 5.3: මුහුදේ දී ආරක්ෂාව සහතික කිරීම සඳහා චන්ද්‍රිකා පාදක කරගත් යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් ඇතුළුව කාර්යක්ෂම කාලගුණ තොරතුරු කළමනාකරණ හා සන්නිවේදන පද්ධතියක් ඇති කිරීම | DFAR | SLPA, SLN, DMC, SLCG | 1. VMS පද්ධති සවිකර ඇති බහුදින යාත්‍රා ප්‍රතිශතය<br><br>2. AIS පද්ධති සවිකර ඇති බහුදින යාත්‍රා ප්‍රතිශතය | | නියෝග (රෙගුලාසි) සංශෝධනය;<br><br>DFAR වාර්තා | 1. WIMS පැරණි අනුවාදයක්<br><br>2. AIS පද්ධති සහිත බෝට්ටු සුළු ප්‍රමාණයක් | 1. මුහුදේ දී ආරක්ෂාව සහතික කිරීම සඳහා කාර්යක්ෂම කාලගුණ තොරතුරු කළමනාකරණ හා සන්නිවේදන පද්ධතියක් ඇති කර තිබීම (චන්ද්‍රිකා පාදක කරගත් යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් ඇතුළුව) | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 8.8 |

## NDC 6 - දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දීම ගොඩනැංවීම පිණිස ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය විවිධාංගීකරණය

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 6.1: අවදානමට ලක්විය හැකි ධීවරයින්ට ණය සඳහා ඇති ප්‍රවේශය දියුණු කිරීම සහ ජීවනෝපාය විවිධාංගීකරණය සඳහා පුහුණු කිරීම | DFAR | MoFish, MoSD&VT, NARA, ITI, බැංකු, රක්ෂණ සමාගම් | 1. ජීවනෝපාය විවිධාංගීකරණය සඳහා ක්‍රියාත්මක යෝජනා ක්‍රම ගණන<br><br>2. තමන්ගේ ජීවනෝපාය විවිධාංගීකරණය කරගත් ධීවරයින් ගණන | | අදාළ ආයතනවල ප්‍රගති වාර්තා | 1. නැත<br><br>2. නැත | 1. ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 8.2, 8.3, 14.b |
| 6.2: දැනුම හුවමාරු ක්‍රියාකාරකම්, පුහුණු සැසිවාර, ව්‍යාප්ති වැඩසටහන්, ණය පහසුකම් සැපයීම, නිෂ්පාදන යෙදවුම් ආදි කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ධීවර කාන්තාවන් වෙනුවෙන් ප්‍රතිශතයක් වෙන් කිරීම | DFAR | DFAR MoSD&VT, MoWCSD, කාන්තා කාර්යාංශය, NARA, ෂඔෂ, බැංකු, රක්ෂණ සමාගම් | 1. දැනුම හුවමාරු ක්‍රියාකාරකම්, පුහුණු සැසිවාර, ව්‍යාප්ති වැඩසටහන්, ණය පහසුකම් සැපයීම, නිෂ්පාදන යෙදවුම් ආදි කටයුතු ක්‍රිය-ාත්මක කිරීමේ දී ඇතුළත් කරගත් ධීවර කාන්තාවන් ප්‍රතිශතය<br><br>2. ණය පහසුකම්, නිෂ්පාදන යෙද-වුම් සඳහා ප්‍රවේශය ලබාගත් කාන්තාවන් ගණන | | DFAR ප්‍රගති වාර්තා (සේවා ලබාදුන් හා පහසුකම් ලබාගත් ධීවර කාන්තාවන් ගණන දැක්වෙන) | 1. වාර්තා වී නැත<br><br>2. වාර්තා වී නැත<br><br>ක්‍රියාකාරකම් සිදු කර ඇතත් ස්ත්‍රී පුරුෂ වශයෙන් වර්ගීකරණය කළ දත්ත වාර්තා වී නැත | තීරණය කළ යුතුය | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.4, 5.5, 5.a, 5.b, 8.5, 14.b |
| 6.3: ධීවර අස්වැන්න අඩුවීමෙන් සිදුවන තත්ත්වය පාලනය සඳහා ඉහළ වටිනාකමක් සහිත වෙළෙඳපොළ සොයාගැනීමට සහාය වීම | DFAR | MoFish, MoSD&VT, NARA, බැංකු, රක්ෂණ සමාගම් | ස්ථාපිත කළ, අගය එකතු කළ වෙළෙඳපොළ ගණන | | DFAR වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 9.3, 14.b |
| 6.4: ධීවර කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමෙන් (මාළු තෙල්, මාළු සෝස් සහ වෙනත් අගය එකතු කළ නිෂ්පාදන) අගය එකතු කිරීමට පහසුකම් සැපයීම | DFAR | NARA, ITI, BOI, EDB | වාර්ෂිකව හඳුන්වා දෙන අගය එකතු කළ නිෂ්පාදන ගණන | | අදාළ ආයතනවල ප්‍රගති වාර්තා | විශේෂිත නිෂ්පාදන හඳුන්වා දී නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 9.3, 14.b |

## NDC 7 - දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීම ගොඩනැංවීම සඳහා ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ පැවැත්වීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 7.1: ධීවර හා ජලජ සම්පත්වලට ඇතිවන දේශගුණික බලපෑම් තක්සේරු කිරීම | NARA | ශාස්ත්‍රඥයන් | 1. වාර්ෂිකව සිදුකරන තක්සේරු ගණන<br><br>2. දේශගුණ බලපෑම් තක්සේරු කිරීමේ දී සලකා බලන අංශ ගණන (ධීවර - මුහුදු, ජලජීවීවගා සහ මිරිදිය ධීවර, ජලජ සම්පත් - වාස-ස්ථාන, කොරල්පර, කඩොලාන, මුහුදු තණ, ලවණ වගුරු) | | අදාළ ආයතනවල වාර්තා | පර්යේෂණ පැවැත්වීම හා දත්ත එකතු කිරීම සිදු කර ඇත. එහෙත්, දේශගුණ විපර්යාස බලපෑම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර නොමැති අතර, තක්-සේරුවක් සඳහා යෙ-ාදාගැනීමට තරම් දත්ත සම්පූර්ණ ද නැත<br><br>දේශගුණ විපර්යාස හා සම්බන්ධ යෝජනා දෙකක් සකස්කර ඇති අතර, අරමුදල් නෙ-ාමැතිනිසා ක්‍රියාත්මක කිරීමට නොහැකිව ඇත. | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2, 14.3 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7.2: කොරල් පර විරංජනය වීම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් ලබා දීම සඳහා කොරල්පර අධීක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම | NARA | ශාස්ත්‍රඥයන් | කොරල්පර අධීක්ෂණ පද්ධති | | NARA වාර්තා | වාර්ෂිකව කොරල්පරයේ තත්ත්වය පිළිබඳව පර 2ක් අධීක්ෂණය කර තිබේ.<br><br>දත්ත එකතු කරන උපකරණ 4ක් පවත්නා අතර (එහෙත් ඒවා තත්‍යකාලීන නොවේ. තත්‍යකාලීන වීම කොරල්පර අධීක්ෂණ පද්ධතියක දී අත්‍යාවශ්‍ය වේ.) | ස්වයංක්‍රීය තත්‍යකාලීන දත්ත අධීක්ෂණ පද්ධති 04ක් ස්ථාපිත කිරීම (බටහිර වෙරළ තීරයට 2ක් හා නැගෙනහිර වෙරළ තීරයේ 2ක්) 2025 දී 2ක් හා 2030 දී 4ක්. | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2, 14.3 |
| 7.3: සාගර ආම්ලිකකරණය සම්බන්ධ බලපෑම් සඳහා ධීවර කර්මාන්තයේ අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුනාගැනීම | NARA | ශාස්ත්‍රඥයන් | 1. සාගරය ආම්ලිකකරණය මැනීම සඳහා ස්ථාපිත ස්වයංක්‍රීය අධීක්ෂණ පද්ධති ගණන<br><br>2. සාගරයේ ගැටලු නිරාකරණය සඳහා ගන්නා අනුහුරුවීමේ පියවර ගණන | | NARA වාර්තා | ස්ථාන දෙකක සාගර ආම්ලිකකරණය වීම මැනීම සිදුකරනු ලැබෙන නමුත් එම මැනුම අතින් සිදුකරන්නකි (නැගෙනහිර වෙරළ හා බටහිර වෙරළ) | ස්වයංක්‍රීය අධීක්ෂණය කිරීම් 04 | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2, 14.3 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7.4: කොරල් කීටයන්ට අවශ්‍ය උපස්ථර අවම වන ස්ථානවල දී කෘතිම පර ස්ථාපනය කිරීම | NARA | CWC, CC&CRMD | ස්ථාපිත කෘත්‍රිම පර ගණන | | NARA වාර්තා | කුඩා පරිමාණ කෘත්‍රිම පර ස්ථාන 4ක නියමු මට්ටමින් ස්ථාපිත කර ඇත (පෙ-ාල්හේන, ගාල්ල, සින්නපාඩුව, වැලිගම) | අවම වශයෙන් ස්ථාන 4ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 14.2, 14.3, 14.5 |
| 7.5: හඳුනාගත් ප්‍රදේශවල මත්ස්‍යයින් එකතු කිරීමේ උපකරණ යෙදවීම | NARA | CWC, CC&CRMDD | 1. ස්ථාන ගණන හඳුනාගැනීමට අධ්‍යයන පැවැත්වීම<br><br>2. NAQDA යෙදවීම | | NARA වාර්තා | 1. ස්ථාන හතරක මේවා යෙදවීම සඳහා ශක්‍යතා අධ්‍යයන පවත්වා ඇත<br><br>2. නැත | 1. 2025 වන විට සවිස්තර තක්සේරු-වක් සිදුකිරීම<br><br>2. 05 | √ | √ | √ | √ | √ | | | | | | 14.4 |
| 7.6: වෙනස්වන දේශගුණයක් තුළ ධීවර අස්වැන්න හා ඵලදායිතාවය පහත වැටීමට ප්‍රතිචාර වශයෙන්, ඉන්ධන කාර්යක්ෂමතාව සහිත තාක්ෂණයන් හඳුන්වා දීමෙන් හා ප්‍රවර්ධනය කිරීමෙන් ධීවර හා ජලජීවී වගාවේ ප්‍රාග්ධනය, මෙහෙයුම් සහ අනෙකුත් වියදම් අඩු කිරීම. | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 7.6.1: බහුදින ධීවර යාත්‍රාවලට හා මත්ස්‍ය සැකසුම් කර්මාන්තශාලාවලට සූර්ය පැනල පද්ධති හඳුන්වා දීම | DFAR | CEB, SLSEA | සූර්ය පැනල පද්ධති සහිත බහුදින ධීවර යාත්‍රා ගණන | | NAQDA හා DoF වාර්තා | නැත | සියලු බහුදින ධීවර යාත්‍රාවලට සූර්ය පැනල පද්ධති සවිකර තිබීම (5500ක් පමණ) | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.4 |

## 4.4 පශුසම්පත් අංශය

දරිද්‍රතාවය තුරන් කිරීමට හා ආහාර සුරක්ෂිතතාවය සඳහා සහාය වන කෘෂිකාර්මික සංවර්ධනයේ ප්‍රමුඛ දායකත්වයක් පශුසම්පත් අංශය මගින් ලබා දෙයි. ප්‍රධාන වශයෙන් කුඩා පරිමාණයෙන් ක්‍රියාත්මක 600,000ක් පමණ වන ලියාපදිංචි සත්ත්ව පාලන ගොවිපොළ (කුකුළු පාලනය ද ඇතුළුව) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය සහ ආහාර පද්ධති සඳහා ඉතා වැදගත්ය. දේශගුණ විපර්යාස නිසා බලපෑමට ලක්වන ආර්ථික අංශ අතර වඩාත් බලපෑමට ලක්වන අංශයක් ලෙස පශුපාලනය දැක්විය හැකිය. ජාතියේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ දී පශුසම්පත් අංශයේ සංවර්ධනය අනිවාර්ය එකකි. වැඩිදියුණු කළ පාංශු පෝෂණය ඉහළ භෝග අස්වැන්නක් සඳහා අවශ්‍ය වන ආකාරයටම පශුසම්පත් නිෂ්පාදන ඉහළ ප්‍රමාණයකින් සුලභ වීම සඳහා ද මෙය සත්‍ය වේ.

බොහෝ විට කුඩා පරිමාණයෙන් පවත්වාගෙන යනු ලබන පශුපාලනය මගින් ග්‍රාමීය කෘෂිකාර්මික කුටුම්භවලට අතිරේක ආදායමක් හා ඔවුන්ගේ ජීවන ක්‍රමයට සහාය වීම සිදුකරන්නේ ග්‍රාමීය ප්‍රදේශවල පවතින අතිරික්ත ශ්‍රමය, ඌනඋපයෝජිත කෘෂිකාර්මික අතුරු ඵල සහ ආන්තික ඉඩම් භාවිත කරමිනි. 4-4 රූපයේ දැක්වෙන ආකාරයට පශුසම්පත් අංශයේ දී කුකුළු පාලනයට පසුව සතුන් ප්‍රමාණය අනුව දෙවැනි තැන හිමිවන්නේ ගවපාලනයටයි. මෙරට ගව ගහනය පසුගිය වර්ෂ පහක පමණ කාලයේ දී මිලියන 1.1ක අවට සාමාන්‍ය අගයක් දක්වමින් ස්ථාවර තත්ත්වයක පැවතියේය. එළුවන් හා මීහරකුන් ගණන ද එකම මට්ටමක පවතින අතර, ඒ සංඛ්‍යාව ගවයින්ගේ ගහනයට වඩා සැලකිය යුතු තරම් අඩුය. මේ අතර, බැටළු ගහනය අඩුම අගය පෙන්වයි. 4-3 වගුවේ දැක්වෙන ආකාරයට 2019 හා 2020 වර්ෂ අතර කුකුළු ගහනයේ කැපී පෙනෙන ඉහළ යෑමක් දැකිය හැකිය. කෙසේවෙතත් සලකා බලන කාලය තුළ බිත්තර නිෂ්පාදනය බිලියන 2ට ආසන්න අගයක විචල්‍යවෙමින් තිබේ.




4-4 රූපය පශුසම්පත් සංඛ්‍යා (කුකුළන් හැර[32]) (**තාවකාලික)

4-3 වගුව කුකුළන්, කිරි හා බිත්තර නිෂ්පාදනය[50] (**තාවකාලික)

| වර්ෂය | කුකුළන් (සංඛ්‍යාව) | කිරි (ලීටර් මිලියන) | බිත්තර (මිලියන) |
|---|---|---|---|
| 2017 | 21,275,820 | 397.92 | 2072.87 |
| 2018 | 20,531,000 | 467.69 | 1972.21 |
| 2019 | 20,411,050 | 447.58 | 2084.21 |
| 2020 | 24,277,830 | 491.54 | 1869.69 |
| 2021 | 24,310,690 | 513.31 | 1953.71 |
| 2022** | 22,766,750 | 506.45 | 1848.60 |

පශුසම්පත් අංශය දේශගුණ විපර්යාස නිසා තදින් තර්ජනයට ලක්ව ඇති බව පැහැදිලිය. නියඟය, ගංවතුර හා තාප ආතතිය යනු ගෝලීය දේශගුණ විපර්යාස මගින් ඇති කරනු ලබන වර්ෂාපතන හා උෂ්ණත්ව වෙනස්වීම් නිසා ඇති වනු ඇතැයි පුරෝකථනය කර ඇති ආන්තික කාලගුණ තත්ත්ව හා දේශගුණ විචල්‍යතාවලට උදාහරණ කීපයකි. නිදර්ශනයක් ලෙස ගතහොත්, 2022 දෙසැම්බර් මාසයේ රට හරහා ඇදී ගිය ශීත ප්‍රවාහය නිසා උතුරු පළාතට සැලකිය යුතු හානියක් ඇති වූ අතර, දහසකට වඩා අධික සතුන් ප්‍රමාණයක් අහිමි විය. මේ ඍජු බලපෑම්වලට අමතරව, ද්විතීයික බලපෑම් රැසක් ද ඇතිවිය හැකිය. ඒ අතර, සත්ත්ව ආහාර සඳහා යොදාගන්නා ශාක වර්ධනයට, තෘණ සුලභතාවයට, ජලය රැඳීම, වැඩි වෙමින් පවත්නා රෝග නිසා ඇති වන රෝග අවදානම, සත්ත්ව ආහාර භෝගවල නිෂ්පාදනය හා ගුණාත්මක බව අඩුවීම මේ අතර වේ.

මෙම අංශයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශනය සපයනු ලබන්නේ ජාතික පශුසම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය (NLDP) (2007) සහ පශුසම්පත් මහ සැලසුම - පශු සම්පත් ස්වයංපෝෂිතභාවය කරා සංවර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගය (2011) මගිනි. ජාතික ප්‍රතිපත්තියේ දී උප අංශ හතරක් පිළිබඳව අවධානය යොමු කර ඇත. ඒ, (i) කිරි, (ii) කුකුළු, (iii) මස්, හා (iv) සත්ත්ව ආහාර සම්පත් යන අංශයි. මෙමගින් අරමුණු තුනක් ඉලක්ක කරගෙන කටයුතු කරන අතර ඒවා නම්, (i) රටේ පශුසම්පත් අංශයේ සංවර්ධන අරමුණු හා පශුසම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්වල දී රාජ්‍ය අංශයේ කාර්යභාරය පැහැදිලි කිරීම, (ii) පශුසම්පත් හා පශුසම්පත් නිෂ්පාදන නිපදවීමේදී, සැකසුම් කිරීමේ දී හා අලෙවියේ දී, පෞද්ගලික අංශයට හා වෙනත් ආයතනවල ක්‍රියාකාරකම්වලට අදාළ විෂයපථය හා අවස්ථා හඳුනාගැනීම සඳහා පහසුකම් සැපයීම, හා (iii) ජාතික අයවැයේ ඒකාබද්ධ අරමුදලෙන් පශුසම්පත් අශයට සිදුකරන ආයෝජන යුක්තියුක්ත කිරීම හා පෞද්ගලික අංශයේ ආයෝජන මගින් වෙළෙඳපොළ ග්‍රහණය කිරීම වැළැක්වීම වේ[49].

අමාත්‍ය මණ්ඩලය වෙත නුදුරේදී ඉදිරිපත් කිරීට නියමිත ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ කෙටුම්පතේ එන දැක්ම වන්නේ 'ජාතික සෞභාග්‍යය අත්පත් කරගැනීම සඳහා තිරසර ආහාර සුරක්ෂිතතාවයක්' යන් වන අතර, මෙහෙවර ලෙස සඳහන් වන්නේ 'ගෝලීය වශයෙන් තරඟකාරී කෘෂිකාර්මික නිෂ්පාදන, සැකසුම් කිරීම හා අලෙවි යාන්ත්‍රණයක් හරහා ශ්‍රී ලංකාවේ සමාජයීය වශයෙන් පිළිගත හැකි තිරසර ආහාර පද්ධතියක්' යන්නය. මේ ජාතික ප්‍රතිපත්තියට තේමාත්මක අංශ දහයක් ඇතුලත්ය; භෝග නිෂ්පාදනය හා නිශ්පාදීතාවය, යෙදවුම් කළමනාකරණය, දියුණු තාක්ෂණයන්, ආහාර සුරක්ෂිතතාවය හා ගුණාත්මක බව කළමනාකරණය, පරිසර හිතකාමී මෙහෙයුම්, කෘෂි ව්‍යවසායකත්වය හා අලෙවිය, නිෂ්පාදකයා බලගැන්වීම, දේශගුණ ඔරොත්තුදීම හා වෙනත් අවදානම් කළමනාකරණය, දැනුම කළමනාකරණය හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවා හා පාලනය හා මෙහෙයුම් කළමනාකරණයයි. මේ ප්‍රතිපත්තිය මගින් කෘෂිකර්ම අංශයේ සියලු ප්‍රධාන ආයතනවලට ප්‍රතිපත්ති රාමුවක් ලබා දෙන අතර, මීට භෝග, පශුසම්පත්, මිරිදිය ධීවර, භෝග සැකසුම හා වාර්මාර්ග, ගොවිජන සංවර්ධන හා පරිසරය අයත්වේ.

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති අනෙක් ආයතන ද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ද පශුසම්පත් අංශයේ සංර්ධනය සම්බන්ධව ප්‍රධාන කාර්යභාරය ඉටුකරයි. ශ්‍රී ලංකාවේ ජාතික පශුසම්පත් අභිජනන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ (2010) මගින් පශුසම්පත් අභිජනනයට අදාළ ප්‍රදාන මාර්ගෝපදේශ වේ.

50 http://www.vri.lk/nnn3/ldp.php

රෝමන්ථයින්ගේ සත්ත්වපාලන පිළිවෙත්වල සහ ඌරු සහ කුකුළු ගොවිපොළ කළමනාකරණයේ දේශගුණ ඔරොත්තු දීම වර්ධනය ශක්තිමත් කිරීම සහ සමස්ත අංශයේ ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පුහුණු හා ධාරිතා වර්ධනය සිදුකිරීම ආවරණය කරන NDC තුනක් යටතේ (4-5 වගුව) පශුසම්පත් අංශයේ අනුහුරුවීමේ ප්‍රමුඛතා ඉදිරිපත් කර තිබේ.

4-4 වගුව පශුසම්පත් අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | දේශගුණ විපර්යාසවලින් රෝමන්ථයින්ට (වමාරා කන සතුන්) ඇතිවන බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීම |
| 2 | කුකුළු පාලනයේ සහ ඌරු කොටුවල දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීම වර්ධනය කිරීම සඳහා තාක්ෂණික නවෝත්පාදන සහ මැදිහත්වීම් හඳුන්වාදීම |
| 3 | දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා පර්යේෂණ, අධ්‍යාපන, දැනුම්වත්භාවය සහ ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම |

## 4.4.1 පශුසම්පත් අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ කරුණු

බොහෝ ග්‍රාමීය ප්‍රජාවන් පශුසම්පත් කළමනාකරණය සිදුකරන්නේ ආදායම් උත්පාදන ක්‍රමයක් ලෙසය. සාමාන්‍යයෙන් ගත් විට, පිරිමින් විශාල සතුන් (ප්‍රධාන වශයෙන් ගවයින්) සම්බන්ධ වගකීම දරණ අතර, කාන්තාවන් යෙදෙන්නේ සතුන් රැකබලාගැනීමේ හා කිරිගැනීම වැනි කාර්යවලය. එළුවන් හා කුකුළන් වැනි කුඩා සතුන් හැසිරවීමේ වගකීම ද කාන්තාවන් දරයි. සතුන්ට අවශ්‍ය ආහාර හා ජලය සැපයීමේ කාර්යය සිදුකරන කාන්තාවන් තාප ආතතිය, නියඟය, ගංවතුර නිසා අසීරු තත්ත්වයකට පත්වේ. ගංවතුර හා නියඟ තත්ත්ව හමුවේ සතුන්ගේ කොටු හා කූඩු නඩත්තු කිරීම ද අභියෝගයකි. කෘෂිකර්ම අමාත්‍යාංශය හා අන්තර්ජාතික සංවිධානවල සහයෝගයෙන් මේ කාන්තාවන් ක්ෂුද්‍ර ව්‍යවසායකත්වය සඳහා පුහුණුව ලබාදී ඒවායේ යෙදවීම සඳහා මුලපිරීම් ගණනාවක් සිදුකර කර තිබේ. ශ්‍රී ලංකාවේ බැංකු ගණනාවක්ම සත්ත්ව පාලනයේ හා කිරි නිෂ්පාදන අලෙවියේ යෙදෙන කාන්තාවන් සඳහා ණය යෝජනාක්‍රම හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

## 4.4.2 ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරී ලෙස හෘක සැලසුම හා ක්‍රියාත්මක කිරීම සඳහා වූ නිර්දේශ

ද්විතීයික මූලාශ විශ්ලේෂණයේ දී පෙන්නුම් කරන්නේ කෙතරම් බාධක තිබුණ ද කාන්තාවන් පශුසම්පත් අංශයේ සැලකිය යුතු දායකත්වයක් දරණ බවයි. මේ නිසා, NDC හරහා ඔවුන්ගේ කාර්යභාරයට පහසුකම් සැපයීමට, සහාය දීමට හා ඉහළ නැංවීම සිදුකිරීම වැදගත්ය. එමගින් සමස්ත NDC ප්‍රතිඵල වඩාත් කාර්යක්ෂම හා ඵලදාවී වනු ඇත. මේ සඳහා පහත සඳහන් නිර්දේශ යෝජනා කර තිබේ:

(a) අංශයේ NDC ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රමය බෙදී යන ආකාරය පිළිබඳව හා පශුසම්පත් අංශයේ දී කාන්තාවන් සිදුකරන වැදගත් දායකත්වය පිළිබඳව සලකා බැලීම වැදගත් වේ. මේ කාර්යභාරය අංශයට සම්පතක් වන අතරම, පිරිමින් විසින් සිදුකරන කාර්යභාරය සඳහා අනුපූරක එකක් වේ.

(b) ප්‍රජා ක්‍රියාකාරකම්වල සක්‍රියව යෙදීමට නම් කාන්තාවන්ගේ සහභාගීත්වය හා විභවය දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාකරම් ඇතුළත් කළ යුතු වේ (කිරි සමූපාකාර, ග්‍රාමීය සංවර්ධන සංවිධාන හා NDC ක්‍රියමාර්ග මගින් සිදුකරන පුහුණු හා ධාරිතා වර්ධන වැඩසටහන් හරහා) .

(c) අනුහුරුවීමේ ක්‍රියාමාර්ග, තාක්ෂණික නවෝත්පාදන හා ඔරොත්තු දෙන කෘෂි පිළිවෙත්, යන්ත්‍ර, සහනාධාර වැනි අංශවල දී ලබා දෙන පුහුණුව දී කාන්තාවන් ඇතුළත් කරගැනීම හා ඉලක්ක කරගැනීම අගය දාමය තුළ ඔවුන් සිටින ස්ථානයෙන් ඉදිරියට ගෙන යෑම සඳහා උපකාරී වේ.

(d) NDC සැලසුම්වල ඇතුළත් ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී වන ක්‍රියාකාරකම්, ප්‍රතිඵල ආදිය ප්‍රගති සමාලෝචනයේ දී හා අධීක්ෂණයේ දී ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණ කළ දත්ත ඇතුළත් කිරීම වැදගත්ය (ස්ත්‍රී පුරුෂ සමාජභාවයට හා සමාජමය වශයෙන් අන්තර්ගතකරණය ක්‍රියාත්මක කිරීමේ දී විශේෂිත ක්‍රියාමාර්ග සඳහා 4.4.3 වගුව බලන්න).

### 4.4.3 පශුසම්පත් අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

| NDC 1 - දේශගුණ විපර්යාසවලින් රෝමන්ථයින්ට (වමාරා කන සතුන්) ඇතිවන බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: යෝග්‍ය අනුහුරුවීමේ ක්‍රියාමාර්ග, තාක්ෂණික නවෝත්පාදන සහ තාප ආතති කළමනාකරණය ඇතුළු ඔරොත්තු දීමේ ගොවිපොළ පිළිවෙත් හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම | DAPH | MoA, PDAPHs, NLDB, VRI, ශාස්ත්‍රඥයන්, කිරි සැකසුම් ආයතන. අදාළ රාජ්‍ය නොවන සංවිධාන | නිර්දේශිත අනුහුරුවීමේ ක්‍රියාමාර්ග<br><br>ක්‍රියාත්මක කරන තාක්ෂණික නවෝත්පාදන ගණන | | DAPH වාර්තා | 0 (සියලු ක්‍රියාකාරකම් සඳහා) | පවත්නා ගොවි පොළවලින් 50% ක තාක්ෂණික නවෝත්පාදන මත භාවිත කරමින් අනුහුරුවීමේ ක්‍රියාමාර්ග යොදාගැනීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 8.2, 12.2, 13 |
| 1.2: මධ්‍යම සහ මහා පරිමාණ ගොවිපොළ-වලට වැසිජලය රැස්කිරීමේ පොකුණු ඒකා-බද්ධ කරගැනීම ප්‍රවර්ධනය කිරීම | DAPH | PDAPHs, MASL, කිරි එකතු කිරීමේ ආයතන | පොකුණු සහිත මධ්‍යම හා මහා පරිමාණ ගොවිපොළ ගණන | | වාරික ප්‍රගති වාර්තා හා වාර්ෂික වාර්තා | 0 | වියළි කලාපයේ ගොවිපොළ අතරින් 50%ක ස්ථාපිත කිරීම | | | √ | √ | √ | √ | | | | | 2.3, 2.4, 6.b, 12.2, 13.3 |
| 1.3: ආන්තික දේශගුණ සිදුවීම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා සත්ත්ව ආහාර භෝග සංරක්ෂණය, සත්ත්ව ආහාර සැපයුම් පද්ධති වෙනස්කිරීම වැනි අනුහුරුවීමේ පියවර හඳුන්වාදීම | DAPH | MoA, PDAPHs, NLDB, VRI, ශාස්ත්‍රඥයන්, කිරි සැකසුම් ආයතන. අදාළ රාජ්‍ය නොවන සංවිධාන | මෙම තාක්ෂණයන් යොදාගන්නා ගොවීන් ගණන (ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ දත්ත) | | DAPH, VRI වාර්තා හා සත්ත්ව ආහාර රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වාර්තා | 0 | ගොවීන් ගණන 50% | | | √ | √ | √ | | | | | | 2.3, 2.4, 13.3 |
| 1.4: ඉහළ ඵලදාවක් සහිත සහ දේශගුණයට අනුහුරු වියහැකි නව සත්ත්ව ආහාර භෝග සහ සත්ත්ව ආහාර සම්පත් හඳුන්වාදීම/ දියුණු කිරීම | DAPH, VRI | MoA, PDAPHs, NLDB, MASL, ශාස්ත්‍රඥයන්, කිරි සැකසුම් ආයතන. අදාළ රාජ්‍ය නොවන සංවිධාන | ප්‍රවර්ධනය කළ හා භාවිතයට ගත් ප්‍රභේද හා සත්ත්ව ආහාර සම්පත් ගණන | | DAPH, VRI වාර්තා | 3 | නව ප්‍රභේද 2ක් | √ | √ | √ | √ | √ | | | | | | 2.3, 2.4, 12.2, 13.3 |
| 1.5: නව/ නැවත මතුවෙමින් ඇති දේශගුණය හා සම්බන්ධ රෝග (මීඋණ, කිනිතු වාහක රෝග ආදි) හඳුනාගැනීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා පශුවෛද්‍යවරුන් සිදුකරන අඛණ්ඩ අධීක්ෂණය/ වැඩිදියුණු කළ ආවේක්ෂණය | DAPH | PDAPHs, VRI, VICs | නව සහ නැවත මතුවෙමින් ඇති රෝග හා වසංගත ආවේක්ෂණය | | DAPH වාර්තා | 0 | වාර්ෂික ආවේක්ෂණ | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 13.3 |

## NDC 2 - කුකුළු පාලනයේ සහ ඌරන් ඇති කිරීමේ දී දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීම වර්ධනය කිරීම සඳහා තාක්ෂණික නවෝත්පාදන සහ මැදිහත්වීම් හඳුන්වාදීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: තාප ආතතිය වැළැක්වීම සඳහා දේශගුණ විපර්යාසවලට ඔරොත්තුදෙන සත්ත්ව නිවාස හා කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීමට කුඩා පරිමාණ ක්‍රියාකරුවන්ට පහසුකම් සැපයීම. | DAPH | PDAPHs, VRI, ශාස්ත්‍රඥයන්, අදාළ රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය | පවත්වන ලද පුහුණු සැසි ගණන<br><br>සහභාගීවුවන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත<br><br>නිර්දේශිත අනුහුරුවීමේ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම<br><br>දියුණු කළ සත්ත්ව නිවාස ප්‍රමාණය | | වාර්ෂික වාර්තා හා පුහුණුව සඳහා ගෙවිලියන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් සංඛ්‍යාලේඛන සංග්‍රහ | දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ ද සැලසුම් සහගතව නොවේ | පුහුණු සැසි ගණන පිළිබඳ ඉලක්ක ස්ථාපිත කළ යුතුය<br><br>පවත්නා ගොවිපොළ අතරින් 50% ක් තාප ආතතිය අඩු කිරීම සඳහා අනුහුරුවීමේ පියවර අනුගමනය කිරීම<br><br>අනුමනය කරන ගෙවිලියන් ප්‍රතිශතය (ඉහත සඳහන් 50%න්) | | | √ | √ | √ | √ | | | | | 2.3, 2.4, 8.2, 12.2, 13 |
| 2.2: කුකුළන් සහ ඌරන් අතර නව/ නැවත මතු වෙමින් පවතින දේශගුණය සම්බන්ධ රෝග හඳුනාගැනීමටත් ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා පශුවෛද්‍යවරුන් සිදුකරන අඛණ්ඩ අධීක්ෂණය/ වැඩිදියුණු කළ ආවේක්ෂණය | DAPH | VRI, VIC, PDAPHs | නව/ නැවත මතු වෙමින් පවතින රෝග හා වසංගත පිළිබඳ ආවේක්ෂණය | | DAPH හි වසංගතවේද සංග්‍රහය | 0 | සියලුම ගොවිපොළවල | | | √ | √ | √ | √ | | | | | 2.3, 2.4, 13.3 |
| 2.3: ආන්තික දේශගුණ සිදුවීම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා සත්ත්ව ආහාර භෝග සංරක්ෂණය, සත්ත්ව ආහාර සැපයුම් පද්ධති වෙනස්කිරීම වැනි දැනටමත් පවත්නා අනුහුරුවීමේ පියවර පුළුල් කිරීම ප්‍රවර්ධනය | DAPH | VRI, ශාස්ත්‍රඥයන්, පෞද්ගලික අංශය | නවීකරණ/ සැකසීම් ගණන | | VRI වාර්තා DAPH වාර්ෂික වාර්තා, සත්ත්ව ආහාර රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වාර්තා | 0 | 2 | | | | √ | √ | √ | √ | | | | 2.3, 2.4, 13.3 |

**NDC 3 - දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා පර්යේෂණ, අධ්‍යාපන, දැනුම්වත්භාවය සහ ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: පශුසම්පත් අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව සැලකිල්ලට ගනිමින් අනුහුරුවීමේ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණය හා දැනුම පැවරුම | DAPH | PDAPHs, VRI, NLDB, ශාස්ත්‍රඥයන් | තාක්ෂණය හා පැවරුම් තක්සේරු කිරීම<br><br>දැනුම හා තාක්ෂණය පැවරුම් පැකේජ සංවර්ධනය කර අදාළ ඉලක්ක කණ්ඩායම් සඳහා ලබාදීම (ස්ත්‍රී-පුරුෂ හා තරුණ කොටස් සහිත)<br><br>දැනුම හා තාක්ෂණ පැවරුම ලැබුණු ගෙවිලියන් ගණන දැක්වෙන ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත | | DAPH හි අවසන් තක්සේරු වාර්තා<br><br>පර්යේෂණ පත්‍රිකා | 0 | සමස්ත තාක්ෂණ හා පැවරුම් තක්සේරුව සිදුකිරීම (2024)<br><br>සත්ත්ව පාලන ගොවීන් අතරින් 50%කට නොඅඩු පිරිසකට දැනුම පැවරුම | | | | √ | √ | √ | √ | √ | √ | √ | 5.b, 13.3 |
| 3.1.1: පශුසම්පත් අංශයේ අනුහුරුවීමට අදාළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රධාන ගැටලු හඳුනාගැනීම සඳහා සහ මූලික දත්ත ස්ථාපිත කිරීම සඳහා සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තක්සේරුවක් සිදුකිරීම | DAPH ,<br>HARTI | MoA, MoWCSD, PDAPH, ශාස්ත්‍රඥයන්, සැකසුම් ආයතන | අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව තක්සේරුව (අංශයේ කාන්තාවන්ගේ සහභාගීත්වය, අදාළ ස්ත්‍රී පුරුෂ සමාජභාව ගැටලු, බාධක හා අභියෝග ) | | DAPH වාර්තා | අධ්‍යයන තරමක් ඇති අතර, තොරතුරු විසිරී ඇත | අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව තක්සේරුව | | √ | √ | | | | | | | | 5.b, 13.3, 13.b |
| 3.1.2: තාක්ෂණික නවෝත්පාදන, අනුහුරුවීමේ පියවර, ඔරොත්තු දෙන ගොවිපොළ පද්ධති හඳුනාගැනීම, සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා 3.1.1 ක්‍රියාකාරකමේ දී හඳුනාගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු අන්තර්ගත කිරීම | DAPH | MoA, MoWCSD, PDAPH, VRI NLDB, ශාස්ත්‍රඥයන්, සැකසුම් ආයතන | ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී අනුහුරුවීමේ පියවර, තාක්ෂණික නවෝත්පාදන | | DAPH ප්‍රගතිවාර්තා/ පුවත් සංග්‍රහ | ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ගැටලු අවධානයට ලක්ව නැත | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු අන්තර්ගත කිරීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 5.b,13.3,13.b |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.1.3: NDC ක්‍රියාකාරී සැලසුමේ සියලු අනුහුරුවීමේ පියවර (තාක්ෂණික සංවර්ධනය, ඔරොත්තුදෙන ගොවිපොළ පද්ධති, සත්ත්ව ආහාර භෝග සංරක්ෂණය, ආහාර පද්ධති, සැකසුම් හා අලෙවි යාන්ත්‍රණ ආදි) ප්‍රවර්ධනය සඳහා කාන්තා සත්ත්වපාලන නිෂ්පාදිකාවන් සහභාගීකරගැනීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම | DAPH | MoA, PDAPHs, NLDB, VRI, ශාස්ත්‍රඥයන්, සැකසුම් ආයතන, අදාළ රාජ්‍ය නොවන සංවිධාන | කාන්තා සත්ත්ව පාලන නිෂ්පාදිකාවන් සහභාගීවීම | | DAPH වාර්තා | අවධාරණයට ලක් වී නැත | සත්ත්ව පාලනයේ යෙදෙන පිරිස අතරින් 50%කට නොඅඩු ගණනක් කාන්තා නිෂ්පාදිකාවන් වීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 5.b,13.3,13.b |
| 3.1.4: NDC ක්‍රියකාරී සැලසුමේ ඇති අනුහුරුවීමේ පියවර සංවර්ධනය හා හඳුන්වාදීම සඳහා සැලසුම්කරණයේ/ තීරණ ගැනීමේ මට්ටමේ තනතුරුවල සිටින කාන්තා විද්‍යාඥවරියන්/ පර්යේෂිකාවන්/ තාක්ෂණ ශිල්පිණියන් දිරිමත් කිරීම | DAPH , PDAPHs | NLDB, VRI, ක්‍රියාත්මක කිරීමේ හවුල්කාර සංවිධාන, ශාස්ත්‍රඥයන් | සැලසුම්කරණයේ/ තීරණ ගැනීමේ යෙදෙන කාන්තා විද්‍යාඥවරියන්/ පර්යේෂිකාවන්/ තාක්ෂණ ශිල්පිණියන් ප්‍රතිශතය | | DAPH වාර්තා (ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ දත්ත ඇතුළත්) | අවධාරණය කර නැත | 40%කට අඩු නැත | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 5.5, 5.a, 5.b,13.3,13.b |
| 3.2: පශුසම්පත් ක්‍රියාකාරකම්වල දේශගුණ ඔරොත්තු දීම පිළිබඳව දැනුම්වත් කිරීමේ සහ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම | DAPH | PDAPHs, රාජ්‍ය නොවන සංවිධාන, ගොවි සංවිධාන, පෞද්ගලික අංශය | DAPH මගින් (TOT) පුහුණුව ලද ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාප්ති නිලධාරීන් ගණන<br><br>PDAPHs මගින් පුහුණු කරන ලද සත්ත්ව පාලන ගොවීන් ගනන | | PDAPHs වාර්තා.<br><br>සත්ත්වපාලන ගෙවිලියන්/ ව්‍යාප්ති නිලධාරිනියන්ගේ සහභාගිත්වය දැක්වෙන ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත ඇතුළත් පැමිණීමේ ලේඛන | අවධානයට ලක් වී නැත | වර්ෂයකට 25<br><br>වර්ෂයකට 800 | | | | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 13.3 |
| 3.3: NDC 1 සහ 2 යටතේ සාකච්ඡා කර ඇති ඔරොත්තු දීම ගොඩනැංවීමේ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සඳහා පශුසම්පත් අංශයේ සේවා සපයන සියලු ආයතනවල ධාරිතා වර්ධනය කිරීම | DAPH | PDAPHs, DAD, NLDB, VRI, MASL, පෞද්ගලික අංශය, සැලසුම් ආයතන | එක් එක් ආයතන ලද පුහුණුවීම් ගණන<br><br>ධාරිතාවර්ධන ද්‍රව්‍ය/ මොඩියුලවලයට ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ ගැටලු ඇතුළත් කිරීම<br><br>සහභාගි වූ කාන්තා සහභාගිකයන් ගණන | | DAPH වාර්තා | අවධානයට ලක් වී නැත | වර්ෂයකට එක් ආයතනයක් සඳහා පුහුණු වීම් ලබා දීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.3, 2.4, 12.8, 13.3 |
| 3.4: දේශගුණ අවදානම් සහ වෙනස්කම්වලට අනුහුරුවීම සඳහා සහාය වීම සඳහා අවදානම් කළමනාකරණය සහ මූල්‍යකරණය සඳහා ප්‍රවේශය | කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ සංවර්ධන මණ්ඩලය (AAIB) හා වෙනත් රක්ෂණ සමාගම් | VRI, DAPH, PDAPHs, DMC, ගොවීන් කළමනාකරණය කරන සමිති, පෞද්ගලික අංශය | රක්ෂණය සඳහා ලියංපදිංචි වූ ගොවීන් ගණන<br><br>ලියාපදිංචි වූ ගෙවිලියන් ගණන | | AAIB, ගොවි කළමනාකරණ සමිති වාර්ෂික වාර්තා, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද තොරතුරු තුළත් DAPH වාර්තා | 10%ට අඩුය | සත්ත්ව පාලන ගොවීන් අතරින් 60%කට අධික පිරිසකට රක්ෂණ ක්‍රමයකට ප්‍රවේශය ලැබීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 13.3,13.a |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.5: පශුවෛද්‍ය හා සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත උපාධි පාඨමාලා සහිත විශ්වවිද්‍යාලවල සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පවත්වන පුහුණුවල විෂය මාලාවලින් දේශගුණ අවදානම ආමන්ත්‍රණය සඳහා සමාලෝචනය කර සංශෝධනය කිරීම | UGC, ශාස්ත්‍රඥයන්, DAPH | VRI, PDAPHs, පෞද්ගලික අංශය | දේශගුණ අවදානම ආමන්ත්‍රණය කරන මොඩියුල/ පාඨමාලා ගණන<br><br>පශුසම්පත් අංශයේ අනුහුරුවීමට බලපාන දේශගුණ අවදානමේ ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ ගැටලු ආමන්ත්‍රණය කරන මොඩියුල/ පාඨමාලා ගණන | | පාඨමාලා විෂය නිර්දේශ/ මොඩියුල | 0 | පශුවෛද්‍ය හා සත්ත්ව නිෂ්පාදන විෂය නිර්දේශ සියල්ලටම දේශගුණ විපර්යාස ඒකාබද්ධ කිරීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 4.7, 13.3 |
| 3.5.1: අනුහුරුවීමේ NDCවල සියලු අදාළ ක්‍රියාකාරකම් සඳහා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත රැස්කිරීම | DAPH | PDAPHs, NLDB, කිරි සැකසුම් සමාගම් | ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය සඳහා අවශ්‍ය ආකෘති සකස්කිරීම හා හඳුන්වා දීම | | DAPH වාර්තා, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත තොරතුරු සංග්‍රහ | 0 | ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී NDC ක්‍රියාත්මක කිරීම කළ හැකි වන ලෙස ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීමේ පිළිවෙත | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2,5,13 |
| 8.1.1 ඉහත අධ්‍යයනයෙන් අනාවරණය වන කරුණු අනුව යෝග්‍ය විකල්ප වාරිජල මූලාශ්‍ර ප්‍රවර්ධනය කිරීම | DoI | LRWHF, WRB, NWSDB, DNCWS, MASL | 1. යෝජනා සකස් කර නැත<br><br>2. වාරි ජලය සඳහා ස්ථාපිත වැසි ජල පද්ධති ගණන<br><br>3. විකල්ප වාර් ජල සම්පාදන ප්‍රවර්ධනය සඳහා ඉලක්ක කරගත්/ සහභාගි වූ කාන්තාවන් ප්‍රතිශතය | | ID, DAD, PIDs, MASL වාර්තා | 1. නැත<br><br>2. යා-වත්කාලීන කළ යුතුය - තොරතුරු HARTI සතුව ඇත<br><br>3. නැත | 1. ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. LRWHF ඉලක්කයඃ වාරි ජලය සඳහා වැසි ජල පොකුණු (පතස්) 250ක්<br><br>3. ඉලක්කය ස්ථාපිත කළ යුතුය | - | - | - | - | - | √ | √ | √ | √ | √ | 5.b, 5.5, 13.3 |
| 8.1.2 බාහිර සහාය ඇතිව අනුහුරුවීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රධාන ගැටලු හඳුනාගැනීම පිණිස වාරිමාර්ග අංශය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තක්සේරුව හා විශ්ලේෂණයක් සිදුකිරීම | MoIrri | ID, DAD, PIDs, LRWHF, WRB, MASL | තක්සේරුව | | ID වාර්තා<br><br>ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිචාරී අනුහුරුවීමේ පිය-වර හඳුනාගැනීම හා ප්‍රවර්ධනය සඳහා වූ නිර්දේශ සහිත වාරිමාර්ග අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජ-භාවය පිළිබඳ තක්-සේරුව; සොයාගැනීම් සන්නිවේදන-යේ වාර්තා | නැත | වාරිමාර්ග අංශ-යේ ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභා-වය පිළිබඳ ප්‍රධාන ගැටලු ලේඛනගත කිරීම හා අංශයේ ආයතන අතර හුවමාරු කරගැනීම | - | - | √ | √ | - | - | - | - | - | - | 5.5, 6.5 |
| 8.1.3 දේශගුණ විපර්යාස හා අදාළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු හා වාරි ජලය භාවිතය පිළිබඳව වාරි අංශයේ ප්‍රධාන සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ආයතනවල දැනුම්වත්භාවය හා ධාරිතාව ගොඩනැගීම | MoIrri | වනිතා කටයුතු භාර අමාත්‍යාංශය, අන්තර්ජාතික සංවර්ධන ආයතන | දේශගුණ විපර්යාස-වලට අනුහුරුවීමේ ස්ත්‍රී පුරුෂ සමාජ-භාවය පිළිබඳ ගැටලු පිළිබඳව සැලසුම් හා තීරණ ගැනීමේ මට්ටමින් පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැටසටහන් ගණන | | MoIrri වාර්තා (වාරිමාර්ග අං-ශයේ දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ ස්ත්‍රී පුරුෂ සමා-ජභාවය පිළිබඳ ගැටලු හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිචාරී සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වූ දැනුම්-වත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පිළිබඳ) | මේ දක්වා නැත | 10 (අදාළ සියලු ආයතන ආවරණය වන ලෙස වර්ෂයකට එක් වැඩසටහනක්) | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.b, 6.5 |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8.1.4 වාරිමාර්ග අංශයේ දේශගුණ විපර්යාස අනුහුරුවීම ප්‍රවර්ධනයේ දී තාක්ෂණය හා දැනුම පැවරීම, පුහුණු සැසිවාර, ව්‍යාප්ති වැඩසටහන්, ආදර්ශන ආදියේ දී කාන්තාවන්ගේ සහභාගීත්වය තහවුරු කිරීම | MoIrri | MoWS, ID, MASL, NWSDB, DCWS, පළාත් සභා බලධාරීන් DAD, DoA, MD, WRB | ඉලක්ක ගත හා සම්බන්ධ වූ කාන්තාවන් ප්‍රතිශතය | | කාන්තා සහභාගීත්වය පිළිබඳ විස්තර දැක්වෙන ID හා MASL වාර්තා | තක්සේරු කර නැත | වාරිමාර්ග අංශයේ දේශගුණ අනුහුරුවීමේ ක්‍රියාකාරකම්වල කාන්තා සහභාගීත්වය 15%ට නොඅඩු වේ | - | - | - | √ | √ | √ | √ | √ | √ | √ | 5.b,13.3 |
| 8.2 දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීම ගොඩනැංවීමේ මැදිහත්වීමක් වශයෙන්, භූගත ජල ප්‍රභවයන්ගෙන් සහය ලබාදිය යුතු (නළ ළිං, ගැඹුරු ළිං හරහා), ප්‍රමුඛතාවයෙන් වැඩි ගෘහස්ත ජල සැපයුම් සහ පරිපූරක වාරිමාර්ග ඇගැයුම් කිරීම සහ හඳුනාගැනීම | WRB | NWSDB, LRWHF, ID, DCWS, UNICEF | ප්‍රමුඛතා ලේඛනය | | NWSDB, WRB, ID වාර්තා | නැත | පුමුඛතා ලේඛනය සම්පූර්ණයි | √ | √ | √ | | | | | | | | 6.4, 6.5, 13.1 |
| 8.2.1 දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම ගොඩනැගීමේ මැදිහත්වීමක් ලෙස ගෘහස්ථ ජල සම්පාදනයේ ප්‍රමුඛතා හා අතිරේක වාරිමාර්ග යෝජනාක්‍රමවල පුමුඛතා තක්සේරු කිරීමේ දී හඳුනාගැනීමේ දී ප්‍රාදේශීය මට්ටමේ දී කාන්තාවන් සමඟ උපදේශන පැවැත්වීම ඇතුළත් කරගැනීම | MoIrri | MoWS, NWSDB, WRB, LRWHF, DCWS, ID, MASL, UNICEF | 1. උපදේශනය ලබාගත් කාන්තා සංවිධාන ගණන<br><br>2. උපදේශනය ලබාගත් කාන්තාවන් ගණන | | ක්‍රියාවලිය සඳහා කාන්තාවන්නේ යෙදවුම් දැක්වෙන MoIrri, MoWS, NWSDB, LRWHF WRB තක්සේරු වාර්තා | 1. නැත<br><br>2. නැත | 1. ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. ඉලක්කය ස්ථාපිත කළ යුතුය | - | - | - | √ | √ | √ | √ | √ | √ | √ | 5.5, 6.5, 13.3 |
| 8.3 ජල සුලභතාව සහ සුරක්ෂිතව නිස්සාරණය කළ හැකි ජල මට්ටම අනුව, වාරි කටයුතු සඳහා වගා ළිං හරහා භූගත ජලය ලබාදීම නියාමනය කිරීම | WRB | DCWS, DAD, NWSDB | නියෝග ( රෙගුලාසි) ක්‍රියාත්මක කිරීමේ මට්ටම | | WRB | නියෝග (රෙගුලාසි) ප්‍රකාශිතය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.5, 15.1 |
| 8.3.1 ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා සැලසුම් කණ්ඩායම්වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥතාවය ඇතුළත් කිරීම | MoWS | MoIrri , NWSDB, WRB, DAD | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශ්ලේෂණයෙන් නිරූපණය වන, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥතාවය සහිත ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා සැලසුම් කණ්ඩායම් ප්‍රතිශතය | | MoWS හා MoI වාර්තා (වාරිමාර්ග අංශයට අදාළව ස්ත්‍රී පුරුෂ සමාජභාව විශ්ලේෂණය සහිත වාර්තා)<br><br>දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීම ගොඩනැගීමේ අදාළ මැදිහත්වීම් පිළිබඳ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ දත්ත | නැත | 2030 වන විට සියලු ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා සැලසුම් කණ්ඩායම් | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.5, 13.1 |

NDC 9 - වාරිමාර්ග යෝජනාක්‍රම 40ක ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 9.1 වාරි ජලය සැපයෙන ඉඩම් හෙක්ටාර 45,000ක ප්‍රමාණයක් අවම වශයෙන් ආවරණය කිරීම සඳහා වාරි යෝජනාක්‍රමවල ජල පරිහරණ කාර්යක්ෂමතාවය 10%කින් වැඩිකරගැනීම | MoIrri | ID, MASL | යෝජනා ක්‍රම ගණන හා ආවරණය වන ප්‍රදේශය | | ID හා MASL- වාර්තා | වර්තමාන සමස්ත ජල අවශ්‍යතාවය (අක්කරයකට අක්කර අඩි) විවිධ යෙ-ා්ජනාක්‍රමවල අඩි 4-දක්වා අතර පරාස-යක පවතී (සාමාන්‍යය අඩි 5.5) | ID යෝජනා ක්‍රම 30ක්<br><br>ඉතිරි යෝජනා ක්‍රම 10 MASL | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 2.4, 6.5 |
| 9.2 ක්ෂුද්‍ර වාරි පද්ධති (ඉසින) සහ ජල පරිභෝජනය අඩු භෝග වර්ග වැනි ජලය ඉතිරිකරගත හැකි යෙදවුම් හඳුන්වාදීම | DoA | PDoA, DAD, පෞද්ගලික අංශය | 1. හඳුන්වා දෙන ලද ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති ගණන<br><br>2. හඳුන්වා දෙන ලද භෝග වර්ග ගණන | | D0A, PDoA වාර්තා | නැත | 2025 වන විට 14 | √ | √ | √ | √ | √ | | | | | | 2.4, 6.5 |
| 9.3 ජලය ඉතිරිකරගත හැකි යෙදවුම් සම්බන්-ධයෙන් ගොවීන් පුහුණු කිරීම සහ දැනුම්වත් කිරීම | MoIrri | IMD, ID, MASL, DAD | 1. පවත්වන ලද වැඩසටහන් ගණන;<br><br>2. වැඩසටහන් සඳහා ගෙවිලියන් සහභාගි වූ ප්‍රතිශතය | | IMD, ID, MASL වාර්තා<br><br>ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ පැමිණීමේ දත්ත | ක්‍රියාත්මක වේ | 1. වර්ෂයකට වැඩසටහන් 40කට නොඅඩු ගණනක්<br><br>2. ඉහත වැඩසටහ-න් අතරින් 10%කට නොඅඩු ප්‍රමා-ණයකට කාන්තාව-න් සහභාගි වී ඇත. | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 5.b, 6.b |
| 9.4 වඩා හොඳ ජලය වෙන්කිරීමේ යාන්ත්‍රණ හරහා ගොවි සංවිධාන අතර කාර්යක්ෂමව ජලය බෙදාදීම හඳුන්වාදීම | MoIrri | DoA, ID, DAD, PDoI | නියමු අධ්‍යයනයක් | | ශක්‍යතා වාර්තා | ආරම්භ කර නැත | 2025 වන විට නියමු ව්‍යාපෘතිය පවත්වා ඇත | - | - | √ | √ | √ | | | | | | 2.4, 6.5 |
| 9.5 නව වාරි තාක්ෂණය භාවිත කිරීම සඳහා වෙළෙඳපොළ පදනම් කරගත් මෙවලම් ප්‍ර-වර්ධනය කිරීම (ජල සහනාධාර යෝජනාක්‍රම සහ බදු සහන) | DoA | DAD, PDoI | නියමු අධ්‍යයන ගණන | | ශක්‍යතා වාර්තා | නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12.8, 6.5 |

**NDC 10 - ප්‍රමුඛතා ගංගාද්‍රෝණි පහක ඇතිවිය හැකි ක්ෂණික ගංවතුර තත්ත්ව සඳහා ගංගා පිටාරගැලීම් අවමකිරීමේ ක්‍රියාමාර්ග සහ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති තක්සේරු කිරීම (නියමු පදනමින් කැළණි ගඟ, අත්තනගලු ඔය, කළු ගඟ, කිරිඳි ඔය, සහ මල්වතු ඔය ආවරණය කෙරේ)**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 10.1. ප්‍රමුඛතා ගංගා ද්‍රෝණි පහේ ගංගා සහ ජලාශ මානක සවිකිරීම සහ වර්ෂාපතන දත්ත හා ගංගා ප්‍රවාහ දත්ත එකතුකිරීම | ID | MD, NBRO | ප්‍රමාණවත් ජල කාලගුණ විද්‍යාත්මක දත්ත ජාලයක් මගින් ගංගා ද්‍රෝණි ආවරණය වීම | | ID වාර්තා | ගංගා ද්‍රෝණි 5 පිහිටි ස්ථාන 16ම ජල කාලගුණ විද්‍යාත්මක දත්ත ජාලය මගින් ආවරණය කිරීම | දියුණු කළ ජල කාලගුණ විද්‍යාත්මක දත්ත ජාලය මගින් ගංගා ද්‍රෝණි 5 ආවරණය වේ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.6, 13.1, 13.3 |
| 10.2 සියලුම ප්‍රමුඛතා ගංගාද්‍රෝණි සඳහා ඩිජිටල් උන්නතාංශ සිතියම්/ ආකෘති සකස් කිරීම සහ ස්වයංක්‍රිය පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ඇතිකිරීම | ID | MD, NBRO, DMC | ප්‍රමුඛතා ගංගා ද්‍රෝණි සඳහා ඩිජිටල් උන්නතාංශ ආකෘති (DEMs)<br><br>ප්‍රමුඛතා ගංගා ද්‍රෝණි සඳහා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති | | ID වාර්තා | ප්‍රමුඛතා ගංගා ද්‍රෝණි 2ක් සඳහා ඩිජිටල් උන්නතාංශ ආකෘති (DEMs) ඇත (කැලණි ගඟ හා අත්තනගලු ඔය).<br><br>සියලු ප්‍රධාන ගංගා ද්‍රෝණි 5 සඳහාම මිනිසුන් විසින් ක්‍රියාත්මක කරන පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ඇත | ප්‍රමුඛතා ගංගා ද්‍රෝණි 3ක ගංවතුර අවදානමට ලක්වන ප්‍රදේශ සඳහා ඩිජිටල් උන්නතාංශ ආකෘති (DEMs) සකස් කර ඇත<br><br>ප්‍රමුඛතා ගංගා ද්‍රෝණි 5 සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති උත්ශ්‍රේණිගත කිරීම | - | - | √ | √ | √ | | | | | | 13.3 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10.3 අළුතින් ඇතිකළ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හා සම්බන්ධ තාක්ෂණික යෙදවුම් සහ තොරතුරු බෙදාහැරීම සම්බන්ධ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම | ID | MD, NBRO, DMC | 1.පවත්වන ලද ධාරිතා වර්ධන වැඩසටහන් ගණන<br><br>2. ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා සහභාගි වූ කාන්තා-වන් ප්‍රතිශතය දක්න ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ සහභාගිකයන්ගේ සංඛ්‍යාව | | ID වාර්තා | පවත්නා පද්ධති සඳහා අදාළ කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය ධාරිතාව | 1. අදාළ සියලු ආයතනවල ධාරිතා වර්ධනය වීම | - | - | √ | √ | √ | | | | | | 5.b, 6.5, 13.3 |
| 10.3.1 ගංවතුර ඇති වීම පිළිබඳව ජංගම දුරකථන යෙදවුමක් හරහා ප්‍රජාවට සන්නි-වේදනය කිරීම | ID | MD, NBRO, DMC | 1. ජංගම දුරකථන යෙදවුම<br><br>2. යෙදවුම හඳුන්වා දීමේ දී ඉලක්ක කළ/ ඇතුළත් කළ කා-න්තාවන් ප්‍රතිශතය | | ID වාර්තා (ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ) | 1. නොමැත<br><br>2. යෙදවුම හඳුන්වා දිය යුතුය | 1. යෙදවුම හඳුන්වාදීම<br><br>2. කාන්තාවන් අතරින් 50%කට නොඅඩු ප්‍රමාණයක් යෙදවුමට සම්බන්ධ වීම | - | - | √ | √ | √ | | | | | | 5.b, 6.5, 13.3 |
| 10.4 දේශගුණ විපර්යාසවල බලපෑමෙන් ඇතිවන අවදානම් සඳහා මුහුණදීමට ගංවතුර අවම කිරීමේ ව්‍යුහ හඳුන්වාදීම | ID | LUPPD, MD, DMC | ගංවතුර අවම කිරීමේ ව්‍යුහ | | ID වාර්තා | ගංගා ද්‍රෝණි දෙකක දැන-ටත් පවතී (කැලණි, කළු) | අවශ්‍ය ස්ථානවලදී පවත්නා ව්‍යුහ වැඩිදියුණු කිරීම හා සුදුසු ව්‍යුහ දෙකක් හඳුන්වාදීම (අඹතලේ ලවණ බාධකය හා වී ඔය ජලාශය) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 13.3 |

## 4.6 ජෛව විවිධත්ව අංශය

විවිධ ජෛව දේශගුණික කලාප මගින් ආවරණය වන පුළුල් පරාසයක පරිසර පද්ධති සහ වාසස්ථාන පරාසයක ව්‍යාප්ත වී ඇති විශිෂ්ට ජෛව විවිධත්වයක් ශ්‍රී ලංකාවේ දැකිය හැකිය. සංසන්දනාත්මකව කුඩා භූමි ප්‍රමාණයක් (වර්ග කිමී 65,610) ඇති වුවත්, මෙරට තුළ විවිධත්වයෙන් යුක්ත භෞමික සහ ජලජ (මිරිදිය, සමුද්‍රීය සහ කිවුල් ජලය) පරිසර පද්ධති පවතී. වර්ෂා වනාන්තර, කඳුකර වළාකුළු වනාන්තර, වියළි කලාපීය මෝසම් වනාන්තර සහ ශුෂ්ක කටු පඳුරු සහිත වනාන්තර වැනි විශේෂිත වනාන්තර වර්ග මගින් මෙරට ඇති විවිධ වූ දේශගුණ කලාප නිරූපණය වේ. ශ්‍රී ලංකාවේ දැකිය හැකි පරිසර විද්‍යාත්මක, දේශගුණික, පාංශු සහ භූගෝලීය විවිධත්වය නිසා බොහෝ වෘක්ෂලතා සහ සත්ත්ව විශේෂවලට බොහෝ ස්ථානවල පැවතිය හැකිය. ඉහළ ආවේණිකත්වය සහ තර්ජනවලට නිරාවරණය වීමේ තරම මත පදනම්ව, ඉන්දියාවේ බටහිර ඝාට්ස් සමඟ එක්ව ශ්‍රී ලංකාව ජෛව විවිධත්ව උණුසුම් ස්ථාන 36 න් එකක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සහ සත්ත්ව විශේෂ මුහුණ පා ඇති තර්ජනයේ තත්ත්වය මෙරට ජාතික රතු ලැයිස්තුවේ වාර්තා කර ඇත.

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට ඇති මූලික තර්ජන වන්නේ වාසස්ථාන අහිමි වීම, වාසස්ථාන ඛණ්ඩනය වීම සහ හායනය; ජෛව සම්පත් අධික ලෙස භාවිතයට ගැනීම; සාම්ප්‍රදායික භෝග සහ පශුසම්පත් ප්‍රභේද සහ වර්ග වඳ වී යාම; පරිසර දූෂණය; මිනිසුන් සහ වනජීවීන් අතර ගැටුම්; ආගන්තුක ආක්‍රමණශීලී විශේෂවල වේගවත් ව්‍යාප්තිය; සහ ඉහළ යන මානව ජන ඝනත්වයයි. වනාන්තරවල ඉඩම් පරිහරණයේ ඇතිවන වෙනස්කම්, තෙත්බිම් ගොඩකිරීම, වෙරළබඩ ප්‍රදේශ පාලනයකින් තොර භාවිතය, තෙත්බිම් පිරවීම සහ වනාන්තර විනාශය යන සියලු හේතු වාසස්ථාන අහිමි වීම සඳහා දායක වේ. වෙරළබඩ වාසස්ථාන වෙනස් කිරීම, විනාශකාරී මසුන් අල්ලන උපක්‍රම, නැව් මගින් ඇතිවන දූෂණය සහ ගොඩබිම සිදුවන ක්‍රියාකාරකම් නිසා ඇතිවන අහිතකර බලපෑම් නිසා සිදුවන මුහුදට කසළ එකතු වීමට හේතු වන වෙනත් බරපතළ ගැටලු අතර වේ.

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථාදායක, උපායමාර්ගික, නියාමන සහ මෙහෙයුම් ක්‍රියාමාර්ග ගණනාවක් මෙරට තුළ ක්‍රියාත්මක කර ඇත. ජෛව විවිධත්ව සම්මුතියේ (CBD) කේන්ද්‍රස්ථානය වන්නේ පරිසර අමාත්‍යාංශයයි. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයේ තත්ත්වය, අමාත්‍යාංශය මගින් 2019 දී ප්‍රකාශිත 6 වන ජාතික වාර්තාවේ (6thNR) වාර්තා කර තිබේ[54]. පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ මඟපෙන්වීම යටතේ, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම පිණිස ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රතිපත්තිය ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම (NBSAP) 2016-2022 ලේඛනයේ දක්වා ඇත[55] . ජෛව විවිධත්ව සංරක්ෂණය සිය ප්‍රධාන කාර්යය ලෙස පවත්නා වෙනත් රාජ්‍ය ආයතන අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (FD) සහ වනජීවී හා වන සංරක්ෂණ යන විෂය භාර අමාත්‍යාංශ ද වේ. මෙම ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා කැප වී සිටින අතර, ඊට සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපනය හා සංස්කෘතික ක්‍රියාකාරකම්වලට සැලසුම්ගතව හා ක්‍රමානුකූලව ජෛව විවිධත්වය ඒකාබද්ධ කිරීම මෙන්ම හායනයට ලක් වූ පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය හා පුනරුත්ථාපනය ද ඇතුළත් වේ.

ජාතික වන ප්‍රතිපත්තිය (1995), ජාතික වනජීවී ප්‍රතිපත්තිය (2000), ජාතික පාරිසරික ප්‍රතිපත්තිය (2022) සහ ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2016), ජාතික පරිසර  සංවේදී කලාප ප්‍රතිපත්තිය (2022) ආදිය ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණයට අදාළ ප්‍රධාන ප්‍රතිපත්ති අතරින් සමහරකි. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහාය ලැබෙන ප්‍රධාන නීති වන්නේ පිළිවෙලින් 2009 වර්ෂයේ දී සංශෝධිත අංක 22 දරන වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත සහ 2009 අංක 65 දරන වන සංරක්ෂණ ආඥාපනතින් සංශෝධිත 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥාපනතයි. 1988 අංක 3 දරන ජාතික උරුම වනජීවී ප්‍රදේශ පනත, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ එහි සංශෝධන, 1951 අංක 25 දරන පස සංරක්ෂණ පනත සහ 1981 අංක 59 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත මගින් තවදුරටත් ජෛවවිවිධත්වය ආරක්ෂා කිරීමේ මෙරට මූලික නීති රාමුව තනයි. මෙම අංශයට සහය වූ තවත් ප්‍රධාන ලේඛනයක් වන්නේ, වන ක්ෂේත්‍ර මහ සැලසුම (FSMP) 1995-2020 හා 2021-2030 සඳහා සිදුවන එහි යාවත්කාලීන කිරීමකි.

54 MoE (2019) Sri Lanka's Sixth National Report: Biodiversity Profile - Sri Lanka to the Convention on Biological Diversity

55 MoMD&E (2016). National Biodiversity Strategic Action Plan 2016-2022. Colombo, Sri Lanka: Biodiversity Secretariat, Ministry of Mahaweli Development and Environment. xxi + 284 pp



ජෛවවිවිධත්ව අංශයේ ඇතැම් NDC ක්‍රියාකාරකම් වන ක්ෂේත්‍ර මහ සැලසුම (FSMP) කෙටුම්පතට ඒකාබද්ධ කර ඇත. ආරක්ෂිත ප්‍රදේශවලින් පිටත පිහිටා ඇති සංවේදී ප්‍රදේශ සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය, දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පාරිසරික පිවිසුම් සහ භූ දර්ශන සම්බන්ධ කිරීම සහ ආක්‍රමණික ආගන්තුක ජීවී විශේෂ කළමනාකරණය උක්ත සැලසුමේ ඉස්මතු කර දක්වා ඇති කරුණු කිහිපයකි.

මෑත කාලය පුරා මෙරට තුළ සීග්‍ර වන විනාශයක් දැකිය හැක්කේ රජය හා කර්මාන්ත මුහුණ දී ඇති ආර්ථික පීඩනයේ ප්‍රතිඵලයක් ලෙස, මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති, වැවිලි ව්‍යාප්ත කිරීම, සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කරන නැවත පදිංචි කිරීමේ මුලපිරීම් සඳහා සිදුකරන කටයුතු නිසාය. විවිධ පරිසර පද්ධති රඳා පවත්නා වාසස්ථානවල විනාශයට මෙම වනාන්තර විනාශ හේතු වන අතර, එය කාබන් තිරකිරීම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි. දේශගුණ විපර්යාසවල ප්‍රතිඵලයක් ලෙස පරිසර පද්ධතිවල දේශගුණික තත්ත්ව වෙනස් වන අතර, උෂ්ණත්වය ඉහළ යාම සහ වෙනස් වන වර්ෂාපතන රටාව නිසා ආක්‍රමණශීලී ශාක විශේෂ ද වර්ධනය වනු ඇත. දේශගුණ විපර්යාසයේ මෙම අහිතකර බලපෑම නිසා ඇතැම් සතුන්ගේ ආහාර චක්‍ර සඳහා අත්‍යවශ්‍ය වන සමහර ශාක විශේෂ වඳ වී යාමට ද හැකියාව ඇති අතර එය පරිසර පද්ධතිවල පාරිසරික සමතුලිතතාවය පිළිබඳ ගැටලු ඇති කළ හැකිය. මානවකෘත ක්‍රියාකාරකම් රැසක් නිසා ඇති වී තිබෙන ජල සම්පත් ක්ෂය වීම හා පිරිහීම නිසා ජල දූෂණය වැළැක්වීමේ අභියෝග රැසකට ශ්‍රී ලංකාව මුහුණ දී සිටින අතර, එය ජෛව විවිධත්වයට ද හානි කරයි. එසේම  ගෘහාශ්‍රිත අපද්‍රව්‍ය, වාරිමාර්ග, නාවුක තෙල් බැහැරකිරීම්, අපද්‍රව්‍ය බැහැරකිරීම හා කොරල් හා වැලි කැනීම් ආදිය කළමනාකරණය හා පාලනය ප්‍රමාණවත් නොවීමනිසා සාගර ජීවීන් හා වෙරළබඩ පරිසර පද්ධති මුහුණ දී ඇති තර්ජනය ද බරපතළ වී තිබේ.

දේශගුණ සංවේදී ප්‍රදේශ කළමනාකරණය සහ ආරක්ෂිත ප්‍රදේශ තුළ හා ඉන් පිටත හායනයට ලක් වූ ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීම, දේශගුණය හේතුවෙන් ඇතිවන වෙනස්කම් අනුව ජීවී විශේෂවල සංක්‍රමණය සඳහා සම්බන්ධතාවය වැඩිකිරීම, ආරක්ෂිත ප්‍රදේශ පද්ධතියක් හරහා ජෛව විවිධත්වයේ ඔරොත්තු දීම ගොඩනැංවීමට ආරක්ෂිත ප්‍රදේශ පුළුල් කිරීම, ශාක සහ සත්ත්ව විශේෂවල විතැන් සංරක්ෂණය  ශක්තිමත් කිරීම සහ ආක්‍රමණික ආගන්තුක විශේෂ ඵලදායී අන්දමින් කළමනාකරණය කිරීම යන ක්‍රියාමාර්ග ආවරණය වන NDC අංශ පහක් යටතේ (4-6 වගුව) ජෛව විවිධත්වය සඳහා ඔරොත්තු දීම ගොඩනැංවීමේ ක්‍රියාමාර්ග ඉදිරිපත් කර තිබේ. කාබන් තිරකිරීම ඇතුළුව ජෛව විවිධත්වයේ හරිතාගාර වායු විමෝචන අවමකිරීමේ සම-ප්‍රතිලාභ, වනාන්තර අංශයේ අවමකිරීමේ NDCවලට ඇතුළත් වේ.

4-6 වගුව ජෛව විවිධත්ව අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | දේශගුණ විපර්යාස නිසා දැඩි අවදානමකට ලක්ව ඇති වාසභූමි සංරක්ෂණය සඳහා ආරක්ෂිත ප්‍රදේශ ජාලය තුළ සහ ඉන් පිටත පිහිටි දේශගුණ සංවේදී ප්‍රදේශ කළමනාකරණ සහ හායනය වූ ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීම |
| 2 | වර්තමාන පුරෝකථනවලට අනුව, දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන  වෙනස්වීම්වලට ලක්වනු ඇතැයි අපේක්ෂිත කලාපවල සම්බන්ධකතාවය, භූදර්ශන ප්‍රවේශය භාවිත කරමින් වර්ධනය කිරීම |
| 3 | දේශගුණ විපර්යාස සඳහා ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකිරීමට ආරක්ෂිත ප්‍රදේශ  ජාලයට ඇති හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ආරක්ෂිත ප්‍රදේශවල භූමි ප්‍රමාණය ව්‍යාප්ත කිරීම. |
| 4 | දේශගුණ විපර්යාස නිසා අවදානමට ලක්ව ඇති තක්සෝන සහ කලාප ආවරණය කරන විතැන් සංරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම |
| 5 | යෝග්‍ය දේශගුණ තත්ත්ව යටතේ වේගයෙන් ව්‍යාප්ත විය හැකි ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ පැතිරයාම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම |

## 4.6.1 ජෛව විවිධත්ව අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - දේශගුණ විපර්යාස නිසා දැඩි අවදානමකට ලක්ව ඇති වාසභූමි සංරක්ෂණය සඳහා ආරක්ෂිත ප්‍රදේශ ජාලය තුළ සහ ඉන් පිටත පිහිටි දේශගුණ සංවේදී ප්‍රදේශ කළමනාකරණ සහ හායනය වූ ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1 පවතින සිතියම් ඇසුරින් දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන වෙනස්වීම්-වලින් වඩාත් අවදානමට ලක්ව ඇති වාසභූමි හඳුනාගැනීම සහ ආරක්ෂිත ප්‍රදේශ තුළ සහ ඉන් පිටත ප්‍රතිස්ථාපනය කළ යුතු හෝ පුනරුත්ථාපනය කළ යුතු ප්‍රමුඛතා ස්ථාන සම්බන්ධයෙන් දේශගුණ විපර්යාස සඳහා ප්‍රතිචාර දක්වන්නා වූ අනුහුරුවීමේ ක්‍රියාමාර්ග ගැනීම | MoE (BDS හා CCS), DNBG | FD, DWC, CC&CRMD, CEA, MEPA, MASL, MD, DMC, NARA, NWPEA, ශාස්ත්‍රඥයන් හා පර්යේෂකයන්, NGOs | 1. දේශගුණ විපර්ය-ාස නිසා අවදානමට ලක්ව ඇති බවට හඳුනාගත් වාසස්ථාන ගණන<br><br>2. හඳුනාගත් වාස-ස්ථාන අතරින් යෝග්‍ය අනුහුරුවීමේ පියවර ගෙන ඇති ගනන<br><br>3. පවත්න ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර සංවේදී ප්‍රදේශ ගණන | | BDS වාර්තා | DWC යටතේ ආරක්ෂිත ප්‍රදේශ 105<br><br>FD යටතේ ආරක්ෂිත ප්‍රදේශ 845<br><br>CEA යට-තේ පරිසර ආරක්ෂිත ප්‍රදේශ 10<br><br>CC&C-MD යට-තේ විශේෂ කළමනාක-රණ ප්‍රදේශ 14<br><br>පරිසර සංවේදී ප්‍රදේශ 5<br><br>NWPEA ප්‍රදේශ 3 (මේවා ප්‍රකාශයට පත්කර ඇත්තේ ඒවායේ පාරිසරික වැදගත්මක මත වන අතර දේශගුණ අවදානම මත නොවේ) | 1. රට තුළ දේශගුණ විපර්යාස නිසා වඩාත් අවදානමට ලක්ව ඇති වාසස්ථාන හඳුනාගෙන ඇත.<br><br>2. ඒවායේ ඔරොත්තු දීම ඉහළ නැංවීමට යෝග්‍ය අනුහුරුවීමේ පියවර ගෙන ඇත<br><br>අවම වශයෙ-න් ප්‍රදේශ 500ක් (ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර සංවේදී ප්‍රදේශ) හඳුනාගෙ න/ ප්‍රකාශයට පත් කර/ ගැසට්ගත කර/ සම කළමාක-රණය කර ඇත) | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 15.1, 15.4 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.2 ජීවායේ ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම සඳහා ඉහත සඳහන් ප්‍රමුඛතා ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේදී අවධානය යොමුකළ යුතු කඩොලාන, මුහුදු තෘණභූමි, මීදුම බාධක ප්‍රදේශ, විල්ලු ආදිය ඇතුළත් භෞමික, තෙත් බිම්, වෙරළබඩ හා සාගර ප්‍රදේශ සඳහා සිතියම් සකස් කිරීම | MoWL&FC, DNBG | MoE, FD, DWC, CC&CRMD, CEA, MEPA, MASL, MD, DMC, NARA, SD, NWPEA, ශාස්ත්‍රඥයන් හා පර්යේෂකයන් , NGOs | සකස් කළ සිතියම් සංඛ්‍යාව | | සිතියම් සකස් කිරීම | කඩොලාන හා වෙනත් ආරක්ෂිත ප්‍රදේශ සිතියම් DWC මගින් පිළියෙල කර ඇත. ආක්‍රමණික විශේෂ, හායනයට ලක් වූ වාසස්ථාන, කඩොලාන හායනය වූ ප්‍රදේශ ඇත.<br><br>පරිසර සංවේදී ප්‍රදේශ (ESA) සිතියම්<br><br>මූලික දත්ත - වනාන්තර 89 (හෙක් 18959.7) | හඳුනාගත් සියලු අවදානම් පරිසර පද්ධති සඳහා සිතියම් 500ක් සකස් කර ඇත | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 14.5 15.1, 15.4 |
| 1.3 දේශගුණ විපර්යාසවලින් ඉහළ අවදානමකට ලක්ව ඇති ශාක සහ සත්ත්ව විශේෂ හඳුනාගැනීම | MoE, DNBG, | MoWL&FC,FD, DWC, CC&CRMD, CEA, MEPA, DNM, ශාස්ත්‍රඥයන්, පෞද්ගලික අංශය NGOs, CBOs | විද්‍යාත්මක ක්‍රම මගින් දේශගුණ විපර්යාසවලින් අවදානමට ලක්ව ඇති ජීවී විශේෂ පිළිබඳ යාවත්කාලීන කළ ලැයිස්තුවක් හඳුනාගැනීම | | දේශගුණ විපර්යාසවලින් අවදානමට ලක්ව ඇති ජීවී විශේෂ (සතුන් හා ශාක) පිළිබඳ MoE (BDS) වාර්තාව | පවත්නා ජාතික රතු ලැයිස්තුව | දේශගුණ විපර්යාස නිසා බලපෑමට ලක්ව ඇති ශාක හා සතුන් පිළිබඳ සවිස්තර ලැයිස්තුවක් සකස් කර ඇත | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 15.1 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.4 ඉහත 1.1. සහ 1.3 හි හඳුනාගත්, වැඩිම අවදානමට ලක්ව ඇති ජීවී විශේෂ සම්බන්-ධයෙන් පර්යේෂණ සහ අධ්‍යයන සිදුකිරීමට දිරිගැන්වීම | MoWL&FC, DNBG | MoE, DWC, FD, NRC, NSF, CARP, NARA, MoSTR, ශාස්ත්‍රඥයන්, ස්වාධීන පර්යේෂණ කණ්ඩායම් | විද්‍යාත්මක ප්‍රකාශන ගණන, පර්යේෂණ ව්‍යාපෘති ගණන | | ප්‍රකාශිත පර්යේෂණ පත්‍රිකා, ප්‍රතිසාධන සැලසුම් | පර්යේෂණ කටයුතු අංශ කීපයකි-න් යුතුය. ඒවා නම් - DNBG ව්‍යාපෘති 3+ DNBG ප්‍රතිසාධන සැලසුම් 2, සහ ශාස්ත්‍රඥයන් විසින් සිදුක-රන එහෙත් දේශගුණ විපර්යාස යටතේ නොගැනෙන | හඳුනාගත් අවදා-නමක් ඇති පරිසර පද්ධතිවල දීර්ඝ කාලීන පර්යේෂණ ව්‍යාපෘති සිදුකෙරේ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 15.1, 15.4 |
| 1.5: දේශගුණය හේතුවෙන් ජීවී විශේෂවල සහ වාසභූමිවල ඇතිවන වෙනස්වීම් හඳුනාගැනීම සඳහා දේශගුණ සංවේදී ප්‍රදේශවල දීර්ඝ-කාලීන අධීක්ෂණ ස්ථාන සහ යාන්ත්‍රණ ඇතිකිරීම | MoWL&FC, DNBG | MOE (CCS, BDS), FD, DWC, CC&CRMD, CEA, MEPA, NARA, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන හා පෞද්ගලික අංශයේ ආයතන | 1. දේශගුණ විපර්යාසයෙන් අවදානමට ලක්ව ඇති ජීවී විශේෂ සඳහා වූ අධීක්ෂණ සැලසුම් ගණන<br>2. යෝග්‍ය යාන්ත්‍රණ සහිතව දීර්ඝ කාලීනව අධීක්ෂණයට ලක් කරනු ලබන ස්ථාන | | MoWL&FC වාර්තාව | සිංහරාජයේ 3ක් - මහාචාර්ය ගුණතිලක, මහාචාර්ය සිංහකුමාර - පියකැලේ, වලන්කන්ද ඇන්දාන වත්ත, FD මගින් සලකුණු කරන ලද ස්ථාන 4500, - අනාගත පර්යේෂණ සඳහා දේශගුණ අවදානම හඳුනාගත යුතුය. | යෝග්‍ය යාන්ත්‍රණයක් සහිතව දීර්ඝකාලීන වශයෙන් අධීක්ෂණය කරනු ලබන ස්ථාන සියලු දේශගුණ කලාප ආවරණය වන ලෙස ස්ථාපිත කර ඇත | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 15.1, 15.4 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ජාතික උද් භිද උද්‍යානය හම්බන්තොට, මිරිජ්ජවිල පර්යේෂණ ස්ථානය, පුනර්ජනන ස්ථානය | | | | | | | | | | | | |
| 1.6 ඉහත (1.2 හිදී) හඳුනාගත් හායනය වූ භෞමික සහ වෙරළබඩ සහ සමුද්‍රීය වාසභූමි ඇතුළු තෙත්බිම් ප්‍රදේශවලින් අවම වශයෙන් 25%ක ප්‍රදේශයක් වර්තමාන භූමි ප්‍රදේශය මත පදනම් වෙමින්, ජෛව විවිධත්ව වටිනාකම, පරිසර පද්ධති වටිනාකම, සහ දේශගුණ වෙනස්වීම නිසා පත්ව ඇති අවදානම අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලින්, ප්‍රතිස්ථාපනය කිරීම | MoWL&FC | MoE (CCS, BDS), FD, DWC, CC&CRMD, CEA, MEPA, NWPEA, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන හා පෞද්ගලික අංශය, IUCN, UN ආයතන | ප්‍රතිස්ථාපිත ප්‍රදේශයේ ප්‍රතිශතය | | MoWD&FC අධීක්ෂණ හා ප්‍රගති වාර්තා | 1.1 හා 1.2 සම්පූර්ණ වූ පසුව ප්‍රකාශයට පත් කෙරේ | 1.1 හා 1.2 ක්‍රියාකාරකම්වල දී හඳුනාගත් ප්‍රදේශයෙන් අවම වශයෙන් 25%ක් ප්‍රතිස්ථාපනය කෙරේ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 14.5, 15.1, 15.4 |
| 1.7 මීදුම් බාධක කලාපවල ස්වාභාවික පරිසර පද්ධතිය අවම වශයෙන් 25%ක් වත් ප්‍රතිස්ථාපනය කිරීම | MoWL&FC | MoE, FD, DWC, RPCs, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන | ප්‍රතිස්ථාපිත ප්‍රදේශයේ ප්‍රතිශතය | | M&E ප්‍රගති වාර්තා සහ DWC, FD වෙනත් වාර්තා | හායනයට ලක් වූ මීදුම් බාධක භූදර්ශනය හඳුනාගැනීම සම්පූර්ණ කළ පසුව ප්‍රකාශ කෙරෙනු ඇත. (ESA සිතියම්ගත කිරීම සිදුවේ. අවදානම් සිතියම්)<br><br>හෙක්. 19.5කින් Ulex ඉවත් කිරීම | 1.1 හා 1.2 දී හඳුනාගත් ප්‍රදේශයෙන් අවම වශයෙන් 25%ක් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 15.1, 15.4 |

**NDC 2 - වර්තමාන පුරෝකථනවලට අනුව, දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන වෙනස්වීම්වලට ලක්වනු ඇතැයි අපේක්ෂිත කලාපවල සම්බන්ධකතාවය, භූදර්ශන ප්‍රවේශය භාවිත කරමින් වර්ධනය කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: දේශගුණ සංවේදී ප්‍රදේශවල පිහිටා ඇති ගංගා ද්‍රෝණි භාවිත කරමින්, භූදර්ශන/ සමුද්‍රදර්ශන මට්ටමින් සම්බන්ධකතා පිවිසුම් හඳුනා ගැනීම සඳහා (ඉහත 1.2 පදනම් කරගෙන) ශක්‍යතා තක්සේරුවක් සිදුකිරීම | LUPPD | MoE (CCS හා BDS), FD, DWC, NARA, DAAD, SD, NWSDB, ID, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන | භූදර්ශන හා සමුද්‍රදර්ශන පිළිබඳ ශක්‍යතා තක්සේරු | | 2.2 හා 2.3 සඳහා වලංගුකරණය කළ වාර්තා හා සිතියම් සැකසීම | වනපිවිසුම් පිළිබඳ ශක්‍යතා සිදුකර ඇතත් ඒ දේශගුණ අවදානම සැලකිල්ලට ගෙන නොවේ | 1.2 හි හඳුනාගත් සියලු අවදානම් පරිසර පද්ධති සම්බන්ධව ශක්‍යතා අධ්‍යයන සිදුකර ඇත | | | √ | √ | | | | | | | 14.2, 14.5, 15.1, 15.4 |
| 2.2: ඉහත සඳහන් කළ ශක්‍යතා තක්සේරුව පදනම් කරගනිමින්, ඉන් හඳුනාගත් භූමි ප්‍රදේශයෙන් අවම වශයෙන් 25%ක් වත් ආවරණය වන සේ, වනපිවිසුම් ලෙස ක්‍රියාත්මක විය හැකි දේශගුණ අවදානමට ලක්ව ඇති ගංගාශ්‍රිත ප්‍රදේශ සහ ගංගාව තුළ පිහිටි ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීම | ID, MASL, FD | FD, DWC, CEA, LAs හා පෞද්ගලික අංශය | ප්‍රතිස්ථාපනය කළ ප්‍රදේශයේ ප්‍රතිශතය | | ID, MASL, FD වාර්තා | 0 (2.1 සම්පූර්ණ කළ පසු සිදුකෙරේ)<br><br>DWC මගින් විල්පත්තුවට උතුරින් මොල්ලිකුලම හා කල්ආරු හා හුන්ගම අලි පිවිසුම | හඳුනාගත් ප්‍රදේශවලින් අවම වශයෙන් 25%ක් ප්‍රතිස්ථාපනය කර ඇත | | | | | √ | √ | √ | √ | √ | √ | 13, 14.2, 15.1, 15.2, 15.4 |
| 2.3: ජෛව විවිධත්ව වනපිවිසුම් වශයෙන් ක්‍රියාකිරීම සඳහා එවැනි වනපිවිසුම්වල සඵලත්වය අධීක්ෂණය කිරීම සහ සචලත්වය වැඩිදියුණු කිරීම සඳහා අනුහුරුවීමේ වෙනස්කම් සිදුකිරීම | ID, MASL, FD | DWC, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන හා පෞද්ගලික අංශය | හඳුනාගත් වනපිවිසුම් හා ජීවී විශේෂ අධීක්ෂණය හා වනපිවිසුම් භාවිත කරන සතුන් ගණන | | M&E ජෛව විවිධත්ව වාර්තා හා නිර්දේශ<br><br>FD, DWC වාර්තා | 0 | හඳුනාගත් සියලු වනපිවිසුම් අඛණ්ඩව අධීක්ෂණය කරයි | | | | | √ | √ | √ | √ | √ | √ | 13, 14.2, 15.1, 15.2, 15.4 |

**NDC 3 - දේශගුණ විපර්යාස සඳහා ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකිරීමට ආරක්ෂිත ප්‍රදේශ ජාලයට ඇති හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ආරක්ෂිත ප්‍රදේශවල භූමි ප්‍රමාණය ව්‍යාප්ත කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: දේශගුණ සංවේදී ප්‍රදේශ තුළ ඇති පරිසර විද්‍යාත්මකව/ පාරිසරිකව සංවේදී, දැනට පවතින ආරක්ෂිත ප්‍රදේශ සමඟ ඒකාබද්ධ කළහැකි ප්‍රදේශ (1.2 පදනම් කරගනිමින්) හඳුනාගැනීම | MoWL&FC, CEA, NWPEA | MoE (BDS, Env Eco), FD, DWC, NWPEA, LUPPD, LRC, SD, CC&CRMD, ශාස්ත්‍රඥයින්, පර්යේෂණ ආයතන, පෞද්ගලික අංශය, NGOs, CBOs | හඳුනාගත් ප්‍රදේශ පවත්නා ආරක්ෂිත ප්‍රදේශ ජාලයට ඇතුළත් කිරීම | | තක්සේරු වාර්තා | පරිසර සංවේදී ප්‍රදේශ 5ක් දැනටමත් හඳුනාගෙන ඇත. මීට කඩොලාන හෙක්ටයාර් 18,000ක් ඇතුළත්ය | හඳුනාගත් සියලු ප්‍රදේශ ආරක්ෂිත ප්‍රදේශ කරනු ඇත | | | | √ | √ | √ | √ | √ | | | 13.1, 14.2, 15.1, 15.4 |
| 3.2: එසේ හඳුනාගත් ප්‍රදේශ, දැනට පවතින ආරක්ෂිත ප්‍රදේශ සමඟ ඒකාබද්ධ කිරීම/ විධිනියමලත් ආයතන යටතේ නව ආරක්ෂිත ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම | MoWL&FC, CEA, NWPEA | MoE (BDS, Env Eco), FD, DWC, LUPPD, LRC, SD, CC&CRMD, ශාස්ත්‍රඥයින්, පර්යේෂණ ආයතන, පෞද්ගලික අංශය, NGOs, CBOs | ප්‍රකාශයට පත් කරන ලද ස්ථාන ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කිරීම | | FD, DWC, CC&CRMD වාර්තා | 0 | හඳුනාගත් සියලු ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සිදුකෙරේ. ප්‍රමාණය සඳහන් කළ නොහැක්කේ එය සිදුකරනු ඇත්තේ අවශ්‍යතාවය මත බැවිනි. විශාල ප්‍රදේශ නොමැති විය හැකි නමුත් මිරිස්ස, තලවිල අභයභූමිවලට යාබද ප්‍රදේශ DWC මගින් අනාගතයේදී ප්‍රකාශයට පත් කරනු ඇත. | | | | | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 15.1, 15.4, 15.9 |

## NDC 4 - දේශගුණ විපර්යාස නිසා අවදානමට ලක්ව ඇති තක්සෝන සහ කලාප ආවරණය කරන විතැන් සංරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1: දේශගුණ අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල ශාක විතැන් සංරක්ෂණය කිරීම සඳහා අවම වශයෙන් ස්ථාන දෙකක් (උද්භිදඋද්‍යාන සහ වෘක්ෂෝද්‍යාන) වර්ෂ 5ක් තුළ ස්ථාපිත කිරීම | DNBG | FD, DWC, LAs, LRC, PGRC, වෘක්ෂෝද්‍යාන | උද්භිද උද්‍යාන ස්ථාපිත කිරීම | | DNBG වාර්තා | පවත්නා පහසුකම් 6කි (පේරාදෙණිය, හක්ගල, ගම්පහ, අවිස්සාවේල්ල, හම්බන්තොට, ගනේවත්ත) පින්නදූව ඉඩම් අත්පත් කරගැනීම සිදුවේ) ඖෂධ පැළෑටි උද්‍යාන 1 | ශාක විතැන් සංරක්ෂණය සඳහා පහසුකම් 2ක් ස්ථාපිත කර ඇත. | | | | | √ | | | | | | 13.1, 14.2, 15.1, 15.4 |
| 4.2: දේශගුණ අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල සත්ත්ව වර්ග විතැන් සංරක්ෂණය කිරීම සඳහා අවම වශයෙන් ස්ථාන දෙකක් (විතැන් සංරක්ෂණ මධ්‍යස්ථාන) වර්ෂ 5ක් තුළ ස්ථාපිත කිරීම | DNZG | MoWL&FC, DWC, ශාස්ත්‍රඥයින්, පර්යේෂණ ආයතන | විතැන් පහසුකම් | | DNZG, DWC වාර්තා | 3 (සෆාරි උද්‍යාන - රිදියගම, ගෝනගල ගොවිපොළ, දෙහිවල, පින්නවල සංරක්ෂණ මධ්‍යස්ථානය) | විතැන් සංරක්ෂණ පහසුකම් 2ක් ස්ථාපිත කර තිබීම (කඳුකර+අතරමැදි) | | | √ | √ | √ | √ | √ | | | | 13.1, 14.2, 15.1, 15.4 |
| 4.3: දේශගුණ සංවේදී හෝ තර්ජනයට ලක් වූ ශාක සහ සතුන් පරිස්ථාපනය/ නැවත හඳුන්වාදීම සඳහා සහායවන යාන්ත්‍රණයක් ඇති කිරීම | MoWL&FC | DWC, FD DNZG, NARA, DNBG, MASL, ID, IUCN, ශාස්ත්‍රඥයින්, පර්යේෂණ ආයතන | දේශගුණ සංවේදී හෝ තර්ජනයට ලක් වූ ශාක සහ සතුන් පරිස්ථාපනය/ නැවත හඳුන්වාදීම සඳහා සහායවීමට යාන්ත්‍රණයක් | | DWC , DNBG වාර්තා | දේශගුණ සංවේදී හෝ තර්ජනයට ලක් වූ ශාක සහ සතුන් පරිස්ථාපනය සිදුකර නැතත්, සංවර්ධන | යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත | | | √ | √ | √ | √ | √ | | | | 13.1, 14.2, 15.1, 15.4 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ව්‍යාපෘති-වලට අදාළව ඒ ජීවීන්ගේ සංරක්ෂණ තත්ත්වය මත කටයුතු සිදුකර ඇත.<br><br>FD යටතේ ඇති යෝග්‍ය වාසස්ථා-නවලට *Alphonsea hortensis* නැවත හඳුන්වාදීම<br><br>මොරගහකන්ද ව්‍යාපෘතියේ DWC මගින් සිදුකර ඇත.<br><br>තර්ජනයට ලක්ව ඇති/ ආසන්න තර්ජිත ජීවී විශේෂ FD මගින් නැවත හඳුන්වාදීම සිදුකරයි. (දළ වශයෙ-න් වර්ෂයකට 3ක්), යාන් ඔය, වයඹ පළාත් ඇළ මාර්ගය, ඉහළ කොත්මලේ (රාවනා), ඉහළ ඇලහැර | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.4: විතැන් සංරක්ෂණ මධ්‍යස්ථාන සඳහා නව පශුවෛද්‍ය/ වසංගත අධ්‍යයන ඒකක තුනක් හඳුන්වාදීම | DWC, VRI, DNZG | DWC, NARA, DAPH, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන | පහසුකම් හඳුන්වාදීම | | VRI, DWC, DNZG වාර්ෂික වාර්තා | ගිරිතලේ, හියාරේ සංරක්ෂණ මධ්‍යස්ථාන, DWC (බෙල්ල න්විල)<br><br>සත්වෝ ද්‍යාන 3ට නව රෝහල් ඇත | පහසුකම් 3ක් හඳුන්වාදීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 15.1, 15.4 |
| 4.5: ජාතික සත්ත්වෝද්‍යානවල. ජාතික උද්භිද උද්‍යානවල සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ (PGRC) ජාන බැංකු සං-වර්ධනය කිරීම | DNBG, DNZG, VRI | PGRC, NARA, ශාස්ත්‍රඥයන්, පර්ය-ේෂණ ආයතන | ජාන බැංකු (ශාක හා සත්ත්ව)<br><br>ප්‍රවේශ සංඛ්‍යාව<br><br>ජීවී විශේෂ ගණන, උප විශේෂ ගණන | | PGRC, DNBG, DNZG දත්ත සමුදාය | DNA බැංකුව - ශාකාගාරය, PGRC | ජාතික සත්වෝද්‍යානවල, ජාතික උද්භිද උද්‍යා-නවල හා පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ (PGRC) ජාන බැංකු සංවර්ධනය/ උත්ශ්‍රේණිගත කිරීම | | | | | | | | √ | √ | √ | 13, 14.2, 15.1, 15.4 |

## NDC 5 - යෝග්‍ය දේශගුණ තත්ත්ව යටතේ වේගයෙන් ව්‍යාප්ත විය හැකි ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ පැතිරයාම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1: පරාස ව්‍යාප්තියක් සිදුවීමට ඉඩ ඇති ආක්‍රමණික ආගන්තුක විශේෂ මොනවාද යන්න සහ දේශගුණ විපර්යාස හා මානවකෘත ක්‍රියාකාරකම් මගින් පරාස ව්‍යාප්තියක් සඳහා පහසුකම් සැලසෙනු ඇත්තේ කුමන ආක්‍රමණික ආගන්තුක විශේෂවලට ද යන්න හඳුනාගැනීම සඳහා දැනට පවතින ආක්‍රමණික ආගන්තුක විශේෂ ව්‍යාප්ති සිතියම් මත පදනම් වී ලේඛන තක්සේරුවක් සිදු කිරීම | MoE (BDS) | DoA, National HerbariumNH), FD, DWC, NARA, MEPA, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන | තක්සේරු වාර්තා | | MoE (BDS) තක්සේරු වාර්තා | ව්‍යාප්ති සිතියම් BDS සතුව තිබේ | ලේඛන තක්සේරුවක් සම්පූර්ණ කිරීම | | | √ | √ | | | | | | | 13.1, 14.2, 15.1, 15.4, 15.8 |
| 5.2: දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවිය හැකි ජෛව විද්‍යාත්මක ආක්‍රමණවලට ඔරොත්තුදීම සඳහා පරිසර පද්ධතිවල ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම සඳහා 5.1 හි හඳුනාගත් මූලික අංශවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | MoE (BDS) | MoSTR, DoA, FD, DWC, LAs, CEA, NWPEA, ශාස්ත්‍රඥයන්, පර්යේෂණ ආයතන | පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | | MoE (BDS) ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගති වාර්තාව | 0 | වැදගත් ප්‍රදේශවල පවත්වනු ලැබූ වැඩසටහන් (5.1හි හඳුනාගත්) | | | | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 14.2, 15.1, 15.4, |

## 4.7 වෙරළබඩ හා සමුද්‍රීය අංශය

ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය රටේ සමාජ, පාරිසරික, සංස්කෘතික සහ ආර්ථික සංවර්ධනයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙරට වෙරළ තීරයේ දිග කිලෝමීටර් 1,790 කට ආසන්න වන අතර, එමගින් වර්ග කි.මී 230,000ක සාගර ආර්ථික කලාපයක් ලැබේ[56]. සුවිශේෂ පරිසර විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක විවිධත්වයකින් යුක්ත වෙරළබඩ පරිසරයක් මෙම වෙරළ තීරයේ දැකිය හැකිය. කඩොලාන, ලවණ වගුරු බිම්, වැලි වැටි, වෙරළ සහ වෙරළබඩ තෙත්බිම් ඇතුළු ඉතා වැදගත් පරිසර පද්ධති මෙම වෙරළ ප්‍රදේශයේ දැකිය හැකිය. මානවකෘත ක්‍රියාකාරකම් මගින් උග්‍රවන දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් මෙම සියලු පරිසර පද්ධතිවලට විවිධ මට්ටම්වලින් බලපෑම් කිරීමට ඉඩක් පවතී. ඒ අතර ජීව විද්‍යාත්මක සමතුලිතතාවයට සහ වෙරළබඩ යටිතල ව්‍යුහයන්ට අවදානමක් ඇති කරන ජලයෙන් යටවීම, වෙරළ ඛාදනය, වෙරළබඩ ගංවතුර සහ මෝය සහ ජලධරවල ලවණතාව වැනි බලපෑම් ප්‍රමුඛය. ධීවර කර්මාන්තය සහ වෙරළ ආශ්‍රිත සංචාරක කර්මාන්තය රටේ ආර්ථිකයට අත්‍යාවශ්‍ය අංශ වේ. වෙරළ තීරයේ ක්‍රියාත්මක සංචාරක ව්‍යාපාරයට ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ ක්‍රීඩාව, සමුද්‍ර ක්ෂීරපායින් නැරඹීම, යාත්‍රා කිරීම, විවිධ වර්ගයේ කිමිදීම් කටයුතු, බෝට්ටු පැදීම සහ විනෝදාත්මක ක්‍රීඩා, හිරු රැස් නෑම සහ නොගැඹුරු පර සහිත ප්‍රදේශයේ කැස්බෑවන් නැරඹීම වැනි ක්‍රියාකාරකම් ඇතුළත් වේ. ඇස්තමේන්තු අනුව, වෙරළාශ්‍රිත සංචාරක කර්මාන්තය මෙම අංශයේ සමස්ත අලෙවි ආදායමෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් ජනනය කරන අතර, පුළුල් පරාසයක අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරයි. සාගරයේ සිට කිලෝමීටර් 50 ක් පමණ අභ්‍යන්තරයට විහිදෙන වෙරළබඩ කලාපය මෙරට මුළු භූමි ප්‍රමාණයෙන් දළ වශයෙන් 23% ක් ආවරණය කරන අතර, රටේ ජනගහනයෙන් 25% කට වැඩි ජනගහනයක් මේ ප්‍රදේශයේ වාසය කරයි. මෙරට කර්මාන්ත හා සංචාරක ආකර්ෂණවලින් සැලකිය යුතු කොටසක් වෙරළබඩ කලාපයේ පිහිටා ඇති අතර, එය රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 40% ක් පමණ ප්‍රමාණයකට දායක වේ[57].

වෙරළ කලාප කළමනාකරණය සඳහා පදනම සහ මාර්ගෝපදේශ මූලධර්ම සපයන 1997 වර්ෂයේ වෙරළ කලාප කළමනාකරණ සැලසුම, 2004, 2016 සහ 2018 වර්ෂවල දී සංශෝධනය කර යාවත්කාලීන කරන ඇත. එය වෙරළ තීරය කළමනාකරණය, වෙරළ දූෂණය පාලනය, වෙරළබඩ වාසස්ථාන කළමනාකරණය සහ සංරක්ෂණය, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සහ නියාමන යාන්ත්‍රණය යන කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

වෙරළ සංරක්ෂණය සඳහා වන ප්‍රධාන නීති රාමුව සමන්විත වන්නේ 2016 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සහ එහි නියෝග (රෙගුලාසි), 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත, එහි සංශෝධන/ වෙරළ සංරක්ෂණ නියෝග (රෙගුලාසි) සහ 2006 අක 35 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත හා එහි සංශෝධන, සහ සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ නියෝගවලිනි. 2011 වර්ෂයේ දී වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කර වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත ලෙස නම් කරන ලදි.

එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියට අනුව, ශ්‍රී ලංකාව සැලකිය යුතු අමතර මුහුදු ප්‍රදේශයකට හිමිකම් කීමේ ක්‍රියාවලියේ මේ වන විට නිරතව සිටී. එමගින් රටේ ආර්ථික අවස්ථා වැඩි වනු ඇත.
2021 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සිදුවූ "එක්ස්ප්‍රස් පර්ල්" නම් භාණ්ඩ ප්‍රවාහන නෞකාවේ අනතුර ලෝකයේ විශාලතම ප්ලාස්ටික් සමුද්‍ර දූෂණයට වගකිව යුතු බව ව්‍යසනයෙන් සිදු වූ හානිය තක්සේරු කරන කමිටුව පෙන්වා දී ඇත. පාරිසරික තත්ත්ව පිළිබඳ මූලික පදනමක් නොමැති වීම එම පාරිසරික තක්සේරුව සිදු කිරීමේදී විශාල අභියෝගයක් වී තිබේ. මෙම ව්‍යසනය සඳහා ශ්‍රී ලංකාවට ලැබිය යුතු වන්දි මුදල් තවමත් නොලැබීම සඳහා ද ඒ තත්ත්වය ප්‍රධාන හේතුවකි[58].

56 Department of Census and Statistics, Sri Lanka, http://www.statistics.gov.lk/abstract2021/CHAP1
57 Annual Report 2021, Central Bank, Sri Lanka
58 https://news.mongabay.com/2022/06/a-year-since-x-press-pearl-sinking-sri-lanka-is-still-waiting-for-compensation/ (Accessed on 2 April 2023)

දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා වූ වෙරළබඩ සහ සමුද්‍රීය අංශයේ ප්‍රමුඛතා NDC හතරක් යටතේ ස්ථාපිත කර ඇත (4-7 වගුව). ඒ මූලික වශයෙන් දේශගුණ විපර්යාස සහ විචල්‍යතා නිරීක්ෂණය සහ විසඳුම් සෙවීම සඳහා තාක්ෂණික කුසලතා සහ යාන්ත්‍රණ සංවර්ධනය කිරීම මගිනි. මුහුදු මට්ටම ඉහළ යාම පුරෝකථනය කිරීම සඳහා විශ්වසනීය ක්‍රමවේදයක් සකස් කිරීම, අවදානම් සහ අවදානම් සිතියම් යාවත්කාලීන කිරීම, වෙරළ තීරය කළමනාකරණ ප්‍රයත්න වේගවත් කිරීම සහ විවෘත වෙරළබඩ ස්ථානවල ඇති විශේෂ ස්වාභාවික ප්‍රදේශ ආරක්ෂා කිරීම මීට ඇතුළත් ය. උදාහරණයක් ලෙස කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීම මගින් ජෛව විවිධත්ව අංශයට අදාළව අනුහුරුවීමේ ප්‍රතිලාභ ද, වනාන්තර අංශය යටතේ හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ප්‍රතිලාභ ද ඇත.

4-7 වගුව වෙරළබඩ හා සමුද්‍රීය අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | මුහුදු මට්ටම ඉහළ යාම නිවැරදිව පුරෝකථනය කිරීමේ පද්ධතියක් ශ්‍රී ලංකාව සඳහා ස්ථාපිත කිරීම |
| 2 | ශ්‍රී ලංකාවේ වෙරළ තීරය සඳහා අවදානමට ලක් විය හැකි බව සහ අවදානම් පිළිබඳ යා-වත්කාලීන කළ සිතියම් සකස් කිරීම |
| 3 | මුහුදු මට්ටම ඉහළ යාම නිසා වැඩි අවදානමකට ලක්ව ඇති ප්‍රදේශවල වෙරළ ඛාදනය වැලැක්වීම සඳහා දැඩි සහ සුමට විසඳුම් සහිත මිශ්‍ර ක්‍රමයක් භාවිතයෙන් බලපෑමට ලක්වූ වෙරළ තීරය ආවරණය කිරීමට ප්‍රශස්ත වෙරළ තීර කළමනාකරණ කටයුතු/ පියවර අනුගමනය කිරීම |
| 4 | දේශගුණ විපර්යාසවල බලපෑම්වලට ඔරොත්තු දීම ගොඩනැංවීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු වෙරළබඩ සහ සමුද්‍රීය ස්වාභාවික ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම |

## 4.7.1 වෙරළබඩ හා සමුද්‍රීය අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - මුහුදු මට්ටම ඉහළ යාම නිවැරදිව පුරෝකථනය කිරීමේ පද්ධතියක් ශ්‍රී ලංකාව සඳහා ස්ථාපිත කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1. ඓතිහාසික උදම් මට්ටම් දත්ත යොදාග නිමින්, අවශ්‍ය කරන දත්තසමුදාය ස්ථාපිත කර ගැනීම | NARA | CC&CRMD, SD, DMC, MD, SLN, SLPA | දත්තසමුදාය ස්ථාපිත කිරීම සඳහා ගතවන කාලය | | NARA වාර්තා | ජාතික මට්ටමේ දත්ත සමුදායක් නොපවතී (කෙසේ වෙතත් විවිධ ආයතන සතුව විසිරුණු දත්ත පැවතිණි) | 2022 දක්වා ඓතිහාසික උදම් මට්ටම් දත්ත සහිත උදම් දත්තසමුදාය-ක් 2023 දී ප්‍රකාශ-යට පත් කිරීම හා වාර්ෂිකව යා-වත්කාලීන කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | | 11.5, 11.b, 13.1, 14,a |
| 1.2. වර්තමාන මධ්‍යන්‍ය මුහුදු මට්ටම (MSL) මැන වාර්තා කරගැනීම සහ මුහුදු මට්ටම ඉහළයාමේ මිනුම් තක්සේරු කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 1.2.1. වර්තමාන මධ්‍යන්‍ය මුහුදු මට්ටම මැනීම හා වාර්තාකිරීම | SD | CC&CRMD, DMC, MD, SLPA, SLN, NARA | වර්තමාන මධ්‍යන්‍ය මුහුදු මට්ටම මැන වාර්තා කරනු ලබන ස්ථාන ප්‍රතිශතය | | SD වාර්තා | 0% (කෙසේ වෙතත්, මධ්‍යන්‍ය මුහුදු මට්ට-මේ පෙර ලබාගත් දත්ත ඇත) | 100% (සියලු ස්ථානවල සංශෝධිත මධ්‍යන්‍ය මුහුදු මට්ටම් සහිතව) | √ | √ | √ | | | | | | | | 11.5, 11.b, 13.1, 14,a |
| 1.2.2. මුහුදු මට්ටමේ ඉහළ යෑමේ මිනුම් තක්සේරු කර ප්‍රකාශයට පත් කිරීම | CC&CRMD | SD, DMC, MD, SLPA, SLN, NARA | වර්තමාන මුහුදු මට්ටම තක්සේරු කර වාර්තා කරනු ලබන ස්ථාන ගණනේ ප්‍රතිශතය | | CC&CRMD වාර්තා | 0% (කෙසේ වෙතත්, මුහුදු මට්ටම ඉහළ යෑමේ පෙර ලබාගත් වාර්තා හා සිතියම් ඇත) | 100% (සියලු ස්ථානවල සංශෝධිත මුහුදු මට්ටම ඉහළ යෑමේ දත්ත සහිතව) | | | | √ | √ | √ | √ | √ | √ | √ | 11.5, 11.b, 13.1, 14,a |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.3. මුහුදු මට්ටම මැනීම සඳහා දැනට ඇති මැනුම් ස්ථානවලට අමතරව ශ්‍රී ලංකාවේ වෙරළතීරය ආවරණය වන සේ මිනුම් ස්ථාන ඇතිකළ හැකි ස්ථාන හඳුනාගැනීම සහ ඒවා ස්ථාපිත කිරීම | NARA | CC&CRMD, SD, DMC, MD, SLN, SLPA | අතිරේක/උපස්ථ උදම් මිනුම් ස්ථාන සංඛ්‍යාව | | CCහා CRMD, SLPA හා SLN වාර්තා | වර්තමාන ස්ථාන 7 | නව ස්වයංක්‍රීය ස්ථාන තුනක් උපස්ථ ස්ථාන සහිතව හා පවත්නා සියලු ස්ථාන සඳහා උපස්ථ ස්ථාන 7ක් | √ | √ | √ | √ | √ | | | | | | 11.5, 11.b, 13.1, 14,a |
| 1.4. ගෝලීය යහපිළිවෙත් භාවිත කරමින් ශ්‍රී ලංකාවට අදාළව මුහුදු මට්ටම ඉහළ යෑමේ පුරෝකථන ගණනය කිරීම | NARA | CC&CRMD, SD, DMC, MD, SLN, SLPA, ශාස්ත්‍රඥයන් | මුහුදු මට්ටම ඉහළ යෑම ගණනය කිරීමට යොදාගන්නා ස්ථාන සංඛ්‍යාව | | IPCC වාර්ෂික වාර්තා | 2016 සිට මුහුදු මට්ටම ඉහළ යෑම NARA මගින් ගණනය කරන අතර, අද දක්වාම අඛණ්ඩව සිදු කර තිබේ | 10 | | | √ | √ | √ | √ | | | | | 11.5, 11.b, 13.1, 14,a |

| NDC 2 - ශ්‍රී ලංකාවේ වෙරළ තීරය සඳහා අවදානමට ලක් විය හැකි බව සහ අවදානම් පිළිබඳ යාවත්කාලීන කළ සිතියම් සකස් කිරීම | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1. ඉහත 1.1 දැක්වෙන මුහුදු මට්ටම ඉහළයාම පිළිබඳ පුරෝකථන අනුව වෙරළබඩ ප්‍රදේශ ආවරණය වන අන්දමින් ජලගැල්ම සිතියම් යාවත්කාලීන කිරීම | CC&CRMD | NARA, SD, DMC, UDA, ID, DS, ශාස්ත්‍රඥයන් | ජලගැල්ම සිතියම් මගින් ආවරණය වන වෙරළ තීරයේ ප්‍රතිශතය | | DMC ක්ෂේත්‍ර දත්ත හා පළාත්ප-ාලන ආයතනවල ක්ෂේත්‍ර වාර්තා | 0% | 100% | | | √ | √ | √ | | | | | | 11.5, 11.b, 13.1, 14,a |
| 2.2. මුහුදු මට්ටම ඉහළ යෑමෙන් අවදානමට ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම | CC&CRMD | NARA, SD, DMC, UDA, ID, DS, ශාස්ත්‍රඥයන් | ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | | DMC දත්ත හා සිතියම් | නැත | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 74ම සඳහා | √ | √ | √ | √ | | | | | | | 11.5, 11.b, 13.1, 14,a |
| 2.2.1. අවදානමට ලක්විය හැකි ප්‍රජාව වාසය කරන ස්ථාන හඳුනාගෙන ඒ ප්‍රමාණය අඩු කිරීමට පියවර ගැනීම | DS | NARA, SD, DMC, UDA, ID, NPPD, CC&CRMD, ශාස්ත්‍රඥයන් | 1. ග්‍රාම නිලධාරී කොට්ඨාස අනුව ස්ථාන ගණන<br>2. අවදානමට ලක්ව ඇති පවුල්වලින් නැවත පදිංචි කළ ප්‍රතිශතය | | CC&CRMD and DMC වාර්තා | මූලික දත්ත ලබාගත යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | | | | | | 11.5, 11.b, 13.1 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.2.2. අවදානමට පාත්‍රවිය හැකි ප්‍රදේශයේ නව ජනාවාස ඇති වීම වැළැක්වීම | NPPD | LAs, UDA, NARA, SD, DMC, DS, CC&CRMD | 1. නව ජනාවාස ඇතිවීම වැළැක්වීම සඳහා නියාමනය<br><br>2. නව ජනාවාස ඇති වීම වැළැක්වීම සඳහා කළ මැදිහත්වීම් ගණන | | NPPD, CC&CRMD හා DMC වාර්තා | 1. නියෝග (රෙගුලාසි) නැත.<br><br>2. මැදිහත්වීම් නැත. | 1. නව ජනාවාස පිහිටුවීම වැළැක්වීමට නියෝග (රෙගුලාසි) පැනවීම<br><br>2. ඉලක්කය ස්ථාපිත කළ යුතුය | | | √ | √ | √ | | | | | | 11.5, 11.b, 13.1 |
| 2.3. වෙරළබඩ කලාපය සඳහා මී. 0.5 සමෝච්ච රේඛා අන්තර ඇතිව මුහුදු මට්ටම ඉහළ යෑමෙන් ඇතිවිය හැකි බලපෑම් සහිත අවදානම් සිතියම් සකස් කිරීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම | DMC | SD, NARA, UDA, ID, DS, CC හා CRMD, ශාස්ත්‍රඥයන් | අවදානම් සිතියම් මගින් ආවරණය කරන ප්‍රදේශය | | SD, DMC සිතියම් | ආපදා සිතියම් සමහරක් පවතී, එහෙත් වලංගුකරණය කර නැත | 100% | | | | | √ | √ | √ | | | | 13.1, 13.2 |
| 2.3.1. මී. 0.5 සමෝච්ච රේඛා අන්තර ඇතිව වෙරළබඩ කලාපය සඳහා අවදානමට ලක්විය හැකි බව පිළිබඳ දත්තසමුදායයන් සකස් කිරීම | SD | NARA, DMC, UDA, ID, DS. CC හා CRMD, ශාස්ත්‍රඥයන් | අවදානමට ලක්විය හැකි බව පිළිබඳ දත්ත සමුදායයන්ගෙන් ආවරණය වන ප්‍රදේශයේ ප්‍රතිශතය | | අදාළ ආයතනවල වාර්තා | දත්ත සමුදායක් නැත. එහෙත් අවදානමට ලක්විය හැකි බව පිළිබඳ යම් තොරතුරු/ දත්ත පවතී | 100% (දත්ත සමුදායන් සම්පූර්ණ වෙරළ කලාපයම ආවරණය කරයි) | | | | √ | √ | | | | | | 13.1, 13.2 |
| 2.3.2. සමස්ත වෙරළ කලාපය සඳහාම ඩිජිටල් උන්නතාංශ ආකෘතියක් (DEM) ස්ථාපිත කිරීම | SD | NARA, DMC, UDA, ID, DS. CC හා CRMD, ශාස්ත්‍රඥයන් | DEM මගින් ආවරණය වන වෙරළ කලාපයේ ප්‍රතිශතය | | අදාළ ආයතනවල වාර්තා | 0% (DEM නැත) | 100% (DEM මගින් සම්පූර්ණ වෙරළ කාලපයම ආවරණය කෙරේ. | | | | √ | √ | | | | | | 13.1, 13.2 |
| 2.4. ඉහත 2.3 සිදු කළ සොයාගැනීම්, වෙරළබඩ කලාපයේ සංවර්ධනයට පවත්නා බාධක යාවත්කාලීන කිරීම සඳහා යොදාගැනීම | CC&CRMD | NARA, SD, DMC, UDA, ID, DS, ශාස්ත්‍රඥයන් | වෙරළ කලාප කළමනාකරණ සැලසුමට (CZMP) මුහුදු මට්ටම ඉහළ යෑම ඇතුළත් කරමින් යාවත්කාලීන කළ බාධක ප්‍රතිශතය | | CC&CRMD වාර්තා | 0% (යාවත්කාලීන කළ බාධක CAMP ඇතුළත් කළ යුතුය) | 100% (සමස්ත වෙරළ කලාපයම ආවරණය කරමින් මුහුදු මට්ටම ඉහළ යෑම ඇතුළත් කරමින් යාවත්කාලීන කරන ලද බාධක) | | | | | | √ | | | | | 11.5, 11.b, 13.1, 13.2 |

**NDC 3 - මුහුදු මට්ටම ඉහළ යාම නිසා වැඩි අවදානමකට ලක්ව ඇති ප්‍රදේශවල වෙරළ ඛාදනය වැලැක්වීම සඳහා දැඩි සහ සුමට විසඳුම් සහිත මිශ්‍ර ක්‍රමයක් භාවිතයෙන් බලපෑමට ලක්වූ වෙරළ තීරය ආවරණය කිරීමට ප්‍රශස්ත වෙරළ තීර කළමනාකරණ කටයුතු / පියවර අනුගමනය කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1. මුහුදු රළ මිනුම් සහ අවසාදිත පරිවහන අධ්‍යයනය ඇතුළුව අවශ්‍යකරන දීර්ඝකාලීන දත්ත එකතුකිරීම සඳහා වැඩසටහන් ආරම්භ කිරීම | CC&CRMD | NARA, SLPA, SLN, ශාස්ත්‍රඥයන් | වැඩසටහන්/ අධ්‍යයන ගණන | | CC&CRMD වාර්තා | ආරම්භ කර නැත | රළ මිණුම් හා අවසාධිත පරිවහන අධ්‍යයනය සම්පූර්ණ කර ඇත. | | √ | √ | √ | √ | √ | | | | | 13.1, 13.2 |
| 3.2. ඛාදන කළමනාකරණ සැලසුම යාවත්කාලීන කිරීම | CC&CRMD | NARA, ශාස්ත්‍රඥයන් | ඛාදන කළමනාකරණ සැලසුම යාවත්කාලීන කිරීම | | CC&CRMD වාර්තා | පවත්නා ඛාදන කළමනාකරණ සැලසුම - 1986 | ඛාදන කළමනාකරණ සැලසුම යාවත්කාලීන කර ඇත | √ | √ | √ | √ | √ | √ | | | | | 13.1, 13.2 |
| 3.3. වෙරළ ඛාදනය අධීක්ෂණය සඳහා (විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ ආයතන සමග සහයෝගීතාවයෙන්) වැඩසටහන් ඇතිකිරීම සහ පහත සඳහන් අංශවල දත්ත/ තොරතුරු එකතු කිරීමඃ වෙරළ ඛාදන නැඹුරුතා හා තත්ත්වය, අවසාදිත ශේෂ පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සහ අවසාදිත ප්‍රභව පිළිබඳ තක්සේරු, ඛාදනය හේතුවෙන් නිවාසවලට, ඉඩම් පරිහරණයට සහ ඉතා වැදගත් වාසභූමිවලට ඇතිවන තර්ජනය, අගාධමිතික සහ ජලවිද්‍යාත්මක තත්ත්ව | CC&CRMD | GSMB, NARA, SD, SLN CEA, ශාස්ත්‍රඥයන් | 1. පර්යේෂණ කරන අංශ<br>2. වර්ෂයකට ආරම්භ කළ සහයෝගීතා/ අධ්‍යයන ගණන | | CC&CRMD හා වෙනත් අදාළ ආයතනවල වාර්තා | 1. නැත<br>2. නැත | 1. පර්යේෂණ සිදුකරන අංශ 5ක් (වෙරළ ඛාදන නැඹුරුතා හා තත්ත්වය; අවසාදිත ශේෂ පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සහ අවසාදිත ප්‍රභව පිළිබඳ තක්සේරු; ඛාදනය හේතුවෙන් නිවාසවලට ඇතිවන තර්ජනය; ඉඩම් පරිහරණයට සහ ඉතා වැදගත් වාසභූමිවලට ඇතිවන තර්ජනය; අගාධමිතික සහ ජලවිද්‍යාත්මක තත්ත්ව)<br>2. වර්ෂයකට දෙක බැගින් | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1, 13.3, 13b, 14.2, 14a |
| 3.4. හෙක්ටාර 1000ක කඩොලාන ඇතුළු වෙරළබඩ පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය (මෙම ක්‍රියාමාර්ගය ජෛව විවිධත්ව අංශයේ පළමු NDC හි ඇතුළත් 1.6 ක්‍රියාමාර්ගය හා සම්බන්ධය) | CC&CRMD | LAs, NGOs, FD, DWC, CEA, MEPA, පෞද්ගලික අංශය NGOs, CBOs | වෙරළබඩ පරිසර පද්ධතිවල ප්‍රතිස්ථාපනය කළ හෙක්ටයාර ප්‍රමාණය | | CC&CRMD වාර්තා | හෙක් 100 | හෙක් 1,000ක කඩොලාන ආවරණය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.1 |

NDC 4 - දේශගුණ විපර්යාසවල බලපෑම්වලට ඔරොත්තු දීම ගොඩනැංවීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු වෙරළබඩ සහ සමුද්‍රීය ස්වාභාවික ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1. ඉහළ ප්‍රමුඛතාවයෙන් යුත් ස්වාභාවික ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට සුදුසු නිර්ණායක හා අපේක්ෂිත ස්ථාන ලැයිස්තුවක් සූදානම් කිරීම | CC&CRMD | MEPA, NARA, CEA, UDA, DWC, ශාස්ත්‍රඥයන් | ප්‍රකාශයට පත් කරන ලද අපේක්ෂිත ස්ථාන | | CC&CRMD වාර්තා | ස්ථාන දෙකක් (2020ට පෙර ස්ථාපිත) | තවත් ස්ථාන 10ක් අතිරේකව | √ | √ | √ | √ | √ | | | | | | 13.1, 13.2, 14.5, 14c |
| 4.2. එම ඉහළ ප්‍රමුඛතාවයෙන් යුත් ස්වාභාවික ප්‍රදේශ අවශ්‍ය පරිදි ගැසට් නිවේදන හරහා ප්‍රකාශයට පත් කිරීම | CC&CRMD | MEPA, NARA, CEA, UDA, DWC, ශාස්ත්‍රඥයන් | 1. ගැසට් කරන ලද නව ස්ථාන<br>2. සකස් කරන ලද නව කළමනාකර සැලසුම් ගණන | | CC&CRMD වාර්තා | මෙම ක්‍රියාකාරකම ආරම්භ කර නැත | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | | | 13.1, 13.2, 14.5, 14c |

## 4.8 සෞඛ්‍ය අංශය

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතියට කටු චිකිත්සාව, හෝමියෝපති ක්‍රමය, ආයුර්වේදය, යුනානි, සිද්ධ, බටහිර වෛද්‍ය විද්‍යාව සහ තවත් විවිධ වෛද්‍ය ක්‍රම ඇතුළත් වේ. බටහිර හෙවත් ඇලෝපති වෛද්‍ය විද්‍යාව මේවායේ ප්‍රමුඛ උප කුලකය වන අතර. එය ජනතාවගෙන් අති බහුතරයකගේ සෞඛ්‍යමය අවශ්‍යතා ඉටු කරයි. සියලුම පුරවැසියන්ට නොමිලේ සෞඛ්‍ය සේවාවක් ලබා දෙන විශ්වීය සෞඛ්‍ය සේවා පද්ධතියක් ශ්‍රී ලංකා රජය විසින් පවත්වාගෙන යන්නේ ජාතික ප්‍රමුඛතාවයක් ලෙසය. මීට අමතරව, ජනගාවගේ ආදායම් මට්ටම ඉහළ යාම සහ පෞද්ගලික සෞඛ්‍ය සේවාව සඳහා ඇති ඉල්ලුම හේතුවෙන් පෞද්ගලික රෝහල් සහ අනෙකුත් සෞඛ්‍ය පහසුකම් විශාල ප්‍රමාණයක් මේ වන විට මෙරට ක්‍රියාත්මක වේ. මහජන සෞඛ්‍ය අංශය එකිනෙකට සමාන්තර ප්‍රවාහ දෙකකට බෙදා ඇත: ඒ, (i) සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ වැළැක්වීම අවධාරණය කරන ප්‍රජා සෞඛ්‍ය සේවා, සහ (ii) ප්‍රාථමික සත්කාරයේ සිට විශේෂඥ සෞඛ්‍ය සේවා දක්වා විවිධ ආයතන මගින් සපයනු ලබන රෝග නිවාරණ සේවා යනුවෙන්[59] .

මෙරට මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය සෞඛ්‍ය සේවාවල සංවර්ධනය සහ නියාමනය අධීක්ෂණය කරන මූලික ආයතනය වේ. මීට අමතරව, සුදුසුකම් ලත් මානව සම්පත, ඖෂධ සැපයුමක් සහ යටිතල පහසුකම් සඳහා සිදුකරන සැලකිය යුතු ආයෝජන ඇතුළුව සෞඛ්‍ය අංශය සඳහා සම්පත් සැපයීම ද මෙම අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරයි. රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා සැපයීම විමධ්‍යගත කර ඇති අතර, පළාත් සෞඛ්‍ය බලධාරීන් විසින් තෝරාගත් විශේෂිත ඇලෝපති සෞඛ්‍ය ආයතනවල ප්‍රාථමික සත්කාර අධීක්ෂණය කරනු ලැබේ.

4-5 රූපය මගින් පෙන්වා දෙන්නේ මෙරට ජනගහනයෙන් දහසකට සිටින වෛද්‍යවරුන් හා හෙද-හෙදියන් හා වින්නඹු සේවා නිලධාරිනීන් ගණන 2004 සිට 2019 දක්වා කාලයේ දී වෙනස් වූ ආකාරයයි (දත්ත මූලාශ්‍රය[60]). සෞඛ්‍ය වියදම්වල ප්‍රභවය 4-6 (a) රූපය මගින් දැක්වෙන අතර, සාමාන්‍ය ඒක පුද්ගල සෞඛ්‍ය වියදම හා මුලු සෞඛ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස 4-6 (b) රූපය මගින් ද දැක්වෙයි.




4-5 රූපය ජනගහනයෙන් දහසකට සෞඛ්‍ය ශ්‍රම බලකායේ අනුපාතය[51]

59 Annual Health Bulletin (2019), Ministry of Health, Sri Lanka
60 WHO, Global Health Expenditure Database: https://apps.who.int/nha/database/country_profile/Index/en



ශ්‍රී ලංකාවේ ඉහළ තත්ත්වයේ සෞඛ්‍ය සේවා පද්ධතියක් පවතී. සහස්‍ර සංවර්ධන අභිමතාර්ථවල (MDGs) සෞඛ්‍යයට අදාළ අභිමතාර්ථ අත්පත් කරගැනීමේ දී ශ්‍රී ලංකාව මනාව කටයුතු කර තිබේ. වඩාත් මෑත කාලීන (2019) සංඛ්‍යාලේඛන අනුව, මෙරට තුළ රජයට අයත් රෝහල් 643ක් හා ඒ රෝහල්වල ඇඳන් 86,589ක් තිබේ. ජනගහනයෙන් 1,000ක් දෙනාට ඇති රෝහල් ඇඳන් ප්‍රමාණයේ සාමාන්‍යය 4ක් වන අතර, එහි වැඩිම අනුපාතය අගය වන 7.6 මන්නාරම දිස්ත්‍රික්කයෙන් ද, අඩුම අගය වන 2.5 අගය ගම්පහ, කළුතර හා පුත්තලම යන දිස්ත්‍රික්කවලින් ද වාර්තා වේ[61].




4-6 රූපය (a) සෞඛ්‍ය වියදමේ ප්‍රභව (b) ඒක පුද්ගල සෞඛ්‍ය වියදම (මූලාශ්‍ර: WHO)[3]

ශක්තිමත් සෞඛ්‍ය සේවා පද්ධතියක් තිබියදීත්, ශ්‍රී ලංකාවේ ළමුන් සහ කාන්තාවන් අතර පවත්නා මන්දපෝෂණ අනුපාතය සැලකිය යුතු ඉහළ මට්ටමක පවතී. එහි ප්‍රධාන ගැටලු අතරට අඩු බර ළදරුවන් (6.4%), උපත් බර අඩු අලුත උපන් දරුවන් (12% ක් පමණ), ගර්භණීභාවයේ සති 12ක කාලයේ දී හෝ ඊට පෙර වන විට අඩු ශරීර ස්කන්ධ දර්ශකයක් (BMI) සහිත ගර්භනී කාන්තාවන් (15%), වයස අවුරුදු 1-2 අතර (12%) සහ අවුරුදු 2-5 අතර කුඩා දරුවන් (19%) පෙන්වා දිය හැකිය[61]. වාහක බෝවන රෝග ව්‍යාප්තිය සඳහා මෝසම් වර්ෂාව සැලකිය යුතු බලපෑමක් සිදුකරයි. එසේම 2022 සිට 2023 දක්වා කාලයේ දී ඩෙංගු රෝගීන් සංඛ්‍යාවේ වැඩි වීමක් පෙන්නුම් කර ඇතත්, වාර්තා වන මරණ සංඛ්‍යාවේ අඩුවීමක් දැකිය හැකිය[62] . සෑම වර්ෂයකම මී උණ (මඩ උණ - ලෙප්ටොස්පයිරෝසිස්) රෝගීන් ඉහළ සංඛ්‍යාවක් වාර්තා වේ. COVID-19 වසංගත කාලය තුළ ජනතාවගේ වැඩි පිරිසක් කෘෂිකර්මාන්තයට යොමු වීම සහ වසංගතය කෙරෙහි වැඩි අවධානයක් යොමු වීම නිසා මෙම මරණ සංඛ්‍යාව වැඩි විය[63].

61 Department of Census and Statistics, Sri Lanka http://sis.statistics.gov.lk/statHtml/statHtml.do?orgId=144&tblId=DT_HEA_ANN_117&conn_path=I2
62 https://cdn.who.int/media/docs/default-source/sri-lanka-documents/dengue-sit-rep-1-12.05.2023-v2.pdf?sfvrsn=80da2b2d_1
63 https://www.e-epih.org/upload/pdf/epih-44-e2022015.pdf

දේශගුණ විපර්යාස මානව සෞඛ්‍යය සහ යහපැවැත්ම කෙරෙහි නිශේධනීය ලෙස බලපාන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රය පීඩාවට පත්වීම නොවැළැක්විය හැකි කරුණකි. සෞඛ්‍ය අංශය සඳහා වන අනුහුරුවීමේ ඉලක්ක NDC හයක් මගින් ඉදිරිපත් කර තිබේ (4-8 වගුව). දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන ඉලක්කගත ක්‍රියාමාර්ග ප්‍රධානධාරාගත කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මට්ටමේ මුලපිරීම්, දේශගුණ විපර්යාසයේ බලපෑම නිසා ඇති වන සෞඛ්‍ය සහ රෝග තත්ත්ව කළමනාකරණය කිරීමේ ධාරිතාව වර්ධනය කිරීම, වායු දූෂණයේ සෞඛ්‍යමය බලපෑම් ආමන්ත්‍රණය කිරීම සහ දේශගුණ ආපදාවලින් ඇතිවන රෝගාබාධ සහ මරණ අවම කිරීම මෙම NDC මගින් ආවරණය වේ.

4-8 වගුව සෞඛ්‍ය අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | සෞඛ්‍ය අංශයේ දේශගුණ ඔරොත්තුදීම වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රතිපත්ති මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම සහ අදාළ සෑම අංශයකටම ඒකාබද්ධ කිරීම |
| 2 | දේශගුණ විපර්යාසවල සෘජු බලපෑමෙන් ඇතිවන බෝ නොවන රෝග (**NCD**) සහ සෞඛ්‍ය තත්ත්ව කළමනාකරණය සඳහා අවශ්‍ය ධාරිතාවය වැඩිදියුණු කිරීම |
| 3 | දේශගුණ විපර්යාස නිසා තවදුරටත් උග්‍රවන ඌනපෝෂණය හා මන්දපෝෂණය කළමනාකරණය කරගැනීම |
| 4 | වාහකයින්ගෙන් සහ මූෂිකයන්ගෙන් බෝවන, දේශගුණ සංවේදී රෝග (ඩෙංගු, මැලේරියාව, බරවා, ලිෂ්මේනියාව හා මී උණ) සම්බන්ධ ආවේක්ෂණය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම |
| 5 | ආන්තික කාලගුණ/ දේශගුණ සිදුවීම් (ගංවතුර, නියගය, නායයෑම් සහ වෙනත් දේශගුණ විපර්යාස ආශ්‍රිත සිදුවීම්) හේතුවෙන් ඇතිවන රෝගාතුර වීම් හා මර්ත්‍යතාව අඩු කිරීම |

### 4.8.1 සෞඛ්‍ය අංශයේ ජාතිකව NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - සෞඛ්‍ය අංශයේ දේශගුණ ඔරොත්තුදීම වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රතිපත්ති මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම සහ අදාළ සෑම අංශයකටම ඒකාබද්ධ කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: ශ්‍රී ලංකාව සඳහා තාප-සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුමක් (HHAP) සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම | පාරිසරික සෞඛ්‍ය, වෘත්තීය සෞඛ්‍ය හා ආහාර ආරක්ෂාව (EOH& අධ්‍යක්ෂ කාර්යාලය MoH) | MoH (වෙනත් අදාළ ඒකක), MoE, CEA, MD, පළාත් සෞඛ්‍ය බලධාරීන්, පළාත්පාලන ආයතන, ශාස්ත්‍රඥයන් | HHAP | | ප්‍රකාශිත HHAP, ප්‍රගති අධීක්ෂණ රැස්වීම් වාර්තා | HHAP කෙටුම්පත සකස් කර ඇත | තාප-සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුම අවසන් කර (2023) ක්‍රියාත්මක කර ඇත | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 13.2 |
| 1.2: සෞඛ්‍යය, පරිසරය සහ දේශගුණ විපර්යාස සඳහා වන ජාතික උපායමාර්ගික සැලසුම (NHSPEC) සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoH (වෙනත් අදාළ ඒකක), MoE, CEA, MET, MoPC&LG, MoF, NBRO, DMC, ශාස්ත්‍රඥයන්, UN ආයතන, ප්‍රජා-මූලික සංවිධාන | NHSPEC | | ප්‍රකාශිත NHSPEC, ප්‍රගති අධීක්ෂණ රැස්වීම් වාර්තා | ආරම්භ කර නැත. | NHSPEC සංවර්ධනය කර හා ක්‍රියාත්මක කර ඇත | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 13.2 |
| 1.3: හරිත සහ සෞඛ්‍ය සම්පන්න රෝහල් ඇතිකිරීම සඳහා වන මාර්ගෝපදේශ සහ ප්‍රමිති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoE, MoF, MoH (වෙනත් අදාළ ඒකක - සෞඛ්‍යාරක්ෂණ තත්ත්ව ඒකකය, DPRD), DMC, UDA, SLSEA, CEA, LAs, ශාස්ත්‍රඥයන් GBCSL | 1. මාර්ගෝපදේශ හා ප්‍රමිති<br><br>2. සහතික කළ හරිත හා සෞඛ්‍ය සම්පන්න රෝහල් ප්‍රතිශතය<br><br>3. හරිත හා සෞඛ්‍ය සම්පන්න රෝහල් සුචිය | | මාර්ගෝපදේශ හා ප්‍රමිති, හරිත, සෞඛ්‍ය සම්පන්න හා ආරක්ෂිත රෝහල් විගණනය | 1. ආරම්භ කර නැත<br><br>2. ආරක්ෂිත රෝහල් පිළිබඳ නියමු ව්‍යාපෘති දෙකක් ආරම්භ කර ඇත<br><br>3. ආරම්භ කර නැත | 1. හරිත සහ සෞඛ්‍ය සම්පන්න රෝහල් ඇතිකිරීම සඳහා වන මාර් ගෝපදේශ සහ ප්‍රමිති සංවර්ධනය කර (2024 වන විට) ක්‍රියාත්මක කිරීම<br><br>2. අවම වශයෙව් 5%<br><br>3. අවසන් කළ හරිත හා සෞඛ්‍ය සම්පන්න රෝහල් සුචිය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 11.7, 13.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.4: වායු දූෂණය නිසා ඇතිවන රෝග අඩුකරගැනීමට සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoH (වෙනත් අදාළ ඒකක), MoE, CEA, MD, ශාස්ත්‍රඥයන් | 1. වායු දූෂණය නිසා ඇතිවන රෝග අඩුකරගැනීමට සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුමක්<br>2. වායු දූෂණය නිසා ඇතිවන රෝග පිළිබඳව අධීක්ෂණය කිරීමට ආවේක්ෂණ පද්ධතියක් | | ක්‍රියාකාරී සැලසුම, MoH ප්‍රකාශිත වාර්තා, ප්‍රගති අධීක්ෂණ රැස්වීම් වාර්තා | ආරම්භ කර නැත | 1. වායු දූෂණය නිසා ඇතිවන රෝග අඩුකරගැනීමට සෞඛ්‍ය ක්‍රියාකාරී සැලසුම සකස් කර ක්‍රියාත්මක කර ඇත<br>2. වායු දූෂණය නිසා ඇතිවන රෝග පිළිබඳව අධීක්ෂණය කිරීමට ආවේක්ෂණ පද්ධතිය ක්‍රියාත්මකයි | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 13.2 |

**NDC 2 - දේශගුණ විපර්යාසවල සෘජු බලපෑමෙන් ඇතිවන බෝ නොවන රෝග (NCD) සහ සෞඛ්‍ය තත්ත්ව කළමනාකරණය සඳහා අවශ්‍ය ධාරිතාවය වැඩිදියුණු කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: දේශගුණ විපර්යාසවල බලපෑමෙන් උග්‍ර වනු ඇතැයි අපේක්ෂා කරන රෝග සහ සෞඛ්‍ය තත්ත්ව හඳුනා ගැනීම. | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoH බෝනොවන රෝග (NCD) පිළිබඳ කාර්යාංශය හා වෙනත් අදාළ ඒකක, MoE (CCS, NOU), අදාළ වෘත්තීය ආයතන, SLMA, ශාස්ත්‍රඥයන් | දේශගුණ විපර්යාසවල බලපෑමෙන් උග්‍ර වනු ඇතැයි අපේක්ෂා කරන රෝග සහ සෞඛ්‍ය තත්ත්ව තක්සේරුව පැවැත්වීම | | ප්‍රකාශන, රෝග සමීක්ෂණ වාර්තා හා පුවත් සංග්‍රහ, වාර්තා හා නාමලේඛන | ආරම්භ කර නැත | දේශගුණ විපර්යාස වල බලපෑමෙන් උග්‍ර වනු ඇතැයි අපේක්ෂා කරන රෝග සහ සෞඛ්‍ය තත්ත්ව හඳුනාගැනීම හා වාර්තාකිරීම | | | √ | √ | | | | | | | 3.9, 13.b |
| 2.2: සායනික හා වැළැක්වීමේ මාර්ගෝපදේශ ඇතුළුව ප්‍රමුඛතාගත කළ රෝග සහ සෞඛ්‍ය තත්ත්ව සඳහා කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoH, බෝනොවන රෝග (NCD) පිළිබඳ කාර්යාංශය හා වෙනත් අදාළ ඒකක, MoE (CCS, NOU), අදාළ වෘත්තීය ආයතන | මාර්ගෝපදේශ | | සකස්කරන මාර්ගෝපදේශ පිළිබඳ MoH වාර්තා | ආරම්භ කර නැත. | සායනික හා වැළැක්වීමේ මාර්ගෝපදේශ ඇතුළුව ප්‍රමුඛතාගත කළ රෝග සහ සෞඛ්‍ය තත්ත්ව සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත | - | √ | √ | √ | √ | | | | | | 3.c |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.3: දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන රෝග හා සෞඛ්‍ය තත්ත්වවලට පිළියම් යෙදීම සඳහා සෞඛ්‍ය පද්ධතියේ ධාරිතාව වර්ධනය කිරීම | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoH, බෝනොවන රෝග (NCD) පිළිබඳ කාර්යාංශය හා වෙනත් අදාළ ඒකක, MoE (CCS, NOU), අදාළ වෘත්තීය ආයතන | 1. පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>2. පුහුණු කළ කාර්යමණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව | | වෙන්කරන ලද හා භාවිත කරන ලද අරමුදල් පිළිබඳ MoH වාර්තා, පැමිණීම් වාර්තා, ප්‍රගති වාර්තා | විශේෂිත ධාරිතා වර්ධන වැඩසටහන් ආරම්භ කර නැත | 1. වර්ෂයකට වැඩසටහන් 5ක්<br><br>2. වර්ෂයකට සෞඛ්‍ය සේවකයන් 250ක් | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.9, 13.b |
| 2.4: අවදානම් සහිත කාණ්ඩ/ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (වයස්ගතවූවන්, ළමුන්, අවදානමකට ලක්විය හැකි ශ්‍රමික කණ්ඩායම් සහ වෙනත් අවදානමට ලක්විය හැකි කාණ්ඩ) හඳුනා ගැනීම සහ දේශගුණ විපර්යාස හේතුවෙන් ඇති වන බෝ නොවන රෝග කළමනාකරණය කිරීමට මාර්ග සිතියමක් සකස් කිරීම | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoH, බෝනොවන රෝග (NCD) පිළිබඳ කාර්යාංශය හා වෙනත් අදාළ ඒකක, MoE (CCS, NOU), අදාළ වෘත්තීය ආයතන | විවිධ අවදානම් සහිත කාණ්ඩ සඳහා දේශගුණ විපර්යාස හේතුවෙන් ඇති වන බෝ නොවන රෝග කළමනාකරණය කිරීම සඳහා මාර්ග සිතියම | | MoH ප්‍රගති වාර්තා | අවදානම් සහිත කාණ්ඩ හඳුනාගෙන ඇතත් ඒ විශේෂිතව දේශගුණ විපර්යාසවල බලපෑමට නොවේ | අවසන් කළ මාර්ග සිතියම | | | √ | √ | √ | √ | | | | | 3.2 |
| 2.5: දේශගුණ විපර්යාස සහ සෞඛ්‍යමය බලපෑම් පිළිබඳ සාධක හඳුනාගැනීම පිළිබඳ පර්යේෂණ ධාරිතාව ශක්තිමත් කිරීම | MoH | MoSTR MoEd, MoF, NSF, UN ආයතන, IFS, IPS, ශාස්ත්‍රඥයන් | 1. පර්යේෂණ න්‍යායපත්‍රය සකස්කිරීම<br><br>2. සිදුකරන ලද හා පළ කරන ලද පර්යේෂණ කටයුතු සංඛ්‍යාව | | ප්‍රකාශන, කොෂ්ඨාගාරවලින් ලැබෙන තොරතුරු | 1. පර්යේෂණ න්‍යායපත්‍රය සකස්කිරීම ආරම්භ කර නැත<br><br>2. මේ පිළිබඳව දැනටත් පවත්නා පර්යේෂණ වාර්තා හඳුනාගත යුතුය | 1. පර්යේෂණ න්‍යායපත්‍රය ප්‍රකාශයට පත් කිරීම<br><br>2. වර්ෂයකට එක් පර්යේෂණයක් හෝ සම්පූර්ණ කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 13.2 |

NDC 3 - දේශගුණ විපර්යාස නිසා තවදුරටත් උග්‍රවන ඌනපෝෂණය හා මන්දපෝෂණය කළමනාකරණය කරගැනීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: පෝෂණය හා සම්බන්ධ සෞඛ්‍ය ගැටලු අවම කිරීම සඳහා ආහාර සුලබතාව පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.1.1: ශ්‍රී ලංකාවේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය සඳහා ආවේක්ෂණ පද්ධතියක් සකස් කිරීම පිණිස අදාළ ආයතනවලට පෝෂණ තත්ත්වය සම්බන්ධ දත්ත ලබා දීම | MoH (DDG PHS 2) | MoH (EOH අධ්‍යක්ෂ කාර්යාලය, පෝෂණ අංශය, DPRD, FHB, NCD ඒකකය), SMoWCP&P MRI, DCS; MoEd, MoA, DoA, MD , UN ආයතන, FAO, ශාස්ත්‍රඥයන් | පෝෂණ තත්ත්ව දත්ත ලබා දීම | | FHB, පෝෂණ අංශය, MRI (පෝෂණ ඒකකය) වාර්තා | පෝෂණ තත්ත්-වය ගැන ඇත්තේ සීමිත තොරතුරුය | සවිස්තර පෝෂණ තත්ත්ව දත්ත එකතු කර සන්නිවේදනය කර ඇත | | | √ | √ | √ | | | | | | 2.1, 13.3 |
| 3.2: ආහාර සුරක්ෂිතභාවය අහිමිවීමට ලක් විය හැකි බවට හඳුනාගෙන ඇති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (MOH) ප්‍රදේශවල දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින්, කිරි දෙන මව්වරුන් සහ කුඩා දරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආවරණය කිරීම සඳහා සමාජ සුභසාධන ක්‍රම ශක්තිමත් කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 3.2.1: අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල පෝෂණය ඉහළ නැංවීමට වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම (ආබාධ සහිත පුද්ගලයින්, වැඩිහිටියන් ආදී) | MoH (පෝෂණ අංශය) | MoH (FHB, YEDD, MoH (EOH අධ්‍යක්ෂ කාර්යාලය, ආහාර ආරක්ෂණ ඒකකය), MoEd, MRI, පළාත් ලේකම් කාර්යාලය, DS, සමාජ සේවා | අවදානමට ලක්විය හැකි කණ්ඩායම් අතර පෝෂණය ඉහළ නැංවීමේ වැඩසටහන් දියත් කිරීම | | වාර්තා, මාර්ගෝප දේශ හා ආහාර නියෝග (රෙගුලාසි) | විශේෂ වැඩසටහන් සිදුකර නැත | අවදානමට ලක්විය හැකි කණ්ඩායම් අතර පෝෂණය ඉහළ නැංවීමේ වැඩසටහන් සකස් කර දියත් කර ඇත | - | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.3, 13.3 |
| 3.3: දේශගුණ විපර්යාස බලපෑමෙන් ඇති වන පෝෂණ ගැටලුවලට කඩිනමින් මැදිහත් වීමට මහජන සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම | MoH (පෝෂණ අංශය) | MoH (EOH අධ්‍යක්ෂ කාර්යාලය, (ආහාර ආරක්ෂණ ඒකකය), NCD ඒකකය), MoEd, MoA, SMoWCP&P, MRI (පෝෂණ ඒකකය), DCS; DoA, MD, UN ආයතන, FAO, ශාස්ත්‍රඥයන් | දේශගුණ විපර්යාස බලපෑමෙන් ඇති වන පෝෂණයට අදාළ කරුණු මහජන සෞඛ්‍ය පද්ධතියට ඒකාබද්ධ කිරීම | | MoH, FHB වාර්තා | ගැටලු හඳුනා ගැනීම හා මැදිහත්වීම් ආරම්භ කිරීම | දේශගුණ විපර්යාස බලපෑමෙන් ඇති වන පෝෂණ ගැටලු හඳුනාගෙන විසඳුම් සපයා ඇත (අවු. 5ට අඩු දරුවන්ගේ මන්දපෝෂණය, ක්ෂුද්‍රපෝෂක හීනතාව) | √ | √ | √ | √ | √ | √ | | | | | 2.1, 13.3 |

NDC 4 - වාහකයින්ගෙන් සහ මූෂිකයනගෙන් බෝවන, දේශගුණ සංවේදී රෝග (ඩෙංගු, මැලේරියාව, බරවා, ලිෂ්මේනියාව හා මී උණ) සම්බන්ධ ආවේක්ෂණය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1: දේශගුණ විපර්යාසවලට සංවේදී වාහක රෝග සඳහා රෝග ආවේක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම | DDG මහජන සෞඛ්‍ය සේවා | MoH (වසංගතවේද ඒකකය), ජාතික ඩෙංගු මර්දන වැඩසටහන, මැලේරියා මර්දන ව්‍යාපාරය, බරවාරෝග මර්දන ව්‍යාපාරය, LAs | දේශගුණ විපර්යාසවලට සංවේදී වාහක රෝග සඳහා රෝග ආවේක්ෂණ පද්ධතිය | | ජාතික ඩෙංගු මර්දන ඒකකයේ වාර්තා, මැලේරියා මර්දන ව්‍යාපාරයේ මාසික සමලෝචන වාර්තා පද්ධතිය, බරවාරෝග මර්දන ව්‍යාපාරයේ කාර්තුමය වාර්තා, වසංගතවේද ඒකකයේ දත්ත සමුදාය | ඩෙංගු, මැලේරියා, බරවා හා ලීෂ්මේනියාව සඳහා ආවේක්ෂණ පද්ධතියක් පැවතීම | හොඳින් ක්‍රියාත්මක වාහක රෝග ආවේක්ෂණ පද්ධතිය | √ | √ | √ | √ | √ | √ | | | | | 3.3, 13.3 |
| 4.2: වර්ෂාපතනය/ උෂ්ණත්ව පුරෝකථනය මත පදනම්ව, එක් එක් දේශගුණ සංවේදී වාහකයින්ගෙන් බෝවන රෝග සඳහා වන පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස මට්ටමින් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සංවර්ධනය කිරීම | DDG මහජන සෞඛ්‍ය සේවා 1 | MoH (වසංගතවේද ඒකකය), ජාතික ඩෙංගු මර්දන වැඩසටහන, මැලේරියා මර්දන ව්‍යාපාරය, බරවාරෝග මර්දන ව්‍යාපාරය, DMC, MD, | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස මට්ටමින් දියුණු කළ වාහක රෝග පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ප්‍රතිශතය | | ඩෙංගු ආවේක්ෂණ පද්ධතියේ වාර්තා, මැලේරියා මර්දන ව්‍යාපාරයේ මාසික සමලෝචන වාර්තාකරණ පද්ධතිය, බරවාරෝග මර්දන ව්‍යාපාරයේ කාර්තුමය වාර්තා, වසංගතවේද ඒකකයේ දත්තසමුදාය | 20% | 80% | √ | √ | √ | √ | | | | | | | 3.3, 3.d, 13.3 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.3: බෝවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා ඵලදායී මැදිහත් වීමක් මගින් වසංගත ඇති විම වැළැක්වීම හා පූර්ව අනතුරු ඇඟවීම්වලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහා මහජන සෞඛ්‍ය පද්ධතියේ, පළාත් පාලන ආයතනවල සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය | MoH (DDG DDG මහජන සෞඛ්‍ය සේවා 1) | MoH (වසංගතවේද ඒකකය), ජාතික ඩෙංගු මර්දන වැඩසටහන, මැලේරියා මර්දන ව්‍යාපාරය, බරවාරෝග මර්දන ව්‍යාපාරය, LAs, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ | 1. ධාරිතා වර්ධන වැඩසටහන් ගණන<br><br>2. පුහුණු කළ අංශ හා සංඛ්‍යාව<br><br>3. පුහුනු අත්පොත් | | පළාත් ලේකම් කාර්යාලයේ වාර්තා | 1. වාර්ෂිකව වැඩසටහන් කිහිපයක් පැවැත්වේ<br><br>2. පුහුණු කළ අංශ හා සංඛ්‍යා හඳුනාගත යුතුව ඇත<br><br>3. පුහුණු අත්පොත් ප්‍රකාශයට පත් කළ යුතුව ඇත | 1. වර්ෂයකට වැඩසටහන් 5ක්<br><br>2. (i) වාර්ෂිකව මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල 250ක් පුහුණු කිරීම<br><br>(ii) වර්ෂයකට පළාත්පාලන ආයතන හා ප්‍රජා මූලික සංවිධාන සාමාජිකයන් 50ක් පුහුණු කර ඇත<br><br>3. පුහුණු අත්පොත් ප්‍රකාශයට පත් කර ඇත | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.3, 3.d, 13.3 |
| 4.4: වසංගත ඇති වීම පුරෝකථනය කරන ලද කාලවලදී, වාහකයින්ගෙන් බෝවන රෝග පාලනය පිළිබඳ මහජන සෞඛ්‍ය අවදානම් සන්නිවේදනය ශක්තිමත් කිරීම | MoH (DDG මහජන සෞඛ්‍ය සේවා 1 හා 2) | MoH (මාධ්‍ය ඒකකය), එදෑ (CCS), HPB, ජාතික ඩෙංගු මර්දන වැඩසටහන, මැලේරියා මර්දන ව්‍යාපාරය, බරවාරෝග මර්දන ව්‍යාපාරය, DMC, DoGI | 1. වසංගත ඇති වීම පුරෝකථනය කරන ලද කාලවල දී වාහක රෝග පාලනය පිළිබඳ මහජන සෞඛ්‍ය අවදානම් සන්නි-වේදනය සැලසුම් කිරීම<br><br>2. පුරෝකථනය කළ වසංගත තත්ත්වවලදී සැලසුමට අනුව සන්නිවේදනය කිරීම | | HPB, ජාතික ඩෙංගු මර්දන වැඩසටහන, මැලේරියා මර්දන ව්‍යාපාරය, බරවාරෝග මර්දන ව්‍යාපාරය, වසං ගතවේද ඒකකයේ වාර්තා | 1, පවත්නා සැලසුම<br><br>2. පුරෝ කථනය කළ වසංගත කාලවල පවත්නා සන්නිවේදන ක්‍රමය | 1, දියුණු කළ සැලසුම<br><br>2. පුරෝකථනය කළ වසංගත කාලවල දී දියුණු කළ සන්නිවේදනය-ක් තිබීම | √ | √ | √ | √ | | | | | | | 3.3, 3.d, 13.3 |
| 4.5: මහජන සෞඛ්‍ය, පළාත් පාලන ආයතන බලධාරීන් සහ අනෙත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය සඳහා වූ ආවේක්ෂණ පද්ධතියට අන්තර් ආංශික සම්බන්ධීකරණය හා තොරතුරු පද්ධතිය සම්බන්ධ කිරීම | MoH (DDG මහජන සෞඛ්‍ය සේවා 1) | MoH (DPRD, වසං ගතවේද ඒකකය) MoEd, MoE (CCS), MoFish, MoD, MoUD)H, MoEd, MoPC)LG, තාක්ෂ-ණය හා පර්යේෂණ විෂය භාර අමාත්‍යාංශ, MoMM, CEA, MD, ජාතික ඩෙංගු මර්දන වැඩසටහන, මැලේරියා මර්දන ව්‍යාපාරය, බර-වාරෝග මර්දන ව්‍යා-පාරය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ | 1. අන්තර්-ආංශික කමිටු හා වාර්තාකරන කාලපරතරය<br><br>2. තොරතුරු හුවමාරු කිරීමේ වේදිකාව | | කමිටු රැස්වීම්වල වාර්තා, තොරතුරු තාක්ෂණ වේදිකා | 1. සාමාන්‍ය-යෙන් 40%ක්<br><br>2. ස්ථාපිත කර නැත | 1. එක් එක් රෝග සඳහා වන අන්තර්-ආංශික කමිටු මගින් සිදුකරන කාර්තුමය සන්නිවේදනය<br><br>2. තොරතුරු හුවමාරු කර ගැනීමේ වේදිකාවක් ස්ථාපිත කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.c, 13.2 |

NDC 5 - ආන්තික කාලගුණ/ දේශගුණ සිදුවීම් (ගංවතුර, නියඟය, නායයෑම් සහ වෙනත් දේශගුණ විපර්යාස ආශ්‍රිත සිදුවීම්) හේතුවෙන් ඇතිවන රෝගාතුර වීම් හා මර්ත්‍යතාව අඩු කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1: සිදුවිය හැකි ආන්තික සිදුවීම් හෝ වර්ෂාපතන විචල්‍යතා පිළිබඳව නිසිකලට හා නිවැරදිව පූර්ව අනතුරු ඇඟවීම් සෞඛ්‍ය අංශයට ලැබීම සහ බෙදා හැරීම ශක්තිමත් කිරීම සහ ඒවා ජාතික, කලාපීය, මහජන සෞඛ්‍ය කොට්ඨාස සහ ගම් මට්ටමේ මැදිහත්වීම් සමඟ සම්බන්ධ කිරීම | MoH (DPRD) | DMC, DS, PMoH, RDHS | ආපදා තොරතුරු ලැබීමේ හා බෙදාහැරීමේ පද්ධතියක් හා පූර්ව අනතුරු ඇඟවීම් | | DPRD වාර්තා | පවත්නා පද්ධතිය සියලු ප්‍රධාන සිදුවීම් ආවරණය කරයි (එහෙත් ජාතික, කලාපීය, මහජන සෞඛ්‍ය කොට්ඨාස සහ ගම් මට්ටමෙන් ආවරණය කිරීමට විස්තීර්ණ නැත) | ආපදා තොරතුරු ලැබීමේ හා බෙදාහැරීමේ පද්ධතියක් හා පූර්ව අනතුරු ඇඟවීම් සඳහා විස්තීර්ණ පද්ධතියක් තිබීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.c, 13.3 |
| 5.2: දේශගුණ විපර්යාස නිසා ඇතිවන සිදුවීම් ඇතුළුව, සෞඛ්‍ය අංශය සඳහා සියලු ආපදා සඳහා අවදානම් තක්සේරු කිරීම | EOH අධ්‍යක්ෂ කාර්යාලය MoH | MoH (DPRD, වසංගතවේද අංශය, වාහක/ ආහාර/ ජලය මගින් ව්‍යාප්තවන රෝග/- වයිරස් රෝග පාලන ඒකක ), DHS, RDHS, DMC, MD, MRI | අවදානම් තක්සේරු සිතියම් | | DPRD, PDHS, RDHS, MRI, වසංගතවේද අංශයේ වාර්තා, සිතියම් | පළාත් හතරක් ආවරණය කරමින් දැනට ක්‍රියාත්මකය | සියලු පළාත් ආවරණය වන ආපදා තක්සේරු සිතියම් සකස් කර ඇත | | | √ | √ | √ | √ | | | | | 3.c, 13.3 |
| 5.3: දේශගුණ විපර්යාස ඇතුළු සියලු ආපදා සඳහා ජාතික, උප ජාතික, මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස, සහ ගම් මට්ටමින් රෝග නිවාරණ හා වැළැක්වීමේ යන අංශ දෙකේම සෞඛ්‍ය සූදානම වැඩි දියුණු කිරීම. | MoH (DPRD) | RDHS, DMC, PDHS, MD, DMC | ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් සෞඛ්‍ය සූදානම් සැලසුම් | | DPRD වාර්ෂික වාර්තා | පළාත් හතරක් සඳහා සැලසුම් | ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් සෞඛ්‍ය සූදානම් සැලසුම් ස්ථාපිත කිරීම | √ | √ | √ | √ | √ | | | | | | 3.c, 3.9, 13.3 |
| 5.4: දේශගුණ විපර්යාසවල සෞඛ්‍යමය බලපෑම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම හා සකස් කර ඇති අනුහුරුවීම ප්‍රවර්ධනය සහ ආසන්න ආපදා අවදානම්වලට පිළියම් යෙදිය යුතු ආකාරය පිළිබඳව සාම්ප්‍රදායික, විද්‍යුත් හා සමාජ මාධ්‍ය හරහා සැලසුම් කර ප්‍රචාරය කිරීම | MoH (HPB), | MoH (DPRD, E&OH, වසංගතවේද ඒකකය, FHB, පෝෂණ අංශය, EOH), MoE (CCS), DMC, DoGI, ඩෙංගු මර්දන වැඩසටහන, මැලේරියා මර්දන ව්‍යාපාරය, බරවාරෝග මර්දන ව්‍යාපාරය | වර්ෂයකට සිදුකරන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් ගණන හා ප්‍රවර්ධනය කිරීම් ගණන | | HPB, DPRD, E&OH වාර්තා | ක්‍රියාත්මක වෙමින් පවතී. සිදුකරන වැඩසටහන් ඇස්තමේන්තු කළ යුතුය | ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 3.c, 13.3 |

## 4.9 නාගරික සැලසුම්කරණ හා මානව ජනාවාස අංශය

නාගරික ජනගහනය පිළිබඳ අර්ථදැක්වීම අනුව, නම් කරන ලද මහ නගර සභා සහ නගර සභාවල පදිංචිකරුවන් ඇතුළත් වන, ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය 18.7% ක් වේ. මේ ප්‍රමාණය 2030 වර්ෂය වන විට 21% ක් පමණ වනු ඇතැයි ප්‍රක්ෂේපණය කර ඇත. ජනතාව වැඩි වැඩියෙන් නගර කරා සංක්‍රමණය වීමට පටන් ගෙන ඇති බැවින් නාගරිකකරණය වේගයෙන් වර්ධනය වේ. සේවා ඉල්ලුම ඉහළ යෑම, රථවාහන තදබදය වැඩිවීම සහ ඒ නිසා සිදුවන පරිසර දූෂණය හා ස්වාභාවික විපත් නිසා ඇතිවන බලපෑම්, සෞඛ්‍ය අවදානම්, ජීවත්වීමට නුසුදුසු නිවාස, නාගරික තාප දූපත් ආවරණය සහ නාගරික දුප්පතුන්ගේ අඩු ජීවන තත්ත්වය (පැල්පත් නිවාස වර්ධනය) ඇතුළු ගැටලු ගණනාවක් සඳහා මේ තත්ත්වය හේතු වී ඇත. රජය ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන අතර යටිතල පහසුකම් සහ සේවා නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවලට සමානව බෙදා හරියි. කෘෂිකාර්මික-කාර්මිකකරණය හරහා නාගරීකරණය අඩු කිරීමේ අදහස ඉදිරිපත් කර ඇති අතර, යටිතල පහසුකම් සහ සේවා සම්බන්ධව ඇති පරතරය පියවීම සඳහා මුලපිරීම් කිහිපයක් රජය මගින් ආරම්භ කර ඇත. නාගරික සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති ස්ථාපනය කර ඇත්තේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය මගිනි. අවකාශීය සැලසුම් සඳහා සමස්ත රාමුව සහ රීති සපයා දෙන්නේ යාවත්කාලීන කළ 2048 ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලසුම (2023) මගිනි. නාගරික සැලසුම්කරණය සහ ඉඩම් වෙන් කිරීම සඳහා වූ බලය නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලැබී ඇත්තේ 2007 අංක 36 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත (සංශෝධිත) සහ අධිකාරියේ අදාළ සැලසුම් සහ ගොඩනැගිලි නියෝග (රෙගුලාසි) මගිනි. තවද, ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාකාරී ව්‍යාපෘති බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය රාමුව පළාත් සහ පළාත් පාලන මට්ටමේ බලධාරීන්ට සැපයීම පිණිස පළාත් පහක් (ඌව, සබරගමුව, දකුණ, නැගෙනහිර සහ උතුරු මැද) සඳහා කලාපීය භෞතික සැලසුම් සකස් කර ඇත. එසේම, ජාතික මට්ටමේ සංවර්ධන මුලපිරීම් සමඟ ගැලපෙන ආකාරයෙන් ප්‍රාදේශීය සංවර්ධන මුලපිරීම් නැවත ක්‍රමවත් කිරීම සහ නියාමනය කිරීම ද එමගින් සිදු වේ.

ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලසුමේ (NEAP) තේමාත්මක ක්ෂේත්‍ර අටෙන් එකක් ලෙස නගර සහ මානව ජනාවාසවල පරිසර කළමනාකරණය ඇතුළත් කිරීමත් සමඟ මෙම අංශයට ලබා දී ඇති වැදගත්කම පැහැදිලි වේ. නාගරික ප්‍රදේශවල නගර හා මානව ජනාවාස මානව සමාජයේ ගතික සහ අත්‍යවශ්‍ය අංග වන අතර සමාජ, ආර්ථික හා තාක්ෂණික සංවර්ධනයේ ප්‍රධාන ධාවකයක් වුවද, නාගරීකරණයේ සහ දුර්වල නාගරික සැලසුම්කරණයේ ප්‍රතිඵලයක් ලෙස අභියෝග සහ තර්ජන රාශියක් පවතී. ඒවා අතර, අවට පරිසර පද්ධති කෙරෙහි අහිතකර ලෙස බලපෑම සහ අකාර්යක්ෂම ජල කළමනාකරණය සහ සනීපාරක්ෂාව, වායු තත්ත්වය පිරිහීම, ඝන අපද්‍රව්‍ය සහ සෞඛ්‍ය බලපෑම් වැනි ප්‍රාදේශීය පාරිසරික ගැටලු මේ අතර වේ. මෙම අංශයේ තිරසර අරමුණු සපුරාලීම සඳහා උපායමාර්ග නවයක් සහ ක්‍රියාමාර්ග 60ක් ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් වේ.

දේශගුණ උපද්‍රව වර්ධනය වන විට, කෘෂිකර්මාන්තය මත යැපෙන ගම්මානවලින් සිදුවන සංක්‍රමණය වීම නගර අධික ලෙස ජනාකීර්ණ වීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, අවදානම් කිහිපයක් ඇති නාගරික ප්‍රදේශ වල අහඹු, අඩු ආදායම්ලාභී ජනාවාස වර්ධනය විය හැක. දේශගුණ විපර්යාස මානව ජනාවාසවලට වෙනස් සහ පැහැදිලි අභියෝග දෙකක් මතු කරයි: (i) උෂ්ණත්වය ඉහළ යාම නිසා රට පුරා නාගරික සහ තදාසන්න ප්‍රදේශ වාසයට නුසුදුසු වනු ඇත; සහ (ii) නාගරික තාප දූපත් නගරවල තාප ප්‍රවාහ බලපෑම වැඩි කරනු ඇත. දිවා කාලයේ සහ රාත්‍රියේ උෂ්ණත්වය ඉහළ යාම සිසිලනය සඳහා කොපමණ ශක්තියක් භාවිතා කරනවාද යන්න බලපානු ඇත. උෂ්ණත්වය ඉහළ යාම, අධික වාෂ්පීකරණ අනුපාතය සහ දීර්ඝ වියළි කාලසීමාවන් හේතුවෙන් වියළි කලාපයේ ජල හිඟයක් ඇති වේ. නුවරඑළිය සහ බදුල්ල වැනි ඉහළ ජල පෝෂක ප්‍රදේශවල නියඟයේ ප්‍රතිඵලයක් ලෙස ජල සම්පතේ සීමා දැනටමත් කැපී පෙනේ. නාගරික වර්ධනය හේතුවෙන් ඉල්ලුම වැඩි වන විට තෙත් කලාපයේ සංවර්ධනය වෙමින් පවතින නාගරික මධ්‍යස්ථානවල ද මෙවැනි ගැටලු මතු විය හැකිය. කාලගුණය ආශ්‍රිත ව්‍යසනවල වාර ගණන වැඩි වීම මෙන්ම ගංවතුර, නියඟය සහ නාය යෑම් වැඩි වීමේ අවදානම මානව ජනාවාස සඳහා දේශගුණයේ දෙවන අවදානම නියෝජනය කරයි. තෙත් කලාපය සඳහා වන වර්ෂාපතනයේ වර්ධනීය විෂමතා අනුව, දැනටමත් ගංවතුර අවදානමට ලක්ව ඇති රටේ නිරිත දෙසින් පිහිටි නගර වැඩි උවදුරුවලට මුහුණ දිය හැකිය. කඳුකර ප්‍රදේශයේ වතු කම්කරුවන්ගේ නිවාස විශේෂයෙන් නාය යෑම්වලට ගොදුරු වන අතර ඔවුන්ගේ ප්‍රමිතියෙන් තොර නිවාස සහ අස්ථිර ආර්ථික තත්ත්වය හේතුවෙන් මෙම අවදානම වැඩි වේ. ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය විශේෂයෙන් බටහිර සහ දකුණු ප්‍රදේශවල ජනාකීර්ණ වේ. වෙරළබඩ ප්‍රදේශවල පානීය ජල පද්ධති ලවණ ආක්‍රමණයට සහ මුහුදු මට්ටම ඉහළ යාමට විශේෂයෙන් සංවේදී වන අතර එම නිසා දේශගුණ විපර්යාසවල ප්‍රධාන අහිතකර බලපෑම නියෝජනය කරයි.

නාගරික සැලසුම්කරණය සහ මානව ජනාවාස අංශයේ අනුහුරුවීමේ පියවර (4-9 වගුව) NDC හතරක් මගින් සකස් කරයි. වඩා හොඳ සැලසුම් කිරීමක අවශ්‍යතාවය, ආපදා අවදානම අඩු කිරීම සහ ඉදිරියේදී ඇති විය හැකි දේශගුණ අවදානම් ඇතුළත් කිරීම, නිර්මිත පරිසරයේ දේශගුණ ඔරොත්තු දීම ඉහළ නැංවීම සහ සෙමින් සිදුවන වන දේශගුණ විපර්යාස සිදුවීම්වල ප්‍රතිවිපාක අඩු කිරීමේ අවශ්‍යතාවය ඔවුන් ඉස්මතු කරයි. තවද, නාගරික වන වගාව, පරිසර හිතකාමී ප්‍රවාහනය සහ හරිත ගොඩනැගිලි අවම කිරීමේ NDC යටතේ යෝජනා කර ඇති සමහර උපාය මාර්ග අනුහුරුවීම වැඩි දියුණු කිරීම සඳහා සම ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

4-9 වගුව නාගරික සැලසුම්කරණය හා මානව ජනාවාස අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | දේශගුණ විපර්යාස සඳහා අනුහුරු වීම ජාතික, උප ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ භෞතික සැලසුම්වලට ප්‍රධානධාරාගත කිරීමෙන් මානව ජනාවාස හා යටිතල පහසුකම්වල ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම |
| 2 | දේශගුණ විපර්යාස අවදානමට දැඩි අවදානමකට ලක්ව ඇති ප්‍රදේශවල නාගරික හා මානව ජනාවාස සැලසුම්කරණ/ ක්‍රියාත්මක කිරීමට, ආපදා අවදානම් අඩුකිරීම (DRR) අන්තර්ගත කිරීම |
| 3 | දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දෙන නිර්මිත පරිසරයක් ස්ථාපිත කිරීම |
| 4 | වෙරළබඩ ප්‍රදේශයේ ජනාවාස හා යටිතල පහසුකම්වලට සෙමින් සිදුවන සිදුවීම්වල (මුහුදු මට්ටම ඉහළයෑම) බලපෑම අවම කිරීම |

## 4.9.1 නාගරික සැලසුම්කරණ හා මානව ජනාවාස අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - දේශගුණ විපර්යාස සඳහා අනුහුරු වීම ජාතික, උප ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ භෞතික සැලසුම්වලට ප්‍රධානධාරාගත කිරීමෙන් මානව ජනාවාස හා යටිතල පහසුකම්වල ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: වඩාත් නූතන දේශගුණ විපර්යාස අවදානම් සහ අන්තරාය සෑම මට්ටමකදීම භෞතික සැලසුම් තුළට ඒකාබද්ධ කිරීම | NPPD | MoUD&H, MoP-C&LG, MoH, UDA, ID, SLLDC, NBRO, LAs | 1. NPPD - යාවත්කාලීන කළ ජාතික භෞතික සැලසුම (NPP)<br><br>2. NPPහි සඳහන් කරුණුවලට පාර්ශ්වකරුවන් දක්වන එකඟතාවයේ මට්ටම | | NPPD හි ජාතික භෞතික සැලසුම්වලට දේශගුණ විපර්යාස ඇතුළත්කිරීම, NBRO වාර්තා | 1. දේශගුණ විපර්යාස අවදානම ඇතුළත් කරමින් ජාතික භෞතික සැලසුම යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇත<br><br>2. NPP-2019 (වඩා නවතම අනුවාදය) සඳහා ඒ වනවිට සියලු පාර්ශකරුවන් එකඟ විය (කෙසේවෙතත්, සම්පූර්ණ එකඟතාවයක් සඳහා අභියෝගයක් විය) | 1. යාවත්කාලීන කළ ජාතික භෞතික සැලසුම ප්‍රකාශයට පත්කිරීම (2023)<br><br>2. පාර්ශ්වකරුවන් සමපූර්ණයෙන් එකඟව කටයුතු කිරීම | √ | √ | √ | | | | | | | | 13.2 |
| 1.2: දේශගුණ අවදානම් සහ අන්තරාය සම්බන්ධයෙන් ජාතික භෞතික සැලසුමේ (NPP) නිර්දේශ සැලකිල්ලට ගනිමින් උප ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් සම්පාදනය කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.2.1: දේශගුණ අවදානම් සහ අන්තරාය සම්බන්ධයෙන් ජාතික භෞතික සැලසුමේ (NPP) නිර්දේශ සැලකිල්ලට ගෙන කලාපීය (පළාත්) මට්ටමේ භෞතික සැලසුම් සම්පාදනය කිරීම | NPPD | MoUD&H, MoP-C&LG, MoH, ID, UDA, CEA, SLLDC, NBRO, LAs, | දේශගුණ අවදානම් සහ අවදානමට ලක්විය හැකි බව ඇතුළත් කරගෙන සකස් කළ කලාපීය (පළාත්) මට්ටමේ සැලසුම් ගණන | | NPPD, NBRO, UDA වාර්තා | කලාපීය භෞතික සැලසුම් හඳුනාගැනීම හා සකස් කිරීම සිදුවෙමින් පවතී | කලාපීය (පළාත්) භෞතික සැලසුම් හතරක් (නැගෙනහිර, ඌව, මධ්‍යම අවදානම් කලාපය) | √ | √ | √ | √ | | | | | | | 13.2 |
| 1.2.2: UDA ප්‍රකාශිත ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සකස්කිරීම | UDA | MoUD&H, MoP-C&LG, MoH, ID, NPPD, CEA, SLLDC, NBRO, Las | UDA ප්‍රකාශිත ප්‍රදේශ සඳහා දේශගුණ අවදානම හා අවදා-නමට ලක්විය හැකි බව ඇතුළත් කරමින් සකස් කළ ප්‍රාදේශීය භෞතික සැලසුම් ගණන | | UDA, NBRO, NPPD වාර්තා | UDA ප්‍රකාශිත ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් 20ක් | සියලු මහ නගර සභා (MC), නගර සභා (UC), ප්‍රාදේශීය සභා (UDA ප්‍රකාශිත ප්‍රදේශ තුළ) | √ | √ | √ | √ | √ | | | | | | 13.2 |
| 1.2.3: පළාත් පාලන ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් | LAs | MoUD&H, MoPC&LG, MoH, ID, UDA, NPPD, CEA, SLLDC, NBRO, Las | දේශගුණ අවදා-නම හා අවදානමට ලක්විය හැකි බව ඇතුළත් කරමින් සකස් කළ ප්‍රාදේශීය භෞතික සැලසුම් ගණන | | අදාළ LAs, UDA, NPPD, NBRO වාර්තා | ප්‍රාදේශීය භෞතික සඳහා ප්‍රදේශ හඳුනාගැනීම සිදුවේ. | ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් 275ක් සකස්කිරීම | √ | √ | √ | √ | √ | √ | | | | | 13.2 |
| 1.3 සියලුම නාගරික යටිතල පහසුකම් ව්‍යාපෘති සහ වැඩසටහන්වලදී NPPD සහ UDA විසින් නිර්දේශිත මාර්ගෝපදේශ අනුග මනය කිරීම | ව්‍යාපෘති අනුමතකිරීමේ ආයතන (PAAs) | UDA, USDA, NBRO. DMC, SLLDC, CEA, CC&CRMD, DWC | එකඟතාවයේ ප්‍රමාණය | | PAAs වාර්තා (එකඟතා වාර්තා, සැලසුම් කමිටු අනුමැතිය) | එකඟතා වයේ මට්ටම සඳහා නිර්ණායක හා තක් සේරු ක්‍රමවේදයක් සකසා නැත | 100% (සියලු ව්‍යාපෘති NPP හා UDA මාර්ගෝපදේශවලට එකඟවීම) | √ | √ | √ | √ | √ | | | | | | 11.3<br>11.5<br>11.6<br>11.b |
| 1.4: දේශගුණ ඔරොත්තුදීම ගොඩනැංවීම සඳහා ආපදා අවදානම් ඒකාබද්ධ කළ නාගරික කලාප වෙන්කිරීම, වන උයන්, භූගත ජලය පුනරාරෝපණය, වායු පැසේජ/ සුළං කොරිඩෝ, තෙත්බිම් බුද්ධිමත් ලෙස පරිහරණය සහ මාර්ග දෙපස රුක් රෝප-ණය, ස්වභාව පාදක විසඳුම්, ජෛව ඉංජිනේරු තාක්ෂණය, වැනි අනුහුරුවීමේ ක්‍රියා මාර්ග නාගරික සැලසුම්වලට හඳුන්-වාදීම | UDA | DMC, SLLDC, ID, NBRO, Las | දේශගුණ විපර්යාස අනුහුරුවීමේ පියවර ඒකාබද්ධ කරමින් සකස් කරන ලද ප්‍රාදේශීය/ නාගරික සංවර්ධන සැලසුම් ගණන | | අදාළ LAs, UDA, DMC, NBRO, වාර්තා | UDAමගින් ගැසට් කළ සංවර්ධන සැලසුම් 21කට ඇතුළත් කර ඇත | ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් 275ක් | √ | √ | √ | √ | √ | | | | | | 11.3<br>11.5<br>11.6<br>11.b |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.5: දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයෙයන් සකස් කරන ලද දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දෙන මානව ජනාවාස සහ යටිතල පහසුකම් සඳහා වන මාර්ගෝපදේශ ඒකාබද්ධ කිරීම සහ ඊට අනුකූලව කටයුතු කිරීම | MoE | CCS, DMC, SLLDC, ID, NBRO, Las | 1. පවත්වන ලද දැනුම්වත් කිරීමේ හා ධාරිතා වර්ධන වැඩසටහන් ගණන<br><br>2. අනුකූල වීමේ මට්ටම | | MoE හා වෙනත් පාර්ශ්වකාර ආවතනවල වාර්තා | 1. වැඩ සටහන් සැලසුම්කර හා ක්‍රියාත්මක කර නැත<br><br>2. එතඟතාවයේ මට්ටම පිළිබඳ නිර්ණායක හා තක්සේරු ක්‍රමවේදය ස්ථාපිත කර නැත | සියලු නිවාස හා ජනාවාස ව්‍යාපෘති දේශගුණ ඔරොත්තුදීම පිළිබඳ CCS මාර්ගෝපදේශවලට එකඟ වීම | √ | √ | √ | √ | √ | | | | | | 11.3<br>11.5<br>11.6<br>11.b |

NDC 2 - දේශගුණ විපර්යාසවල බලපෑමට ලක්වීමට ඉහළ අවදානමක් ඇති ප්‍රදේශවල නාගරික සහ මානව ජනාවාස සැලසුම්කරණය / ක්‍රියාත්මක කිරීමට ආපදා අවදානම් අඩුකිරීම (DDR) ඇතුළත් කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: නාගරික සහ මානව ජනාවාස සැලසුම්කරණය සඳහා දේශගුණ විපර්යාස බලපෑමෙන් ඇතිවන ආපදා අවදානම් කළමනාකරණය (DRM) සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම | DMC | NBRO, UDA, NHDA, USDA, CCS, ID, SLLDC, NPPD | 1. සකස් කරන ලද මාර්ගොපදේශ ගණන<br><br>2. මාර්ගෝපදේශවලින් ආවරණය වන ක්ෂේත්‍ර<br><br>3. මාර්ගෝපදේශවල ඵලදායකත්වය | | DMC හා වෙනත් පාර්ශ්වකරුවන්ගේ වාර්ෂික වාර්තා | 1. ප්‍රධාන ආයතන මාර්ගෝපදේශ ගණනාවක් පිළියෙල කර ඇත (උදා. UDA - බස්නාහිර පළාත සඳහා තෙත්බිම් සංරක්ෂණ සංවර්ධන සැලසුම)<br><br>2. මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | 1. මාර්ගෝපදේශ ගණන පිළිබඳ ඉලක්කය ස්ථාපිත කළ යුතුය<br><br>2. ආවරණය වන ප්‍රදේශය පිළිබඳ ඉලක්ක ස්ථාපිත කළ යුතුය<br><br>3. ආපදා අවදානම් කළමනාකරණය (DRM), ප්‍රධාන ආයතන මගින් සකස් කළ මාර්ගෝපදේශ මත පදනම්ව නාගරික සහ මානව ජනාවාස සැලසුම්කරණයට ඇතුළත් කිරීම | √ | √ | √ | | | | | | | | 13.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 3. මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | | | | | | | | | | | | |
| 2.1.1: දේශගුණ විපර්යාස බලපෑමෙන් ඇතිවන ආපදා අවදානම කළමනාකරණය ඇතුළත් කිරීම සඳහා නාගරික හා මානව ජනාවාස සැලසුම් නීති සමාලෝචනය කර සංශෝධනය කිරීම | MoUD&H | MoE, USDA, DMC, නීතිපති දෙපාර්තමේන්තුව (AGD), CCS | 1. දේශගුණ විපර්යාස බලපෑමෙන් ඇති-වන ආපදා අවදානම කළමනාකරණය ඇතුළත් කර නාගරික ජනාවාස ප්‍රතිපත්තිය සැකසීම<br><br>2. නාගරික ජනාවාස ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට නිශ්චිත නීති සම්පාදනය | | MoUD&H, USDA, DMC, AGDs, MoE වාර්තා | 1. ප්‍රතිපත්තිය සකස්කිරීම ආරම්භ කර නැත<br><br>2. නිශ්චිත නීති සම්ප-ාදනයකර නැත | 1. දේශගුණ විපර්ය-ාස බලපෑමෙන් ඇතිවන ආපදා අවදානම කළමනා කරණය 2023 වන විට නාගරික ජන-ාවාස ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම<br><br>2. නිශ්චිත නීති 2025 වන විට බලාත්මක කිරීම | √ | √ | √ | √ | √ | | | | | | 13.2 |
| 2.2: අපධාව පද්ධති/ ජලාපවාහන පද්ධති සහ ගංවතුර කෙරෙහි ප්‍රාමාණික අවධානයක් ලබාදෙමින් යටිතල පහසුකම් සැලසුම්කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම | - | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2.2.1: අපධාව පද්ධති/ ජලාපවාහන පද්ධති හා ගංවතුර පිළිබඳව ප්‍රාමාණික අවධානයකි-න් යුක්තව යටිතල පහසුකම් සැලසුම් කිරීම | ID | MoPC&LG, RDA, CEA, NBRO, UDA, SLLDC | 1. සැලසුම්වලින් ආවරණය වන ගංගා ද්‍රෝණි ගණන<br><br>2. නාගරික/ ප්‍රාදේශීය ගංවතුර සැලසුම් වලින් ආවරණය වන ප්‍රදේශය | | DoI හා වෙනත් අදාළ ආයතනවල වාර්තා | 1. ද්‍රෝණි 3 - (කැලණි, ගිං, නිල්වලා ගංගා ද්‍රෝණි)<br><br>2. නාගරික/ ප්‍රාදේශීය ගංවතුර ආවරණය වී නැත | 1. අමතර ගංගා ද්‍රෝණි 5ක් ආවරණය වේ<br><br>2. ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>11.5<br>11.6<br>11.b |
| 2.2.2: අපධාව පද්ධති/ ජලාපවාහන පද්ධති හා ගංවතුර පිළිබඳව ප්‍රාමාණික අවධාන යකින් යුක්තව යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම (2.2.1 හි සැලසුමට අනුකූලව) | LAs | ID, RDA, CEA, NBRO, MoPC&LG, UDA, SLLDC | 1. ක්‍රියාත්මක කිරීමේ දී හා නඩත්තු කිරීමේ දී ආවරණය වූ ගංගා ද්‍රෝණි සංඛ්‍යාව<br><br>2. නාගරික/ ප්‍රාදේශීය ගංවතුර පාලනය ක්‍රියාත්මක කිරීමේ දී හා නඩත්තු කිරීමේ දී ආවරණය වන ප්‍රදේශය | | පළාත්පාලන ආයතනවල, DoI හා වෙනත් අදාළ ආයතනවල වාර්තා | ක්‍රියාත්මක කර නැත | 1. ගංගා ද්‍රෝණි 8ක ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම<br><br>2. ඉලක්කය ස්ථාපිත කළ යුතුය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | SDG 11.3<br>11.5<br>11.6<br>11.b |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.3: කඳුකර ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දී බෑවුම්වල ස්ථායිතාවය සහ පස සංරක්ෂණ ක්‍රියාමාර්ග ඊට ඒකාබද්ධ කිරීම | NBRO | DS, LUPPD, NPPD, වතු නිවාස/ යටිතල පහසුකම් සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය, PHDT, NRMC (DoA) | 1. කඳුකර ප්‍රදේශවල බෑවුමේ අස්ථාවරභාවය නිසා ප්‍රතික්ෂේප වූ සැලසුම් ගණනේ ප්‍රතිශතය<br><br>2. ආවරණය වූ දිස්ත්‍රික්ක ප්‍රතිශතය | | NBRO දත්ත සමුදාය, LIPPD හා NPPD වාර්තා | මූලික දත්ත හඳුනාගත යුතුය (ඇතැම් ප්‍රදේශවල ක්‍රියාත්මක කර ඇතත්, ප්‍රතිශතය ගණන් බැලිය යුතුය) | 1. ප්‍රතික්ෂේපිත සැලසුම් ප්‍රතිශතය පිළිබඳ යාවත්කාලීන කළ තොරතුරු<br><br>2. 100%<br>(සියලු කඳුකර ප්‍රදේශවල ක්‍රියාත්මක කර ඇත) | √ | √ | √ | √ | | | | | | | 11.3<br>11.5<br>11.6<br>11.b |
| 2.4: මානව ජනාවාසවලට සහ යටිතල පහසුකම්වලට බලපාන නායයෑම්/ ගංවතුර අවදානම තක්සේරු කිරීම සහ අධි අවදානම් ප්‍රදේශවල අවදානමට ලක් විය හැකිබව අඩුකිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම | DMC | වතු නිවාස/ යටිතල පහසුකම් සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය, PHDT, NBRO, SLLDC, ID, DS, LUPPD | ආවරණය වූ දිස්ත්‍රික්ක ප්‍රතිශතය | | NBRO වාර්තා, DMC, ID වාර්තා | මූලික දත්ත ස්ථාපිත කළ යුතුව (මානව ජනාවාස හා යටිතල පහසුකම් සඳහා නායයෑම් අවදානම පිළිබඳ සිතියම් තිබේ) | 100% (සියලු දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කර ඇත) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>11.5<br>11.6<br>11.b |
| 2.5: මානව ජනාවාසලවලට ඇති නියඟ අවදානම් තක්සේරු කිරීම සහ අධි අවදානම් ප්‍රදේශවල අවදානම අඩුකිරීමට ක්‍රියාමාර්ග ගැනීම | DMC | MD, DSs, LAs | නියඟ අවදානම තක්සේරුව හා සැලසුම් හඳුන්වා දුන් දිස්ත්‍රික්ක ප්‍රතිශතය | | අදාළ ආයතනවල වාර්තා | යම්කිසි තක්සේරුවක් සිදුකර ඇතත්, පරිපූර්ණ නොවේ | 100% (අධි අවදානම් ප්‍රදේශ සියල්ල ආවරණ කරන තක්සේරුවක්) | √ | √ | √ | √ | | | | | | | 11.3<br>11.5<br>11.6<br>11.b |

NDC 3 - දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන  නිර්මිත පරිසරයක් ඇතිකිරීම (2030)

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: අදාළවන පාර්ශ්වකාර ආයතන විසින් ක්‍රියාත්මක කරන දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ  නිර්මිත පරිසරය සම්බන්ධ උපායමාර්ගවලට දේශගුණ විපර්යාස අවදානම පිළිබඳ ප්‍රක්ෂේපණ ඒකාබද්ධ කිරීම | UDA | MoUD&H, MD, NBRO, GSMB, DMC, CEA, NHDA, DCS, NRMC, ශාස්ත්‍රඥයන් | දේශගුණ විපර්යාවලට ඔරොත්තු දීම පිළිබඳ කරුණු ඇතුළත් කළ UDA සංවර්ධන සැලසුම් ගණන | | Records of UDA වාර්තා | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය (මෙය සැලසුම්කරණයේ දී සිදු කළ යුතු වුවත්, අන්තර්ගත කරන මට්ටම හඳුනාගත යුතුය.<br><br>මූලික දත්ත ස්ථාපිත කළ යුතුය | දේශගුණ විපර්යාස ආපදා ප්‍රක්ෂේපිත සියලු සැලසුම්වලට ඒකාබද්ධ කර ඇත | √ | √ | √ | √ | √ | | | | | | 11.3<br>11.5<br>11.6<br>11.b |
| 3.2: නැගී එමින් ඇති දේශගුණ විපර්යාස අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා දේශගුණ ඔරොත්තු දීමේ සැලසුම් උපායමාර්ග සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම | UDA | MoUD&H, CEA, CCS, DArch. ., NPPD, LUPPD, USDA, CIDA, NBRO, FD, CC&CRMD, DWC, MASL | දේශගුණ විපර්යාවලට ඔරොත්තු දෙන සැලසුම් උපායමාර්ග හා මාර්ගෝපදේශ සකස්කිරීම, යාවත්කාලීන කිරීම හා අන්තර්ගත කළ සංඛ්‍යාව | | සමාලෝචනය හා යාවත්කාලීන කළ වාර්තා, යාවත්කාලීන කළ දේශගුණ විපර් යාවලට ඔරොත්තු දෙන සැලසුම් උපායමාර්ග, හරිත ගොඩනැගිලි රීති පද්ධතිය UDA හා වෙනත් පාර්ශ්වකාර ආයතනවල සංවර්ධන සැලසුම්වලට අන්තර්ගත කිරීම | මේ හා සම්බන්ධ සැලසුම් හා මාර්ගෝපදේශ ඇත - නිදසුනක් ලෙස නීල හරිත ශ්‍රී ලංකාවක්-හරිත ගොඩනැගිලි ප්‍රමිති UDA හි ගැසට් කළ නියෝග වලට (රෙගුලාසි) 2019 දී ඒකාබද්ධ කර ඇත) | ඉලක්කය ස්ථාපිත කළ යුතුය. (UDA ගොඩනැගිලි අනුමත කිරීමේ ක්‍රියාවලිය යටතේ නිකුත් කළ යුතු, හරිත ගොඩනැගිලි සහතිකකරණය උදාහරණයකි) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>11.5<br>11.6<br>11.b |
| 3.3: දැනට පවතින මානව ජනාවාස සැලසුම්, ඉහත 3.2 හි දැක්වෙන දේශගුණ විපර්යාවලට ඔරොත්තු දීමේ උපායමාර්ග  ඒකාබද්ධ කරමින් සංශෝධනය සහ ගැසට් කිරීම | MoUD&H | UDA, CEA, CCS, DArch, NPPD, LUPPD, USDA, CIDA, NBRO, FD, CC&CRMD, DWC | දැනට පවත්නා දේශගුණ ඔරොත්තුදීමේ උපායමාර්ග ඇතුළත් මානව ජනාවාස සැලසුම් ගණන | | ප්‍රකාශිත ගැසට් සංශෝධන. මානව ජනාවාස සැලසුම් හා UDA හා අදාළ PAA වෙනත් වාර්තා | සැලසුම් 20 | සැලසුම් 275 | √ | √ | √ | √ | √ | | | | | | 11.3<br>13.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.4: දේශගුණ විපර්යාසවලින් දැඩි ලෙස අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම (නිර්මිත පරිසරය) වැළැක්වීම සඳහා, දැනට පවතින රීති සහ නියෝග (රෙගුලාසි) සමාලෝචනය, යාවත්කාලීන කිරීම සහ බලාත්මක කිරීම | UDA | CEA, CCS NPPD, LUPPD, BOI USDA, RDA, DArch CIDA, NBRO, FD, CC&CRMD, DWC, PRDA | 1. සමාලෝචනය, යාවත්කාලීන කිරීම සහ බලාත්මක කළ රීති හා නියෝග (රෙගුලාසි) සංඛ්‍යාව<br><br>2. බලාත්මක කිරීමේ මට්ටම | | උපදේශන රැස්වීම්, දේශගුණ විපර්යාස අවදානම අන්තර්ගත කළ රීති හා නියෝග (රෙගුලාසි), දේශගුණ විපර්යාස බලපෑම් පිළිබඳව නිර්මිත පරිසරයට අදාළ රීති හා නියෝගවලට (රෙගුලාසි) අනුගත ව්‍යාපෘති/ සැලසුම්, දේශගුණ විපර්යාස බලපෑම් පිළිබඳව ගොඩනැගිලි ඉදිකිරීමට ( නිර්මිත පරිසරයට) අදාළ රීති හා නියෝගවලට අනුගත NPD මගින් අනුමත කළ ව්‍යාපෘති, හා UDA හා වෙනත් PAAවල රීති හා නියෝග (රෙගුලාසි) බලාත්මක කිරීමට අදාළ අධීක්ෂණ හා තක්සේරුකිරීමේ සැලසුම් | 1. පවත්නා රීති හා නියෝග (රෙගුලාසි) බලාත්මක කිරීම<br><br>2. බලාත්මක කිරීමේ මට්ටම පිළිබඳව නිර්ණායක හා තක්සේරු ක්‍රමවේදයක් නොපවතී | 1. ඉලක්කය ස්ථාපිත කළ යුතුය.<br><br>2. ගොඩනැගිලි ඉදිකිරීම (නිර්මිත පරිසරය) සඳහා ඉදිරිපත් වන සියලු අයඳුම්පත් අදාළ රීති හා නියෝග (රෙගුලාසි)වලට අනුගත වීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>13.2 |
| 3.5: වාස්තු විද්‍යා සහ ඉංජිනේරු විෂයමාලාවලට තිරසර නිර්මිත පරිසරය පිළිබඳ සංකල්ප ඇතුළත් කිරීම | UGC | SLSEA, වෘත්තීයික සංවිධාන, GBCSL, ශාස්ත්‍රඥයන්, තාක්ෂණ විද්‍යාල | හරිත ගොඩනැගිලි සංකල්පය විෂයමාලාවට ඇතුළත් කළ උපාධි/ වෘත්තික පුහුණු වැඩසටහන් ලැයිස්තුවක් | | අදාළ ආයතන/ වැඩසටහන්වල විෂයමාලා | මූලික දත්ත ස්ථාපිත කළ යුතුය (වර්තමානයේ දී ඉංජිනේරු හා වාස්තු විද්‍යා විෂය යටතේ පැවැත්වෙන උපාධි/ පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා 37ක් තිබේ) | ඉලක්කය ස්ථාපිත කළ යුතුය. (උදාහරණයක් ලෙස සියලු වාස්තුවිද්‍යා හා ඉංජිනේරු පාඨමාලාවලට ලෙස තිරසර නිර්මිත පරිසර සංකල්පය ඇතුළත් කිරීම දැක්විය හැකිය) | √ | √ | √ | √ | √ | | | | | | 11.3<br>13.2 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.5.1: ධාරිතා වර්ධන කටයුතු සඳහා තිරසර නිර්මිත පරිසර සංකල්පය හඳුන්වා දීම | MoUD&H | MoE - සැලසුම් අංශය, වාස්තුවිද්‍යාඥයින්ගේ ආයතනය, විශ්ව විද්‍යාලවල නගර සහ ග්‍රාම නිර්මාණ සැලසුම් දෙපාර්තමේන්තු, SLSEA, SLEMA, SLIDA | තිරසර නිර්මිත පරිසර සංකල්ප සමඟ ආරම්භ කළ දැනුම්-වත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ලැයිස්තුවක් | | පුහුණු විෂයමාලා සහ අදාළ ආයතනවල අත්පොත් | තිරසර නිර්මිත පරිසර සංකල්පය ආවරණය කරමින් විවිධ ආයතන මගින් පවත්-වනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් මාලාවක් වර්තමානයේ පවතී. | ඉලක්කය ස්ථාපිත කළ යුතුය. (තිරසර නිර්මිත පරිසර සං-කල්පය සියලු අදාළ CPD වැඩසටහන්-වලට හඳුන්වාදීම නිදසුනකි) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>13.3<br>13.b |
| 3.6: දේශගුණ විපර්යාසවලින් ඉහළ අවදා-නමක් සහිත ප්‍රදේශවල වාසය කරන ප්‍රජාවන් සඳහා යෝග්‍ය ස්ථානවල මහල් නිවාස විසඳුම් ප්‍රවර්ධනය | MoUD&H | USDA, NBRO, MD, සහාධිපත්‍ය කළමන-ාකරණ අධිකාරිය NHDA, UDA LUPPD, Banks, NPPD | දේශගුණ විපර්යාස-වලින් ඉහළ අවදානමක් සහිත ප්‍රදේශවල වාසය කරන ප්‍රජාවන්ට හඳු-න්වා දුන් මහල් නිවාස විසඳුම් සංඛ්‍යාව | | USDA, UDA ව්‍යාපෘති වාර්තා, ආයතනික සැලසුම්, කාර්යසාධන වාර්තා, මිශ්‍ර භාවිත ව්‍යාපෘති, උපා-යමාර්ගික සැලසුම් | ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇතත් ඒ විශේෂ-යෙන් ඉහළ දේශගුණ අවදානම-ක් ඇති ප්‍රදේශවල නොවේ | දේශගුණ විපර්යාස වලින් ඉහළ අවදානමක් සහිත ප්‍රදේශවල වාසය කරන සියලු ප්‍රජා-වන්ට මහල් නිවාස විසඳුම් ස්ථාපිත කිරීම | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>11.5<br>11.a<br>11.b |

**NDC 4 - සෙමෙන් ඇතිවන සිදුවීම්වලින් (මුහුදු මට්ටම ඉහළ යාම) වෙරළබඩ ජනාවාසවලට සහ යටිතල පහසුකම්වලට ඇති වන බලපෑම අවම කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1 අනාගත මුහුදු මට්ටම ඉහළයාම පිළිබඳව සැලකිලිමත් වෙමින් වෙරලබඩ ජනාවාස සහ ඒ හා සම්බන්ධිත යටිතල පහසුකම් සැලසුම් කිරීම් | UDA | MoUD&H, NPPD, NHDA, CC&CRMD, SLTDA, USDA, NWSDB, CEB, SLLRDA. LUPPD, , NARA, RDA, Las | 1. වෙරළ කලාප කළමනාකරණ සැලසුම (CZMP) යාවත්කාලීන කිරීම<br>2. UDA හි ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ගණන | | UDA හා වෙනත් අදාළ ආයතනවල ප්‍රගති වාර්තා, වාර්ෂික වාර්තා | 1. UDA සඳහා 2018 වෙරළ කලාප කළමනාක-රණ සැලසුම (CZMP) බලාත්මක වේ.<br>2. මූලික දත්ත හඳුනාගත යුතුය | 1. UDA ප්‍රකාශිත ප්‍රදේශ සඳහා යාවත්කාලීන කළ වෙරළ කලාප කළමනාකරණ සැලසුම (CZMP) 2023 දී සකස් කිරීම<br>2. ඉලක්කය ස්ථාපිත කළ යුතුය. | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>11.5<br>11.a<br>11.b |
| 4.2 නාගරික ජන ඝනත්වය රට අභ-යන්තරයට දෙසට යොමුකිරීම සඳහා පහ-සුකම් සැලසීමට මුහුදු මට්ටම ඉහළ යාමෙන් ආරක්ෂිත ප්‍රදේශ මායිම් ලකුණු කිරීම | CC&CRMD | නැවත පදිංචිකිරීමේ විෂය භාර අමාත්‍යාංශය SD, UDA DMC, LAs, DS, UDA | සකස් කරන ලද සිතියම් සංඛ්‍යාව | | CC&CRMD පවත්නා ගිල්ම (ජලගැලුම්) සිතියම්, අවදානමට ලක්විය හැකි බව පිළිබඳ තක්සේරු, මිණුම් සිතියම්, DMC සිතියම් | 2011 අනු-වාදයය බලාත්මකය (දේශගුණ විපර්යාවලට ලක්විය හැකි බව පිළිබඳ දත්තසමුදාය) | යාවත්කාලීන කළ ගිල්ම (ජලගැලුම්) සිතියම්, මුහුදු මට්ටම ඉහළ යෑමෙන් ආරත්ෂිත ප්‍රදේශ මායිම් ලකුණු කිරීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11.3<br>11.5<br>11.a<br>11.b |
| 4.3 වෙරළබඩ ප්‍රදේශයේ දැනට පවතින යටිතල පහසුකම් සහ ජනාවාස සඳහා අවදා-නම් කළමනාකරණ සැලසුම් (RMPs) සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම | DMC | CC&CRMD, DS, LAs<br>SLTDA, SLCG, SLN | 1. අවදානම් කළමනා කරණ සැලසුම් සංඛ්‍යාව<br>2. අවදානම් කළම නාකරණ සැලසුම් ක්‍රියාත්මක කරන මට්ටම | | අවදානම් කළමනාකරණ සැලසුම් හා DMCහි වෙනත් වාර්තා, වෙනත් පාර්ශ්වකාර ආයතනවල වාර්තා | 1. අවදානම් කළමනාක රණ සැලසුම්වල මීට පෙර පැවති සංස්කරණ ඇත | 1. වෙරළබඩ ප්‍ර-දේශයේ පවත්නා සියලු යටිතල පහ-සුකම් හා ජනාවාස සඳහා අවදානම් කළමනාකරණ සැලසුම් සකස් කිරීම<br>2. ස්ථාපිත ක්‍රමවේදයක් හා නිර්නායක මගින් ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ ඉලක්කය හඳුනාගැනීම | | | √ | √ | √ | | | | | | 11.b |

## 4.10 සංචාරක හා විනෝදාස්වාද අංශය

සංචාරක ව්‍යාපාරය මෙරට තුන්වන විශාලතම විදේශ විනිමය උපයන අංශය වන අතර ශ්‍රී ලංකාවට වැදගත් ආදායම් උත්පාදන මාර්ගයකි. ලෝක ආර්ථික සංසදයේ (World Economic Forum) 2021 සංචාරක සහ සංචාරක තරගකාරීත්ව වාර්තාව 2021 නම් වාර්තාවට අනුව ලෝකයේ රටවල් 141ක් අතරින් 74 වැනි ස්ථානයට ශ්‍රී ලංකාව පත්ව ඇත. 4-7 රූපයේ දැක්වෙන පරිදි 2012 සහ 2018 අතර කාලයේ දී සංචාරක ක්ෂේත්‍රය රටේ ආර්ථිකයට දායක වෙමින් ක්‍රමානුකූලව වර්ධනය විය. කෙසේ වෙතත්, 2019 වර්ෂයේ ඇති වූ පාස්කු ප්‍රහාරය හා ඉන්පසුව ඇති වූ COVID-19 වසංගතය නිසා, මෙම අංශයේ පසුබෑමක් ඇති වූ අතර, එහි ආර්ථික වර්ධනය දශකයකට පමණ පෙර පැවති තත්ත්වයට පත් විය. සංචාරක අංශය මගින් 2019 වර්ෂයේ දී සෘජු හා වක්‍ර රැකියා 400,000 කට ආසන්න ප්‍රමාණයක් නිර්මාණය කළ අතර, 2020 සහ 2021 වර්ෂවල දී එම ප්‍රමාණය දළ වශයෙන් 350,000ක් දක්වා පහත වැටී තිබේ[64].




4-7 රූපය සංචාරක අංශයේ විදේශ විනිමය උත්පාදනය (දත්ත - Statistical pocketbook, 2022)

වර්තමානය වන විට සංචාරකයන්ගෙන් බහුතරයක් මූලිකව උනන්දු වන්නේ විවේක චාරිකා සඳහා වුවද, ප්‍රජා-පාදක සංචාර සහ පුළුල් වන සෞඛ්‍ය සංචරණ උප අංශය කෙරෙහි කැමැත්තක් දක්වන සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාවට විශාල විභවයක් ඇත. සංචාරක ව්‍යාපාරය සඳහා වන ශ්‍රී ලංකා උපායමාර්ගික සැලසුම 2022-2025 නිර්මාණය කරන ලද්දේ වසංගතය නිසා ඇති වූ වර්තමාන පිරිහීමේ තත්ත්වයෙන් කර්මාන්තයට පුනර්ජීවයක් ලබා දීම පිණිසය. මේ සැලසුම මගින් අවධානය යොමු කළ යුතු ගැටලු සහ අවස්ථා හඳුනාගෙන යෝජනා කර ඇති ක්‍රියාමාර්ග සඳහා ව්‍යුහාත්මක යුක්තියුක්තභාවයක් ලබා දෙයි. එහි අරමුණ වන්නේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රතිසාධනයක් සහ අනාගත ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන න්‍යායපත්‍රයක් සැකසීමයි. සංචාරක අංශයේ විවිධාංගීකරණය සඳහා අවස්ථා ගණනාවක් ඇති අතර, ඊට උදාහරණ ලෙස, ආයුර්වේද ප්‍රතිකාර, භාවනා වැඩසටහන්, කයිට් සර්ෆින් ක්‍රීඩාව, ලෙන් ගවේෂණය (speleology), ත්‍රාසජනක ක්‍රීඩා සහ පුරා ජෛව විවිධත්වය දැක්විය හැකිය.

සංචාරක ව්‍යාපාරය මේ වන විටත් ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ බලපෑමට ලක් වී ඇත. ආන්තික උණුසුම, ගංවතුර, කුණාටු, වෙරළ තීරය අහිමි වීම සහ කොරල්පර සම්පත් ක්ෂය වීම නිවර්තන සහ උපනිවර්තන කලාපවල සංචාරක කර්මාන්තයට ඇති වන අවදානම් උග්‍ර කරයි. ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ පිහිටා ඇති සංචාරක ආකර්ෂණය ඇති ස්ථානවලින් 60% ක් පමණ මුහුදු මට්ටමේ සිට මීටර් දෙකකට වඩා අඩු උසකින් පිහිටා තිබේ.

64 Department of Census and Statics, Statistical Pocket Book, 2022

එසේම සංචාරකයින් සඳහා සංචාරක ගමනාන්ත තෝරා ගැනීමේදී මෝසම් කාලය නිශ්චිත සාධකයකි. මුහුදු වෙරළ, පක්ෂීන් නැරඹීම, තල්මසුන් නැරඹීම, ත්‍රාසජනක ක්‍රීඩා ආදිය සඳහා යෙදිය හැකි කාල වකවානු සහ ප්‍රදේශ පවතී. එබැවින් මෙරට සංචාරක කලාප වාර්ෂික දේශගුණය අනුව අවිධිමත් ලෙස සීමා වී ඇත.

රට අභ්‍යන්තරයේ පිහිටා ඇති බොහෝ සංචාරක ගමනාන්ත ඉතා දර්ශනීය වුව ද, අවදානමට ලක්විය හැකි ස්ථානවල පිහිටා ඇත. සැලසුම් රහිතව සහ අනවසරයෙන් කළ ඉදිකිරීම් මගින් දේශගුණ ආපදා හමුවේ අධික අවදානමක් ඇති වේ. මෙරට ඇති වන නියඟ කාලවකවානුවලදී අධි ඝනත්ව සංචාරක ප්‍රදේශවල ජල හිඟයක් ඇති වන අතර, ගංවතුර කාලවලදී ජලය දූෂිත විය හැකිය. දේශගුණ විපර්යාස නිසා යටිතල පහසුකම්වලට ද බලපෑම් ඇති වන අතර, එහි ප්‍රතිඵලය වන්නේ සංචාරකයන්ට නුසුදුසු තත්ත්ව ඇති වීමයි. බලශක්ති කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය කළමනාකරණය සහ නැවත වන වගාව වැනි කාබන්හරණ ක්‍රියාකාරකම් හරහා සංචාරක අංශයෙන් හරිතාගාර වායු අවමකිරීමේ සම ප්‍රතිලාභ ලබා දෙයි. එමගින්, අඩු කාබන් සංවර්ධන ගමන්මගක් අනුගමනය කරමින් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ආදායම වර්ධනයට, දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කළ හැකි ප්‍රධාන අංශයක් බවට මේ අංශය පත් කළ හැකිය.

සංචාරක අංශයේ අනුහුරුවීමේ ඉලක්ක NDC තුනක් මගින් ඉදිරිපත් කර ඇත්තේ තිරසර සංචාරක භාවිතයක් ආමන්ත්‍රණය කිරීම, අංශයේ අවදානම් අවම කිරීම සහ හරිත ගොඩනැගිලි සංකල්පය අනුගමනය කරන ඔරොත්තුදීම ගොඩනැගීමේ පියවර යන කරුණුය (4-10 වගුව). එසේම, බලශක්ති කාර්යක්ෂමතාව, හරිත ගොඩනැගිලි සහ හුදර්ශන ආශ්‍රිත ක්‍රියාකාරකම් ද සංචාරක අංශය සඳහා වන NDC අතර වන අතර, ඒවා මගින් හරිතාගාර වායු අවම කිරීමේ බලපෑමක් ඇති කරනු ඇත.

4-10 වගුව සංචාරක හා විනෝදාස්වාද අංශය සඳහා වන NDC

| NDC # | NDC |
|---|---|
| 1 | දේශගුණ විපර්යාසවලට ලක්වීමේ අවදානම ඉහළ සංචාරක ගමනාන්තවල තිරසර සංචාරක පිළිවෙත් සහ අවදානම් සූදානම වැඩි දියුණු කිරීම තුළින් ඔරොත්තුදීම ගොඩනැංවීම |
| 2 | සංචාරක කර්මාන්තයට බලපාන දේශගුණ විපර්යාසවලින් ඇතිවන ආපදා සම්බන්ධ අවදානම අඩුකරගැනීමේ සහ අවදානම් පැවරීමේ යාන්ත්‍රණ හඳුන්වාදීම |
| 3 | සියලුම නව ඉදිකිරීම් සහ නැවත සකස්කිරීම් සඳහා හරිත ගොඩනැගිලි සැලසුම් හඳුන්වාදීම හරහා සංචාරක කර්මාන්තයේ දේශගුණ ඔරොත්තු දීම ප්‍රවර්ධනය කිරීම |

### 4.10.1 සංචාරක හා විනෝදාස්වාද අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

**NDC 1 - දේශගුණ විපර්යාසවලට ලක්වීමේ අවදානම ඉහළ සංචාරක ගමනාන්තවල තිරසර සංචාරක පිළිවෙත් සහ අවදානම් සූදානම වැඩි දියුණු කිරීම තුළින් ඔරොත්තුදීම ගොඩනැංවීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: දේශගුණ විපර්යාස නිසා අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල, සංචාරක කර්මාන්තයට දේශගුණ විපර්යාසවලින් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම, ඉසිලුම් ධාරිතා ධාරිතා අධ්‍යයන සහ සංචාරක පහසුකම් හඳුනාගැනීම | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | MoE, MoPC&LG, SLTDA, UDA, CEA, MEPA, , CC&CRMD,, NARA, SLSDC, CCF, DWC, FD, DMC, NBRO, MD | 1. වැඩිම අවදානමකට ලක්ව ඇති ප්‍රදේශවල, සංචාරක කර්මාන්තයට දේශගුණ විපර්යාසවලින් ඇතිවන බලපෑම පිළිබඳ අධ්‍යයනය<br>2. ඉසිලුම් ධාරිතා ධාරිතා අධ්‍යයන සහ ප්‍රධාන ස්ථානවල සංචාරක පහසුකම් හඳුනාගැනීම | | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ වාර්තා | 1 - 0<br>2 - 0 | 1. වැඩිම අවදානමකට ලක්ව ඇති ප්‍රදේශ 5ක, සංචාරක කර්මාන්තයට දේශගුණ විපර්යාසවලින් ඇතිවන බලපෑම පිළිබඳ අධ්‍යයනය සම්පූර්ණ කර ඇත<br>2. ප්‍රධාන ස්ථාන අටක ඉසිලුම් ධාරිතා අධ්‍යයන සහ සංචාරක පහසුකම් හඳුනාගැනීම (කල්පිටිය හා හික්කඩුව ඇතුළත්ව) | √ | √ | √ | √ | √ | | | | | | 14.1, 14.2, 14.5, 15.9 |
| 1.2: ඉහත 1.1හි හඳුනාගත් සංචාරක ගමනාන්ත ප්‍රදේශවල අනුහුරුවීමේ ක්‍රියාමාර්ග හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | MoPC&LG, SLTDA, UDA, CEA, MEPA, CC&CRMD, NARA, SLSDC, CCF, DWC, FD, DMC, NBRO, MD | ආවරණය කරන සංචාරක ගමනාන්ත ගණන | | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ වාර්තා | මහ සැලසුමේ දී සලකා බලා තිබේ | ගමනාන්ත 5ක් ආවරණය වේ | | | | √ | √ | | | | | | 14.1, 14.2, 14.5, 15.9 |
| 1.3: අවදානමට ලක්ව ඇති හඳුනාගත් ගමනාන්ත වෙනුවට විකල්ප වශයෙන් විවිධාංගීකරණය කළ සංචාරක ආකර්ෂණ සහ නිෂ්පාදන උද්දේශනය කිරීම (උදා: සංස්කෘතික, ත්‍රාසජනක, ජීවන රටා, උත්සව සහ සමුද්‍රීය සංචාරක කර්මාන්තය ආදි) | SLTDA | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, MoE, SLINTGL, DWC, FD, CC)CRMD, CEA, පළාත් සභා, CCF, අන්තර්ජාතික අධ්‍යාපන කාර්යාංශය | අවදානමට ලක්විය හැකි ප්‍රදේශවලට විකල්ප පියවර | | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ වාර්තා | 0 | අවදානමට ලක්විය හැකි සියලු ස්ථානවලට විකල්ප පියවර හඳුනාගෙන ඇත | √ | √ | √ | √ | √ | | | | | | 14.1, 14.2, 14.5, 15.9 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.4: විවිධ පාර්ශ්වකරුවන්ට අදාළ වන තිරසර සංචාරක පිළිවෙත් සඳහා මාර්ගෝපදේශ/ මූලධර්ම ඇතුළත් කිරීම | SLTDA | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය SLSDC, GSTC, SLAITO, THASL, ASMET | ගමනාන්ත, නවාතැන් හා සංචාරක මෙහෙයුම් ආවරණය කරන GSTC මාර්ගෝපදේශ | | වෙනත් අංග සඳහා වන SLTDA මාර්ගෝපදේශ | ජගත් මට්ටමෙන් පවත්නා නවාතැන් මාර්ගෝපදේශ (2019) හා ගමනාන්ත මාර්ගෝපදේශ (2020) මෙරටට ගැළපිය යුතුය<br><br>සංචාරක මෙහෙයුම්කරුවන්ගේ මාර්ගෝපදේශ සම්පූර්ණ කර ඇත | විවිධ පාර්ශ්වකරුවන් සඳහා සංචාරක මෙහෙයුම් මාර්ගෝපදේශ ඇතුළත්ව තිරසර සංචාරක මාර්ගෝපදේශ සකස් කර ඇත | √ | √ | √ | √ | √ | | | | | | 11.b, 12.b |
| 1.5: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් ගෝලීය තිරසර සංචරණ සභාව (GSTC) සමග සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ජාතික තිරසර සංචරණ සහතිකකරණ යෝජනාක්‍රමය යටතේ සහතික ලත් ආයතන සහ ගමනාන්ත සංඛ්‍යාව වැඩිකිරීම | SLTDA | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, පළාත් සභා, UNDP, IUCN, පෞද්ගලික අංශයේ සංචාරක සංවිධාන, සිවිල් සංවිධාන හවුල්කරුවන් | සහතික කළ ගමනාන්ත, නවාතැන් හා සංචාරක මෙහෙයුම්කරුවන්, සමාගම් සංඛ්‍යාව | | SLTDA වාර්ෂික වාර්තා | 1 - 0<br><br>2 - 2019 වන විට නවාතැන් ස්ථාන 37ක් සහතික කර තිබිණි | 1 - පළාත් 9න් ගමනාන්ත 9ක් සහතික කර තිබීම<br><br>2 - නවාතැන්/ ස්ථාන 75ක් සහතික කර තිබීම | √ | √ | √ | √ | | | | | | | 12.b |

NDC 2 - සංචාරක කර්මාන්තයට බලපාන දේශගුණ විපර්යාසවලින් ඇතිවන ආපදා සම්බන්ධ අවදානම අඩුකර ගැනීමේ සහ අවදානම් පැවරීමේ යාන්ත්‍රණ හඳුන්වාදීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: වඩාත් අවදානමට ලක්ව ඇති සංචාරක ගමනාන්තවල පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීම සහ ධාරිතා වර්ධනය කිරීම | SLTDA | DMC,MD, NBRO, CC&CRMD, ID | 1 - අවදානමට ලක්ව ඇති සංචාරක ගමනාන්තවල පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීම<br><br>2 - අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය | | SLTDA වාර්තා | පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ඇතත් ඒවා අවදානමට ලක්ව ඇති සංචාරක ගමනාන්ත ඉලක්ක කරගත් ඒවා නොවේ | 1 - අවදානමට ලක්විය හැකි සියලු ප්‍රදේශ 5 සඳහාම ශක්තිමත් කළ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති මගින් ආවරණය වේ<br><br>2 - අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය කර ඇත | | | √ | √ | √ | | | | | | 13.1, 13.3 |
| 2.2: වෙරළ පුනරුත්ථාපනය සහ ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම | CC&CRMD | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය SLTDA, MEPA, FD, DWC | අවදානමට ලක්විය හැකි ප්‍රදේශ 5 වෙරළ ප්‍රදේශ (පවතී නම්) | | CC&CRMD වාර්තා | CC හා CRMDහි ක්‍රියාත්මක වන ප්‍රධාන කාර්යයයි | අවදානමට ලක්විය හැකි ප්‍රදේශ 5ම වෙරළ ප්‍රදේශ (පවතී නම්) මෙම ගින් ආවරණය කර ඇත | √ | √ | √ | √ | √ | √ | | | | | 14.1, 14.2, 14.5, 15.9 |
| 2.3: වෙරළබඩ සංචාරක කලාපීය සැලසුම් සකස්කිරීම ව්‍යාප්ත කිරීම | SLTDA | CC&CRMD, UDA, MEPA, CEA, BOI | අවදානමට ලක්විය හැකි වෙරළබඩ ප්‍රදේශවල ව්‍යාප්ත කළ කලාප සැලසුම් | | 1. මහ සැලසුම් ගැසට් කිරීම<br><br>2. ව්‍යාප්ත කරන ලද සංචාරක කලාප පිළිබඳ වාර්තාව | පාසිකුඩා, යාල, බෙන්තොට සඳහා කලාප සැලසුම් පවතී | අවදානමට ලක්විය හැකි වෙරළබඩ ප්‍රදේශවල ව්‍යාප්ත කරන ලද කලාප සැලසුම් සකස් කර ගැසට් කිරීම | √ | √ | √ | √ | √ | | | | | | 14.1, 14.2, 14.5, 15.9 |
| 2.4: සංචාරක කර්මාන්තයේ අවදානම් කළමනාකරණය සඳහා දේශගුණ විපර්යාස බලපෑම් අන්තර්ගත කළ රක්ෂණ යෝජනාක්‍රමයක් සකස් කිරීම | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | SLTDA, ජාතික රක්ෂණ භාර අරමුදල, රක්ෂණ සමාගම් | අන්තර්ජාතික ආවදානම පැවරීමේ යාන්ත්‍රණවලට සමගාමීව දේශගුණ විපර්යාස බලපෑම් ඇතුළත් රක්ෂණ යෝජනාක්‍රමයක් | | ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව | 0 | දේශගුණ විපර්යාස බලපෑම් අන්තර්ගත කළ රක්ෂණ යෝජනාක්‍රමයක් සකස් කර ඇත | | | √ | √ | √ | | | | | | 11.b |

## NDC 3 - සියලුම නව ඉදිකිරීම් සහ නැවත සකස්කිරීම් සඳහා හරිත ගොඩනැගිලි සැලසුම් හඳුන්වාදීම හරහා සංචාරක කර්මාන්තයේ දේශගුණ ඔරොත්තු දීම ප්‍රවර්ධනය කිරීම

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: දේශගුණ විපර්යාස සහ පාරිසරික පැතිකඩ ඇතුළත් කරගත හැකි ආකාරයට සංචාරක කර්මාන්තය සඳහා දැනට පවතින හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ (GBG) සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම | UDA | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය MoE, SLTDA, GBCSL, SLSEA, සංචාරක උපදේශක කමිටුව, SLIA, SLIE | සංචාරක කර්මාන්තයට විශේෂිත GBG | | නාගරික සංවර්ධන අධිකාරියේ හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ | පවත්නා GBG | GBG සමාලෝචනය කර යාවත්කාලීන කර ඇත | √ | √ | √ | | | | | | | | 6.3, 6.4, 7.2, 7.3, 11.b, 12.8 |
| 3.2: සංචාරක කර්මාන්තය සඳහාම විශේෂිත GBG සඳහා නීත්‍යානුකූලභාවයක් ලබාදීම | UDA | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය MoE, SLTDA, SLSEA | නව ගැසට්පත්‍රය | | නව ගැසට්පත්‍රය | UDA මගින් මේ ලේඛනය පිළියෙල කර ඇත | යාවත්කාලීන කළ GBG ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත | | | √ | √ | √ | | | | | | 6.3, 6.4, 7.2, 7.3, 11.b, 12.8 |
| 3.3: සංචාරක කර්මාන්තය පිළිබඳ හරිත ගොඩනැගිලි රීති සංග්‍රහය (Green Building Code) සැලසුම් කමිටු හා අදාළ පළාත්පාලන අධිකාරීන් සමඟ බෙදාගැනීම | UDA | SLTDA, LAs | මාර්ගෝපදේශ අන්තර්ගත කළ පළාත්පාලන ආයතන සංඛ්‍යාව | | UDA, පළාත්පාලන ආයතන, SLTDA වාර්තා | 0 | සියලු පළාත්පාලන ආයතන ආවරණය වීම | | | | √ | √ | | | | | | 6.3, 6.4, 7.2, 7.3, 11.b, 12.8 |
| 3.4: සංචාරක කර්මාන්තය සම්බන්ධ ගොඩනැගිලි සැලසුම්කිරීමට වගකියන වාස්තු විද්‍යාඥයින් සහ ඉංජිනේරුවන්ට සංචාරක කර්මාන්තය සඳහා හරිත ගොඩනැගිලි රීති සංග්‍රහ අනුගමනය කිරීම පිණිස ඔවුන්ගේ වෘත්තීයමය සංගම් හරහා පවත්වන දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා මුලපිරීම | SLTDA | GBCSL, SLIA, SLIE, IEPSL, ශාස්ත්‍රඥයන්, වෘත්තීයමය ආයතන | අදාළ සියලු පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම | | වෘත්තීයමය සංගම් මගින් සිදුකරන හරිත ගොඩනැගිලි පිළිබඳ වෘත්තීයමය පාඨමාලා විෂයමාලා | හරිත ගොඩනැගිලි පිළිබඳ දැනට පවත්නා වෘත්තීයමය පාඨමාලා විෂයමාලාවන් සංචාරක ර්මාන්තය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්නක් නොවේ. | අදාළ සියලු පාර්ශකරුවන් අතර දැනුම්වත්භාවය ඇති කිරීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 6.3, 6.4, 7.2, 7.3, 11.b, 12.8 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.5: සංචාරක කර්මාන්තයේ සිදුකෙරෙන සියලු නව ඉදිකිරීම් සහ නැවත සකස්කිරීම් සඳහා ඉහත කී හරිත ගොඩනැගිලි මාර් ගෝපදේශ බලාත්මක කිරීම | SLTDA | UDA, LAs, CC&CRMD, CEA, MEPA, NBRO | යාවත්කාලීන කළ SLTDA අනුමත කිරීමේ ක්‍රමවේදය | | SLTDA වාර්තා | SLTDA දැනට පවත්නා අනුමත කිරීමේ ක්‍රමවේදය තුළ නව ඉදිකිරීම් සහ නැවත සකස්කිරීම් සඳහා හරිත ගොඩනැලි මාර්ගෝප-දේශ නැත. | සියලු නව ඉදිකිරීම් සහ නැවත සක-ස්කිරීම් සඳහා හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ ඇතුළත් කිරීම | | | | | | √ | | | | | 6.3, 6.4, 7.2, 7.3, 11.b, 12.8 |

# 5 NDC ක්‍රියාත්මක කිරීම - අලාභ සහ හානි

## 5.1 දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකාව පසුගිය දශක දෙකක පමණ කාලය ඇතුළත විනාශකාරී නියඟ, ගංවතුර සහ නායයෑම් ඇතුළු මහා පරිමාණ ආපදා සිදුවීම් ගණනාවකට මුහුණ දී ඇත. ඒ තත්ත්වය ආහාර සුරක්ෂිතතාව, ජීවනෝපාය, යටිතල පහසුකම් සඳහා බලපෑ අතර, ඇමරිකානු ඩොලර් මිලියන 790කට වඩා අධික වියදමක් ප්‍රතිසංස්කරණ අවශ්‍යතා සඳහා වැය වූ බව ඇස්තමේන්තු කර ඇත. 2017 වර්ෂය සඳහා රජයේ ආපතික වගකීම රුපියල් බිලියන 23.8 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 149) හෝ රජයේ සියලු වියදම්වලින් 1% ක් පමණ විය[65]. දේශගුණ විපර්යාස නිසා ඇති විය හැකි බලපෑම් නිසා 2050 වන විට වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය 1.2% කින් අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. තවද, ශ්‍රී ලංකාව ස්වාභාවික විපත් හා සම්බන්ධව ඇති වන රුපියල් බිලියන 237කට (ඇමරිකානු ඩොලර් බිලියන 1.8) අධික නිවාස/මාර්ග අලාභ හා සහන අවශ්‍යතාවලට සෑම වර්ෂ 100ක කාලයකට වරක් මුහුණ දිය හැකි බව ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත් මේ ඇස්තමේන්තුවල දී ආර්ථික කැලඹීම්, දරිද්‍රතා මට්ටම් සඳහා වන බලපෑම්, සමාජ ආරක්ෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ වෙනත් සමාජ අවශ්‍යතා මත සිදුවන බලපෑම් හෝ සමාජ ආරක්ෂණයට ඇති ප්‍රතිවිපාක වැනි දිගුකාලීන පාඩු පිළිබඳව ගණන් ගෙන නැත. තවද, මෙම ගණනය කිරීම්වල දී ජලාධාර ප්‍රදේශ, ඓතිහාසික ස්ථාන, සංචාරක ආකර්ෂණ ස්ථාන සහ වෙරළ තීර වැනි ස්වාභාවික සම්පත් බාදනය වීම සැලකිල්ලට ගෙන නැත. ඓතිහාසික දත්ත අනුව ගංවතුර ඇතිවන වාර ගණන සහ තීව්‍රතාවය වැඩි වෙමින් පවතී. මීට අමතරව, රටේ ආහාර හා ජල සුරක්ෂිතතාව, කෘෂිකර්මය, ජෛව විවිධත්වය සහ වාසස්ථාන කෙරෙහි බරපතළ නිශේධනීය බලපෑම් ඇති කිරීමට හැකියාව ඇති කාන්තාරකරණය, මුහුදු මට්ටම ඉහළ යාම සහ ලවණීකරණය වැනි සෙමින් ඇති වන වන දේශගුණික අවදානම් පිළිබඳව ද ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුය.

දේශගුණ විපර්යාස බලපෑම් හා සම්බන්ධ අලාභ සහ හානි සඳහා වන වෝර්සෝ අන්තර්ජාතික යාන්ත්‍රණය (අලාභ සහ හානි යාන්ත්‍රණය), ස්ථාපිත කරන ලද්දේ විශේෂයෙන් දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලින් අවදානමට ලක්විය හැකි සංවර්ධනය වෙමින් පවතින රටවල ඇතිවන ආන්තික සිදුවීම් සහ සෙමෙන් ඇති වන සිදුවීම් ඇතුළු දේශගුණ විපර්යාසවල බලපෑම් හා සම්බන්ධ අලාභ සහ හානි පිළිබඳ කටයුතු කිරීම සඳහාය. මෙය පෝලන්තයේ වෝර්සෝහි පැවැති 19 වැනි පාර්ශ්කරුවන්ගේ සමුළුවේ දී (COP 19 - 2013 නොවැම්බර්) ඇතිකරගන්නා ලදි. පසුව, පැරිස් ගිවිසුමේ 8 වැනි වගන්තිය මගින් අලාභ සහ හානි වැළැක්වීම, අවම කිරීම සහ ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම සහ අලාභ සහ හානි අවදානම අවම කිරීම සඳහා තිරසර සංවර්ධනයේ කාර්යභාරය ඇතුළත් කර තිබේ.

අලාභ සහ හානි යාන්ත්‍රණය මගින් දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් හා සම්බන්ධ අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීමේ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කරන්නේ විස්තීර්ණ, ඒකාබද්ධ හා සුසංයෝගී ලෙසය. ඒ පහත සඳහන් කාර්යයන් සිදුකරමිනි[66]:

1. සෙමෙන් සිදුවන සිදුවීම් ද ඇතුළුව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් නිසා ඇතිවන අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීම සඳහා, විස්තීර්ණ ආපදා කළමනාකරණය ප්‍රවේශයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඉහළ නැංවීම පිණිස පහත සඳහන් කටයුතුවලට පහසුකම් සැපයීම හා ප්‍රවර්ධනය කිරීම:

   - තීරණ අංක 3/CP.18, ඡේද අංක 7(a) හි සඳහන්වන අංශ ඇතුළුව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් හා සම්බන්ධ අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීමේ ප්‍රවේශවල ඇති අවබෝධය පිළිබඳ හා විශේෂඥතාවය පිළිබඳ හිඩැස් සඳහා විසඳුම් ලබාදීම;

   - ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණට කළ දත්ත ද ඇතුළුව, අදාළ දත්ත හා තොරතුරු එකතු කිරීම, බෙදා ගැනීම, කළමනාකරණය හා භාවිතය;

   - අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීම සඳහා ගන්නා ප්‍රවේශ සම්බන්ධව යහ පිළිවෙත්, අභියෝග, පළපුරුද්ද හා උගත් පාඩම් පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබාදීම.

65 World Bank, Contingent Liabilities from Natural Disasters Sri Lanka, 2018

66 unfccc.int



2. අදාළ පාර්ශ්වකරුවන් අතර සංවාදය, සම්බන්ධීකරණය, ගැළපීම හා සමයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා:

   - නායකත්වය හා සම්බන්ධීකරණය සැපයීම හා යෝග්‍ය අවස්ථාවල දී සම්මුතිය යටතේ දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් වන ආන්තික තත්ත්ව හා සෙමින් ඇතිවන තත්ත්ව හා සම්බන්ධ අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීමේ ප්‍රවේශ තක්සේරු කිරීම හා ක්‍රියාත්මක කිරීම;

   - සියලු මට්ටම්වල අදාළ කටයුතු හා ක්‍රියාකාරකම් අතර සහයෝගය ප්‍රවර්ධනය කිරීම පිණිස සම්මුතියෙන් පිටත සියලු පාර්ශ්වකරුවන්, ආයතන, ක්‍රියාවලී හා මුලපිරීම් අතර සංවාද, සම්බන්ධීකරණය, ගැලපීම හා සමයෝගීතාව දියුණු කිරීම.

3. දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් නිසා ඇතිවන අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීමේ දී, ඒ ඒ රටවලට 3/CP.18 (ඡේද 6) යටතේ පියවර ගැනීමට හැකියාව ඇතිවන ලෙස මූල්‍ය, තාක්ෂණය හා ධාරිතා වර්ධනය ඇතුළුව, ක්‍රියාකාරිත්වය හා සහයෝගය දියුණු කිරීම සඳහා:

   - ආන්තික තත්ත්ව හා සෙමින් ඇතිවන සිදුවීම් ඇතුළත්ව, දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් නිසා ඇතිවන අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ප්‍රවේශ සඳහා තාක්ෂණික සහාය හා මගපෙන්වීම ලබාදීම;

   - අලාභ සහ හානිවලින් ඇතිවන අවදානම අඩුකිරීම සඳහා සහ අවශ්‍ය අවස්ථාව දී අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීම සඳහා, සම්මුතියේ මූල්‍ය යාන්ත්‍රණයේ මෙහෙයුම් ඒකක ඇතුළත්ව අදාළ අවස්ථාවල දී අදාළ වන මාර්ගෝපදේශනය ලබාදීමේ දී පාර්ශ්වකරුවන්ගේ සමුළුවේ දී සලකා බැලීම සඳහා තොරතුරු හා නිර්දේශ සැපයීම;

   - පවත්නා ප්‍රවේශ ශක්තිමත් කිරීමට හා අවශ්‍ය අවස්ථාවල දී දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් නිසා ඇතිවන අලාභ සහ හානි, ආන්තික තත්ත්ව හා සෙමින් ඇතිවන සිදුවීම් ඇතුළත්ව, ආමන්ත්‍රණය කරන අතිරේක ප්‍රවේශ දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම පිණිස විශේෂඥතාවය, හා මූල්‍ය, තාක්ෂණය හා ධාරිතා වර්ධනය ඇතුළත්ව සහයෝගයේ වර්ධනය සහ සචලනය සඳහා පහසුකම් සැපයීම.

තිරසර සංවර්ධන අභිමතාර්ථ, දේශගුණ ක්‍රියාමාර්ග සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව සමඟ ගැලපෙන ආකාරයෙන් ආපදා කළමනාකරණය සඳහා වූ යටිතල පහසුකම්, ප්‍රතිපත්ති රාමු සහ හවුල් අරමුණු යටතේ වූ සැලසුම් ක්‍රමවත් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. වර්තමානයේ දැකිය හැකි ආයතනික අභියෝග පැන නගින්නේ, විශේෂයෙන් ප්‍රතිචාර දැක්වීමේ අවධිවල දී, බොහෝ ප්‍රතිපත්ති, එකිනෙක අතිච්ඡාදනය වන වගකීම් සහ ප්‍රතිඵලයක් ලෙස කාර්යභාරයන් ව්‍යාකුලවීමෙනි. මීට අමතරව, ප්‍රාදේශීය මට්ටමින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ගැටලු ඇති වන්නේ සම්පත් හිඟකම, මානව ධාරිතාව සහ තාක්ෂණික දැනුම නොමැතිකම හේතුවෙනි. 5-1 රූපය මගින් විවිධ මට්ටම්වල දී ආපදා අවදානම් අවම කිරීම සහ දේශගුණ විපර්යාස අතර පවත්නා ප්‍රතිපත්තිමය භූ දර්ශනය විශ්ලේෂණය කරන අතර, යහ පිළිවෙත් ලේඛනගත කර බෙදාහරිනු ලැබේ[67].

67 https://www.undrr.org/comprehensive-disaster-and-climate-risk-management-crm




5-1 රූපය සවිස්තර ආපදා හා දේශගුණ ආපදා කළමනාකරණය

ඊජිප්තුවේ ෂාම්-එල්-ෂෙයික් හි පැවැති 27 වන පාර්ශ්වකරුවන්ගේ සමුලුවේ දී (COP 27), ගංවතුර, නියඟය සහ අනෙකුත් දේශගුණ ආපදාවලට නිරාවරණය වන අවදානමට ලක්විය හැකි රටවල් සඳහා වූ අරමුදලක් පිහිටුවීම සඳහා ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. පුළුල් වශයෙන් ගත් විට, ගෝලීය සාමාන්‍ය උෂ්ණත්වය වැඩිවීම වැළැක්වීමට හා දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරුවීම සඳහා ගන්නා සියලු ප්‍රයත්න මගින් සමාජය සහ පුද්ගලයන් දැරිය යුතු වන දේශගුණ විපර්යාස හා සම්බන්ධ අලාභ සහ හානිවල අවදානම වැළැක්වීම හෝ අඩු කිරීම සඳහා දායක විය හැකිය.

ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කළ දායකත්ව සඳහා පදනම් වී ඇත්තේ ආපදා අවදානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුව (2015-2030) සහ වෝර්සෝ ජාත්‍යන්තර යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන ආයතනික සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණ මතය. එය 5-1 වගුවේ දක්වා ඇත.

5-1 වගුව අලාභ සහ හානි අංශයේ NDC

| NDC # | NDC |
|---|---|
| 1 | අලාභ සහ හානිවල වර්තමාන තත්ත්වය සහ අවබෝධය තක්සේරු කිරීම සඳහා හිඩැස් විශ්ලේෂණයක් සිදුකිරීම |
| 2 | දැනට පවතින කාලගුණ සහ දේශගුණ අනාවැකි පැවසීමේ පද්ධතිය ශක්තිමත් කිරීම |
| 3 | එක් එක් අංශයේ අලාභ සහ හානි වාර්තා කිරීම සඳහා දත්ත කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම |
| 4 | අලාභ සහ හානි සඳහා සාර්ව, ජාතික වශයෙන් යෝග්‍ය, ක්‍රියාත්මක ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම |
| 5 | පරිපූර්ණ ආපදා කළමනාකරණ රාමුවක් සකස් කිරීම |

## 5.1.1 අලාභ සහ හානි අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්ව ක්‍රියාත්මක කිරීමේ සැලසුම

NDC 1 - අලාභ සහ හානිවල වර්තමාන තත්ත්වය සහ අවබෝධය තක්සේරු කිරීම සඳහා හිඩැස් විශ්ලේෂණයක් සිදුකිරීම: මීට කාලගුණය හා දේශගුණය සම්බන්ධ ආන්තික සිදුවීම්, සෙමෙන් ඇතිවන ආපදා සහ දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බව සලකන ස්වාභාවික ක්‍රියාවලි අයත් වේ. මේ විශ්ලේෂණය මගින් i) අලාභ සහ හානි පිළිබඳ දැනුම්වත් භාවය හා ධාරිතාව, ii) දත්ත එකතු කිරීම හා විශ්ලේෂණය සහ iii) ප්‍රතිපත්ති, ආයතනික සැලසුම් හා විධිනියම ආවරණය වේ.

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 1.1: ජාතික අවශ්‍යතා හා වෝර්සෝ අන්තර්ජාතික යාන්ත්‍රණයේ (WIM) අවශ්‍යතා විශ්ලේෂණ නිර්ණායක ලෙස ගෙන ආපදා අලාභ සහ හානි තක්සේරු කිරීමට හා වාර්තා කිරීම සඳහා පවත්නා ආයතනික යාන්ත්‍රණ අධ්‍යයනය කිරීමට හා හඳුනාගැනීමට අධ්‍යයනයක් සැලසුම් කර සිදුකිරීම | MoDM | MoE, DMC, MD, NBRO, NDRSC, වෙනත් අදාළ ආංශික ආයතන | පවත්නා ආයතනික යාන්ත්‍රණ හඳුනාගැනීමේ අධ්‍යයනයක් | | MoDM හි අධ්‍යයන වාර්තාව | හුදකලා හා තනි මුලපිරීම් විවිධ ආයතනවලින් සිදුකර ඇත | අධ්‍යයන වාර්තාව සකස්කර තිබීම | | √ | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 1.2: අංශ අනුව අලාභ සහ හානි (ආර්ථික හා ආර්ථික නොවන) ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය අර්ථදැක්වීම් පිළිබඳ යාන්ත්‍රණයක් ස්ථාපිත කර එකඟවීම | MoDM | MoDM MoE, DMC, තෝරාගත් ආංශික ආයතන | ක්‍රමවේදය හා අර්ථදැක්වීම් | | MoDM හා DMC වෙතින් දත්ත මූලාශ්‍ර | නැත | ක්‍රමවේදය සකස්කර ඇති අතර, අර්ථදැක්වීම් සඳහා එකඟ වී ඇත | √ | √ | √ | | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 1.3: දේශගුණ විපර්යාස බලපෑමෙන් ඇතිවන ආන්තික තත්ත්ව කාණ්ඩයේ ආපදා සඳහා අලාභ සහ හානිවල පශ්චාත් ආපදා තක්සේරුවක් සඳහා ක්‍රමවේදයක් සැකසීම. මේ ආන්තික තත්ත්වවලට, නියගය, දැඩි සුළං, අකුණුගැසීම්, නිවර්තන සුළිකුණාටු, කුණාටු, ගංවතුර, නායයෑම් හා තාප ප්‍රවාහ ඇතුළත්ය. | MoDM | MoE, MoH, MoWS, DMC, MD, NBRO, NDRSC, ID, MASL, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | ආන්තික තත්ත්ව පිළිබඳ පශ්චාත්-ආපදා තක්සේරුව සඳහා ක්‍රමවේදයක් | | MoDM වාර්තා | වෙනස් ආයතන වෙනස් ක්‍රමවේද භාවිත කරයි | ආන්තික තත්ත්ව පිළිබඳ පශ්චාත්-ආපදා තක්සේරුව සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | √ | √ | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 1.4: දේශගුණ විපර්යාස බලපෑමෙන් සෙමෙන් ඇතිවන තත්ත්ව හා ක්‍රියාවලී කාණ්ඩයේ ආපදා සඳහා අලාභ සහ හානිවල පශ්චාත් ආපදා තක්සේරුවක් සඳහා ක්‍රමවේදයක් සැකසීම. මේ සෙමෙන් ඇතිවන සිදුවීම් හා ක්‍රියාවලීවලට, මුහුදු මට්ටම ඉහළ යෑම, ලවණතාවය වැඩිවීම, සාගරය ආම්ලිකකරණය, කාන්තාරකරණය, භූමිය හා වනාන්තර හායනය, උෂ්ණත්වය ඉහළ යෑම, ජෛව විවිධත්වය අහිමි වීම ඇතුළත්ය | MoE | MoDM, MoH, MoWS, DMC, MD, NBRO, NDRSC, ID, MASL, NARA, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | සෙමෙන් ඇතිවන තත්ත්ව පිළිබඳ පශ්චාත්-ආපදා තක්සේරුව සඳහා ක්‍රමවේදයක් | | අදාළ අනුහුරුවීමේ හා අවමකිරීමේ අංශවල විෂය භාර අමාත්‍යාංශවල වාර්තා | වෙනස් ආයතන වෙනස් ක්‍රමවේද භාවිත කරයි | සෙමෙන් ඇතිවන තත්ත්ව පිළිබඳ පශ්චාත්-ආපදා තක්සේරුව සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත | √ | √ | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 1.5: දේශගුණ විපර්යාස නිසා ඇතිවන ආන්තික තත්ත්ව කාණ්ඩයේ ආපදාවල අලාභ සහ හානි පිළිබඳ පූර්ව-ආපදා තක්සේරු සඳහා ක්‍රමවේදයක් සැලසුම් කිරීම | MoDM | MoE, MoH, MoWS, DMC, MD, NBRO, NDRSC, ID, MASL, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | ආන්තික තත්ත්ව පිළිබඳ පූර්ව-ආපදා තක්සේරුව සඳහා ක්‍රමවේදයක් | | MoDM වාර්තා | වෙනස් ආයතන වෙනස් ක්‍රමවේද භාවිත කරයි | ආන්තික තත්ත්ව පිළිබඳ පූර්ව-ආපදා තක්සේරුව සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර තිබීම | √ | √ | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.6: දේශගුණ විපර්යාස නිසා ඇතිවන සෙමෙන් ඇතිවන සිදුවීම් හා ක්‍රියාවලී කාණ්ඩයේ ආපදාවල අලාභ සහ හානි පිළිබඳ පූර්ව-ආපදා තක්සේරු සඳහා ක්‍රමවේදයක් සැලසුම් කිරීම | MoE | MoDM, MoH, MoWS, DMC, MD, NBRO, NDRSC, ID, MASL, NARA, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | සෙමින් ඇතිවන සිදුවීම් පිළිබඳ පූර්ව-ආපදා තක්-සේරුව සඳහා ක්‍රමවේදයක් | | අදාළ අනුහුරුවීමේ හා අවමකිරීමේ අංශවල විෂය භාර අමාත්‍යාංශවල වාර්තා | වෙනස් ආයතන වෙනස් ක්‍රමවේද භාවිත කරයි | සෙමින් ඇතිවන සිදුවීම් පිළිබඳ පූර්ව-ආපදා තක්-සේරුව සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර තිබීම | √ | √ | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 1.7: ඉහත ක්‍රියාකාරකම් මත පදනම්ව, තෝරාගත් ප්‍රධාන අංශවල දේශගුණ විපර්යාස නිසා ඇතිවන ආන්තික සිදුවීම්වලින් ඇතිවන අලාභ සහ හානි (ආර්ථික, ආර්ථික නොවන) තක්සේරු කිරීමට, විශ්ලේෂණය කිරීමට හා වාර්තාකිරීමට 2015 පාදක වර්ෂය ලෙස ගෙන පද්ධතියක් ස්ථාපිත කිරීම | MoDM | MoE, MoH, MoWS, DMC, MD, NBRO, NDRSC, ID, MASL, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | තක්සේරු කිරීම, විශ්ලේෂණය හා වාර්තා කිරීම සඳහා පද්ධතියක් | | MoDM වාර්තා | වෙනස් ආයතන වෙනස් ක්‍රමවේද භාවිත කරයි | තක්සේරු කිරීම, විශ්ලේෂණය හා වාර්තා කිරීම සඳහා පද්ධතියක් ස්ථාපිත කර තිබීම | | | | √ | √ | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 1.8: ඉහත ක්‍රියාකාරකම් මත පදනම්ව, තෝරාගත් ප්‍රධාන අංශවල දේශගුණ විපර්යාස නිසා සෙමෙන් ඇතිවන සිදුවීම්/ ක්‍රියාවලී නිසා ඇතිවන අලාභ සහ හානි (ආර්ථික, ආර්ථික නොවන) තක්සේරු කිරීමට, විශ්ලේෂණය කිරීමට හා වාර්තාකිරීමට 2015 පාදක වර්ෂය ලෙස ගෙන පද්ධතියක් ස්ථාපිත කිරීම | MoE | MoDM, MoH, MoWS, DMC, MD, NBRO, NDRSC, ID, MASL, NARA, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | තක්සේරු කිරීම, විශ්ලේෂණය හා වාර්තා කිරීම සඳහා පද්ධතියක් | | අදාළ අනුහුරුවීමේ හා අවමකිරීමේ අංශවල විෂය භාර අමාත්‍යාංශවල වාර්තා | වෙනස් ආයතන වෙනස් ක්‍රමවේද භාවිත කරයි | තක්සේරු කිරීම, විශ්ලේෂණය හා වාර්තා කිරීම සඳහා පද්ධතියක් ස්ථාපිත කර ඇත | | | | √ | √ | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 1.9: අලාභ සහ හානි දත්ත සැපයීම සඳහා අදාළ අමාත්‍යාංශ හා ආංශික ආයතනවල නෛතික බැඳීමක් ඇතිකිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන ලබාගැනීම (ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා අදාළ බලධාරීන් අතර අත්සන් කරන අවබෝධතා ගිවිසුම් මගින් දත්ත හුවමාරු කරගැනීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමෙන්) | MoDM | MoE | නෛතික ප්‍රතිපාදන | | MoDM වාර්තා | නැත | නෛතික ප්‍රතිපාදන සකස් කර ඇත | | | | √ | √ | √ | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

**NDC 2 - දැනට පවතින කාලගුණ සහ දේශගුණ අනාවැකි පැවසීමේ පද්ධතිය ශක්තිමත් කිරීම: i) පූර්ව අනතුරු ඇඟවීම සහ භාවිතා කරන්නන් සඳහා වන සේවා වැඩිදියුණු කිරීමට, ii) කාලගුණය හා දේශගුණය සම්බන්ධ ආන්තික සිදුවීම්, සෙමෙන් ඇතිවන ආපදා සහ දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බවක් සලකන ස්වාභාවික ක්‍රියාවලි හා අදාළව අලාභ සහ හානි පුරෝකථනය සහ වාර්තා කිරීම සඳහා වන හැකියාව වැඩිදියුණු කිරීම හා iii) දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බවක් කිවහැකි අලාභ සහ හානි තීරණය කිරීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 2.1: ආන්තික සිදුවීම් පිළිබඳ අනාවැකි පැවසීම, පූර්ව අනතුරු ඇඟවීම් හා පරිශීලක සේවා දියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ධාරිතාව, උපකරණ, සන්නිවේදන යාන්ත්‍රණ තක්සේරු කිරීම සඳහා වර්තමාන කාලගුණ හා දේශගුණ අධීක්ෂණය හා අනාවැකි පද්ධති හා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිවල තත්ත්වය හා හැකියාව සමාලෝචනය කිරීම | MoDM | MoE, MoH, MoWS, MoA, MoPlant, MD, NBRO, DMC, NARA, MEPA, ID, MASL, DoF, කාලගුණ හා දේශගුණ අධීක්ෂණ තොරතුරු භාවිත කරන ආයතන | පවත්නා අනාවැකි පැවසීම, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හා ජනතාව ඉවත්කිරීම් පිළිබඳ වාර්තාවක් | | MoDM වාර්තා | පවත්නා අනාවැකි පැවසීම, පූර්ව අනතුරු ඇඟවීම හා ජනතාව ඉවත්කිරීම | හිඩැස් හඳුනාගෙන ඇත | √ | √ | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 2.2: සෙමෙන් ඇතිවන සිදුවීම් පිළිබඳ අනාවැකි පැවසීම, පූර්ව අනතුරු ඇඟවීම් හා පරිශීලක සේවා දියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ධාරිතාව, උපකරණ, සන්නිවේදන යාන්ත්‍රණ තක්සේරු කිරීම සඳහා වර්තමාන කාලගුණ හා දේශගුණ අධීක්ෂණය හා අනාවැකි පද්ධති හා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිවල තත්ත්වය හා හැකියාව සමාලෝචනය කිරීම | MoE | MoDM, MoH, MoWS, MoA, Mo-Plant, MD, NBRO, DMC, NARA, MEPA, ID, MASL, DoF, කාලගුණ හා දේශගුණ අධීක්ෂණ තොරතුරු භාවිත කරන ආයතන | පවත්නා අනාවැකි පැවසීම, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හා ජනතාව ඉවත්කිරීම් පිළිබඳ වාර්තාවක් | | MoE වාර්තා records | පවත්නා අනාවැකි පැවසීම, පූර්ව අනතුරු ඇඟවීම හා ජනතාව ඉවත්කිරීම | හිඩැස් හඳුනාගෙන ඇත | √ | √ | √ | | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 2.3: ඉහත 2.1 හා 2.2 ක්‍රියාමාර්ගවල දී හඳුනාගත් හිඩැස් ආමන්ත්‍රණය කිරීම. | MD, MoH, NBRO, DMC, NARA, MEPA, ID, MASL, MASL, DoF, කාලගුණ හා දේශගුණ අධීක්ෂණ තොරතුරු භාවිත කරන ආයතන | MoDM, MoE | සෙන්ඩායි දර්ශක A හා B; (A-1 to A-3, B-1, B-2) - බලපෑමට ලක් වූ ජනතාව හා මරණ | | DMC හි "DesInventra" දත්ත සමුදාය | 2015 දී බලපෑමට ලක් වූ ජනතාව 187,250<br><br>2015 දී මරණ 151 | 2030 වන විට බලපෑමට ලක් වූ ජනතාව හා මරණ ප්‍රමාණය 50%කින් අඩු වී ඇත | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

**NDC 3 - එක් එක් අංශයේ අලාභ සහ හානි වාර්තා කිරීම සඳහා දත්ත කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම: 2015 පාදක වර්ෂය ලෙස සලකමින් ආර්ථික සහ ආර්ථික නොවන අලාභ යන දෙකම තක්සේරු කිරීම සහ ප්‍රමාණාත්මකව ගණනය කිරීම සහ ආපදා හා දේශගුණ අවදානම් කළමනාකරණ උපායමාර්ග හා ජාතික සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය දැනුම්දීම**

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 3.1: දේශගුණ විපර්යාස බලපෑම් හා දේශගුණ විපර්යාසවල හානිකර බලපෑම් (ආර්ථික හා ආර්ථික නොවන) හා සම්බන්ධ අලාභ සහ හානි තක්සේරු කිරීමට හා ලේඛනගත කිරීමට ජාතික හා අංශික මට්ටමේ තාක්ෂණික ධාරිතාව වර්ධනය කිරීම | MoDM, MoE, DCS | සියලු අදාළ ආයතන | අලාභ සහ හානි දත්ත හැසිරවීම සම්බන්ධව පුහුණු කළ කාර්යමණ්ඩල ප්‍රමාණය<br><br>අලාභ සහ හානි සඳහා මධ්‍යගත දත්ත සමුදායක් | | DMC වාර්තා | පුහුණු වූ කාර්යම ණ්ඩල ඇත්තේ ආයතනික මට්ටමින් පමණි<br><br>"DesInve ntra" දත්ත සමුදාය, ආපදා ආශ්‍රිත සංඛ්‍යා- නමය රාමුව (DRSF) | 100 දෙනෙකුගේ තාක්ෂණික ධාරිතාව දියුණු කර ඇත (එක් ප්‍රධාන ආයතනයකින් 5 දෙනෙකු පමණ බැගින්)<br><br>අලාභ සහ හානි තොරතුරු සඳහා "DesInventra" දත්ත සමුදාය දිය- ණුකිරීම හෝ නව දත්ත සමුදායක් ස්ථාපිත කිරීම | | | √ | √ | √ | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 3.2: 2017න් පසුව දේශගුණ බලපෑමේ ඇති වූ ප්‍රධාන සිදුවීම් සඳහා ප්‍රධාන අංශ යටතේ ක්‍රියාත්මක කර ඇති ප්‍රතිසාධන/ වන්දි වැඩසටහන් තක්සේරු කර වාර්තා කිරීම | MoDM | MoE, MoH, MoWS, MoA, MoPC&LG, NPD, NDRSC, අනුහුරුවීම හා අවමකිරීම පිළිබඳ ආංශික ආයතන | ප්‍රතිසාදන හා වන්දි වියදම | | ආංශික ආයතනවලින් | ආයතනික මට්ටමින් පමණක් ඇත | ප්‍රතිසාදන හා වන්දි වියදම් ඇස්තමේ- න්තු කර ඇත | | | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 3.3: අලාභ සහ හානි අඩුකිරීමේ අරමුණින් (සහ අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා) ආංශික හා ජාතික සැලසුම්කරණය සඳහා දැනුම්දීම හා භාවිතය පිණිස නිත්‍ය කාලප- රතරවල දී ඇස්තමේන්තු සැකසීම (සැලසුම් චක්‍ර හා ගැළපෙන ලෙස) | MoDM | MoE, MoH, MoWS, MoA, MoPC&LG, NPD, NDRSC, අනුහුරුවීම හා අවමකිරීම පිළිබඳ ආංශික ආයතන | ප්‍රතිසාධන හා වන්දි වියදම හා සත්‍ය වියදම් පිළිබඳ ඇස්තමේන්තු | | වාර්ෂික අය වැය වාර්තා(ව) | ආයතනික මට්ටමින් පමණක් ඇත | ප්‍රතිසාධන හා වන්දි වියදම් සහ සත්‍ය වියදම් වාර්ෂිකව ඇස්තමේන්තු කර ඇත | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

NDC 4 - 'අලාභ සහ හානි සඳහා වන වෝර්සෝ ජාත්‍යන්තර යාන්ත්‍රණයට අනුකූල වන අන්දමින් (NDC 1 හි සඳහන් හිඩැස් විශ්ලේෂණය මත පදනම්ව) අලාභ සහ හානි සඳහා සාර්ව, ජාතික වශයෙන් උචිත, ක්‍රියාත්මක ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. අධීක්ෂණ කටයුතුවලට අමතරව බහුවිධ අංශවල ආයතන සමග සම්බන්ධීකරණය කිරීමට මෙම ආයතනික ව්‍යුහයට විධිනියම හිමිවනු ඇති අතර, ඊට මූල්‍ය සහ අයවැය අධිකාරය ද හිමිවනු ඇත.

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 4.1: වෝර්සෝ අන්තර්ජාතින යාන්ත්‍රණය හෝ අලාභ සහ හානි සඳහා වන වෙනත් යාන්ත්‍රණයක් සමග, පොදු කරුණු හා ප්‍රතිලාභ පිළිබඳ සාකච්ඡා හා සංවාද පවත්වාගැනීම පිණිස ජාතික මට්ටමි-න් අන්තර්ක්‍රියා කිරීම සඳහා තාක්ෂණික ධාරිතාවය හා සාර්ව උපදේශන ධාරිතාව සහිත ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | MoE, MoDM | MoF, NPD, DMC, MD, NBRO, NARA, NDRSC, ID, MASL, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | ආයතනික යාන්ත්‍රණය | | MoE, MoDM වාර්තා | ජාතික ආපදා කළමනා කරණ සම්බන්ධී කරණ කමිටු රැස්වීම් <br><br> අනුහුරුවීම පිළිබඳ NECCC, අවමකිරීම පිළිබඳ NECCC | ආයතනික යාන්ත්‍රණය ස්ථාපිත කිරීම | | | √ | √ | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 4.2: දේශගුණ විපර්යාසවල බලපෑමෙන් ඇති වන ආර්ථික හා ආර්ථික නොවන අලාභ සහ හානි ද ඇතුළත්ව අලාභ සහ හානි තක්සේරු කිරීම සඳහා අදාළ අංශයේ ආයතන අතර සම්බන්ධීකරණය, ගැළපීම හා සමයෝගීතාව ශක්තිමත් කිරීම | MoE, MoDM | DMC, MD, NBRO, NDRSC, ID, MASL, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන, අදාළ ශාස්ත්‍රඥයන්, NGOs හා INGOs | සම්බන්ධීකරණ යාන්ත්‍රණය | | MoE, MoDM වාර්තා | ජාතික ආපදා කළමනාක රණ සම්බන්ධීක-රණ කමිටු රැස්වීම් <br><br> අනුහුරුවීම පිළිබඳ NECCC, අවමකිරීම පිළිබඳ NECCC | ඵලදායී සම්බන්ධීක-රණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 4.3: ජාතික හා ආංශික සැලසුම්, අයවැය ප්‍රතිපාදන හා අධීක්ෂණ ක්‍රියාකාරකම් සමග සම්බන්ධිතව ජාතික වශයෙන් ලාභ/ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අලාභ සහ හානි තක්සේරු තොරතුරු භාවිත කිරීම | MoF (NPD, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - NBD) | MoDM, MoE, MoWS, DMC, Sec-toral agencies, MD, NBRO, NDRSC, ID, MASL, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම | | දත්ත මූලාශ්‍ර හා ආංශික අයවැය හා සැලසුම් | ආයතනික මට්ටමෙන් ඇත | මූල්‍ය පහසුකම් ඇත (ඒකාබද්ධ අරමුදලෙන් අයවැය ප්‍රතිපාදන හා/හෝ බාහිර මූලාශ්‍රවලින්) | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4.4: අන්තර්ජාතික මූල්‍ය යාන්ත්‍රණවලින් වන්දි ලබාගැනීම සඳහා අදාළ ආංශික ආයතනවලට පහසුකම් සැපයීම අලාභ සහ හානි තක්සේරු තොරතුරු භාවිත කිරීම | MoF (NPD, ERD, NBD) | MoDM, MoE, MoWS, DMC, MD, NBRO, NDRSC, ID, MASL, DoA, DoF, වෙනත් අදාළ ආංශික ආයතන | මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම | | දත්ත මූලාශ්‍ර හා ආංශික අයවැය හා සැලසුම් | ආයතනික මට්ටමෙන් ඇත | මූල්‍ය පහසුකම් ඇත (ඒකාබද්ධ අරමුදලෙන් අයවැය ප්‍රතිපාදන හා/හෝ බාහිර මූලාශ්‍රවලින්) | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

NDC 5 - 2005 ආපදා කළමනාකරණ පනත මත පදනම් වූ, එහෙත් දේශගුණය සම්බන්ධ ආන්තික සිදුවීම්, සෙමෙන් ඇතිවන ආපදා හා දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බව සැලකෙන ස්වාභාවික ක්‍රියාවලි සහ අනාගතයේ අපේක්ෂිත අලාභ සහ හානි යන සමස්ත පරාසයම ඇතුළත් කිරීමට හැකිවන පරිදි පුළුල් කරන ලද විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් සංවර්ධනය කිරීම.
ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක අදාළ සියලුම ආංශික ආයතන සිදුකරන ආපදා කළමනාකරණ උපායමාර්ග/ අනුහුරුවීමේ සැලසුම් ප්‍රධානධාරාගත කිරීමට උපකාරී වනු ඇත. ඒ, i) අලාභ සහ හානි අවමකර ගැනීම සඳහා පදනමක් වශයෙන්, ii) සංවර්ධන ආයෝජන අවදානම් සඳහා සංවේදී බව සහතික කරගැනීමට හා අවදානම පැවරුම සඳහා උචිත යන්ත්‍රණ ඒකාබද්ධ කිරීම ඔස්සේ අවශේෂ අලාභ සහ හානි අයකරගැනීමත් සඳහා සබලකරණය කිරීම (සමාජ ආරක්ෂණය, අවදානම් රැඳවුම, රක්ෂණ, හදිසි අවස්ථා අරමුදල් වැනි විකල්ප) ලෙසිනි.

| ක්‍රියාකාරකම්/ අනු ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක කිරීමේ වගකීම | | මූලික කාර්යසාධන දර්ශකය (KPI) | | සත්‍යාපනය කිරීමේ ක්‍රම හා මූලාශ්‍ර | මූලික දත්ත | ඉලක්ක | කාලරාමුව (2021-2030) | | | | | | | | | | අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථයේ ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන ආයතනය | වෙනත් මූලික ආයතන | | | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | |
| 5.1: 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත මත පදනම් වූ ජාතික මට්ටමේ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් සකස් කිරීමෙන් ආපදා අවදානම් කළමනාකරණය, දේශගුණ අවදානම් කළමනාකරණය හා සංවර්ධනය අතර ඉහළ සම්බන්ධීකරණයක් ස්ථාපිත කිරීම | DMC | MoDM, MoE, NPD, අදාළ සියලු රේඛීය අමාත්‍යාංශ හා ආංශික ආයතන | ජාතික මට්ටමේ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් | | MoDM, DMC වාර්තා | ජාතික මට්ටමේ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් MoDM, DMCවාර්තා<br><br>ජාතික ආපදා කළමනාකරණ සැලසුම (2013-2017)<br><br>ශ්‍රී ලංකා විස්තීර්ණ ආපදා කළමනාකරණ වැඩසටහන (2014-2018) | ජාතික මට්ටමේ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුව සකස් කිරීම | √ | √ | √ | | | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.2: දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් හා ආපදා හා සම්බන්ධිත අලාභ සහ හානි ආමන්ත්‍රණය කිරීම සඳහා විස්තීර්ණ අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් පිළිබඳ සැලසුම්කරණයේ යෙදෙන ආපදා, දේශගුණ හා සංවර්ධන අංශවල නිලධාරීන් අතර අවබෝධය හා දැනුම වර්ධනය කිරීම (සෙන්ඩායි රාමුව, WIM හා SDG මගින් නිර්දේශිත පරිදි) | MoDM | MoE, අදාළ වෙනත් අමාත්‍යාංශ හා ආයතන | වැඩසටහන් සංඛ්‍යාව<br><br>නිලධාරීන් සංඛ්‍යාව | | MoDM වාර්තා | නැත (අන්තර් ජාතික මට්ටමින් පුහුණු වූ තනි පුද්ගලයන් හැර) | වර්ෂයකට වැඩසටහන් 5 බැගින් පවත්වා වාර්ෂිකව අවම වශයෙන් නිලධාරීන් 100ක් පුහුණු කිරීම | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 5.3: අවදානම් පැවරුම සන්දර්භය යටතේ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ අලාභ සහ හානි අවශ්‍යතා තක්සේරු කිරීම (NDC 1 පදනම්ව) | MoF, MoDM | MoE, NPD, DMC, NDRSC, අදාළ ආංශික ආයතන | තක්සේරුව | | MoDM/NPD හි තක්සේරු වාර්තාව | ඇතැම් ආයතන තනිව වැඩසටහන් පවත්වා ඇත | තක්සේරුව පවත්වා තිබීම | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 5.4: අලාභ සහ හානි ආමන්ත්‍රණය සඳහා දැනට පවත්නා රක්ෂණ ප්‍රතිපත්ති හා ප්‍රතිපත්ති මෙවලම් සමාලෝචනය කිරීම | MoF, MoDM | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම (IRCSL), MoF, MoE, NDRSC, MoA, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC), සමාජ ආරක්ෂණ මණ්ඩලය, අදාළ අමාත්‍යාංශ හා අනුහුරුවීමේ හා අවමකිරීමේ අංශ | රක්ෂණ ප්‍රතිපත්ති සමාලෝචන වාර්තාව | | IRCSL වාර්තා | පවත්නා ප්‍රතිපත්ති | පවත්නා රක්ෂණ ප්‍රතිපත්ති සමාලෝචනය කර ඇත | | √ | √ | √ | √ | | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 5.5: දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් හා ආපදා නිසා ඇතිවන අලාභ සහ හානිවලින් ප්‍රතිසාධනය වීමට හැකියාව ඇතිකිරීම සඳහා දැනට පවත්නා රක්ෂණ යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම | MoF, MoDM | MoE, DMC, NDRC, SLECIC, රක්ෂණ සමාගම් (රාජ්‍ය හා පෞද්ගලික) | ඵලදායී රක්ෂණ යෝජනා ක්‍රම | | IRCSL වාර්තා | පවත්නා රක්ෂණ යෝජනා ක්‍රම | පවත්නා රක්ෂණ යෝජනා ක්‍රම ශක්තිමත් කර ඇත | | | | | √ | √ | | | | | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |
| 5.6: අලාභ සහ හානි කළමනාකරණය සඳහා යෝග්‍ය ලෙස සමාජ ආරක්ෂණය, ආපදා වැළැක්වීම, හදිසි අවස්ථා අරමුදල් වැනි ප්‍රවේශයන් යොදාගැනීම පිළිබඳ දැනුම හා අවබෝධය වැඩිදියුණු කිරීම | MoF (NPD), MoDM | MoE, DMC, SLECIC, අදාළ ආංශික ආයතන | අදාළ ආයතනවල පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව<br><br>අවදානමට ලක්විය හැකි ප්‍රජාව සඳහා පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | | MoDM හා අදාළ ආංශික ආයතනවල වාර්තා | ඇතැම් ආයතන විසින් තනිව වැඩසටහන් සිදුකර තිබේ | වර්ෂයකට අදාළ ආයතනවල නිලධාරීන් 10ක් බැගින් පුහුණු කර ඇත.<br><br>අවදානමට ලක්විය හැකි ප්‍රජාව සඳහා වර්ෂයකට වැඩසටහන් 30 බැගින් පවත්වා ඇත. | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 1.5, 3.9, 3.d, 11.5, 13.1, 13.2, 13.3 |

# 6 ක්‍රියාත්මක කිරීමේ මාර්ග

## 6.1 දළ විශ්ලේෂණය

දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ 2 වැනි වගන්තියේ දක්වා ඇති දීර්ඝ කාලීන උෂ්ණත්ව ඉලක්කය සම්පූර්ණ කරගැනීම සඳහා, සංවර්ධිත රටවල් වන පාර්ශ්ව මගින් "ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන්" යටතේ, මූල්‍ය ආධාර (9 වැනි වගන්තිය), තාක්ෂණ සංවර්ධනය සහ පැවරීමේ සහාය (10 වැනි වගන්තිය) සහ ධාරිතා වර්ධන සහාය (11 වැනි වගන්තිය) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට ලබාදිය යුතුය.

ශ්‍රී ලංකාවේ 'කොන්දේසි සහිත' NDC සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා රටට අවශ්‍ය මොනවාද යන්න මෙම කොටසෙන් කෙටියෙන් සාකච්ඡා කෙරේ. තාක්ෂණික සහ ධාරිතා ගොඩනැගීමේ අවශ්‍යතා මුලින්ම ආමන්ත්‍රණය කරනු ලබන අතර, මූල්‍ය ගැටලු සහ අවශ්‍ය බාහිර මූල්‍ය ආධාර ඉන්පසු සාකච්ඡා කෙරේ. ඊළඟ කොටස් මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) හා අනුගත වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීම, සහ සමාජ අන්තර්ගතභාවයේ වැදගත් අංග විස්තර කර ගැඹුරින් ගවේෂණය කරයි. අවසාන වශයෙන්, NDC ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ කෙටියෙන් ඉදිරිපත් තර ඇත.

## 6.2 තාක්ෂණය පැවරීම හා ධාරිතා වර්ධන අවශ්‍යතා

### 6.2.1 තාක්ෂණය පැවරීම:

දේශගුණ විපර්යාසවලට මුහුණ දීම සඳහා අප භාවිතා කරන තාක්ෂණයන් දේශගුණ තාක්ෂණයන් නම් වේ. මේ ඇතැම් තාක්ෂණයන් හරිතාගාර වායු විමෝචන අවමකිරීම සඳහා උපකාරී වන අතර, අනෙකුත් තාක්ෂණයන් දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුමුරුවීමට අපට උපකාර කරයි (ඔරොත්තු දීම වැඩි කිරීම). දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ 10 වැනි වගන්තියේ දක්වා ඇති ආකාරයට, තාක්ෂණයන් සංවර්ධනය කිරීම සහ පැවරීම අත්‍යාවශ්‍ය අංගයකි. එසේම දේශගුණ තාක්ෂණයන් වෙනත් පාර්ශ්වවලට, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවලට, පැවරීම හෝ ප්‍රවේශය ලබාදීම ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ මූල්‍ය සහාය ලබාදීම සඳහා ප්‍රායෝගික සියලු පියවර ගන්නා ලෙස සංවර්ධිත රාජ්‍ය පාර්ශ්වයන්ගෙන් ඉල්ලයි. ශ්‍රී ලංකාව පැරිස් ගිවිසුමට දක්වන සිය කැපවීම් ඵලදායි ලෙස ක්‍රියාත්මක කළ හැකි ප්‍රමාණය රඳා පවතින්නේ සංවර්ධිත රාජ්‍ය පාර්ශ්වයන් විසින් මූල්‍ය සම්පත් හා තාක්ෂණය පැවරීම සම්බන්ධව ඔවුන්ගේ කැපවීම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මතය. දේශගුණ තාක්ෂණයන් වෙත ප්‍රවේශය ලැබීමෙන් ශ්‍රී ලංකාවට පොසිල ඉන්ධන මත යැපෙන තාක්ෂණයෙන් ඉවත් වී අඩු කාබන් ආර්ථිකයක් කරා ගමන් කළ හැකිය. දැනටමත් හඳුනාගෙන ඇති සමහර තාක්ෂණික අවශ්‍යතා අතර; දේශගුණ-සුහුරු කෘෂිකර්මය, සමකාලීන බෝග කළමනාකරණ ශිල්ප ක්‍රම, දේශගුණ අනාවැකි සහ පූර්ව අනතුරු ඇඟවීම්, ජල සම්පාදන හා වාරිමාර්ග යටිතල පහසුකම්, දේශගුණ-සුහුරු නගර, සහ සංචාරක යටිතල පහසුකම්, බලශක්ති උත්පාදනය (නව පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය - NRE) සහ බලශක්ති සංචය කිරීමේ පහසුකම්, අඩු කාබන් ප්‍රවාහන සහ නාගරික යටිතල පහසුකම්, වෙරළබඩ කලාපයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ අති නවීන තාක්ෂණයන් මේ අතර වේ.

### 6.2.2 ධාරිතා වර්ධනය:

සංවර්ධනය වන රටවල NDC වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පැරිස් ගිවිසුමේ සඳහන් ධාරිතා වර්ධනය පිළිබඳ අංග සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ යුතුය. ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ සහ දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ ක්‍රියාමාර්ග සහ අලාභ සහ හානි ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණය පැවරීම සහ ධාරිතා ගොඩනැගීම තවදුරටත් අවශ්‍ය වේ. මෙම අනුහුරුවීමේ සහ අවමකිරීමේ අංශවල ඉතා වැදගත් ධාරිතා වර්ධන අවශ්‍යතා කිහිපයක් 6-1 වගුවේ ලැයිස්තුගත කරයි. NDC ලබා දීම සඳහා, පහත දැක්වෙන සාමාන්‍ය ධාරිතා වර්ධන අවශ්‍යතා සපුරාලිය යුතුය:

(a) විශේෂයෙන් සමස්ත සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා, ආයතනික සංවර්ධනය සහ ශක්තිමත් කිරීම;



(b) අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම;

(c) අංශ හරහා සහ ඉන් පිටතට විහිදෙන ජාලකරණය, හවුල්කාරිත්වය සහ අත්දැකීම් බෙදාගැනීම;

(d) තාක්ෂණික අවබෝධය සහ නව දැනුම වැඩිදියුණු කිරීම සඳහා අන්තර්ජාලය පාදක කරගත් මෙවලම්/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදවුම්/මාර්ගගත පාඨමාලා.

පෞද්ගලික අංශයට සහ ජාතික ආයතනවලට ද දේශගුණ මූල්‍ය වෙත ප්‍රවේශ වීම සඳහා ධාරිතාව ගොඩනැඟීම අවශ්‍ය වේ. ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන දේශගුණ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම, පිරිවැයකරණය, සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල හැකියාවන් වැඩි කිරීම ඉතා වැදගත් වේ. දේශගුණ විපර්යාස ආශ්‍රිත දැනුම්වත් කිරීම් සහ සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම, මුලපිරීම් තක්සේරු කිරීම, දත්ත රැස් කිරීම සහ බෙදා හැරීම, NDC වර්ධනය නිරීක්ෂණය කිරීම සහ මෙරටට විශේෂිත තොරතුරු, දත්ත ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම සඳහා පහත විස්තර කර ඇති පාලන ව්‍යුහය තුළ මූලික නිපුණතා ගොඩනගා ගැනීම කඩිනම් අවශ්‍යතාවයකි.

6-1 වගුව අවමකිරීමේ හා අනුහුරුවීමේ අංශවල කඩිනම් ධාරිතා ගොඩනැගීමේ අවශ්‍යතා (මූලාශ්‍රය[68])

| අවමකිරීමේ ක්‍රියාමාර්ග සඳහා ධාරිතා අවශ්‍යතා | අනුහුරුවීමේ ක්‍රියාමාර්ග සඳහා ධාරිතා අවශ්‍යතා |
|---|---|
| <u>කාර්මික දැනුම හා යෙදවුම්:</u><br>අක්වෙරළ සුළං සම්පත් සංවර්ධනය, සුහුරු විදුලි පද්ධති, ජනන ගබඩාකරණ ජල විදුලිය ඇතුළත්ව බලශක්තිය සංචය කිරීම, ත්‍රිත්ව ජනනය, LRT, BRT පද්ධති වැනි නූතන ප්‍රවාහන අංශ යටිතල පහසුකම් දියුණු කිරීම්, චක්‍රිය ආර්ථික පිළිවෙත්, පරිසර හිතකාමී-කර්මාන්ත උද්‍යාන සංකල්ප, තිරසරභාවය සඳහා සැලසුම (D4S), ජීවන චක්‍ර ප්‍රවේශය (LCA), චක්‍රිය ආර්ථිකය හා ඩිජිටල් ආර්ථිකය, සුනිශ්‍චිත කෘෂිකර්මය හා යාන්ත්‍රිකකරණය, අගය එකතු කිරීම හා නවීන ප්‍රතිචක්‍රිකරණ තාක්ෂණය. දියුණු කොම්පෝස්ට් තාක්ෂණය හා අපද්‍රව්‍ය සඳහා තාප ප්‍රතිකාර (උදා. බලශක්තිය ආපාසු ලබාගැනීම සඳහා තාපවිච්ඡේදන තාක්ෂණය), බිම් පිරවුම් වායු තාක්ෂණය, මධ්‍යගත මලාපවාහන පිළියම්කිරීම | දේශගුණ අනාවැකි පළකිරීම හා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිවල වර්ධනය, අවදානම් විශ්ලේෂණය හා දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සඳහා සංවර්ධන ආයෝජන වෙනස්කිරීමේ සියලු වැදගත් අංශවල අනුහුරුවීමේ ක්‍රියාකාරකම් සඳහා මූලික දත්ත ස්ථාපිත කිරීම, දේශගුණ දත්ත ලබාගැනීම, හා අධීක්ෂණය |
| <u>මූලික දත්ත තක්සේරුකිරීම්, සහතිකකිරීම හා සම්මත පිහිටුවීම:</u><br>පාරිසරික සහතිකකරණ පද්ධති, අවම කාර්යසාධනය හා බලශක්ති කාර්යක්ෂමතාව ලේබල්කරණ වැඩසටහන්, හරිත ගොඩනැගිලි හා ගොඩනැගිලි කළමනාකරණ පද්ධති (BMS), පරිසර හිතකාමී කාර්මික උද්‍යාන සඳහා මූලික දත්ත තක්සේරුව ඇතුළුව ස්ථානීය වූ නිර්මාණ හා සැලසුම් කිරීම්, ඉන්ධන කාර්යක්ෂමතා ලේබල්කරණය, ප්‍රවාහන අංශයේ මූලික දත්ත පිහිටුවීම, බොහෝ තාක්ෂණික යෙදවුම් සඳහා මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) පද්ධති ඇතිකිරීම වේ, | ආංශික දත්තසමුදාය ස්ථාපිත කිරීම, මූලික දත්ත ස්ථාපිත කිරීම, දේශගුණ තොරතුරු පද්ධති ඇතිකිරීම, දීර්ඝ කාලීන අධීක්ෂණ ස්ථාන පිහිටුවීම, දේශගුණ විපර්යාස මගින් ඇති කරන රෝග හා සෞඛ්‍ය තත්ත්වවලට ප්‍රතිකාර කිරීමට මහජන සෞඛ්‍ය පද්ධතියේ ධාරිතාව ශක්තිමත් කිරීම |
| <u>පර්යේෂණ හා සංවර්ධනය හා දැනුම පැවරුම:</u><br>සුනිශ්චිත කෘෂිකර්මය, සත්ත්ව රංචු/ වර්ගවල ප්‍රවේණික දියුණුකිරීම්, බලශක්තිය ගබඩා කිරීම (විදුලි පද්ධතියේ හා පාරිභෝගික පාර්ශ්වයේ (මනුපස)), පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන කටයුතු, වාහන කාර්යසාධනය හා ඉන්ධන කාර්යක්ෂමතාව ලේබල් කරණය | පර්යේෂණ හා සංවර්ධන කටයුතු හරහා දියුණුකළ නව ප්‍රභේද මගින් භෝග අස්වනු ඉහළ නැංවීම, දේශගුණ විපර්යාවලට ඔරොත්තු දෙන නාගරික හා වෙරළබඩ සංවර්ධනය, දේශගුණ ආපදා සඳහා සොබාදහම-පාදක කරගත් ප්‍රතිචාර, භූමිය සංරක්ෂණය හා සාගර ජෛව විවිධත්වය ආදි |

68 Updated Nationally Determined Contributions, Sri Lanka



සියලුම අංශවල හරිතාගාර වායු අවම කිරීම, දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීම සහ අලාභ සහ හානි සම්බන්ධ පියවර ක්‍රියාත්මක කිරීමේ දී දත්ත උත්පාදනය සහ කළමනාකරණ ධාරිතාව වැඩිදියුණු කිරීම ඉතා වැදගත් වේ. නියමිත කාලයට ලැබෙන, මනාව විශෝධනය කළ සහ ප්‍රමිතිගත දත්ත නොමැතිවීම නිසා සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සාමාන්‍යයෙන් අඩාල වේ. දේශගුණ විපර්යාස සහ විපත් පිළිබඳ මෑත කාලීන අධ්‍යයන මගින් අලාභ සහ හානි, අනුහුරුවීම සඳහා නැඹුරුතාව හා ධාරිතාව, දේශගුණ පරාමිතීන්ට දක්වන සංවේදීතාව ආදිය ඇස්තමේන්තු කිරීම සඳහා වැදගත් වන දර්ශක පිළිබඳ දත්ත හිඟයක් පෙන්නුම් කරයි.

අලාභ සහ හානි, අනුහුරුවීම සහ අවම කිරීම යන අංශවලට සහාය දක්වන දේශගුණ විපර්යාස ක්‍රියාමාර්ග සහ අධීක්ෂණ හා ඇගයීමේ (M&E) පද්ධතිවල මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) ධාරිතාව ගොඩනැගීම ප්‍රධාන අවස්ථාවකි. වර්ෂ 10ක කාලයක් සඳහා වන NDC ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණ සැලසුම් ඵලදායීව සහ කාර්යක්ෂමව සිදුකිරීමට මෙය අත්‍යාවශ්‍ය වේ. ශක්තිමත් මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) පද්ධති මගින් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නංවන අතර, සම්පත් සචලනය සඳහා අවස්ථා ලබා දෙනු ඇත. පහත දැක්වෙන්නේ, ශ්‍රී ලංකාවේ යාවත්කාලීන කරන ලද NDCවල, විශේෂයෙන්ම අධීක්ෂණ හා ඇගයීමේ (M&E) පද්ධති/ මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) පද්ධති සහ සම්පත් සචලනය සඳහා හඳුනාගෙන ඇති ධාරිතා අවශ්‍යතා කිහිපයකි.

(a) දත්ත සහ විශ්ලේෂණ මෙවලම් භාවිත කිරීමෙන් ප්‍රාදේශීය දේශගුණ අවදානමට ලක්විය හැකි බව/ ඔරොත්තු දීමේ තක්සේරු සංවර්ධනය කිරීම;

(b) කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) සංවර්ධන තත්ත්වයක් සහ දේශගුණ විපර්යාස බලපෑම් සහ පුරෝකථනය කළ බලපෑම් තත්ත්ව අතර වෙනස හඳුනා ගැනීම සඳහා මෙවලම් සහ විශ්ලේෂණය;

(c) කටයුතු පුරුදු පරිදි සිදුවන (BAU) විමෝචන තත්ත්වය සහ ඇතැම් අවම කිරීමේ අංශ සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා සිදු විය හැකි හරිතාගාර වායු විමෝචන අඩු කිරීමේ මාර්ග;

(d) බලපෑම මැනීම සඳහා දත්ත ලබා ගැනීමේ පහසු කිරීම සඳහා ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීම (කාලය තුළ සිදුවන වෙනස්වීම් මැනීමට).

NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීමේදී ආංශික පාර්ශ්වකරුවන්ගේ පුළුල් උපදේශන සහ සහභාගීත්වය NDC ක්‍රියාකාරකම් පිළිබඳව වඩාත් හොඳ අවබෝධයක් ලබා ගැනීමට සහ දේශගුණ ක්‍රියාමාර්ග වේගවත් කිරීම සඳහා අවශ්‍ය හිමිකාරිත්වය සහ ගම්‍යතාවය ඇති කිරීමට හේතු වී තිබේ. මෙම ගම්‍යතාවය පවත්වා ගැනීම සඳහා, ආංශික පාර්ශ්වකරුවන් විසින් NDC ඔවුන්ගේ නිත්‍ය ආංශික සංවර්ධන සැලසුම්වලට ඒකාබද්ධ කළ යුතු අතර, අදාළ නිල ආයතනවලට ක්‍රියාත්මක කිරීමේ වගකීම් පවරමින් එක් එක් NDC ක්‍රියාකාරකම් සඳහා සවිස්තර ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතුය. දේශගුණ ක්‍රියාමාර්ග වේගවත් කිරීමේ ගම්‍යතාවය පවත්වා ගැනීම සඳහා ධාරිතාව ගොඩනැගීමේ වගකීම පරිසර අමාත්‍යාංශය සතුය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දේශගුණ පොරොන්දුව (Climate Promise) ව්‍යාපෘතියේ සහාය ඇතිව, අමාත්‍යාංශය විසින් දැනටමත් සිදු කර ඇති ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් වන්නේ ශ්‍රී ලංකා රජයේ "2050 කාබන් උදාසීනකරණය"ඉලක්ක කරගත් මුලපිරීමයි. ඵලදායී ධාරිතා වර්ධනයක් සහතික කිරීම සඳහා, ප්‍රාදේශීය අත්දැකීම් සහ දේශීය දැනුම උපයෝගී කර ගත යුතු අතර, දේශගුණ විපර්යාස පිළිබඳ විශේෂඥයින් සහ අංශ විශේෂඥයින් අතර අංශ අතර ඉගෙනීම ප්‍රවර්ධනය කළ යුතුය.

## 6.3 පිරිවැය ගැටලු හා අවශ්‍ය බාහිර මූල්‍ය සහාය

රටේ සංවර්ධනය සඳහා වන ප්‍රමුඛතාවලට අනුකූල වන ඇතැම් දේශගුණ මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මහජන මුදලින් ප්‍රතිපාදන වෙන් කරයි. කෙසේ වෙතත්, රටේ අභිලාෂය තවත් ඉදිරියට පුළුල් කිරීමට මෙරටට බාහිර මූල්‍ය ආධාර අවශ්‍ය වේ. ප්‍රකාශිත හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ සහ දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා, අනුහුරුවීම සහ අඩු කාබන් සංවර්ධනය සඳහා අවශ්‍ය අරමුදල් වැඩි කිරීම අවශ්‍ය වේ.

2021 සහ 2030 දක්වා කොන්දේසි සහිත සහ කොන්දේසි විරහිත හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා පිරිවැය ප්‍රක්ෂේපණ සකස් කිරීම සඳහා, NDC සංශෝධන ක්‍රියාවලියේ කොටසක් ලෙස කඩිනම් උපදේශනයක් මගින් මූලික තක්සේරුව සිදු කරන ලදි[69].

69 මෙම කාර්යය UNDP Climate Promise Project යටතේ රංග පල්ලාවෙල මහතා විසින් සිදුකරන ලදි. අප්‍රකාශිත වාර්තා කෙටුම්පත පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයේ (CCS) ඇත - "Final Report - Investment & Financing Strategy for Nationally Determined Contributions of Sri Lanka - December 2021"

මෙම තක්සේරුව අවම කිරීමේ අංශ 6 කට සීමා වූයේ අනුහුරුවීමේ අංශ 9 ක අවශ්‍ය දත්ත සහ අලාභ සහ හානි අංශයේ දත්ත ඒ අවස්ථාව වන විට නොතිබීම නිසාය. 2021 වර්ෂය වන විට හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ අංශවල සමස්ත වියදම්වල අපේක්ෂිත ප්‍රකාශිත වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 10.85 ක් බව විශ්ලේෂණයෙන් සොයා ගන්නා ලදි. මෙම තක්සේරුව සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය පෙර සඳහන් කළ වාර්තාවේ දක්වා ඇත[70]. පවතින ආර්ථික අර්බුදය නිසා ඇති වී ඇති ගැටලු සඳහා මෙම ඇස්තමේන්තුවට සුදුසු ගැලපීම් අවශ්‍ය වේ. 6-2 වගුව මගින් දැක්වෙන්නේ අවම කිරීමේ අංශය සඳහා ඇස්තමේන්තුගත පිරිවැයයි. එසේම 6-3 වගුව මගින් දැක්වෙන්නේ අංශ අනුව සහ NDC අනුව සූචක පිරිවැය ඇස්තමේන්තුවයි. 6-3 වගුව මගින් NDC අනුව සූචක පිරිවැය ඇස්තමේන්තුව බෙදාදැක්වීම අංශ අනුව දක්වා ඇත

6-2 වගුව අවමකිරීමේ අංශයේ NDC සූචක පිරිවැය සාරාංශය

| NDC අංශය | අවම පරාසයේ පිරිවැය ඇ.ඩො. මිලියන | උපරිම පරාසයේ පිරිවැය ඇ.ඩො. මිලියන |
|---|---:|---:|
| විදුලිබල | 10,733,541.11 | 10,733,548.61 |
| කර්මාන්ත | 538.49 | |
| ප්‍රවාහන | 114,247.36 | 114,272.36 |
| අපද්‍රව්‍ය කළමනාකරණය | 1,677.13 | තොරතුරු නැත |
| වනාන්තර | 234.00 | 289.82 |
| කෘෂිකර්ම හා පශු සම්පත් | 216.20 | තොරතුරු නැත |
| එකතුව | 10,850,454.30 | 10,850,542.62 |

6-3 වගුව සූචක පිරිවැය ඇස්තමේන්තුව බෙදාදැක්වීම

| අවමකිරීමේ අංශය | NDC | අවම පරාසයේ පිරිවැය (ඇ.ඩො. මිලියන) | උපරිම පරාසයේ පිරිවැය (ඇ.ඩො. මිලියන) |
|---|---|---:|---:|
| කෘෂිකර්ම අංශය | NDC1 | 76.51 | තොරතුරු නැත |
| | NDC2 | 77.3 | තොරතුරු නැත |
| | NDC3 | 4.61 | තොරතුරු නැත |
| | NDC4 | 50.86 | තොරතුරු නැත |
| | NDC5 | 6.92 | තොරතුරු නැත |
| | NDC6 | වෙනත් NDC මගින් ආවරණය වේ | |
| බලශක්ති (විදුලිබල) අංශය | NDC 1 | 10,729,049.61 | තොරතුරු නැත |
| | NDC 2 | 17.70 | තොරතුරු නැත |
| | NDC 3 | 2,223.90 | තොරතුරු නැත |
| | NDC4 | 851.10 | තොරතුරු නැත |
| | NDC5 | 1,398.80 | තොරතුරු නැත |
| කර්මාන්ත අංශය | NDC1 | 25.86 | තොරතුරු නැත |
| | NDC2 | 312.40 | තොරතුරු නැත |
| | NDC3 | 20.51 | තොරතුරු නැත |
| | NDC4 | 1.64 | තොරතුරු නැත |
| | NDC5 | 170.00 | තොරතුරු නැත |
| | NDC6 | 8.08 | තොරතුරු නැත |
| වනාන්තර අංශය | NDC1 | 51.712 | තොරතුරු නැත |
| | NDC2 | 108.372 | 164.192 |
| | NDC3 | 24.64 | තොරතුරු නැත |
| | NDC4 | 49.28 | තොරතුරු නැත |
| ප්‍රවාහන අංශය | NDC1 | 1,076.70 | තොරතුරු නැත |
| | NDC2 | 1,661.50 | තොරතුරු නැත |
| | NDC3 | 239.48 | 264.48 |
| | NDC4 | 4,200.00 | තොරතුරු නැත |
| | NDC5 | 102.88 | තොරතුරු නැත |
| | NDC6 | 138.90 | තොරතුරු නැත |
| | NDC7 | 61.50 | තොරතුරු නැත |
| | NDC8 | 3,058.85 | තොරතුරු නැත |
| | NDC9 | 0.50 | තොරතුරු නැත |
| | NDC10 | 1.50 | තොරතුරු නැත |
| | NDC11 | 103,690.00 | තොරතුරු නැත |
| | NDC12 | 12.55 | තොරතුරු නැත |
| | NDC13 | 3.00 | තොරතුරු නැත |

70 තක්සේරුව විකල්ප තුනක් මගින් සිදුකර තිබේ. 1වන විකල්පය - ප්‍රතිපත්ති මට්ටමේ දැනටමත් පිරිවැයකරන ලද ඇස්තමේන්තු යොදාග නිමින් (උද්ධමනය හා විනිමය අනුපාතිකයේ අපගමනය හා විශේෂඥ අදහස් අනුව ගැළපීම් කරමින්), 2වන විකල්පය - ද්විතීයික පර්යේෂණ හා විශේෂඥ දැනුම මත පදනම්ව හා ඒකක හෝ ව්‍යාපෘති පිරිවැය කොටසක් දන්නා අවස්ථාවලදී පිරිවැයෙන් කොටසක් ගණනය කළ ක්‍රියාකාරකම් සඳහා පරිමාණනය කරමින්, 3වන විකල්පය - දේශීය වශයෙන් පිරිවැයකරණයක් නොමැති අවස්ථාවල දී එය විශේෂඥ උපදේශනයෙන් හා වලංගුකරණයෙන් ජනනය කිරීම.

| | | | |
|---|---|---|---|
| ජල අංශය | NDC 1 | 86.5 | තොරතුරු නැත |
| | NDC 2 | 919.31 | තොරතුරු නැත |
| | NDC 3 | 165 | තොරතුරු නැත |
| | NDC4 | 502 | තොරතුරු නැත |
| | NDC5 | 4.321 | තොරතුරු නැත |

ශ්‍රී ලංකාවේ කොන්දේසි සහිත දායකත්වය සම්පූර්ණ කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය, පැරිස් ගිවිසුම මගින් ස්ථාපිත ආයතන හරහා සැලකිය යුතු දේශගුණ මූල්‍ය සම්පාදනයක් ලබාගත යුතු අතර, අඩු කාබන් සංවර්ධනයක් සඳහා ද්විපාර්ශ්වික ගිවිසුම් යොදාගත යුතුය. හරිත දේශගුණ අරමුදල (GCF) මගින් සහයෝගය ලැබෙන ජාතික අනුහුරුවීමේ සැලසුම (NAP) සූදානම ව්‍යාපෘතිය මගින් තාක්ෂණික හා මූල්‍යමය සහයෝගය සඳහා අනුහුරුවීමේ ප්‍රමුඛතා සමූහයක් ඇති කරන අතර, ශ්‍රී ලංකා ජාතික අනුහුරුවීමේ සැලසුම (NAP) යාවත්කාලීන කරනු ඇත.

NDC ඉලක්ක අත්පත් කරගැනීම සඳහා මූල්‍ය සම්පත් සචලනය කිරීම සඳහා හඳුනාගෙන ඇති උපායමාර්ගික දිශානති[71] 8ක් 6-4 වගුවේ දැක්වේ.

6-4 වගුව මූල්‍ය සම්පත් සචලනය කිරීම සඳහා උපායමාර්ගික දිශානතිය

| | |
|---|---|
| උපායමාර්ගික දිශානතිය 1 | ඒකාබද්ධ ව්‍යාපෘති සංවර්ධනය |
| උපායමාර්ගික දිශානතිය 2 | හවුල්කාරිත්ව හා සන්ධාන පිහිටුවීම හා ශක්තිමත් කිරීම |
| උපායමාර්ගික දිශානතිය 3 | පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය |
| උපායමාර්ගික දිශානතිය 4 | විශේෂිත දේශගුණ අරමුදල් සමඟ මුල්පිරීම් ශක්තිමත් කිරීම හා ව්‍යාප්ත කිරීම |
| උපායමාර්ගික දිශානතිය 5 | දේශගුණ මූල්‍ය මැනීම, වාර්තාකරණය හා සත්‍යාපනය (MRV) |
| උපායමාර්ගික දිශානතිය 6 | දේශගුණ ආයෝජන සඳහා ප්‍රවේශවීම හා සචලනය සඳහා දේශීය ධාරිතාව දියුණු කිරීම |
| උපායමාර්ගික දිශානතිය 7 | වෙනත් නව්‍ය දේශගුණ මූල්‍ය මෙවලම් පිළිබඳ ගවේෂණය - ණය සඳහා දේශගුණ හුවමාරුව, නීල බැඳුම්කර, හරිත බැඳුම්කර |
| උපායමාර්ගික දිශානතිය 8 | කාබන් වත්කම් පාදක හා වෙළෙඳපොළ පාදක මූල්‍ය විකල්ප මගින් ප්‍රයෝජන ලබා ගැනීමට ඇති විභවය ගවේෂණය කිරීම |

71 Final Report – Investment & Financing Strategy for Nationally Determined Contributions of Sri Lanka, UNDP- Sri Lanka



## 6.4 NDC-SDG අනුබද්ධතාව තක්සේරුව

### 6.4.1 යුක්තියුක්තතාව

තිරසර සංවර්ධන SDG (තිරසර සංවර්ධන අභිමතාර්ථ) සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ සහ දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ සහ NDCවල අවධානය යොමු වී ඇති අභියෝග මූලික වශයෙන් සමාන බව පෙනේ. න්‍යාය පත්‍ර දෙක අන්තර්ජාතික මට්ටමින් තදින් බද්ධ වී ඇති අතර, ඒවායේ පවත්නා අන්තර් සම්බන්ධතාවය ජාතික, උප-ජාතික සහ ප්‍රාදේශීය මට්ටම්වල නිශ්චිත ක්‍රියාමාර්ග දක්වා ද විහිදෙයි. SDGවල මූලික අන්තර් සම්බන්ධතාවයෙන් ඇඟවෙන්නේ දේශගුණ ක්‍රියාමාර්ග (SDG-13) අනෙකුත් සියලුම අභිමතාර්ථවල නිශ්චිත ප්‍රතිපත්ති ඉලක්ක සමඟ ඒකාබද්ධ හා බෙදිය නොහැකි ආකාරයෙන් සම්බන්ධ වන බවයි. එසේම, ආර්ථිකය, සමාජය සහ පරිසරය යන තිරසර සංවර්ධනයේ මාන ත්‍රිත්වය සමතුලිත කරන අතරම ජාතික, උප-ජාතික සහ ප්‍රාදේශීය සන්දර්භය සැලකිල්ලට ගනී.

NDC මගින් මූලික වශයෙන් රට විසින් සිදු කරනු ලබන නිශ්චිත දේශගුණ ක්‍රියාමාර්ග පිළිබිඹු කරයි. එහෙත්, ඒවා හඳුනා ගැනීම, තෝරා ගැනීම සහ ප්‍රමුඛතාවය දීම සිදුවිය යුත්තේ ජාතික යථාර්ථයන් සහ ප්‍රමුඛතා සැලකිල්ලට ගෙන සහ, හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාමාර්ග, සංවර්ධන ඉලක්ක කෙරෙහි සාධනීය සහ නිශේධනීය බලපෑම් ඇති කළ හැකි බව හඳුනා ගනිමිනි. ඒ අනුව, NDC හි සම-ප්‍රතිලාභ පිළිබඳ සංකල්පය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සහ හැකි සෑම අවස්ථාවක දීම සමාජ, ආර්ථික සහ පාරිසරික අරමුණු හරහා දේශගුණ අභිමතාර්ථ සහ දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව අතර සාධනීය සබඳතා පැවතීම සහතික කිරීම පිළිබඳව අවධාරණය කර ඇත.

SDG සහ NDC සඳහා පදනම්ව ඇති කරුණුවලින් පැහැදිලි වන්නේ ඒ එක් එක් න්‍යායපත්‍රය, අනෙක් න්‍යායපත්‍රයේ වැදගත්කම පිළිගන්නා අතර, ඒ දෙක අතර පැහැදිලි සහයෝගීතාවයක් පෙන්නුම් කරන බවයි. අනෙක් අතට, NDC මගින් හඳුනාගෙන ඇති පරිදි සහ අනෙක් අතට දේශගුණ විපර්යාස පිළිබඳව ගනු ලැබෙන සාර්ථක ක්‍රියාමාර්ගවලින් තොරව SDG සම්පූර්ණ සාර්ථකත්වයට ළඟා විය නොහැකි වනු ඇත. එය අනෙක් අතට ද එසේමය.

### 6.4.2 ක්‍රමවේදය

මෙම SDG සහ NDC අතර දැකිය හැකි අන්තර් සම්බන්ධතා සහ එකිනෙකා මත රඳාපැවැත්ම SDG සහ NDC සාකල්‍ය ආකාරයකින් යුක්තියුක්ත කිරීමට බොහෝ ප්‍රයත්න දරා ඇති අතර, සම්බන්ධතා සිතියම්ගත කිරීම සඳහා ආකෘති සමඟ සංකල්පමය මට්ටමින් ඒවා ස්ථාපිත කිරීමේ දී ප්‍රගතියක් ලබා ඇත. NDC-SDG අතර අන්තර්ක්‍රියා තේරුම් ගැනීම සහ ආමන්ත්‍රණය කිරීම සඳහා මෙන්ම ඒවා අතර අන්තර් සම්බන්ධතා ස්ථාපිත කිරීමට භාවිත කරන සමහර මෙවලම් අතරට සම්ප්‍රදායිකව ආංශික ක්ෂේත්‍රවල ප්‍රතිපත්තිමය ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වන ජාල විශ්ලේෂණ ඇතුළත් වේ (හෝ සයිලෝ තුළ සිතීම); සහ අන්තර්ක්‍රියා ඇගයීම සඳහා වන විද්‍යාත්මක සාක්ෂි ඒකාබද්ධ කරන පූරකමය ප්‍රවේශයන්, විශේෂඥ අදහස් සහ සහභාගීත්ව ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලී මීට ඇතුළත්ය. සාමාන්‍යයෙන්, මෙම අන්තර් සම්බන්ධතා විභව සහයෝගීතාවන් හෝ වෙනස් මට්ටම්වල වැදගත්කමක් (පරිමාණ) සහිත හිලව්කිරීම් ලෙස ද තක්සේරු කළ හැකිය. එක් උදාහරණයක් වන්නේ එකිනෙකා අතර ඇති සාධනීය, නිශේධනීය හෝ උදාසීන සම්බන්ධතාවයට අනුව SDG සහ NDC ලකුණු ලබා දී ශ්‍රේණිගත කිරීමයි. මෙම රාමුව තුළ, SDG සහ ඒවායේ ඉලක්ක අතර ඇති මූලික හා ක්‍රියාකාරී සම්බන්ධතා පිළිබඳ විද්‍යාත්මක සාධක සහ විශේෂඥ තීරණ මත පදනම්ව, කරුණු හතක් ඇති පරිමාණයක් වර්ධනය කර ඇත. මේ ඉලක්ක එකිනෙකාගේ සාර්ථත්වයට දායක වන සහයෝගීතා බලපෑම් ඇති කිරීමට අපේක්ෂා කරන විට, ඒවා +1 (සක්‍රීය කිරීම), +2 (ශක්තිමත් කිරීම) හෝ +3 (බෙදිය නොහැකි) ලෙස ලකුණු ලබා දී ඇත. හිලව් කිරීම් පෙන්නුම් කරන ඉලක්ක -1 (සීමා කිරීම), -2 (ප්‍රතිවිරුද්ධව ක්‍රියා කිරීම) හෝ -3 (අවලංගු කිරීම) වේ. උදාසීන සම්බන්ධතා සඳහා ලැබෙන ලකුණ 0 වේ.

අන්තර් සම්බන්ධකතා ඇගයීම සඳහා ගන්නා මේ හා සමාන ප්‍රවේශයක් මගින්, NDC ක්‍රියාමාර්ග සහ SDG ඉලක්කවල මූලික සහ ක්‍රියාකාරී සම්බන්ධතා ග්‍රහණය කරගනියි. එය එහි ඇති ඉලක්ක සහ දර්ශක හරහා පිළිබිඹු වන පරිදි, අන්තර්ක්‍රියාවල ස්වභාවය සහ ප්‍රමාණය දැක්වීමට පරිමාණයක් ඇතඃ

- බෙදිය නොහැකිඃ සාධනීය අන්තර්ක්‍රියා වල ප්‍රබලම ආකාරයයි. එහිදී NDC ක්‍රියාකාරකම් නිශ්චිත SDG හා එහි ඉලක්ක අත්පත්කරගැනීම සඳහා සෘජුවම දායක වන වේ (සහ අනෙක් අතට ද ක්‍රියාත්මකය).
- දායක වීමඃ සාධනීය අන්තර්ක්‍රියාවල මධ්‍යස්ථ ආකාරයයි. මෙහි දී NDC ක්‍රියාකාරකම් මගින් නිශ්චිත SDG සහ එහි ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සෘජුවම දායක වන තත්ත්ව නිර්මානය කරයි (සහ අනෙක් අතට ද ක්‍රියාත්මකය).
- සක්‍රීය කිරීමඃ ධනාත්මක අන්තර්ක්‍රියාවල අඩු මට්ටමකි. මෙහි දී NDC ක්‍රියාකාරකම් නිශ්චිත SDG හා එහි ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරයි (සහ අනෙක් අතට ද ක්‍රියාත්මකය).

- අසම්බන්ධිතඃ අන්තර්ක්‍රියාවල උදාසීන හෙවත් නිෂ්ක්‍රීය මට්ටමයි. මෙහි දී, NDC ක්‍රියාකාරකම මගින් නිශ්චිත SDG සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සම්බන්ධව කැපී පෙනෙන දායකත්වයක් ඇති නොකරන අතර, සාධනීය හෝ නිශේධනීය බලපෑමක් ඇති නොකරන සේ සලකනු ලැබේ. (සහ අනෙක් අතට ද ක්‍රියාත්මකය)

- සීමා කිරීමඃ නිෂේධනාත්මක අන්තර්ක්‍රියා (හිලව්කිරීම්) කාණ්ඩයකි. නිශ්චිත SDG සහ එහි ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා බාධාකරන, ප්‍රතිවිරුද්ධ අතට ක්‍රියාකරන හෝ අහිතකර පරිසරයක් නිර්මාණය කරන NDC ක්‍රියාකාරකම්ය (සහ අනෙක් අතට ද ක්‍රියාත්මකය).

මෙහි සාධනීය අන්තර්ක්‍රියා යනු එක් ක්ෂේත්‍රයක වැඩිදියුණු කිරීමක් අනෙක් ක්ෂේත්‍රයේ දියුණුවට හේතු වන අතර, එක් ක්ෂේත්‍රයක පිරිහීමක් අනෙක් ක්ෂේත්‍රයේ පිරිහීම සඳහා හේතු වන සහසම්බන්ධයකි. නිශේධනීය අන්තර්ක්‍රියා යනු, එක් ක්ෂේත්‍රයක වැඩිදියුණු කිරීමක් මගින් අනෙක් ක්ෂේත්‍රයක පිරිහීම සඳහා හේතු වන (සහ අනෙක් අතට ද ක්‍රියාකරන) තත්ත්වයක ප්‍රතිලෝම ආකාරයේ සම්බන්ධතාවයකි.

අන්තර් සම්බන්ධකතා සිතියම්ගත කිරීමේදී භාවිතා කරන ප්‍රධාන පියවර 6-1 රූපයේ දක්වා ඇත.




6-1 රූපය NDC-SDG අන්තර් සම්බන්ධකතා සිතියම්ගත කිරීමේ ප්‍රධාන පියවර

වර්තමාන අධ්‍යයනයේ දී, NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වල මෙම අන්තර්ක්‍රියා සාධනීය ද නිශේධනීය ද යන්න සහ එහි වැදගත්කමේ මට්ටම සඳහන් නොකර, SDG සමඟ ඇති සම්බන්ධය පමණක් ඉදිරිපත් කිරීමට ක්ෂේත්‍රයක් ඇතුළත් වේ. ඒ අනුව, මෙම තක්සේරුවේදී භාවිත කරන ක්‍රමවේදය වන්නේ සම්බන්ධතා සංඛ්‍යාව මත පදනම්ව NDC සහ SDG අතර සම්බන්ධයක් තිබීම ඉස්මතු කිරීමයි. මෙහිදී, SDG13- දේශගුණ ක්‍රියාමාර්ග මගින් නියෝජන කරන අතර දේශගුණ විපර්යාස නිසා ඇති වන ගැටලු ආමන්ත්‍රණය කිරීමේ මැදිහත්වීමක් වන අතර NDC ලෙස නොසැලකේ.



## 6.4.3 ප්‍රතිඵල

එක් එක් අංශයේ NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම විශ්ලේෂණය (හරිතාගාර වායු අවම කිරීමේ අංශ 6ක් හා දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමෙ අංශ 9ක් සහ අලාභ සහ හානි) මගින් පෙන්නුම් කරන ලද්දේ සියලු ම SDG ආවරණය වන පරිදි විවිධ NDC සමඟ පුළුල් බහු සම්බන්ධතාවන් ඇති බවයි (6-5 වගුව බලන්න). සමස්තයක් වශයෙන් ගත් විට අවම කිරීමේ අංශවල ක්‍රියාකාරකම්/උප-ක්‍රියාකාරකම් 261කට, SDG සමඟ සම්බන්ධතා 753ක් ඇති අතර, අනුහුරුවීමේ අංශවල NDC ක්‍රියාකාරකම්/උප-ක්‍රියාකාරකම් 243ක් සමඟ SDG සම්බන්ධතා 566ක් ඇත. අලාභ සහ හානි ක්‍රියාකාරකම්/උප-ක්‍රියාකාරකම් 245කට SDG සමඟ සම්බන්ධතා 100ක් ඇත. මෙහි දී සම්බන්ධතා ගණන නිශ්චිත NDC අංශයක ක්‍රියාකාරකම් සහ උප ක්‍රියාකාරකම් ගණන මත රඳා පවතින බව සැලකිය යුතුය. 6-6 වගුව මගින් එක් එක් SDG යටතේ පවත්නා සම්බන්ධතා සංඛ්‍යාව, අවම කිරීමේ සහ අනුහුරුවීමේ NDC ඉදිරිපත් කරයි.

6-5 වගුව NDCහා SDG අතර ඇති බහුවිධ සම්බන්ධතා

| අංශය | | ක්‍රියාකාරකම් හා උප ක්‍රියාකාරකම් ගණන | සම්බන්ධතා ගණන |
|---|---|---|---|
| අවමකිරීම | කෘෂිකර්මය | 43 | 114 |
| | බලශක්තිය | 22 | 37 |
| | වනාන්තර | 35 | 58 |
| | කර්මාන්ත | 49 | 88 |
| | ප්‍රවාහනය | 64 | 229 |
| | අපද්‍රව්‍ය | 48 | 227 |
| | උප එකතුව | **261** | **753** |
| අනුහුරුවීම | කෘෂිකර්මය | 30 | 65 |
| | ජෛව විවිධත්වය | 19 | 61 |
| | වෙරළබඩ හා සමුද්‍ර | 19 | 33 |
| | ධීවර | 33 | 82 |
| | සෞඛ්‍ය | 21 | 25 |
| | පශුසම්පත් | 17 | 47 |
| | සංචාරක | 14 | 54 |
| | නාගරික සැලසුම්කරණය හා මානව ජනාවාස | 24 | 58 |
| | ජල | 66 | 141 |
| | උප එකතුව | **243** | **566** |
| අලාභ සහ හානි | | 25 | 100 |
| එකතුව | | **529** | **1,419** |

6-6 වගුව එක් එක් SDG යටතේ ඇති සම්බන්ධතා

| තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) | NDC සමග ඇති සම්බන්ධතා | | | |
|---|---|---|---|---|
| | අවමකිරීම | අනුහුරුවීම | අලාභ සහ හානි | එකතුව |
| SDG1 - දරිද්‍රතාවය අවසන් කිරීම | 1 | 1 | 25 | 27 |
| SDG2 - සාගින්න දුරු කිරීම | 45 | 67 | 0 | 112 |
| SDG3 - යහපත් සෞඛ්‍යය හා යහපැවැත්ම | 117 | 22 | 50 | 189 |
| SDG4 - ගුණාත්මක අධ්‍යාපනය | 0 | 1 | 0 | 1 |
| SDG5 - ස්ත්‍රී පුරුෂ සමානතාව | 13 | 43 | 0 | 56 |
| SDG6 - පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව | 53 | 118 | 0 | 171 |
| SDG7 - දැරිය හැකි හා පිරිසිදු බලශක්තිය | 107 | 22 | 0 | 129 |
| SDG8 - යහපත් රැකියා සහ ආර්ථික වර්ධනය | 50 | 11 | 0 | 61 |
| SDG9 - කර්මාන්ත, නවෝත්පාදන හා යටිතලපහසුකම් | 88 | 2 | 0 | 90 |
| SDG10 - අසමානතා අඩුකිරීම | 0 | 0 | 0 | 0 |
| SDG11 - තිරසර නගර හා ප්‍රජාවන් | 90 | 86 | 25 | 201 |
| SDG12 - වගකීමෙන් යුක්ත පරිභෝජනයක් හා නිෂ්පාදනයක් | 144 | 45 | 0 | 189 |
| SDG13 - ජලයේ ජීවය | 1 | 94 | 0 | 95 |
| SDG14 - ගොඩබිම ජීවය | 41 | 51 | 0 | 92 |
| SDG15 - සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන | 0 | 0 | 0 | 0 |
| SDG16 - අභිමතාර්ථ සඳහා හවුල්කාරිත්ව | 3 | 3 | 0 | 6 |
| එකතුව | 753 | 566 | 100 | 1,419 |

හඳුනාගත් NDC-SDG සම්බන්ධතා යනු මූලික වශයෙන් ඍජු හා පැහැදිලි සම්බන්ධතා බව සැලකිය යුතුය. ඒ නිසා වඩාත් වක්‍ර සම්බන්ධතා මෙන්ම වැදගත්කමේ වර්ගය හා මට්ටම ද සලකා බලමින් ස්ථාපිත කළ යුතු පරිපූර්ණ අන්තර්සම්බන්ධතා ස්ථාපිත කිරීම සඳහා වැඩිදුර තක්සේරු කිරීම් අවශ්‍යය.

අවමකිරීමේ, අනුහුරුවීමේ හා අලාභ සහ හානි අංශවල NDCවල අන්තර් සම්බන්ධතා 6-2, 6-3 හා 6-4 රූපවල දැක්වේ. මෙම රූපවල වර්ණ යොදාගෙන ඇත්තේ NDC අංශ හා SDG වෙන්කර පැහැදිලිව හඳුනා ගැනීම පිණිසය.




6-2 රූපය අවමකිරීමේ අංශ NDC හා SDG අතර සම්බන්ධතා




6-3 රූපය අනුහුරුවීමේ අංශ NDC හා SDG අතර සම්බන්ධතා




6-4 රූපය අලාභ සහ හානි අංශයේ NDC හා SDG අතර සම්බන්ධතා

## 6.5 ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඒකාබද්ධ කිරීම හා සමාජ අන්තර්ගතභාවය

### 6.5.1 පසුබිම හා සන්දර්භය

දේශගුණ විපර්යාස ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ දී ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහ අවදානමට ලක්විය හැකි තත්ත්වවල සිටින ජනතාවයේ අයිතීන්ට හා සංවර්ධනයට, ස්ත්‍රී පුරුෂ සමානතාවය සහ සවිබල ගැන්වීම සඳහා කාන්තාවන්ට ඇති අයිතියට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සලකා බැලීම කළ යුතු බව පැරිස් ගිවිසුම අවධාරණය කරයි[72]. ඒ අනුව අවදානමට ලක්විය හැකි කණ්ඩායම්, ප්‍රජාවන් සහ පරිසර පද්ධති පිළිබඳව සැලකිල්ලට ගනිමින් දේශගුණ ක්‍රියාමාර්ග සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන, සහභාගීත්ව ප්‍රවේශයක් යොදාගනීමට ශ්‍රී ලංකාව ද පැරිස් ගිවිසුම හරහා කැපවී සිටී.

දේශගුණ විපර්යාසවල බලපෑම් සමාන නොවේ. ඒවා දරිද්‍රතාවයෙන් පීඩිතම සහ වඩාත්ම ආන්තික මට්ටමේ වෙසෙන ජනතාවට අසමානුපාතිකව බලපායි. බොහෝ සමාජවල දීර්ඝ කාලීනව පවත්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතා නිසා දේශගුණ විපර්යාස බලපෑම්වලට වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායමක් ලෙස කාන්තාවන් හඳුනාගෙන තිබේ. ලිංගභේදය පමණක් අවදානමට ලක්වීමේ හැකියාවන් සහ අනුහුරුවීමේ හැකියාවන් හැඩගස්වන්නේ නැති අතර, එය වෙනත් සමාජ සාධක ගණනාවක් සමඟ එකිනෙක ඡේදනය වේ. එබැවින් එසේ ඡේදනය වන සාධක සලකා බැලීම සහ සහභාගී වීම සඳහා සමාජ අන්තර්ගතකරණය අවශ්‍ය වේ.

අවදානමට ලක්වීමේ හැකියාව හා අනුහුරුවීමේ හැකියාව සඳහා බලපාන හෙවත් ඡේදනය වන සමූලික සාධක අතරට ලිංගිකත්වය, වයස, අධ්‍යාපනය, දැනුම සහ කුසලතා, ජනවර්ගය, හැකියාවන්, සංස්කෘතිය, සහ සමාජ-ආර්ථික තත්ත්වය ඇතුළත්ය. ඒ අනුව, දුප්පතුන්, කාන්තාවන්, ආබාධිතයන්, ළමුන්, වැඩිහිටියන් සහ සුළුතර ප්‍රජාවන් ආන්තික කණ්ඩායම්වලට අයත් වේ. ඒ කණ්ඩායම්, අවදානමට ලක්විය හැකිබව සහ හැකියාව යන දෙඅංශයෙන්ම දේශගුණ ක්‍රියාකාරකම්වලදී සලකා බැලිය යුතු වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජ වෙනස්කම් හුදෙක් අවදානමට ලක් විය හැකියාවන් පමණක් නොවන අතර, ඔරොත්තුදීමේ හැකියාව සඳහා ප්‍රභව වේ[73].

72 United Nations, Paris Agreement, 2015. Article 7, clause 5.
73 International Development Research Centre (IDRC), Advancing gender equality and social inclusion through climate action, October 31, 2022
https://www.idrc.ca/en/research-in-action/advancing-gender-equality-and-social-inclusion-through-climate-action

අනුහුරුවීමේ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය සහ දැනුම බෙදාගැනීමට අදාළව සම්පත්, තොරතුරු සහ සේවා වෙත ප්‍රවේශ වීමේ දී ආන්තික සහ/ හෝ අඩු නියෝජනයක් ඇති කණ්ඩායම් මගහැරී යා හැකිය. බොහෝ දෙනා දේශගුණ විපර්යාස දකින්නේ තාක්ෂණික විසඳුම් අවශ්‍ය වන විද්‍යාත්මක ගැටලුවක් ලෙස වන අතර, අනුහුරුවීමට සෘජුවම සම්බන්ධ සමාජ අංශ නොසලකා හැර තිබේ. කාන්තාවන් සහ අනෙකුත් ආන්තික කණ්ඩායම් බොහෝ විට හඳුනාගනු ලැබෙන්නේ සහභාගීවන්නන් ලෙස නොව දේශගුණ ක්‍රියාමාර්ගවල ප්‍රතිලාභීන් ලෙස වන බැවින් ප්‍රජා සහභාගීත්වය සඳහා ඇති අවස්ථා සීමා වේ[74].

### 6.5.2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තාවගේ තත්ත්වය

ජගත් මට්ටමෙන් ගත් විට වයස අවුරුදු 15 සහ ඊට වැඩි වයස කාන්තාවන් මිලියන 247 ක් පමණ පිරිසක් 2021 වර්ෂයේ දී දිනකට ඇමරිකානු ඩොලර් 1.90 කට වඩා අඩු මුදලකින් ජීවත් වන අතර, ඒ කාණ්ඩයට අයත් පිරිමින් ගණන මිලියන 236 කි පමණ වේ. 2030 වර්ෂය වන විට, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ දරිද්‍රතා පරතරය වැඩි වනු ඇතැයි අපේක්ෂා කරන්නේ ලෝකයේ ආන්තික දරිද්‍රතාවයෙන් පෙළෙන බහුතරය කාන්තාවන් වන නිසාය. 2020 වර්ෂයේ දී සිදුකරන ලද සමීක්ෂණයකට අනුව, ලෝකය පුරා කාන්තා දරිද්‍රතාවය වැඩි කිරීම සඳහා COVID-19 අර්බුදය හේතු වනු ඇත[75]. ග්‍රාමීය ප්‍රදේශවල දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගෙන් 70%ක් කාන්තාවන් වේ. සංවර්ධනය වෙමින් පවතින රටවල, කාන්තාවන් ආහාරවලින් 80%ක් දක්වා වූ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන නමුත්, ඔවුන් සතු වගා බිම් ප්‍රමාණය මුළු වගාබිම් ප්‍රමාණයෙන් පහෙන් එකකට වඩා අඩුය[76]. බොහෝ කාන්තාවන් අඩු වැටුප් ලබන අතර, අවිධිමත් සහ අනාරක්ෂිත රැකියාවල නිරත වේ. එසේම නිවසේ වගකීම් සහ රැකවරණ කටයුතු මගින් ඔවුන්ගේ ආදායම් ඉපැයීම් සහ වෙනත් අවස්ථා සීමා කරයි. බොහෝ සමාජවල කාන්තාවන් සමාජ, ආර්ථික සහ දේශපාලනික වශයෙන් පහළ මට්ටමක පසුවෙති.

ලෝකය පුරා සංවර්ධනය වෙමින් පවතින රටවල පර්යේෂණවලට අනුව, දේශගුණ විපර්යාස අවදානම, අවදානමට ලක්විය හැකි බව සහ ප්‍රතිචාර විකල්ප යන කරුණු පිරිමින් සහ කාන්තාවන් අතර සහ විවිධ සමාජ කණ්ඩායම් සහ ජීවනෝපායන් අනුව වෙනස් වන ආකාරය අවබෝධ කර ගැනීම දේශගුණ ක්‍රියාමාර්ගවලට සහාය වීම සඳහා මූලික වේ[77].

2012 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික සංගණනයට අනුව ජනගහනයෙන් 51.5% ක් කාන්තාවන් වන අතර, ස්ත්‍රී පුරුෂ අනුපාතය කාන්තාවන් 106 කට පිරිමි 100 පමණ වේ. ලෝක ආර්ථික සංසදයේ, ලෝක ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පරතර වාර්තාවට අනුව, 2006 වර්ෂයේ දී, ඇගැයීමට ලක් කළ රටවල් 115ක් අතරින් ලෝකයේ හොඳම රටවල් 20 අතරට ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කර ඇත[78]. කෙසේ වෙතත්, අධ්‍යාපන මට්ටම් සහ මහජන සෞඛ්‍ය සඳහා ප්‍රවේශය වැනි දර්ශකවලින් හොඳ මට්ටමක සිටිය ද, 2022 වර්ෂය වන විට ශ්‍රී ලංකාව මේ දර්ශකයේ රටවල් 146 කින් 110 වැනි ස්ථානය දක්වා පහළට පැමිණ තිබේ. ප්‍රජනක සෞඛ්‍යය, සවිබලගැන්වීම සහ ශ්‍රම වෙළෙඳපොළ යන මාන තුන ඔස්සේ සකස්කරන ස්ත්‍රී පුරුෂ අසමානතාවයේ සංයුක්ත මිනුමක් වන ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතා දර්ශකය (GII) අනුව ශ්‍රී ලංකාව ඉහළ මට්ටමක සිටී. මානව සංවර්ධන වාර්තාව අනුව එය 73 (2021/2022 ඇගැයීම) වන ස්ථානයට ශ්‍රේණිගත කර ඇත[79]. ස්ත්‍රී පුරුෂ සමාජභාව පරතරයේ ස්ථානයේ සහ ඉහළ ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතා දර්ශකයේ අගයේ පහත වැටීමට හේතු වන කරුණු අතර පාර්ලිමේන්තුවේ කාන්තාවන්ට හිමි මන්ත්‍රී ආසන සංඛ්‍යාව 5.3% ක් වීම හා ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය (30.9%) පිරිමින්ට (68.5%) සාපේක්ෂව අඩු අගයක් ගැනීම දැක්විය හැකිය[80]. සංඛ්‍යාලේඛනවලට අනුව, ශ්‍රම බලකාය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්ව අනුපාතය පිරිමින්ගේ එම අගයෙන් අඩකට වඩා වැඩිය.

74 https://lgiu.org/social-inclusion-in-climate-resilience-planning/
75 Statista, Gender poverty gaps worldwide in 2020 & 2021 by gender
https://www.statista.com/statistics/1219896/gender-poverty-gaps-worldwide-by-gender/#:~:text=Globally%2C%20247%20million%20women%20aged,of%20the%20world's%20extreme%20poor.
76 Reliefweb, Women and Development: The world's poorest are women and girls, March 2016
https://reliefweb.int/report/world/women-and-development-worlds-poorest-are-women-and-girls?gclid=CjwKCAiAmuKbB-hA2EiwAxQnt71Fyby-ODhvHjgqiqHNfkjTAVanDVAIa6VWGcVOETErGfKvInidWkBoC7LAQAvD_BwE
77 ibid
78 Gender Gap Index reflects 04 dimensions—Political Empowerment Gap, Economic Participation & Opportunity, Education Attainment and Health & Survival Gap. (https://economynext.com/sri-lanka-slips-in-global-gender-gap-rankings-wef-36501/)
79 UNDP, Human Development Report 2021/2022
80 Ibid (Labour Force Participation figures are for the year 2021)

කෙසේ වෙතත්, කාන්තාවන් වැඩි ප්‍රමාණයක් දැකිය හැකි සමහර ක්ෂේත්‍ර පවතී. නිදසුනක් ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පරිපාලකයින්ගෙන් 64% කාන්තාවන්ය. සමස්ත ලංකා රාජ්‍ය සේවාව ගත් විට (2016 වර්ෂයේ දී) පිරිමි 51.9% ක් සහ කාන්තාවන් 48.1% ක් පමණ විය. ඒකාබද්ධ සේවාව ගත් විට එහි 61.2%ක් කාන්තාවන් වූ අතර 38.8% පිරිමින් විය (සංගණන සහ සංඛ්‍යාලේඛන). සම්පූර්ණයෙන්ම පාහේ කාන්තාවන් සේවය කරන අංශ ඇති අතර, ඊට තේ, ඇඟලුම්, හෙද වෘත්තිය වැනි අංශ (ශ්‍රම තීව්‍ර) අයත් වේ.

අධ්‍යාපනයෙන් ලද ජයග්‍රහණ තිබුණ ද ජගත් මට්ටමෙන් ගත් විට ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පරතරය අනුව ශ්‍රී ලංකාව 14වැනි වැඩිම පරතරය ඇති රට වේ. පසුගිය දශක දෙකක පමණ කාලය තුළ කාන්තා සහභාගිත්වයේ අනුපාතය සියයට 30-35 අතර පැවති බව සඳහන් වේ. 2022 පළමු කාර්තුවේ කාන්තාවන්ගේ විරැකියා අනුපාතය 6.5% ක් වූ අතර, එය 3.0%ක් වූ පිරිමින් සඳහා වූ අගය මෙන් දෙගුණයක් පමණ වේ[81]. මේ හා සමානව, තරුණයන් අතර විරුකියා අනුපාතය මේ හා සමාන වන අතර, එහි දී කාන්තාවන් අතරින් 36.3ක්% විරැකියාවෙන් පසුවන අතර, පිරිමින් සඳහා එව 21.1%කි. එසේම සමාන කාර්යයක් සඳහා කාන්තාවන්ට ගෙවනු ලබන්නේ අඩු මුදලකි. ශ්‍රම බලකාය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය සඳහා බලපාන කරුණු ගණනාවක් ඇති අතර, ඊට දැරිය හැකි තත්ත්වයෙන් උසස් ළමා රැකවරණ සේවා නොමැති වීම, ගෘහාශ්‍රිත කටයුතු බෙදාගැනීම සඳහා සහායක් නොමැති වීම සහ කාන්තා සේවිකාවන් සඳහා සහයෝගී නොවන සේවා සංස්කෘතිය දැක්විය හැකිය[82]. ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් ගෘහමූලිකත්වය දරන නිවාස (FHH) ප්‍රමාණය 25.3%ක් පමණ වේ[83] (ජන සංගණන හා සංඛ්‍යාලේඛන 2016-2019) අතර, එම අගය මධ්‍යම හා උතුරු මැද පළාත්වල ඉහළය. මෙම තත්ත්වයේ ඇති ගැටලු අතර, ආබාධ සහිතව ජීවත්වන පුද්ගලයින්ගේ රැකවරණ වගකීම් වැඩි වශයෙන් කාන්තාවන්ට පැවරීම ද වේ.

දේශගුණ විපර්යාසවල බලපෑමෙන් පීඩාවට ලක්වන ස්වාභාවික සම්පත් මත කාන්තාවන් වැඩි වශයෙන් යැපෙන අතර ඒ නිසා පිරිමින්ට වඩා කාන්තාවන් අවදානමට ලක් වේ. කාන්තාවන්ගේ සාම්ප්‍රදායික දැනුම සහ අත්දැකීම් දේශගුණ විපර්යාස අවම කිරීමේ, දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ සහ ආපදා අවදානම් අවම කිරීමේ උපායමාර්ග භාවිතා කළ හැකිය. කාන්තාවන් වෙනස් කිරීමේ නියෝජිතයන් වන අතර, ස්වාභාවික හා ගෘහ සම්පත්වල භාරකරුවන් ලෙස ගෘහ මට්ටමේ සහ ප්‍රජාවන්හි ඔවුන් සතු වගකීම්, වෙනස් වන පාරිසරික යතාර්ථයන්ට අනුහුරුවීම සඳහා ඔවුන්ගේ ඇති හැකියාව වැඩි කරයි[84].

## 6.5.3 දරිද්‍රතාවය සහ විරැකියාව

වත්මන් අර්බුදය හේතුවෙන් 2021 සහ 2022 වර්ෂ අතර දරිද්‍රතා අනුපාතිකය සියයට 13.1 සිට 25.6 දක්වා දෙගුණයකින් වැඩි වී ඇති අතර, දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව සංඛ්‍යාව මිලියන 2.7 කින් වැඩි වී තිබේ. COVID-19 වසංගත තත්ත්වය නිසා දරිද්‍රතාවය 2019 හි සියයට 11.3 සිට 2020 දී සියයට 12.7ක් දක්වා වැඩි වී තිබූ අතර, එය දුප්පතුන් 300,000 කට වඩා වැඩි සංඛ්‍යාවක් අලුතින් එකතු වීමකි. මේ වන විට ශ්‍රී ලංකාවේ දරිද්‍රතා අනුපාතය 2009න් පසු ඉහළම අනුපාතය වේ. දුප්පතුන්ගෙන් සියයට 80 ක් තවමත් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන අතර, 2021 සහ 2022 අතර කාලයේ දී නාගරික ප්‍රදේශවල දරිද්‍රතා අනුපාතය සියයට 5 සිට 15 දක්වා තුන් ගුණයකින් පමණ ඉහළ ගොස් තිබේ. වතු ප්‍රදේශවල ජනගහනයෙන් අඩක් පමණ දැන් ජීවත් වෙන්නේ දරිද්‍රතා රේඛාවට පහළිනි. ඉදිරි වර්ෂ කිහිපය තුළ දී ද දරිද්‍රතාවය 25% ට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත[85].

2021 වර්ෂයේ මෙරට රැකියා විරහිත පුද්ගලයන් සංඛ්‍යාව 439,783ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මේ අතරින් සියයට 47.1ක් පිරිමි වන අතර, සියයට 52.9ක් පමණ කාන්තාවන් වේ. ජාතික මට්ටමින් ගත් විට, කාන්තාවන්ගේ විරැකියා අනුපාතය පිරිමි විරැකියා අනුපාතයට වඩා දෙගුණයකට වඩා වැඩි ය[86].

81 Department of Census and Statistics, Sri Lanka Labour Force Statistics, Quarterly Bulletin, First Quarter 2022
82 https://asiapacific.unwomen.org/en/countries/sri-lanka
83 http://www.statistics.gov.lk/GenderStatistics/StaticalInformation/SpecialConcerns/FemaleHeadedHouseholdsBySectorProvinceAndDistrict2016
84 https://www.un.org/womenwatch/feature/climate_change/downloads/Women_and_Climate_Change_Factsheet.pdf
85 World Bank, Poverty and Equity Brief, Sri Lanka, October 2022
86 Department of Census and Statistics, Labour Force Survey, Annual Report 2021



## 6.5.4 වෙනත් සමාජයීය වශයෙන් ආන්තික කණ්ඩායම්

ආබාධිතභාවය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂයේ ඇස්තමේන්තුවලට අනුව, ආබාධ සහිත පුද්ගලයින් සංඛ්‍යාව මිලියන 1.6 කි[87]. මෙය රටේ ජනගහනයෙන් සියයට 8.7ක් පමණ වේ. මේ අතර පිරිමි 43%ක් හා කාන්තාවන් 57% ලෙස වෙනස් වේ. ඇස් පෙනීම සහ සංචලනය යන දෙකම පිළිබඳ අපහසුතා ඇති කාන්තාවන්ගේ අනුපාතය පිරිමින්ට වඩා වැඩිය.

ආබාධිත පුද්ගලයන්ගෙන් බහුතරයක් ආර්ථික වශයෙන් අක්‍රිය (ආර්ථික වශයෙන් අක්‍රිය අයගෙන් 48%) ලෙස වාර්තා වන්නේ මහලු විය නිසා ඔවුන්ට වැඩකළ නොහැකි බැවිනි[88]. වයස අවුරුදු 15-19 අතර ආබාධිත ජනගහනයෙන් 55.4% ක් සහ වයස අවුරුදු 20-24 අතර ආබාධිත ජනගහනයෙන් 86% ක් කිසිදු අධ්‍යාපන කාර්යයක හෝ වෘත්තීය පුහුණුවක නියැලෙන්නේ නැත[89].

වැඩිහිටි ජනතාව[90]

අනෙක් දකුණු ආසියාතික රටවලට වඩා ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීම වේගවත් වන අතර, 1980 ගණන්වල සිට ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. 1981 සහ 2012 වර්ෂ අතර, වයස අවුරුදු 60 සහ ඊට වැඩි ජනගහනයේ අනුපාතය 6.6% සිට 12.4% දක්වා වැඩි වී ඇත. මරණ අනුපාතයේ සහ උපත් අනුපාතයේ කැපී පෙනෙන අඩුවීමක් හා ආයු අපේක්ෂාව වැඩි වීමක් සහිතව ජනවිකාශනයේ සිදු වූ වේගවත් වෙනස්වීම, ජනගහනයේ වයස්-ලිංගික ව්‍යුහයේ වැදගත් වෙනස්කම් ඇති කරමින් තිබේ. උපතේදී පිරිමි සහ ගැහැනු ආයු අපේක්ෂාව පිළිවෙළින් අවුරුදු 72 සහ 79 ලෙස වාර්තා වන අතර, 2012 වර්ෂයේ දී ගැහැනුන් පිරිමින්ට වඩා අවුරුදු හයක් පමණ වැඩි කාලයක් ජීවත් වී තිබේ. සමස්ත වැඩිහිටි ජනගහනයෙන් බහුතරය කාන්තාවන් වේ. 2012 වර්සයේ දී, ශ්‍රී ලංකාවේ සමස්ත වයස්ගත ජනගහනයෙන් 56% ක් පමණ කාන්තාවන් වූ අතර, වයසින් වැඩිම වයස් කාණ්ඩයේ (අවුරුදු 80 හෝ ඊට වැඩි) මෙම අනුපාතය 61% ක් විය. මුළු වැඩිහිටි ජනගහනය ගත් විට සෑම කාන්තාවන් 100 කටම පිරිමින් 94 ක් සිටියි.

## 6.5.5 දේශගුණ සන්නිවේදනවල එන ස්ත්‍රී පුරුෂ සමානතාව හා සමාජ අන්තර්ගතභාවය සඳහා කැපවීම

හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ සහ දේශගුණ විපර්යාසවලට අනුහුරුවීමේ ක්‍රියාවල දී කාන්තාවන්ගේ දායකත්වය සක්‍රීය කිරීමට මෙන්ම ප්‍රතිලාභ සඳහා ඔවුන්ට සමාන ප්‍රවේශයක් ලබා දීම සඳහා ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගැටලු විසඳීමේ වැදගත්කම 2021 NDC සන්නිවේදනය[91] මගින් පිළිගෙන තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන ප්‍රවේශයන් අනුගමනය කරමින් ස්ත්‍රී පුරුෂ සමානතාවය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳව 'දේශගුණ විපර්යාස සඳහා වූ පැරිස් ගිවිසුම' මගින් සාමාජික රාජ්‍ය වෙත පෙන්වා දී තිබේ. මේ සඳහා වන ශ්‍රී ලංකා රජයේ කැපවීම් සිය ජාතික ප්‍රතිපත්ති රාමු තුළින් දක්වා තිබේ.

අනුහුරුවීමේ ප්‍රමුඛතා තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජ ආරක්ෂණයන් ප්‍රධාන ප්‍රවාහගත කිරීම වැදගත් උපාය මාර්ගයක් ලෙස NDC සන්නිවේදනය මගින් හඳුනාගෙන ඇත. ඒ නිසා, අඩු පරිමාණයේ අවදානම් තක්සේරු කිරීම් සහ ආංශික සැලසුම්වල දී කාන්තාවන්, කුඩා ළමුන්, ආබාධිත සහ වැඩිහිටි ජනගහනයේ නිශ්චිත අවශ්‍යතා, අවදානමට පත්වීමේ හැකියාව සහ ඔවුන්ගේ හැකියාවන් ඒකාබද්ධ කිරීම නිර්දේශ කෙරේ.

87 අර්ථදැක්වීම: "උපතේ සිට හෝ එසේ නොවන ආකාරයෙන් තමන්ට ඇති වූ කායික හා මානසික හැකියාවන්ගේ දුර්වලතාවයක් හේතුවෙන් තම ජීවිතයේ අවශ්‍යතා තමා විසින්ම සිදුකරගැනීමට අසමත් ඕනෑම පුද්ගලයෙකු"
88 Department of Census and Statistic, Disability in Sri Lanka, 2012 https://unstats.un.org/unsd/demographic-social/meetings/2016/bangkok--disability-measurement-and-statistics/Session-6/Sri%20Lanka.pdf
89 UNICEF, Every Mind, 'Learning Disabilities in Sri Lanka', 2016 - https://www.unicef.org/srilanka/every-mind
90 Ageing Population of Sri Lanka: Emerging Issues, Needs and Policy Implications, Thematic Report based on Census of Population and Housing 2012, UNFPA
91 Ministry of Environment, Updated Nationally Determined Contributions under the parisd Agreement on Climate Change, July 2021

ජාතික පරිසර ප්‍රතිපත්තියේ (2022), 4.7.7 වගන්තිය (පිටුව 67) මගින් පාරිසරික කළමනාකරණයේ දී කාන්තා සහ තරුණ සහභාගීත්වය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ තරුණයින් සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය ඉස්මතු කර දක්වා ඇත. එසේම, සෑම ආකාරයකම ප්‍රජාව සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව කටයුතුවල දී විශේෂ අවධානයක් යොමු වන බව ද දක්වා තිබේ..

ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලසුම 2022-2030හි අංක 6 වන උපායමාර්ගය මගින් දේශගුණ විපර්යාසවලට එරෙහිව සටන් කිරීමට කාන්තා සහභාගිත්වය ඉහළ නැංවිය යුතු බව නිර්දේශ කර ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය දේශගුණ විපර්යාසවලට අදාළ සියලුම නව ප්‍රතිපත්ති සහ සැලසුම්වලට ඇතුළත් කිරීමේ ඉලක්කය සමඟය. එසේම 8 වන උපාය මාර්ගයට අනුව ඇතුළත් කිරීම, බලගැන්වීම සහ සමානතාවය සහතික කිරීම සඳහා තවදුරටත් සමාජ සජීවීකරණය කිරීම, සමාජ අන්තර්ගතකරණය, බලගැන්වීම, සමානතාවය සහ සංස්කෘතික විවිධත්වය මැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා සමාජ දර්ශක සම්මත කිරීම සහ ස්ථාපිත කිරීම නිර්දේශ කිරීම් යනුවෙන් සඳහන් වේ[92].

හරිත දේශගුණ අරමුදල මගින් අරමුදල් සපයන ජාතික අනුහුරුවීමේ සැලසුම සූදානම් සහාය ව්‍යාපෘතිය (ක්‍රියාත්මකයි) මගින් ජාතික අනුහුරුවීමේ සැලසුම (NAP) ක්‍රියාවලීන් හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජ අන්තර්ගතකරණය ප්‍රධාන ධාරාගත කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාව සහ සමාජ ක්‍රියාකාරී සැලසුමක් (GSAP) සකස් කරනු ඇත.

### 6.5.6 ධීවර, පශුසම්පත්, ජල (අනුහුරුවීම), විදුලිබල (අවම කිරීම) යන අංශවල දී හඳුනාගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමාජ අන්තර්ගතකරණය පිළිබඳ ගැටලු

කාන්තාවන් එක් එක් අංශයට දායක වන සැලකිය යුතු සම්පතක් වන බව අංශ විශ්ලේෂණයෙන් පෙනී යයි. මෙම සෑම අංශයකම ස්ත්‍රී පුරුෂ වශයෙන් වන ශ්‍රම බෙදීමක් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් ඇති අතර, ඒ බව ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙනස් වන කාර්යභාරයන් අනුව සහ වගකීම් තුළින් දෘශ්‍යමාන සහ පැහැදිලි වේ. ඒ අනුව, පිරිමින්ට සහ කාන්තාවන්ට වෙනස් වන අනුරූප අවශ්‍යතා, ප්‍රමුඛතා සහ ප්‍රවේශයන් (a) තොරතුරු සහ දැනුම, b) තාක්ෂණයන්, c) පුහුණුව, d) ආධාරක සේවා, e) යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආදිය සඳහා) පවතී.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රමය බෙදීම බොහෝ විට අනුපූරක විය හැක. කෙසේ වෙතත්, ස්ත්‍රී පුරුෂභාවය අනුව වර්ගීකරණය කළ දත්ත නොමැතිකම, ප්‍රතිපත්ති හිඩැස් සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ සංජානන සහ ඒකාකෘති නිසා කාන්තාවන්ගේ දායකත්වය තවදුරටත් බොහෝ දුරට නොපෙනේ.

### 6.5.7 සියලු අංශවලට පොදු ලක්ෂණ

දේශගුණ ක්‍රියාමාර්ගවලදී දිළිඳු ජනතාව, කාන්තාවන් සහ අනෙකුත් කණ්ඩායම් ආන්තිකකරණය කිරීමට හේතු වන, විවිධ අංශවලට පොදු වූ ලක්ෂණ පහත දක්වා ඇත.

(a) ජාතික මට්ටමේ ආංශික සැලසුම්කරණයේ දී අවධානය යොමුවන්නේ තාක්ෂණික අංශ කෙරෙහිය. ආංශික නිෂ්පාදන සහ බෙදාහැරීමේ ප්‍රතිඵලවල අවශ්‍ය අංගයක් වන ප්‍රජාව සහ සමාජීය කරුණුවලින් බැහැර කර තිබීම.

(b) ප්‍රමාණවත් මට්ටමේ අධ්‍යාපනයක් සහ සාක්ෂරතාවයක්, කුසලතා සහ පළපුරුද්ද තිබියදීත් වුවත් තීරණ ගැනීමේදී (ප්‍රාදේශීය මට්ටමින් ඇතුළුව) කාන්තාවන් සහ අනෙකුත් ආන්තිකකරණය වූ කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස නියෝජනය නොවීම හෝ උපදේශනය සඳහා සම්බන්ධ කර නොගැනීම.

(c) ගොවි/ධීවර සංවිධාන, සමුපකාර සමිති ආදියේ තීරණ ගැනීමේ මට්ටමේ දී බොහෝවිට ප්‍රමුඛත්වය ගන්නේ ඉඩම් අයිතිය ඇති පිරිමින් වන අතර, කාන්තාවන්ගේ හඬ කිසිසේත්ම නොසැලකේ. මෙය සිරිතක් ලෙස සලකනු ලැබේ.

92 Ministry of Environment, National Environment Action Plan 2022-2030: Pathway to sustainable development in Sri Lank, July 2022



(d) අංශ මට්ටමේ සැලසුම්කරණ තීරණවල දී, තාක්ෂණික දියුණුව සහ සේවාවල සහාය ඇතිව, බොහෝ විට පිරිමින් විසින් මෙහෙයවන ලද ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛත්වය හිමි වේ (ධීවර යාත්‍රා, වාරිමාර්ග, සිසිලනය සහ සැකසුම් ශිල්පීය ක්‍රම වැනි)

(e) ආංශික අගය දාමයන් තුළ කාන්තාවන් පහළ අන්තයේ සිටින අතර, ඔවුන්ට ප්‍රාථමික, ඒකාකෘතික සහ බොහෝ විට මුදල් නොලබන කාර්යයන් පැවරී ඇත.

(f) විශේෂයෙන්ම කාන්තාවන්ගේ ප්‍රශස්ත විභවය නිසි පරිදි අවබෝධ කරගැනීමට හැකි ප්‍රතිපත්ති සහ සැලසුම් පරිසරයක් අංශ තුළ නොමැති නිසා ජාතික ආර්ථිකයට අලාභයක් ඇති වේ.

(g) සිය තත්ත්වය, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ට ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව දැනුම්වත්භාවයක් සහ අවබෝධයක් ග්‍රාමීය කාන්තාවන්ට නැත.

(h) දිළිඳු, ආන්තිකකරණය වූ කණ්ඩායම්වලට සහ කාන්තාවන්ට පුහුණුව, ධාරිතා වර්ධනය, දැනුම බෙදාගැනීමේ අවස්ථාවලට පිවිසීමට නොහැක.

(i) දැනුම නොමැතිකම, ඵලදායී සම්පත්, තාක්ෂණය සහ මූල්‍ය ධාරිතාවය සඳහා සඳහා දුර්වල ප්‍රවේශයක් තිබීම හේතුවෙන් ආන්තික කණ්ඩායම් සීමා වී ඇත.

(j) ශ්‍රමය අධික ලෙස අවශ්‍ය හා ප්‍රාථමික කාර්යයන් පැවරෙන්නේ සම්පත් හිඟ සහ ආන්තිකකරණය වූ කණ්ඩායම් වෙත වීම.

(k) නිෂ්පාදන සම්පත් (යෙදවුම්, සහනාධාර, ණය, වාරි ජලය සඳහා ප්‍රවේශය) සඳහා ප්‍රවේශ වීමේ දී ඉඩම් හිමිකම තීරණාත්මක සාධකයක් වේ. ඉඩම් හිමිකම සාම්ප්‍රදායිකව පිරිමින් වෙත පවත්නා අතර, කාන්තාවන් සහ දිළිඳු ජන කණ්ඩායම් මෙහි දී ආන්තිකකරණය වී ඇත. ඔවුන්ගේ සමාජයේ පහළ මට්ටමක ස්ථානගත වීම ද ඊට හේතුවකි.

(l) ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු සහ අනෙකුත් ආන්තිකකරණය වූ කණ්ඩායම් සම්බන්ධයෙන් ආංශික ප්‍රතිපත්ති බොහෝ දුරට උදාසීන ප්‍රවේශයක් ගනී.

### 6.5.8 ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කරුණු NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට අන්තර්ගත කිරීම

NDC ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ගැටලු අන්තර්ගත කිරීමේ දී පහත පරිදි ආමන්ත්‍රණය කළ යුතුය;

හඳුනාගැනීමේ සහ ලේඛනගත කිරීමේ අරමුණින්, එක් එක් අංශය සඳහා, අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තක්සේරුවක් සිදුකිරීම:

- අංශයට විශේෂිත වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ශ්‍රම විභජනය සහ පිරිමින් සහ කාන්තාවන් විසින් සපයන ලද දායකත්වය පිළිබඳ හිඩැස් විශ්ලේෂණය
- පිරිමින් සහ කාන්තාවන්ගේ නිෂ්පාදන ආශ්‍රිත නිශ්චිත කුසලතා සහ විශේෂඥතාව
- ඵලදායී දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමක් සඳහා සහ හරිතාගාර වායු විමෝචන අවම කිරීම සඳහා පිරිමින්ට සහ කාන්තාවන්ට අවශ්‍ය අවශ්‍යතා සහ සහාය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන දේශගුණ විපර්යාස අනුහුරුවීම සහ අවම කිරීම සඳහා ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු සම්බන්ධ ආයතනවල සහ ප්‍රජාවන්ගේ ධාරිතා ගොඩනැගීමේ අවශ්‍යතා

(a) දේශගුණ විපර්යාස අනුහුරුවීම සඳහා පවත්වනු ලබන අවශ්‍යතා සහ ශක්‍යතා තක්සේරු කිරීම් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥතාව ඇතුළත් කිරීම,

(b) NDC ක්‍රියාමාර්ගවල සැලසුම් කර ඇති සියලුම ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්වල ගැටලු විසඳීම සඳහා වූ ප්‍රවේශවලට අංශයකට විශේෂිත වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු ග්‍රහණය කරගැනීමට ගන්නා මොඩියුල/ සැසි අන්තර්ගත කිරීම,

(c) දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීම සහ අවම කිරීමේ ක්‍රියාකාරකම්වල කාන්තා නියෝජනය සහ සහභාගීත්වය/ ළඟා වීම සඳහා වූ නිශ්චිත ඉලක්ක මෙන්ම ප්‍රතිශතයක් සැකසීම,

(d) ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීමේ හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්යයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය සක්‍රීය කිරීම,

(e) ධාරිතා හිඩැස් සහ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා දේශගුණ විපර්යාසවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු පිළිබඳ දැනුම්වත්භාවය සහ භාවිතය පිළිබඳ දැනුම සම්බන්ධව ආංශික ආයතන (ජාතික මට්ටමින්) තක්සේරු කිරීම.

(f) NDC අංශවල හරිතාගාර වායු විමෝචන අඩු කිරීමේදී කාන්තාවන්ගේ භූමිකාව හඳුනාගැනීම සහ පිළිගැනීම

(g) වඩාත් අවදානමකට ලක්විය හැකි හා ආන්තිකකරණය වූ කණ්ඩායම්වලට අදාළ ප්‍රධාන ගැටලු හා හරිතාගාර වායු විමෝචන අවමකිරීමේ හා දේශගුණ විපර්යාසවලට අනුහුරුවීම සැලසුම්කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ඒවා ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අංශවල ආයතනික දැනුම්වත්භාවය හා ධාරිතාව ගොඩනැංවීම .

(h) ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් කිරීමේ දී සහ දේශගුණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ප්‍රජාවන්, කාන්තාවන්, තරුණයින් සහ අනෙකුත් ආන්තිකකරණය සහ/හෝ අඩු නියෝජනයක් ඇති කණ්ඩායම් උපදේශන සඳහා සම්බන්ධ කරගැනීමේ පිළිවෙත හඳුන්වා දීම

(i) සමානාත්මතාවය සහ තිරසර ආයෝජන සහ භාවිතයන් සක්‍රීය කරමින්, අනුහුරු වීමේ ධාරිතාව ඉහළ නැංවීමට සහ වඩාත්ම ආන්තිකකරණ වූ කණ්ඩායම්වල ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීමට හේතුවන ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවාට ප්‍රමුඛත්වය දීම.

(j) දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන තාක්ෂණය සංවර්ධනය, ප්‍රවර්ධනය සහ දැනුම බෙදාගැනීම, අනුහුරුවීමේ සම්පත් සඳහා ප්‍රවේශය ලබා දීමේ දී ආන්තිකකරණය වූ කණ්ඩායම්වල ගැටලු සලකා බැලීම/ ඇතුළත් කිරීම සහතික කිරීම.

## 6.6 ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ

NDC සැලසුම්වල දක්වා ඇති දේශගුණ ක්‍රියාකාරකම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) 4 වන වගන්තියට සහ පැරිස් ගිවිසුමේ 9, 10 සහ 11 වගන්තිවලට අනුකූලව මූල්‍ය පහසුකම්, තාක්ෂණ පැවරුම සහ ධාරිතා වර්ධනය අවශ්‍ය වේ. "පොදු නමුත් වෙනස් වූ වගකීම් සහ ඒවායේ නිශ්චිත ජාතික සහ කලාපීය සංවර්ධන ප්‍රමුඛතා, අරමුණු සහ තත්ත්ව" සලකා බලමින්, දේශගුණ විපර්යාස පිළිබඳ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට සංවර්ධනය වෙමින් පවතින රටවලට සහාය වීම සහ අවම කිරීමේ අභිලාෂය වැඩි කිරීම පිළිබඳව මෙම වගන්තිවලින් පැහැදිලි වේ. පැරිස් ගිවිසුමේ 4 වැනි වගන්තියේ 5 වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තේ "මෙම වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනය වන රාජ්‍ය පාර්ශ්වයන් සඳහා සහය ලබා දිය යුතු අතර, 9, 10 සහ 11 වගන්තිවලට අනුව, සංවර්ධනය වෙමින් පවතින රාජ්‍ය පාර්ශ්වයන්ට වැඩි සහායක් ලබා දීමෙන් ඒ රටවල ක්‍රියාමාර්ගවල අභිලාෂය ඉහළ නැංවිය හැකිය" යනුවෙනි.

මෙම ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව මගින් ශ්‍රී ලංකාව සිය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ඉහළ අභිලාෂය සාක්ෂාත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර සහාය අපේක්ෂා කරන අතර, දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමට හා දේශගුණ විපර්යාස ආශ්‍රිත ආපදා නිසා ඇති වන අලාභ සහ හානි අවම කිරීම සඳහා කඩිනමින් සහාය අපේක්ෂා කරයි. කෘෂිකාර්මික අනුහුරුවීම, ආහාර නිෂ්පාදනය, වාරිමාර්ග සහ පානීය ජලය, වාසස්ථාන සහ මානව සෞඛ්‍යය, ජෛව විවිධත්වය සහ වෙරළ ආරක්ෂාව මෙමගින් ආවරණය වේ. දේශගුණ අනතුරු රාශියකට මුහුණ දෙන ජාතියක් ලෙස, වැඩිදියුණු කළ දේශගුණ අනාවැකි, අවදානම් සන්නිවේදනය, පූර්ව අනතුරු ඇඟවීම් සහ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුව ශ්‍රී ලංකාවට විශේෂයෙන් වැදගත් වේ.

## 7. උපලේඛනය

ජාතික මෙහෙයුම් කමිටුවේ (NSC) හා සැලසුම් හා අධීක්ෂණ කමිටුවේ (PMC) යොමු කිරීම් අනුදේශ (ToR).

පහත සඳහන් වන යොමු කිරීම් අනුදේශ (ToR) 2022 දෙසැම්බර් 20 දින ජාතික මෙහෙයුම් කමිටුවේ (NSC) රැස්වීමේ දී ලැයිස්තුගත කරන ලද ඒවාය. මේ යොමු කිරීම් අනුදේශ රටේ පවත්නා තත්ත්වයන් හා ජාතික අවශ්‍යතාවය මත එක් එක් ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමේ දී වෙනස් වීමට ඩ ඇත.

A. ජාතික මෙහෙයුම් කමිටුවේ යොමු කිරීම් අනුදේශ (ToR)

- ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව (PMC) මගින් ලබා දී ඇති ප්‍රතිපත්ති, උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ උපදෙස් ලබාදීම හා මාර්ගෝපදේශනය ලබාදීම.
- ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව මගින් ලබා දී ඇති ප්‍රතිපත්ති, උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
- වෙනස් අමාත්‍යාංශ හා ආයතන අතර සහයෝගීතාවය හා සහාය ලබා දීම
- දත්ත හුවමාරු කිරීම හා NDC ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්-අමාත්‍යාංශ හා අන්තර්-ආයතන සම්බන්ධීකරණය ඇතිකිරීමට මගපෙන්වීම හා සහාය ලබා දීම.
- NDC ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන බාධක ජයගැනීමට ප්‍රායෝගික විසඳුම් ලබාදීම.
- NDC ක්‍රියාත්මක කිරීමේ සමස්ත ප්‍රගතිය මාර්ගෝපදේශ හා සංසන්දනය කරමින් මැනීම.
- NDC ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රමවේද සුපරීක්ෂණය.
- ජාතික මෙහෙයුම් කමිටුව (NSC) වර්ෂයකට වරක් රැස්කිරීම.

B. සැලසුම් හා අධීක්ෂණ කමිටුවේ යොමු කිරීම් නිර්දේශ (ToR)

- සැලසුම් හා අධීක්ෂණ කමිටුව වර්ෂයකට දෙවරක් රැස්කිරීම.
- පරිසර අමාත්‍යාංශය මගින් සකස් කරන ලද ඉහළ-මට්ටමේ ක්‍රියාකාරී සැලසුමෙන් සවිස්තර ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් සකස්කිරීම.
- දත්ත හුවමාරු කිරීම හා NDC ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්-අමාත්‍යාංශ හා අන්තර්-ආයතන සම්බන්ධීකරණය ස්ථාපිත කිරීම.
- එක් එක් NDC අංශය සඳහා පරිසර අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය කිරීම පිණිස කේන්ද්‍රස්ථානයක් හඳුනාගැනීම.
- අදාළ ඒ ඒ ආයතනයේ (ක්‍රියාත්මක කිරීමේ සැලසුමේ දී හඳුනාගත්) අධ්‍යක්ෂ (සැලසුම්) විසින් NDC ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ලබාගෙන කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) වෙත වර්තාකිරීම සඳහා වූ ආයතනික රාමුව සකස් කිරීම.
- ඔවුන්ගේ ප්‍රගතිය අඛණ්ඩව වාර්තා කිරීම පිණිස අදාළ ආයතනවලින් දත්ත ලබාගැනීම සඳහා මැනීම, වාර්තාකරණ හා සත්‍යාපන පද්ධතියක් සකස් කිරීම.
- NDC ක්‍රියාත්මක කිරීම හා ප්‍රමාණාත්මක ලෙස ප්‍රගතිය වාර්තා කිරීම පිණිස කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා නියමිත පරිදි ධාරිතා වර්ධන හා පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම.
- ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා බාධා කරන තත්ත්ව හඳුනාගැනීම හා ඒ සම්බන්ධව ජාතික මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා විසඳුම් නිර්දේශ කිරීම.
- NDC ක්‍රියාමාර්ග ප්‍රමුඛතාගත කිරීම හා ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ලබාගැනීම සඳහා වෙනත් ආයතන සමඟ හවුල්කාරිත්ව ඇතිකරගැනීම.
- අංශය ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී කිරීම.